වර්ණනා

සහිත

# හංස සන්දේශය


පි. ඩී. ඇස්. වීරසූරිය මහත්මයා

විසිනි



ප්‍රකාශකයෝ සහ මුද්‍රණකරුවෝ

ජේ. ඩී. ප්‍රනාන්දු

ගුණප්‍රකාශ යන්ත්‍රාලය, වේල්ල වීදිය, කොළඹ.

2480–1936

වර්ණනා සහිත

# හංස සන්දේශය

—❧—

## සංක්ෂේපනය

**හංස සන්දේශය**

**හංසයකු** දූත කාර්යයෙහි යොදන ලද අයුරු රචිත මෙය **හංස සන්දේශය** නම්. පොතෙහි කර්තෘ නාම සඳහන් නාතමක අවසාන කවෙහි "මෙ බඳු නමින් සැලසී නිසර සන්දෙස" ය යි දැක්වේ. සුදු හංසයන්ට 'නිසර' යනු ද අභිධානයෙකි.. එහෙයිනි එසේ දැක්වුණේ.* මේ කර්තෘහුගේ වාග් ප්‍රයොග ගැන බලනවිට **'නිසර සන්දෙස'** යනු **'හංස සන්දෙස'** ය යි ලිවේ නම් වඩා යොග්‍ය යි.

**නිමිත්තය**

"ජයවර්ධන පුරාධීශ්වර **ශ්‍රී සඞ්ඝබොධි ශ්‍රී පරාක්‍රමබාහු** මහරජාණන්ගේ රාජ්‍ය පරිපාලනය නිරුපද්‍රුතව චිරස්ථායි වනු සඳහා පිරිත් කියා සෙත් සලසා සතුරු බියවුල් අතුරුදන් කර ආරක්ෂා කොට දෙන ලෙස පුල්වන් සුරිඳුන් ඈ සුරනට පින් දෙනු මැනව" යි කැරගල පද්මවති පරිවෙණාධිපති ශ්‍රී රාජගුරු **වනරතන සඞ්ඝරාජයන්** වහන්සේට යාච්ඤා කිරීම (198–199) මෙහි නිමිත්තය යි.

**කර්තෘ**

මෙහි කර්තෘ **වීදාගම මහා නෙත්‍ර ප්‍රාසාද මූල මෛත්‍රෙය මහා ස්ථවිරපාදයන්** වහන්සේය. (201–202). "කර්තෘ නාමය මෙහි අනිර්දිෂ්ටයි. මුඛ පරම්පරා වශයෙන් මෙහි කර්තෘහු **වීදාගම මෛත්‍රෙය** මහා ස්ථවිරයෝ ය යි ශ්‍රූයමාණ වේ."†

"......හංස සන්දේශය ද මේ **වීදාගම මෛත්‍රෙය** ස්වාමිපාදයන්ගේ කෘතියෙකි. ......මුද්‍රිත පොත්හි කර්තෘවරයා දැක්වූ කවි දෙකක් ඌන බැව් පෙනේ.‡

---

* තිසර සන්දෙශ නමින් අනෙක් සන්දෙශ කාව්‍යයක් ඇත්තේය.

† හංස සන්දේශය–ශ්‍රී ධර්මාරාම සංස්කරණය. තුන්වන වර මුද්‍රණය

‡ බුදුගුණ අලංකාරය–බී. බී. ජයතිලක සංස්කරණය. පඤ්චම මුද්‍රාංකනය.

“......හංස සන්දේශය ද **විදගම ස්වාමි** පාදයන්ගේ කෘතියක් ය යි ජනශ්‍රැති කථානුසාරී මතයක් පවති. මේ සන්දේශය ප්‍රශස්ත කාව්‍යයක් වුවත් එය මේ මහා ස්ථවිරයන් වහන්සේ විසින් කරන ලද්දකැයි පිළිගැනීමට සෑහෙන තරම් කරුණු නැති බැව් කියමු.”*

“හංස සන්දේශය......කර්තෘ කවරෙක්දැ යි සඳහන් නොවතත් **විදගම මෛත්‍රෙය** ස්වාමිපාදයනැයි ජනශ්‍රැතියෙකි. මේ සන්දේශ කාව්‍යය විදගම ස්වාමීන්ගේ කෘතියක් නොවේ නම් ඒ පරපුරේ අන්‍ය ස්ථවිරතුමකුගේ කෘතියක් විය යුතුය. විදගම ස්වාමීන්ගේ බුදුගුණ අලංකාරයෙන් ප්‍රකාශවන ඇතැම් මත භේද හංස සන්දේශයෙහි ඇතැම් තැන දක්නා ලැබේ.†

සෑහෙන ප්‍රමාණ කාරණා නො දක්වා “කර්තෘ නාමාත්මක කවි පසුව එකතු කරන ලදැ”යි යන තර්කණ මාත්‍රයෙකින් පමණක් මෙහි කර්තෘ විදගම ස්වාමිපාදයෝ නොවෙත් ය යි ප්‍රතික්ෂේප කරමුද? වැදගත් පැරණි සමහර පත් පොත්වල අනිර්දිෂ්ට වුවද මුඛ පරම්පරාගත කිසියම් වෘත්තාන්තයක් පණ්ඩිත සම්මත නම් එය එසේ පිළිගත යුතුය.

**“වී දු ගම වෙහෙරෙහි මෙත් තෙරිඳු ස ඳ**
සාදු රණව පැවසූ මෙත් සිතින් න ඳ
බාදු නොවී මොක් දුකුමට බැඳි මෙ ප ද
පාදු සතුන් සිත පවතීවා නිබ ඳ”

ලෝවැඩ සඟරාව.

“දි න දි න නො අඩු දින පුද පැවැති මිනක ර
ද න ම න රදන සැදි ගෙවුයන් සිරින් ස ර
වැ ජ ඹෙ න පසිඳු මඟ **රයිගම් පුර** අතු ර
බ බ ල න සොඳුරු **විදගම** මහ වෙහෙ **ර**

කි ත් යස සොත් දසදික් දිගු යට’ග බ ඳ
**මෙත් මහ තෙත් පාමුල මහ තෙරිඳු ස ඳ**
සෙ ත් කළ මුනි සඳ ගුණ කව් පෙදෙන් බැ ඳ
ස ත් වැඩ වස් මෙ ද කළෙ මෙත් සිතින් න ඳ”

බුදුගුණ අලංකාරය.

“ම න ර ම් ලකළ මල් පලරම් රදන නි සි
නොවහිම් උතුම් ගෙවුයතුදුල නිතොර දි සි
**ර යි ග ම් නුවර** තුර රැඳි පිරි ඉසුරු රැ සි
වි හි ගු ම් සොඳුරු **විදගම වෙහෙර** වැ සි

---

* බුදුගුණ අලංකාරය—ඩී. බී. ජයතිලක සංස්කරණය. අෂ්ටම මුද්‍රණය.

† සිංහල සාහිත්‍යෝදය කථා—මාර්ටින් වික්‍රමසිංහ.

සත් වෙත මෙත් නිරතුරු පතළ එක ලෙසින්
දත් නෙක, සත් හෙළ සකු මගද ඇති සින්
කිත් යස කොත් බඳ දිගු සට'ග සහතො සින්
**මෙත් මහ නෙත් පාමුල තෙරිඳු සඳ වි සින්"**

**හංස සන්දෙශය.**

"පසන් ලක් දිව් සඳ - මුව මඬල මෙන් හොබනා
පලරම් අරම් සිරි පිරි - **විදාගම වෙහෙර රැඳි**

පසක් තුන් ලෝ සිඳු - ඉඳු බුදු රදුන් වඳහළ
තෙවලා සඳුර කුඹුයොන් - සිරින් ගත් නිය අත්ලෙන්

නොයෙක් සත් තළ සඳ - ලකර වියරණ වියතුන්
මුදුන සැදු **මෙත් මහ නෙත් - පා මුල මහ තෙරිඳු සඳ**

මෙලක එකසත් කළ - සිරි පැරකුම් නිරිඳුහට
පණස් සිවු වස කළෙ මේ - **කව් ලකුණු මිණිමල්** නම්"

**කව් ලකුණු මිණි මල්.**

විදාගම සාමීන්ද්‍රයන්ගේ කෘතින්හි දක්වෙණ කර්තෘ සන්දර්ශී නාමක මේ රචනා සමන්වා බලමු. රචනා මාධුර්යයෙන් සන්ධි ශුද්ධියෙන් වාග් ප්‍රයොගයෙන් අර්ථ රසයෙන් මේවා සංසන්දනය වේ. එක ම කර්තෘ කෙනෙකුන්ගේ නිබන්ධ බවට සැකයෙක් ඇත්තේ නොවේ. කර්තෘ හැඳින්වෙන කව්වලින් පමණක් නොව විදාගම හාමුදුරුවන්ගේ අනෙක් කෘතීන් හා සසඳා බලන කල ද **හංස සන්දෙශය** එම වහන්දෑගේ ම නිබන්ධයක් බව ප්‍රත්‍යක්ෂ විසින් අවබොධ වෙ.

**ලෝවැඩ සඟරා**වෙහි සමහර වචන යොදන ලද අයුරු මෙසේය. විවරට 38, බෝජන 51, බහු නාටක-ගෝර 54, කම්පාව 56, දරුමය-කරුමය 60, සිල්ප-අල්ප-කල්ප 67, කුරුපණ 77, පර සන්තක දෙය 79, ආදාරය-විචාරය-පරදාරය-ලගුකොට 81, පරුස තෙපුල් 84, වැපාදේ 87, ඉද්දි බලය 93, ආබාද 103, විදානය-පදානය 105, මෙත් බාවන 111, නිරන්තර 125, චුතව 129, වෙස්සබු මුනිඳු 131, සාදාරණව-බාදා නොවී 139.

මෙන්න **බුදුගුණ අලංකාරයෙහි** යෙදුම් කිහිපයක්. බලංකාරය-බුදුගුණ අලංකාරය 5, කුංචනාදේ 31, ලිච්ඡවි නිරිඳු 38, දුගි යාචකයන්ට 143, සිව ලිංගය 162, අනෝලෝකිතය 230, සූචිසි අසංඛ්‍යකට 259, විජ්ජාචරණ 264, ලෝකවිදූ 266, අනුත්තර 267, පුරිස දම් සාරථි 268, සත්තා 269, බජනය-බගවත් 271, පෙරේමය-රෝමය 234, ඉරිදුව 286, මනෝරංජන-නිරංජන-අනුවැංජන 305, ගෝතම-බීත කරන 312, වඳ බත්දනයෙන් 328, මත්දතු නරදෙව් 343, යසෝදර නම් කතක් 369, කන්තක 390, අජපාල නුග 397, සුජාතා 398, ආරාදනා 440, කම්පා 454.

**හංස සන්දේශයෙහි** වාග් විලාසය මේ ස්වල්පයෙන් දත හැක. වනරත්න 8-184, සිරිමද්දන-රූපමද්දන-බලවද්දන-ජයවද්දන 11, කුරුපණ රජුන් 32, කුරුපණ 36, සෝක 39, සිංහාසනේ 47, දිසන්තේ-ඒකනායක-වසන්තේ 49, චණ්ඩාතප කිරණ-බණ්ඩාර නායක-වික්‍රම-සක්‍රම-අක්‍රම වංක-වික්‍රමසිංහ 50, සේනානායකවරු 51, ලේඛම්වරු-අදිකරණ 54, මුනි දූතුවෙන් 75, දිය කෝකිල 85, ගණනායක 105, මද්දල සුද්ද තාලම 109, නිරෝගිකර 113, ජර පත්වෙයි 115, වලුරු ගණ 146, සසර බය 157, නාගසේන-පද්මවති 183, රත්නගිරි-රත්නරුචි-රත්නදිවි-මුරුදුවන 184, තිඹිංගල 186; පලාපයෙකැයි 191, සන්දෙස 203

මේ යෙදුම් සසඳා බලමු. වචන සරල ය. කෝමල ය. සුබෝධ ය. වෙන කිසිම ග්‍රන්ථකාරයකු ගිය මඟ නො ගොස් ඒ ඒ තැනට යෝග්‍ය මෙසේ ය යි සුඛාවබෝධය හා ව්‍යවහාරය වඩා ගරු කරමින් වචන රිසි රිසි ලෙස යොදමින් ද මිශ්‍ර වචන හා සංඥා නාම ශ්ලිෂ්ට ලෙස ගළපමින් ද පද්‍ය බන්ධනය කළ බව හස්තාමලකයක් සේ ඔප්පු වේ. මොවුන් වහන්සේගේ ග්‍රන්ථ සුඛාවබෝධය අර්ථ රසය හා මාධුර්‍ය්‍ය අතින් කොතරම් ප්‍රියඞ්කර ද යනු තාත් ග්‍රන්ථ පරිශීලනයට ප්‍රවීණයන් මෙන් ම නවීනයන් ද දක්වන මහදභිලාෂය නො බිඳිය හැකි සාක්ෂ්‍යයෙකි.

**රවීන්ද්‍රනාථ තාගෝර්** මහා කවීන්ගේ හා **බර්නාර්ඩ් ෂෝ** මහා කවීන්ද්‍රයාගේ රචනා ලොව පුරා ප්‍රකටවූයේ කාහටත් සුඛාවබෝධවන අයුරු ව්‍යක්ත ලෙස නො ගැඹුරු සිලිටි බසින් ම සම්පාදනය කොට තිබෙන බැවිනි.

මේ කාව්‍යයෙහි දක්වෙන **පැරකුම්බා නිරිඳු** (27-44) සවන ශ්‍රී පරාක්‍රමබාහු රජු බව ඉතිහාසඥයන්ගේ ඒකමතික පිළිගැන්ම ය. මෙ තුමා කුමාර කාලයෙහි ආගම ධර්මය හා ශබ්ද ශාස්ත්‍රාදිය ප්‍රගුණ කරවා සතුරු බියවුල් ආදියෙන් ආරක්ෂා කොට රාජ්‍යයෙහි පිහිටු වීමට පවා පරම උපකාර ස්වාමියා වූයේ වීදාගම ස්වාමීහු ය. ඒ මේ හංස සන්දේශ කතෘ නො වේ. (පළමුවන) මහ වීදාගම හාමුදුරුවෝ ය. මොවුන් වහන්සේ ගේ කාව්‍ය කරණය අප්‍රකට නිසා ත් වෘද්ධ වයසේ සිට තම ශිෂ්‍ය භාවොපගත නර නායකයන් ගුණ වනමින් සන්දේශය (ග්‍රන්ථය) ක් ග්‍රථිත ය යි සැලකිය නො හැකි හෙයිනුත් මේ සන්දේශය රචනා කරන ලද්දේ කවීන්ද්‍රයකු විශයෙන් පමණක් නොව ධර්මධර විනයධර මහ තෙර කෙනෙකුත් වශයෙන් ද සුප්‍රසිද්ධ කීර්තිමත් වීදාගම හාමුදුරුවෝ ය යි කී කල කවුරුත් දන්නාවූ (දුතිය) **වීදාගම මහා ස්ථවිර ස්වාමීන් විසිනි.**

**ලෝවැඩ සඟරාව:-** මෙය වීදාගම ස්වාමීන් වහන්සේගේ කෘතියක් බව ඉර හඳ මෙන් ම ප්‍රසිද්ධය. එහි

**වෙනත් කෘති** **"වීදගම වෙහෙරෙහි මෙත් තෙරිඳු සඳ"** ය යි සටහන් වී ඇත්තේ මහා නෙත්‍ර ප්‍රාසාද මූල නම් ආයතනයෙහි ආධිපත්‍යය ලැබීමට පෙර ශ්‍රී ඝනානන්ද පිරිවෙන ය යි ප්‍රකට විදාගම විහාරයෙහි වැඩ විසූ සමයෙහි එය කළ හෙයිනි.

ආගම ධර්මය නියායෙන් සච්චරිත්‍ර ධර්ම පූරණයෙන් පවිත්‍ර චෙතස් ඇතිකරන සන්මාර්ග ගාමී ජනකායක් ඇතිකරලීමේ බලවත් සමාජ ව්‍යාපාරයක් හා දයා පරවශ භාවයක් ලෝවැඩ සඟරාව අපට මැනවින් අවබෝධ කරවයි. මෙය **සද්ධම්මෝපායන** නම් පාලි ග්‍රන්ථය ආශ්‍රයෙන් කරන ලද්දකි.

මහා නෙත්‍ර ප්‍රාසාද මූලයෙහි ආධිපත්‍යය ධරන සමයෙහි මෙය සම්පාදිත ය. පොතේ දැක්වෙන **"මෙත්**

**බුදුගුණ අලංකාරය** **මහනෙත් පාමුල මහ තෙරිඳු සඳ"** යනු එයට සාධක ය.

වෙන බොහෝ කවීන් මෙන් ගතානුගතිකව ජාතක කථාවක් තෝරා නො ගෙන බුදු ගුණ අලංකාරයේ කථා ශරීරයට **රතන සූත්‍රය** තෝරා ගන්නා ලද්දේ එහි ගුණානුභාවය ලොවට පෙන්වීමට ම පමණක් නොව බමුණන්ගේ මිථ්‍යා මත හා ඔවුන්ගේ පූජෝපහාරයන්ගේ නිස්සාරත්වය පෙන්වමින් එයට පරිභව කිරීමටත් මහා ජනකාය ලාමක පුද සිරිත්වලින් හා මිථ්‍යා දෘෂ්ටියෙන් මුදවා ගැන්මට ත් ය.

කාව්‍ය ශාස්ත්‍රයාගේ අනාගතාභිවෘද්ධිය අපේක්ෂාවෙන් හා ආධු

**කාව ලකුණු මිණි මල්** නිකානුග්‍රහය පූර්වඞ්ගම කොට ප්‍රණීත මෙය "කාව්‍ය ලක්ෂණ රත්න මාලා" නමින් ද දනිති. මෙහි අවසානයෙහි අනෙක් ග්‍රන්ථවලදී මෙන් නොව ආත්ම වර්ණනයක් කර තිබේ ය යි සමහරු කියති. ධර්ම සාහිත්‍යය ගරු කළ මෙ තුමන්ගේ කෘතීන් හා අදහස් ගති ගුණ පැවැතුම් ගැන යෝනිසොමනසිකාරයෙන් වීමංසනා බුද්ධිය මෙහෙයා බලන විට එකල තමන්ගේ තත්වය ඍජුව නො පැකිළ විදහා පෑ රඟ ප්‍රකාශ වේ. මේ බොරු අහංකාරය හෝ පුහු අභිමානය නොවේ. නිර්භීත පුරුෂ සිංහයන්ගේ ධර්මතා ය.

**වික්‍රමසිංහ අධිකාරම් තුමා** (50) ගැන විශේෂයෙන් වර්ණනා කරන ලද්දේ මෙහි කර්තෘහුගේ ඥාති සම්බන්ධයක්

**පරපුර** ඇති හෙයිනැයි සිතීමට කරුණු පෙනේ. සවන පැරකුම්බා නරනිඳුගේ සහෝදර **මායාදුන්නේ** කුමාරයා පිළිබඳව හෝ පුත්‍රස්ථානයෙහි වැඩුණු **සපුමල් කුමරු, අම්බුළුගල කුමරු** ආදී යමකු ගැන මෙහි සඳහන් නොවීම ද යටකී බන්ධුත්වය සත්‍යය යි සිතාගැන්මට නිදසුනෙකි.

බෞද්ධාගම චක්‍රවර්ති **ශ්‍රී රාමචන්ද්‍ර භාරතී** භූසුරවාදියන් විසින් **වෘත්තමාලාඛ්‍යා**වෙන් වර්ණනා කරනු ලැබුවේ මෙහි සඳහන් වීදාගම ස්වාමිපාදයෝ ය. මහා නෙත්‍ර ප්‍රාසාද මූල ස්ථවිර චරිතය යි එයට තත් කර්තෘවරයා විසින් ම නම් කරනු ලැබුවේ ඒ හෙයිනි. මේ වහන්දූගේ පියාණන්ද **වික්‍රමසිංහ** නාමධෙය උතුමකු බව ද ජයසිංහ ප්‍රතිරාජයන්ගේ දියණියන් වූ **ආභරණවතී** දේවිය මෑණියන්දූ බව ද එහි මෙසේ දැක්වේ.

"සම්බුද්ධ චරණාම්භොජ භ්‍රමරඃ පරවීර හා
අභූද් වික්‍රමසිංහාඛ්‍ය වික්‍රමාර්ජිත සද්යශාඃ

ජම්බුද්‍රෝණි පුරස්ථස්‍ය දත්ත භුක්තානු සම්පදඃ
ශ්‍රීමතඃ ප්‍රතිරාජස්‍ය ජයසිංහස්‍ය පුත්‍රිකාම්

දෙවී මාභරණී සංඥාං සර්වාභරණ භූෂිතාම්
ජනානාහ්ලාද ජනනී මුප යෙමෙ යථා විධි"

කරුණු මෙසේ නමුත් වෘත්තමාලාඛ්‍යාවෙහි ම මෙ තුමා ගල තුරුමූල මහා ස්වාමීන් වෙත දීපඞ්කර නාමයෙන් ප්‍රව්‍රජ්‍යා වූ බව ද ප්‍රකාශ වේ. ප්‍රශ්නයෙකි මෙ තැන. වීදාගම ස්වාමි මෙසේ මහණව සිට දීපඞ්කර යන සංඥා නාමය අත්හැර උපසම්පදා කර්මයේදී මෛත්‍රෙය යන අභිධානය ලබා පසුව මහා නෙත්‍ර ප්‍රාසාද මූලයෙහි අධිපති වී ද? නැතහොත් දීපඞ්කර නමින් පැවිදිව මහා නෙත්‍ර ප්‍රාසාද මූලයෙහි ආධිපත්‍යය ලැබූ අන්‍යතර ස්ථවිර කෙනෙක් වුහු ද යනුයි. විමසත්වා.

වීදාගම පරපුරේ මූලස්ථානය **වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන** ය. **වීදාගම වෙහෙර** ය යි සඳහන් ව ඇත්තේ **නිර්මාණ කාලය**ත් මෙය යි. මෙය පරාක්‍රමබාහු ii (සතර වන පැරකුම්බා නමින් ව්‍යවහෘත) රජු විසින් කරවා චොළීය (දෙශීය) ස්ථවිරයන්ට පූජා කරන ලද්දක් බව ප්‍රසිද්ධ ය.

"සුභෙ විද්දුම ගාමස්මිං රාජගාම පුරන්තිකෙ
වරං සිරි ඝනානන්ද පරිවෙණ සමායුතං

විහාරං කාරයිත්වාන සබොධි පටිමාඝරං
අත්තනො ගරුචොළීය මහා ථෙරස්ස දාපයී"

මහාවංශ 90 පරි: 98, 99.

මේ **වීදාගම විහාරය** හංස සන්දේශ ආදි ග්‍රන්ථ කාරක (ද්විතීය) වීදාගම ස්වාමීන්ද්‍රයන්ට අයිතිවූයේ පරම්පරාගතවය. මේ ස්ථවිරොත්තමයා ශ්‍රී **පරාක්‍රමබාහු vi** රජාණන්ගේ අවසාන භාගයෙහි ත්

**ජයබාහු** රජුගේ සහ **භුවනෛකබාහු** රජුගේ කාලයෙහි ත් පාණ්ඩිත්‍යයෙන් සුප්‍රසිද්ධව ශාසනික කතිකාවත්හි ප්‍රමුඛව වැඩ සිටියේය. ශ්‍රී බු: ව: 2012 (=ක්‍රි: ව: 1469) දී පමණ රාජ්‍ය පදප්‍රාප්ත බුවනෙකබා නරනිඳු දවස රාමඤ්ඤරට **රාමාධිපති** රජතුමා විසින් පුද පඬුරු සහිත තානාපතීන් හා සමග ලක්දිවට එවන ලද භික්ෂූන් වහන්සේ උපසම්පදා කරවීමේ ප්‍රධානත්වය (උපාධ්‍යාය ධුරය) ධරන ලද්දේ මෙකී වීදාගම ස්වාමිපාදයන් බවට **කල්‍යාණී ප්‍රකරණය** සාක්ෂ්‍යය කියයි.

මෙ කල තොටගමුවේ ෂඩ්භාෂා පරමේශ්වර **ශ්‍රී රාහුල සඞ්ඝ රාජයන්** ධරමාන නමුදු ඔවුන්වහන්සේ මේ ආගමික මහොත්සව යෙහි පුරෝගාමි නො වූයේ භුවනෛකබාහු **නරනාථයා**ගේ **යම් කිසි** අසන්තොෂයක් නිසා විය හැක. තොටගමුවේ ස්වාමීන්ට මා හිමි පදවි ලාභය වූයේ **වනරත්න සංඝරාජයන්**ගේ ඇවෑමෙනි. මේ කරුණුවලින් අවබොධ විය යුත්තේ වීදාගම ස්වාමීන් තොටගමුවේ ස්වාමීන්ට මඳක් වයසින් බාලවූ සමකාලික උතුමකු බව යි. හංස සන්දෙශයෙහි තොටගමුවේ හිමියන් ගැන සඳහන් නුවූයේ ඒ නිසාත් වනරතන සඟරජ වැඩ සිටි සමය නිසා ත් ය යි කල්පනා කළ හැක. එසේ හෙයින් හංස සන්දෙශය රචනා කළේ සවන පැරකුම්බා සමයෙහිය.

*පැරකුම්බා රජුගේ රාජ්‍යාදය බුදුවසින් 1953 යයි **සද්ධර්ම රත්නාකරය** සහ **මහාවංශය** දක්වයි. **පඤ්චිකා ප්‍රදීප**යෙහි සඳහන් වන්නේ 1955 බවයි. **කාව්‍යශෙඛර**යේ ත් **පැපිලියාණේ සෙල් ලිපි**යේ ත් දැක්වෙන වර්ෂය 1958 යි.† මේ නරවීරයන්ගේ

---

* ශ්‍රී පරාක්‍රමබාහු රජාණන් රාජ්‍යශ්‍රියට පැමිණි කාලය පිළිගත යුතු ලිපිවල එකිනෙකට මඳක් වෙනස්ව දක්වා තිබේ. තොටගමුවේ ශ්‍රී රාහුල මහ සාමින් විසින් සම්පාදනය කරන ලද පංචිකාප්‍රදීපයෙහි මේ රජ බුධ වර්‍ෂ එක්දහස් නවසිය පස්පනස් වන්නෙහි (ක්‍රි. ව. 1412) රාජ්‍යශ්‍රීයට පැමිණියේය යි කියා තිබේ. නුමුත් එම සාමින් විසින් ම කරන ලද කාව්‍යශෙඛරයෙහි ද මෙම රජු විසින් පැපිලියානේ සුනෙත්‍රා මහදේවි පිරුවන්හි පිහිටුවන ලද ශිලා ලෙඛනයෙහි ද බුධ වර්ෂ 1958 (ක්‍රි. ව. 1415) මේ රජාණන් රජ තන්පත්වූ වර්ෂය කොට දක්වා තිබේ. මේ වර්‍ෂ දෙක ම පිළිගත යුතු වූ ලිපිවල සඳහන්වන බැවින් වීරබාහු රජු කාලක්‍රියා කළ පසු රාජ්‍යය සඳහා වියවුල් හටගත් බවද පරාක්‍රමබාහු රජ සතුරන් පරාජය කොට ක්‍රි. ව. 1415 දී අභිෂෙක ලැබූ බවද කල්පනා කළ හැකිය. කිසි විටෙක වීරබාහු රජු කාලක්‍රියාකළ වර්ෂය පටන් ද කිසිවිටෙක අභිෂෙකය ලැබූ වර්ෂය පටන් ද රාජ්‍ය වර්ෂය ගණන් ගැනීමෙන් මේ ප්‍රභෙදය හටගත් බව සිතිය යුතුය. (සයිමොන් ද සිල්වා වාසල මුදලිඳුගේ ලංකා කථාව).

† **ශණ්ඨා සිංහ සන්නය** 1950 බව කියයි.

රාජ්‍යානුශාසනා කාලය පස් පණස් හවුරුද්දකි‡; එවිට මෙහි සඳහන් වූ පරිදි 2008 හෝ 2010 හෝ 2013 හෝ මේ රජුගේ අවසාන වර්ෂය බව පෙනේ. **කාව් ලකුණු මිණ්මල්** රජ පැමිණි 54 වැන්නෙහි කරන ලදී. යථෝක්ත ත්‍රිවිධාකාර වර්ෂ ප්‍රමාණානුසාරීව බලන විට එය කළේ 2007, 2009, 2012 යන මින් එක් වර්ෂයක බව නිශ්චය වේ. බුවනෙකබා රජුගේ තුන් වැන්නෙහි—එනම් බුද්ධ වර්ෂ 2015 දී **බුදුගුණ අලංකාරය** විහිත බවට ඒ පොත ම නිදර්ශන දෙයි. **ලෝවැඩ සඟරාව** මෙ තුමාගේ පළමු වන කෘතිය බව අවිවාදයෙන් පිළිගනු ලැබේ. එවිට ඊළඟ කෘතිය **හංස සන්දේශය** බව ඉර හඳ සේ දිසේ. තුන් වන කෘතිය **කාව් ලකුණු මිණ් මල්** නමි. අවසාන නිබන්ධය **බුදුගුණ අලඞ්කාරය** වේ.

ශ්‍රී පරාක්‍රමබාහු රජු සමයෙහි හංස සන්දේශය ආදි ග්‍රන්‍ථ නිෂ්පාදනය කළ **වීදාගම ශ්‍රී ඝනානන්ද පරිවෙණාධිපති මෛත්‍රෙය** මහා **ස්ථවිරයන්** පමණක් නොව **කෑරගල පද්මවතී පරිවෙණාධිපති වනරතන සඞ්ඝරාජ, පැපිළියාණේ සුනෙත්‍රා දෙවී පරිවෙණාධිපති මඞ්ගල සඞ්ඝරාජ, තොටගමුවේ විජයබාහු පරිවෙණාධිපති ශ්‍රී රාහුල සඞ්ඝරාජ** යන මාහිමිවරුන්ගෙන් ද; **දෙව්නුවර තිලක පරිවෙණාධිපති ඉරුගල්කුල** මහා ස්ථවිර සහ **විමලකීර්ති, වෑත්තෑවේ, රණස්ගල්ලේ** යන මහා ස්ථවිරවරයන්ගෙන් ද; **රාමචන්ද්‍ර භාරතී, නන්නූරු තුනයා** යන විද්වද්වරයන් ගෙන් ද ලඞ්කාව ධර්මශාස්ත්‍රාලෝකයෙන් එකාලොක විය.

අපගේ සංස්කරණයෙහි ආයේ කව් 203 ය. මෙහි 14 වන කව ශ්‍රී ධර්මාරාම සංස්කරණයෙහි නො ආයේය.

**කාව්‍ය ප්‍රමාණය.** කර්තෘ සන්දර්ශන පද්‍යත්‍රයයෙන් එහි ඇත්තේ අවසාන කව පමණකි. එහි කාව්‍ය ප්‍රමාණය 201 කි. 14 වන කවත් කර්තෘ හැඳින්වෙන 201, 202 කව් දෙකත් එහි ඌනය. ඒ නිසා මේ පොතෙහි කව් (201+3) 204 ක් විය යුතු බව පෙනේ. ශ්‍රී ධර්මාරාම සංස්කරණයෙහි එක ම ගද්‍ය පාඨයකට පමණක් අඞ්කයක් දී අනෙක් ගද්‍ය පාඨයන් අඞ්කයන්ගෙන් බැහැර කොට තිබේ. අපි ඒ ගද්‍ය පාඨයට පමණක් නොව අනෙක් ගද්‍ය පාඨයනට ද අඞ්ක නො ලීමු. එහෙයින් අපගේ සංස්කරණයෙහි **කාව්‍ය ප්‍රමාණය 203** ක් වූයේ.

---

‡ දෙ පණස් වසක් බව මේ පොතේ 26 පිටේ 16 වන පෙළෙහි ද, 27 පිටේ 2 වන පෙළෙහි ද සඳහන් වී ඇත.

මහාවංශයෙහි ද තවත් සමහර පත් පොත්වල ද ඒ එසේමය. කාව් ලකුණු මිණිමල් රජ පැමිණි පණස් සිවු (=54) වන්නෙහි කළ බව ඒ පොතේ ම සඳහන් වේ. රාජ්‍ය කාලය වර්ෂ 52 හෝ වන බවට එය සාක්‍ෂ්‍යයකි. 55 ක් බව පණ්ඩිත සම්මත වූයේ මේ හෙතුවෙනි.

**ප්‍රයෝජන**

අන්‍ය සිංහල සන්දේශ කර්තෘන් මෙන් හුදෙක් දෙවියන් යැදීම මොවුන්වහන්සේ රිසි නො කළහ. පරිත්‍රාණ (=පිරිත්) දේශනාවෙන් සෙත් වඩා දෙවියන්ට පින් දී "තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා" යනා දීන් දැක්වුණු නියායෙන් යාච්ඤා කරන ලෙස වනරතන මාහිමියන්ට ආයාචනය කළෝය.

මොවුන් වහන්සේ සියලු තන්හි ම ආගම ධර්මයට හද පත්ලෙන් ම—සැබෑ ගෞරවයෙන් ම ප්‍රමුඛ ස්ථානය දුන්සේක. මේ සන්දේශ කාව්‍යය ද එයට නිදසුනෙකි. වෙන සන්දේශ කාරකයන් හා හංස සන්දේශ කර්තෘවරයාගේ අසමානත්වයක් මින් අනාවරණය වේ.

වාග් රසයෙන් ද, රචනා මාධුර්යයෙන් ද, සන්ධි ශුද්ධියෙන් ද, ශිෂ්ට ප්‍රයෝගයන්ගෙන් ද, නා නා වර්ණනයන්ගෙන් ද, ශෘංගාර බන්ධනයන්ගෙන් ද, නානාවිධ වෘත්තයන්ගෙන් ද, ස්වයංකෘත උපමා උපමේයයන්ගෙන් ද සාලංකෘත මේ පද්‍ය ග්‍රන්ථය තත් කාලීන ඉතිහාසය – කර්තෘගේ පද යෙදුම් – කාව්‍ය කරණ නීති රීති යනාදිය දැනගැන්මට ප්‍රයෝජන වේ. කියවන්නාගේ මන දොළ පිරීමට වුවමනා අංගෝපාංගයන්ගෙන් මෙහි ඌනත්වයක් නැත්තේය. අනුන් ගිය මඟ ම නො ගොස් ගතානුගතිකත්වයෙන් තොරව විමංසන බුද්ධිය මෙහෙයා **සාහිත්‍ය රස විඳීමට** මේ පොත බෙහෙවින් විහල් වේ.

**වර්ණනා සහිත හංස සන්දේශය**

මේ අපගේ සංස්කරණය **වර්ණනා සහිත හංස සන්දේශය** නමින් හැඳින් වේ. දැනට මුද්‍රිතව පවත්නා හංස සන්දේශය පාණ්ඩිත්‍යයෙන් සුප්‍රසිද්ධව වැඩ විසූ අති ගෞරවාර්හ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සංස්කරණයකි. එය ප්‍රයෝජනවත් පදාර්ථ සන්නයකි. හංස සන්දේශ විවරණය නමින් මුද්‍රිත හංස සන්දේශ කාණ්ඩය සමාස විග්‍රහ ආදිය ප්‍රමුඛ කොට වියරණ විදී දැක්වීමට කරන ලද්දකි.

මේ පොත වනාහි පෙල, අන්වය සහ ඉතිහාස – පරිකථා – ව්‍යාකරණ – ඡේක ප්‍රයෝගාදි විස්තර ඇතුළත් සංලක්ෂ්‍යයන්ගෙන් පරිපූර්ණය. අවසාන භාගයෙහි පදාර්ථ ව්‍යාඛ්‍යා අන්තර්ගතය.

පදාර්ථ ව්‍යාඛ්‍යා—පදගත සන්න කීමෙන් උගන්නවුන්ගේ චින්තන ශක්තිය මොටවන බව සමහර උගතුන්ගේ කල්පනාවකි. ශත වර්ෂාධික කාලයකින් ඔබ්බෙහි විසූ ග්‍රන්ථකාරයාගේ වචනත් – ඒ වචන තේරුම්කර දෙන ගාඨවූ හෝ නුවූ වචනත් – මෙකල ව්‍යවහාරයන් හා සසඳා, අතීත වර්තමාන සමානත්වය හෝ අසමානත්වය වටහා ගැන්මට පදාර්ථ ව්‍යාඛ්‍යා බෙහෙවින් ප්‍රයෝජනය. විභක්ති,

ආඛ්‍යාත, විශෙෂණ විශෙෂ්‍ය, උපමා උපමෙය, සමාසාදිය නිර්ණය කර ගැන්මටත් ශබ්ද කොෂය තර කර ගැන්මටත් පදගත සන්‍ය යෙන් ලැබෙන උපකාර ඉ බොහෝ යි

පද්‍යය කියවා බැලූ විගස ම ඒ ගැන මොහොතකුදු කල්පනා නො කර සන්නය කියවා බැලීම නම් විඥාන ශක්තිය මොට කර ගැන්මක් බව සැබවකි. පද්‍යය කියවා බලා එහි රස විඳීමට උත්සාහ කර නො තේරෙන – අනුමාන – ගැටළු තැන් ව්‍යාඛ්‍යාන යෙන් බලා සැක දුරු කොට රස විඳීම ප්‍රාඥ ගොචරය. මේ ධර් යත් ගරු කොට අපි පදාර්ථ ව්‍යාඛ්‍යා පොතේ අගට යා කළෙමු.

මේ ග්‍රන්ථය සම්පාදනයේ දී සංශය ස්ථාන නිරාකරණය කර දීම්
ආදියෙන් සංග්‍රහ කළ අපගේ පූජ්‍යාචාර්ය වූ
**ආචාර්ය ප්‍රශස්ති තංගල්ලේ ගෞතම විද්‍යාලයාධිපති අති**
**ගෞරවාර්හ පණ්ඩිතාචාර්ය වැලිපටන්විල**
**ශ්‍රී දීපංකර මහාස්ථවිර** ස්වාමීන්ද්‍රයන්වහන්සේ ප්‍රචුරාදරාවනත භක්තියෙන් කෘතඥ කෘතවෙදීව මතක්කරම්හ.

ගුරුවරයකුවීමේ භාග්‍යය අත් කර දුන් අපගේ කාරුණ්‍යවන්ත ගුරුතුමා වූ රජයේ සෙවයෙන් විශ්‍රාම ලත් **මාතර කැකනදුරේ විජය ගිරි නිවස** වැසි **ඩී. ඩී. පලිහක්කාර මහත්මයා** ද මතක් කරන්නේ මහත් ගෞරව සතුතියෙනි.

කෝට්ටගොඩ **සෞගතොදය විද්‍යාලයාචාර්ය රාජකීය පණ්ඩිත**
**ගෞරවාර්හ කහඳමුවදෙර චන්ද්‍රකීර්ති ශ්‍රී**
**අපගේ සතුතිය. පියරතන ස්ථවිර** ස්වාමිපාදයන් හා සමග මෙහි
වූ සමහර කාරුණු ගැන සාකච්ඡා කිරීමෙන් වූ
ලාභය ප්‍රශංසාර්හය. එහෙයින් අපගේ ගෞරවාදර සතුතිය මොවුන් වහන්සේට පිරිණැමෙන්නේ.

පැරණි පිටපත් සපයා දීමෙන් හා වෙනත් අයුරින් මේ සාහිත්‍ය සංග්‍රහය සඳහා උපකාරිවූ හිතාර්ථීන්ටත් අත් පිටපත මුද්‍රණයට යොග්‍ය සේ ලියා දීමෙන් සහාය වූ මිතුරනට හා ශිෂ්‍ය යනටත් අපගේ හිතවත් පැසසුම් අයිතිය.

මෙහි මුද්‍රණ කටයුතු ශොභන ලෙස කිරීම ගැන **කොළඹ ග්‍රන්ථප්‍රකාශ මුද්‍රණාගාරයේ** කෘත්‍යාධිකාරී මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට ද අපි ඉත සිතින් තුති පුදමු.

මේ කෘතිය සර්වතොභද්‍ර නොවේ. දොෂ ස්ථාන ඇති විය හැක.
**වචනයක්.** එබන්දෙහි සත්පුරුෂ සුධීවරයන්ගේ
සමාධිය අපෙක්ෂා කරම්හ.

**පී. ඩී. ඇස්. වීරසූරිය**

1936 ජනවාරි
“ප්‍රියවාස”
ගන්දර.

# පටුන.


| | | | |
|---|---|---|---|
| සංඥාපනය | ... | ... | iii–xii |
| මාතෘකා. | | | |
| ආරම්භය ... | කාව්‍ය අඞ්ක | ... | 1 |
| දූත වර්ණනා ... | .... | ... | 2–5 |
| අදහස ... | ... | ... | 6–7 |
| කාව්‍යනායක වර්ණනා | ... | ... | 8–10 |
| ජයවර්ධනපුර වර්ණනා | ... | ... | 11–26 |
| රාජ වර්ණනා ... | ... | ... | 27–44 |
| සවත් සුරිඳු මැඳුර | ... | ... | 45 |
| දළඳා මැඳුර ... | ... | ... | 46 |
| රාජ සභාව ... | ... | ... | 47–61 |
| ගමනාරම්භය ... | ... | ... | 62 |
| මාර්ග වර්ණනා i | .. | ... | 63–76 |
| කැලණිගඟ වැනුම් | ... | ... | 77–79 |
| ජල ක්‍රීඩා ... | ... | ... | 80–91 |
| මාර්ග වර්ණනා ii | ... | ... | 92–94 |
| සන්ධ්‍යා වර්ණනා | ... | ... | 95–103 |
| විබිසණ සුර මැඳුර | ... | ... | 104–106 |
| නළඟනන්ගේ රැඟුම් | ... | ... | 107–111 |
| විබිසණ යැදුම | ... | ... | 112–114 |
| උදය වර්ණනා ... | ... | ... | 115–118 |
| මාර්ග වර්ණනා iii | ... | ... | 119–124 |
| වන වර්ණනාවක් | ... | ... | 125–148 |
| මාර්ග වර්ණනා iv | ... | ... | 149–153 |
| කැරගල වර්ණනා | ... | ... | 154–169 |
| පද්මවතී පිරුවන | ... | ... | 170–182 |
| සඞ්ඝරාජ වර්ණනා | ... | ... | 183–197 |
| සන්දේශය ... | ... | ... | 198–199 |
| දූතාශංසනය ... | ... | ... | 200 |
| කර්තෘ නාම සන්දර්ශනය | ... | ... | 201–203 |
| පදාර්ථ ව්‍යාඛ්‍යා ... | ... | පිටු | 103–156 |

"එවං නින්දා පසංසාසු
න සමිඤ්ජන්ති පණ්ඩිතා"

වර්ණනා

සහිත

# හංස සන්දේශය.

---

පෙළ

අන්වය

සංලක්ෂණ

ඉ

# වර්ණනා සහිත

# හංස සන්දේශය

**1. සැරද හස රද[1] සඳ-පුන් සඳ පහන් පිරිසුදු**
**පියකරු පියන් පිය පිරි-පියයුරු සිරින්[2] හොබනා**

ශ්‍රී ලඞ්කාධීශ්වර ජයවර්ධන පුරවරාධිවාසී ශ්‍රී **සඞ්ඝබොධි ශ්‍රී පරාක්‍රමබාහු** මහා රජයන්ගේ රාජ්‍ය පරිපාලනය නිරුපද්‍රැතව චිරස්ථායී වනු සඳහා "සම්බුද්ධභාෂිත පරිත්‍රාණ ධර්මය මෛත්‍රී පූර්වඞ්ගමව ගණ සජ්ඣායනය කිරීමෙන් සෙත් සලසා වදාළ මැනව"යි කැරගල පදුමවති පරිවෙණාධිවාසී සකල ලඞ්කා ශාසනාලඞ්කාර ශ්‍රී **රාජගුරු වනරත්න සඞ්ඝරාජ** මාහිමියන් වහන්සේට යාචඤා මුඛයෙන්

"පවිත්‍රෙෂු ප්‍රායො විරචයසි තොයෙෂු වසතිං
ප්‍රමොදං නාලීකෙ වහසි විශදාත්මා ස්වයමසි
අතො'හං දුඃඛාර්තා ශරණමබලා ත්වාං ගතවතී
න භික්ෂා සත්පාත්‍රෙ ව්‍රජති හි කදාචිද්විඵලතාම්"

යනාදින් හංස දූත කාව්‍යයෙහිදු මහා කවි වර්ණිතවූ හංසරාජ පක්ෂියකු දූත කාර්යයෙහි යොදන අයුරින් ශාස්ත්‍රොක්ත දූත කාව්‍ය ලක්ෂණ යුක්ත ස්වභාෂා කාව්‍ය සන්දෙශයක් විධිත්සුවූ විද්වද්වර වරෙණ්‍ය ප්‍රවරොදාර කීර්ති මූර්ති විච්ඡුරිත **විදාගම මහානෙත්‍ර ප්‍රාසාදමූල මෛත්‍රෙය** මහා ස්වාමිපාදයෝ "ආශීර්නමස් ක්‍රියා වස්තු නිර්දෙශො වාපි තන්මුඛම්" යි පඨිත ආශීස්නමස්ක්‍රියා-වස්තු නිර්දෙශ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ කාව්‍ය මුඛය අතුරෙන් ආශීර්මුඛයෙන් කාව්‍යාරම්භය කරන සේක් ස්වාභිමත කාර්ය සාධන තත්පරවූ හංස පක්ෂීන්ද්‍රයාට නිරුපද්‍රැතතාපෙක්ෂකව "සැරද හස රද සඳ" යනාදී යහගිය උපන්‍යාස කළහ.

**අන්වය:**-පුන්සඳ පිරිසුදු පහන් පියකරු පියන් පියපිරි පියයුරු සිරින් හොබනා හස රද සඳ (තෝ) සැරද.

**සංලක්ෂ්‍ය:-සැරද**-යනු ආශීර්වාදගර්භ විධික්‍රියා මධ්‍යම පුරුෂෛක වචනයි. මෙය චිරකාලාර්ථ වාචක මාගධ 'චිර' යන නිපාත පද

1 රදහස  2 ලෙසින්

යෙන් තදඟවවූ 'සර' යනු පූර්‍වකොට ඇති පණ්‍ණ දැරීමෙහි 'දුව' ධාතුහු කෙරෙන් විධික්‍රියා 'අ' ප්‍රත්‍යය කොට ධාත්‍වන්ත වකාර ලොපය හා පූර්‍වස්වර ලොපයද පිළිපෙරැළිද කිරීමෙන් සිද්ධයි.

පුන්සඳ පිරිසුදු පහන්–හොබනා, හස රද සඳ යන්නට තුල්‍යාධි කරණ විශෙෂණයි.

හසයන්ගේ රද හසරද, හසරද සඳ වැනියේ හසරද සඳ! (අලප්). පුන්වූසඳ පුන්සඳ, පුන්සඳ වත් පිරිසුදු පහන් ඇතියේ පුන්සඳ පහන් පිරිසුදු (පද පෙරැළි–අලප් වෙසෙසුන්). පියකරනු වෝ පියකරුහු, පියකරුවූ පියහු පියකරුපියහු. ඔවුන්ගේ (සබඳ) පිරිවූද එම පියයුරුද පිරිපියයුරු, පියවූද එම පිරි පියයුරුද පිය පිරි පියයුරු. ඔවුන්ගේ පියපිරි පියයුරු සිරි. එසින් (කරණ) හොබනේ හොබනා. (අලප් වෙසෙසුන්) මේ මෙහි පදවිග්‍රහයි.

හසරද සඳ! (තෝ) සැරද. (කෙසේවූ හසරද සඳ ද?) පුන්සඳ පිරිසුදු පහන් හසරද සඳ! (තෝ) සැරද. (යලිත් කෙසේවූ හසරද සඳ ද?) හොබනා හසරද සඳ! (තෝ) සැරද. (කුමකින් හොබනා හසරද සඳ ද?) පියපිරි පියයුරු සිරින් හොබනා හසරද සඳ! (තෝ) සැරද. (කවරකුන්ගේ) පිය පිරි පියයුරු සිරින් හොබනා හසරද සඳ ද? පියකරු පියන් පිය පිරි පියයුරු සිරින් හොබනා හසරද සඳ! (තෝ) සැරද යනු මෙහි චොදනා පරිහාර යි.

මේ පද්‍යයෙහි ප්‍රථමපාදය මාත්‍රා නවයකින්ද, ද්විතීය–තෘතීය–චතුර්‍ථ පාදත්‍රය මාත්‍රා එකොළොසින් එකොළොසින්දැයි දෙසාළිස් මාත්‍රාවෙකින් බඳනා ලද හෙයින් මෙය 'යහගි' නම් වෘත්තයයි.

"නවෙණකොළොස් වියමැ–එකොළොස් බැවින් සෙසමෙහි
දුහු බගලින් බඳනුයේ–යහ ගීය මේ නිදසුන්"

සදැස් ලකුණ

දෛත්‍යකාඩියෙහි ප්‍රෙෂ්‍යවූ දූත දූතීන් වනාහි ශාස්ත්‍රොක්ත දූත ගුණ යුක්තවූවන් වියයුතු බැව් කියා තිබේ. ඒ මෙසේය :

"මෙධාවී–වාක්පටුඃ–ප්‍රාඥඃ–පරචිත්තොප ලක්‍ෂකඃ
ධීරො–යථොක්ත වාදීච එෂ දූතො විධීයතෙ"

ප්‍රස්තාවට යොග්‍යවූ කාරණාකාරණයන් වැටහෙන බුද්ධියද, කථායෙහි දක්‍ෂතාවද, ප්‍රඥාවද, මෙරමාගේ අදහස් උදහස් දැනීමද, ධීර ගුණයද, අවිගෙන දිවි නස්නාලෙස සිටි විටත් අන්‍ය ප්‍රකාරයක් නොකියා සත්‍යාර්‍ථයම ප්‍රකාශ කිරීම ද යන ගුණයන්ගෙන් යුක්ත වූවකු දූතයා කරන්නේය යනු මෙහි භාවය යි. මේ දූත ගුණයි. ඒ මේ දූත දූතීහු නිසෘෂ්ටාර්‍ථය–මිතාර්‍ථය–සන්දෙශහාරකය යි ත්‍රි ප්‍රකාර බැව් ශ්‍රී විශ්වනාථ කවිවරයන් විසින් පඨිතයි.

"නිසෘෂ්ටාර්ථො මිතාර්ථශ්ච තථා සන්දෙශහාරකඃ
කාර්‍යප්‍රෙෂ්‍ය ස්ත්‍රිධාදූතො දූතස්‍යචා'පි තථාවිධාඃ
උභයොර්භාව මුන්නීය ස්වයං වදති චොත්තරම්
සුශලිෂ්ටං කුරුතෙ කාර්‍යං නිසෘෂ්ටාර්ථස්තු සස්මෘතඃ
මිතාර්ථභාෂී කාර්‍යස්‍ය සිද්ධිකාරී මිතාර්ථකඃ
යාවද්භාෂිත සන්දෙශ හාරඃ සන්දෙශ හාරකඃ"

යමෙක් තෙම අදහස් දෙන්නාය ලැබිය යුත්තාය යන දෙදෙනාගේ ආශය තමා සිත තබාගෙන අවිරුද්ධ වනසේ උතුරු පිළිතුරු දෙන්නේ ද කාර්‍යයත් මනාසේ සිද්ධකරන්නේ ද මේ දූත තෙම 'නිසෘෂ්ටාර්ථ' නමි. යමෙක් තෙම මිතාර්ථභාෂීවේද හෙවත් ඉතා ලුහුඬින් බස් ප්‍රකාශ කරන්නේ ද මේ දූත තෙම 'මිතාර්ථභාෂි' නමි. යමෙක් ගලපා දුන් සන්දෙශය ගෙන ගොස් දීම පමණක් කරන්නේ වේද මේ දූත තෙම 'සන්දෙශ හාරක' නමි.

මෙසේ දූතයාහට මඞ්ගලාශීර්වාද කොට තදනන්තරව දූතයාගේ ප්‍රශස්තතර මිත්‍රභාවය හා වික්‍රමාතිශයද ස්වාභිෂ්ටකාර්‍ය නිෂ්පාදනයෙහි විද්‍යමාන සාමර්ථ්‍යයද ප්‍රකාශ කටැටිවූවෝ **'තොප තෙපලකින්'** යනාදි සැහැල්ල කියත්.

## <u>දූත වර්ණනා.</u>

2. තොප තෙපලකින් සැප-සැපයෙයි ලොවට හසරද[1]

| | | |
|---|---|---|
| තොප | තුඩ තුලම කිරිරස දිය හැර ව | දිය |
| තොප | පිට පිහිට කර බඹ තෙදිය ඇවි | දිය |

තොප රුව ලත් හසන්-සත් සැප සැපත් කර දේ[2]

| | | |
|---|---|---|
| තොප | උන් වැඹට පිටදි විදි සැර ස | තර |
| තොප | ගෙන එති ගෙන දිව බිම හෙන අ | තර |
| තොප | නම ඉදිරි කල නමටත් උතුමයෙ | තී |
| තොප | කුල පැමිණ[3] මහසත්හුද හිරු දින | තී |
| තොප | සැපි රැගෙන සිපිතැනමත් කෙරෙති රු | තී |
| තොප | වෙත මිතුර! ඉන් අප සිත වැඩෙසි බැ | තී |

**අන්වය:**–හසරද! තොප තෙපලකින් ලොවට සැප සැපයෙයි (යළිත්) තොප තුඩතුලට කිරිරස දියහැර වදිය (එසේම) තොප පිට පිහිටකර බඹ තෙදිය ඇවිදිය (නැවතද) තොප රුවලත් හසත් සත් සැප සැපත් කරදේ (යළිදු) තොප උන් වැඹට පිටදී විදි සැර සතර බිම ගෙන අතර

---

1 සැප සැපයෙයි ලොවට-තොප තෙපලකින් හසරද
2 සත් සැපත රැක සැප දේ  3 රැගෙන

තොප දිවගෙන එති යෙත (නැවතද) තොප නම ඉදිරිකළ නමටත් උතුමයෙති (එසේම) තොප කුල පැමිණි මහසත්හුද හිරු දිනති (නැවතද) තොප සැපි රැගෙන සිපිනැතටත් රුති කෙරෙති මිතුර ඉන් අපසිත බැති තොප වෙත වැඩෙයි.

**සංලක්ෂ්‍ය :-** **'දිනති'**– අතීතාර්ථයෙහි වර්තමාන ක්‍රියායි. (ක්‍රියාවිපර්යාසයි.)

**"තොප තුඩතුලට කිරිරස දියහැර වදිය"**

කිරි හා දිය මිශ්‍රකොට දුන් කල්හි ක්ෂීරරසය ජලයෙන් වෙන්කොට පානය කිරීමේ ශක්තිය හංස රාජයාටම විද්‍යමාන බැව් ලෝකසම්මතය. ඒ බැව් මෙසේ කීහු.

"අනෙක ශාස්ත්‍රං බහු වෙදිතව්‍ය
මල්පශ්ච කාලො බහවශ්ච විඝ්නාඃ
යත්සාරභූතං තදුපාසිතව්‍යං
හංසෛඊර්ථාක්ෂීර මිවාම්බු මධ්‍යාත්"

**"තොප පිට පිහිට කර බඹ නෙදිය ඇවි දිය"**

බ්‍රහ්මරාජයාගේ වාහනය හංසරාජයා බැව්ද ඒ වාහනයෙන් ලෝකයෙහි කාර්‍යාකාර්‍ය විචාරය පිණිස සඤ්චාරය කරනබවද ජගත් ප්‍රසිද්ධය. **නෛෂධ චරිත** මහාකාව්‍යයෙහිදු මේ පැණේ.

"විධෙඃකදාචිද්භ්‍රමණී විලාසෙ-ශ්‍රමාතුරෙභ්‍යඃ ස්වමහත්තරෙභ්‍යඃ,
සකන්ධස්‍ය විශ්‍රාන්තිමදාං තදාදි-ශ්‍රාම්‍යම්භිනා විශ්‍රමවිශ්වගො'පි"යි.

**තොප උන් මැඹට පිටදි විදි සැර සත ර**
**තොප ගෙන එති යෙක දිව බිම හෙන අත ර**
**තොප කුල පැමිණ් මහසත්හුද හිරු දින ති**

මෙයින් ප්‍රකාශිත ප්‍රවෘත්ති තොමෝ මෙසේ සංක්ෂේපයෙන් දතයුත්තිය.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරනකල්හි පුරණලද බෝධිසම්භාර ඇති අපමහා බෝධි සත්ත්වයෝ ජවනහංස යෝනියෙහි ඉපිද අනූදහසක් හංසයන් විසින් පිරිවරන ලදුව චිත්‍රකූට පර්වතයෙහි වසමින් ජම්බුද්වීපයෙහි විල්වල හටගත් ස්වයංජාතහැල් අනුභවකරමින් රැකෙත්නාහ. එසේ යාමෙන් බරණැස් රජු හා සමග බෝධිසත්ත්වයන්ගේ මිත්‍රධර්මයක් ඇතිවීමෙන් නිතර නිතර සමුබව ඔවුනොවුන්ගේ ප්‍රේමයද වැඩිගියේය. එකල්හි බෝධිසත්ත්වයන්වහන්සේගේ මල්වූ හංසපොතක දෙදෙනෙක් හිරු හා සමග දිවීමට මන්ත්‍රණයකොට එපවත් බෝධිසත්ත්වයන්වහන්සේට දන්වූවිට බෝධිසත්ත්වයෝ

අවවාදකොට එය වැලැක්වූහ. දෙවන තෙවන වරත් ඒ අදහස
දැන්වූ කල්හිත් වැලැක්වූහ. ඒ හංස පොතකයෝ දෙදෙන තමන්
ශක්තිමත් හෙයින් හිරු හා සමග දුවනුකැමැත්තෝම බෝධි
සත්ත්වයන්වහන්සේට නොකියා ඉරඋදාවට පළමුකොට යුගන්ධර
පර්වතයෙහි ගොස් සිටගත්හ. මහාබෝධිසත්ත්වයෝ එපවත් අසා
ඔවුන්කෙරෙහි දයා උපදවා "උන්ට ජීවිතදානය කෙරෙමි" සිතා
ගොසින් යුගන්ධර මුදුනෙහිම සිටගත්හ. ඉක්බිත්තෙන් හිරු නගින
කල්හි එම හංස පෝතකයන් දෙදෙන හා බෝධිසත්ත්වයෝද
ආකාශයට පැනනැඟී ඉරු හා සමග දිවන්ට පටන්ගත්හ. ඔවුන්
අතුරෙන් බාල මලණුවෝ පෙරවරුවෙන් භාගයක් දිව අපොහො
සත්ව පියාසන්ධිවල ගිනි නැගෙන කලක් මෙන් වූවිට භයපත්ව
බෝධිසත්ත්වයන්වහන්සේට කියනුවෝ 'බෑනන්වහන්ස! දිවගත
නොහෙමි' සි කීහ. එවිට බෝසතාණෝ "මල, තෝ භය නො
වුව, තට මම ජීවිතය දෙමි" කියා මැදිරියෙක ලාගෙන අස්වැසු
වාසේ සනසා චිත්‍රකූටපර්වතයටම ගෙනගොස් හංසයන් මධ්‍යයෙහි
සිටුවා නැවත ගොස් දෙවන මලණුවන් හා සමග දිවූහ. ඒ
මලණුවෝත් මධ්‍යහනවේලාව දක්වා හිරු හා සමග දිවන්ට
අශක්තවූවෝය. පක්ෂ සන්ධිවල ගිනිඇවිල ගත්තාක් මෙන් දැහ
හටගත්තේය. එවිට බෝධිසත්ත්වයන්ට කියන්නෝ "බෑනන්
වහන්ස! දිවගතනොහෙමි මා රැකගනුව" සි කීහ. බෝධිසත්ත්ව
යෝ ඔවුන් සනසා පෙරසේම චිත්‍රකූටපර්වතයට ගෙන ගොස් තබා
ගියහ. එවිට ඉරු මුදුනට පැමිණියේය. ඉක්බිත්තෙන් මහ
බෝසතාණෝ අද මාගේ ශරිරබලය පරීක්ෂා කරමි සිතා එක
වෙගයෙන් ඉරුකරාද පැමිණ වරෙක හිරුට පෙරාතුව දිව වරෙක
හිරුට පසුව දිව සිතන්නාහු ඉරු හා සමග දිවීම ව්‍යර්ථ වන්නේය.
එය නුවණින් උපදවාගත් ජවයෙක් වන්නේය. මේ ජවයෙන්
ප්‍රයොජන කිමිද? බරණැස් නුවරට ගොස් මාගේ යහලු රජ්ජුරු
වන් හා සමග ප්‍රීතිමත්වෙමි'සි එහි ගියෝය. එවිට එම රජු විසින්
පුදනලද බෝධිසත්ත්වයෝද යට දැක්වූ සියලු තොරතුරු රජහට
දැන්වූහ. මහරජ්ජුරුවෝද ඒ ප්‍රවෘත්තිය අසා අති විස්මයට පැමිණ
"හිරු හා සමග දිවපු වෙගය මටද පෙන්වුව මැනව"සි කීහ.
එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "මහරජ්ජුරුවෙනි, ඒ වෙගය
දක්වන්නට නොපිළිවනැ"සි කීහ. "එසේවීනම් ඊට අල්පවෙග
යක් දක්වව"සි කීහ. බෝධිසත්ත්වයෝ මහරජ, එසේ නම් අක්ෂණ
වෙධි ධනුර්ධරයන් රැස්කරව"සි කීහ. රජතෙම එසේ කළේය.
බෝධිසත්ත්වයෝ ඔවුන්ගෙන් ඇමට නායකවූ සතර දෙනකු තෝරා
ගෙන රාජාඞ්ගනයෙහි ගල්ටැඹක් සිටුවා තමන් කර මිණියක්
බඳවා ගෙන ටැඹ මත්තේ හිඳ දුනුවායන් සතරදෙනා ගල්ටැඹ
වැතිර සතරදිගට මූණලා සිටුවා "මහරජ්ජුරුවන්වහන්ස, මොනු

සතරදෙන එකවිටම සතර දිශාවට අභිමුඛව සිට ඊතල සතර දිගට විදිකල වෙගවත්ව අහසට නැඟී එම ඊදඬු සතර බිමට වැටිය. නොදීම අරගන අවුත් මේ දුනුවායන් සතරදෙනා පාමුල එලාලමි. මා ඒ ඊදඬු ගෙනෙන පිණිස ගියනියාව ඝණ්ඨා නාදයෙන් දතමැනව. මම වූකලී නොපෙණෙමි''යි කියා ඔවුන් විසින් එකපැහැරම විදිනාලද ශරයන් ගෙනවුත් ඒ දුනුවායන් පාමුල හෙලාගල්ටැඹමුදුනේ උන්නාවූ තමන් රජ්ජුරුවන්ට දක්වා "මහරජ්ජුරුවෙනි, මාගේ වෙගය දක්නාලද්දේදැ''යි කියා නැවත "මහරජ්ජුරුවෙනි, මාගේ මේ වෙගය උත්තමත් නොවෙයි. ස්වල්පවූ ලාමක වෙගයෙක. මහරජ්ජුරුවෙනි, අපගේ ස්වභාව වෙගයක ඉතා ශීඝ්‍ර වන්නේය''යි කීහ. මහරජ්ජුරුවෝ බොධිසත්ත්වයන් අතින් විචාරන්නාහු "සබඳ හංස රජ්ජුරුවෙනි, තොපගේ මේ වෙගයට වඩා ශීඝ්‍රවූ අනෙක් වෙගයෙක් ඇත්තේදැ''යි විචාළහ. "එසේය රජ්ජුරුවෙනි, අපගේ උත්කෘෂ්ටවූ වේගයට වඩා සියක් ගුණයෙන් දහස්ගුණයෙන් ලක්ෂගුණයෙන් මේ සත්ත්වයාගේ ආයුඃ සංස්කාරය වහා ගෙවෙන්නේය. බිඳෙන්නේය. විනාශවන්නේය''යි රූපධර්මයන්ගේ භෙදය දැක්වූහ. එසමයෙහි ඒ හංසරාජයාගේ ධර්මාවවාදයෙහි පිහිටි රජ සහ බොහෝ මනුෂ්‍යයෝ ඒ ධර්මය මෙනෙහි කිරීමෙන් ස්වර්ග සම්පත් ලබාගත්තාහුය. (ජවන හංසජාතක)

### තොප නම ඉදිරිකල නමටත් උතුම සෙ ති

හංස ශබ්දය ඉදිරිකළාවූ හෙවත් පරපද කොට ඇති පූර්වවූ පදයගේද උත්තමාර්ථය කවිවරයෝ ප්‍රකාශ කරන්නාහුයයි කියේවේ. "රාජහංස'' යනු ඊට නිදර්ශනයි. එවිට මේ හංස ශබ්දය පිළිබඳවූ උත්තමාර්ථය වන්නේය.

### "තොප සැවි රැගෙන සිටිනැනටත් කෙරෙති රූ ති''

හංසයාගේ ආකාරය ග්‍රහණයකළ ස්ථානයටද ලෝකවාසීහු ඇලුම් කරත්යයි කීහ. හංසයාගේ රම්‍යතර පරිපූර්ණ විලාසමාත්‍රය දරා සිටින්නෝ නම් [කාන්තාවන්ගේ පයොධරයෝ වෙති. මීටා හංසයන් උපමාකිරීම]කවිසම්මතයි.

මයූර සන්දෙශයෙහි :–

අඟනන රඟ බැස පැන අත — රැ යා
තනනා තන නම් රන් තිස — රැසා
විලසින් දනුයෙන් දෙව් අස — රැ යා
දනමත් කරවන දුන් ගී — රැ යා

තිසර සන්දෙශයෙහි :–

වැ පි ය සුනිල් කෙස්බැඳ කුසුම දූව — පි ය
සැ පි ය පැපෑ ගන එන ලිය තුනු ය — පි ය
සි පි ය නරඹමින් තනරන් හස පැ — පි ය
අ පි ය වෙමින් නො ලගව උඩුගල් පි — පි ය

3. ව න කල ගොදුරු මරකත මිණි මියුරු ලෙ ස
බොන කල පොකුරු මී ඉඳ පිපි පියුම් හි ස
ය න කල ගමන් රිවිසෙද[1] පසුකර අහ ස
ම න කල මිතුර තොප යස පවසම් කෙලෙ ස

අන්වය :–මරකත මිණි මියුරු ලෙස ගොදුරු වනකල (යලිත්) පිපි පියුම් හිය ඉඳ පොකුරු මී බොනකල (යලිත්) රිවි පසුකර අහස සෙද ගමන් යනකල මන කල මිතුර තොප යස (මම) කෙලෙස පවසම්.

සංලක්ෂ්‍ය :–මරකතමිණි–පච්ච නමින් ප්‍රකට මැණික් වර්ග ය යි.

යන කල ගමන් රිවිසෙද පසුකර අහ ස

''රණහස රිවි සමග–දිවත් ජයගති බුදුකුරු විසිත්'' (ලෝකොපකාරය) මෙය හා සසඳ බලන්න.

4. මෙතින් නොගෙන උන්ගෙන් වන අ යාප ත
ග තින් ගැන[2] දිදී රන්වන් පි යාප ත
නි තින් සියන් රැකියෙහි[3] සිත ද යාප ත
සි තින් සිතන්වත් බැරි මෙ තොප යාප ත

අන්වය :–උන්ගෙන් වන අයාපත මෙතින් නොගෙන රන්වන් පියාපත ගැන ගතින් දිදී දයාපත සිත නිතින් සියන් රැකියෙහි මෙතොප යාපත සිතින් සිතන්වත් බැරි.

සංලක්ෂ්‍ය :–අයහපත–**අයාපත**, යහපත–**යාපත**; මේ හකාර ලෝපයෙන් හා ස්වරදීර්ඝයෙන් සිද්ධවූ තැනි.

මෙයින් ප්‍රකාශිත කථා ප්‍රවෘත්තිය මෙසේ දතයුතු.

''යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බොධිසත්වයෝ බමුණුකුලයෙක ඉපිද නන්දාය–නන්දවතිය–සුන්දරීනන්ද යයි දූන් තුන්දෙනෙකු ලදින් ඔබ්බෙබ් පරකුලයෙක ලන්ට විවාහ කරන්නාට පළමුව පියවූ බොධිසත්වයන්වහන්සේ මිය ගොස් ස්වර්ණහංසව ඉපිද ජාතිස්මරණඥානයෙන් මේ හංසජාතියට පළමු ජාතියෙහි බ්‍රාහ්මණකුලයෙහි උපන් නියාවත් බැමිණි හා දූන් තුන්දෙනා අනුන්ට බැලමෙහෙ කොට රැකෙන නියාවත් දැක ''මාගේ පියාපත් රන්පියාපත් විසින් කැපීම් තැළීම් ආදිවූ කර්මාන්තයට අනිසිව තිබෙයි. එසේ හෙයින් මාගේ අඹුදරුවන්ට සංග්‍රහ පිණිස මසින් දෙමසින් එකනට ගොස් පියාපත් එලඑලා ආම්නම් යහපතැ''යි සිතා දවසක් තමන්ගේ ගෙට අවුත් පලයපිට උන්කල්හි දූන් තුන්දෙන විසින් ''තොපි කවුරුද''යි විචාරන්නා ''තොප ඇමට පියවූ බ්‍රාහ්මණයෝ නම් මමය. තොපට

1 රිවිසද–හැම	2 ගෙන–යනුත් පාඨයි	3 රැකියෙව

හා තොපගේ මැණියන්ටත් සංග්‍රහ පිණිස ආ මි'' කියා රන්පතක් එලාගියාහ. මෙම නියායෙන් කිපවාරයක් රන්පත් එලාසිටි කල්හි එක්දවසක් බැමිණී සිතන්නී ''තිරිසනා නම් එක් සිතක නොවන්නේය. ඉදිරියේ මෙතනට නොඑම්යි සිතුවොත් අපට බොහෝ අලාභය''යි සිතා දූන් කැඳවා කියන්නී ''තොපගේ පියාණන් දව සෙක අල්වාගෙන ඇඟ පියාපත් උදුරාගනුව''යි කීය. එපවත් අසා උන්ගේ දූන් තුන්දෙන කියන්නාහු ''අපගේ පියාණන්වහන්සේගේ සම්බාධය රිදෙයි. අපි එලෙස නුදුරම්හ''යි කීහ. මේ නියායෙන් කිය කියා උන්කලට හංසයා ඒ ගෙට ආවේය. එකල්හි බැමිණී කියන්නී ''ස්වාමි පුත්‍රය, මා කරා එව''යි කියා කැඳවූ කල්හි බොධිසත්වයන් වහා උන්කරා එන්නාම අල්වාගෙන සම්බාධයේ රෙමයන් උදුරා ගත්තාය. බොධිසත්වයන් නොඅභිප්‍රායෙන් උදුරාගත් හෙයින් සියලු රන්පත් නිස්ප්‍රභාවිය. බොධිසත්වයෝ පියාපත් නැති හෙයින් යානොහී එම ගෙයිම උන්හ. නැවත පියා ඇවිත් ගත ලොම් සුදුපා ඇතිවන්නා බොධිසත්වයන් ඇරපිය. එතැන් පටන් බොධිසත්වයෝ ගෙට නොආවිරූහ. (සුවණ්ණහංස ජාතක)

5\. බැ දී මලෙසි උන් රජු වෙත ම පෙම් බැ දී
මි දී නො ගිය හස දූකා [1]වැදි මලෙන් මි දී
ලැ දී එ ගුණ බඹදත් රජ රජෙන් පි දී
[2]රැ දී දහම් තොප [3]මෙන වැතිර පුදල දී

අන්වය :–මලෙසි බැදී උන් රජු වෙතම පෙම්බැදි (එහෙයින්ම) මිදී නොගිය හස දූකා වැදි මලෙන් මිදී එගුණ ලැදී බඹදත් රජ රජෙන් පිදී (සලිත්) දහම් රැදී තොප මෙන වැතිර පුදලදී.

සංලක්ෂ්‍ය :–මලෙසි– 'මලෙහි'යයි සිටිතැන 'හ'කාරයට 'ය' කාරා දෙශවීමෙන් සිද්ධයි. මෙසේ 'එහි' ප්‍රත්‍යයෙහි 'හ'කාරයට 'ය'කාරා දෙශවීම ද දක්නා ලැබේ.

මයූර සන්දෙශයෙහි :–

වි ස් මය කර දුටුවන් තොම ඇරෙන ලො බා
තොස් වඩමින් රුසිර් සමුදුරෙසි ප බා
ඇ ස් පිල් පෙල දිවුතට තො කළ කල බ ඹා
ඇ ස් දෙකකින් නැරඹිය හැකිද ඇති පු බා

ගුත්තිල කාව්‍යයෙහි :–

වැ ජෙන සි සැඩ පවනෙ හි
ර ශෙන සි පැ දද ගුවනෙ හි
පෙ නෙ සි රත් සක් මෙ හි
පැ නෙ සි සුදු සිදු පෙල ඉදිරියෙ හි

1 බැඳි-වැඩියක් 2 හුදි 3 වෙත-හැම

ඒ මේ 'හ'කාරයට 'ස'කාර ලේශය වනාහි ඇතැම් තැන සුබොධොච්චාරණය ද ඇතැම් තැන එළිසම කිරීමද සලකා කරනු ලැබෙන බව ප්‍රයෝගානුසාරයෙන් පෙණේ.

මේ පද්‍යයෙන් ප්‍රකාශවන කථාපුවත වන්නා සංක්ෂෙපයෙන් මෙසේ දතයුත්තේය :-

"යටගිය දවස බරණැස් නුවර සෙය්‍යසක නම් බරණැස් රජ කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරනලද පාරමී ඇති අපමහ බෝසතාණෝ හංසජාතියෙහි ඉපිද ධෘතරාෂ්ට්‍ර නම් හංසරාජව අනූ දහසක් හංසයන් පිරිවරකොට ඇතිව චිත්‍රකූට පර්වතයෙහි වසන් නාහ. එක් දවසක් එම රජ්ජුරුවන්ගේ ඛෙමා නම් අගබිසොවුන්ට සුවර්ණහංසරාජයකුගෙන් බණ අසනු පිණිස මහත්වූ දොළදුකක් උපන් බව රජතෙම දැනගත්තේය. දැන රජතෙම "සුවර්ණහංසයන් ලැබීමෙහි කවර උපායක්දැ"යි බ්‍රාහ්මණයන් අතින් විචාරා ඔවුන් ගේ අවවාදපරිද්දෙන් නුවරට නුදුරු තැනෙක්හි තුන්ගවු පමණ දිග පුලුල ඇති ඛෙම නම් විලක් ඉදිකොට එහි දියපුරවා නොඑක් ධාන්‍ය ජාතීන් ඇතිකොට පස්වණක් පියුමෙන් සමෘද්ධකරවා සුමුඛ නම් වැද්දාහට පාවාදී ධනයෙන් සංග්‍රහකොට "මෙහි පැමිණෙන සුවර්ණහංසයකු අල්වාගෙනවුත් දුනමැනව"යි එම විල භාර කළේය. ඒ රජහුගේ විධාන පිළිගත් ව්‍යාධයාද හංසයන් ආදි පක්ෂිජාතීන් එතනට එන පරිද්දෙන් නොඑක් උපාමාරු දක්වා කාඩීකරනකල්හි මෙම විල ගොදුරු පහසුව හංසපරම්පරාවෙන් අසා දැනගත් ධෘතරාෂ්ට්‍ර නම් හංසරාජයාද සහපිරිවරින් එම විල කරා දෑමිණ නිර්භයවූයේ අභිලාෂපරිද්දෙන් ගොදුරු කමින් යාම් ඊම් කරන්නේය. එසේ භය නැතුව ගොදුරුගැනීමෙහි හා ක්‍රීඩා කිරීමෙහි පරිචිතවූ හංසයන් අතුරෙහි එම වැදිතෙම උගුලුමලයක් සාදා හංසරජ්ජුරුවන් බස්නා පුරුදුතැන දියතුළ ඔබාතබා සැඟවී සිටගත්තේය. දෙවන දවසෙහි හංසරජ්ජුරුවෝ පෙරසේම ගොදුරු ගැනීමෙහි පුරුදු තැනට බසින්නෝ එහි ඔබාතුබූ මලෙහි බැඳී වෙගයෙන් පා ඇදගැනීම පිණිස උත්සාහකරන අතර පය මස්නහර කැඩීයාමෙන් මහත්වූ දුඃඛවෙදනාවෙන් පීඩිතව මෙසේ සිතූහ. "මම මේ දුඃඛවෙදනාවෙන් රාවය කෙරෙම්නම් මාගේ පිරිවර හංසයෝ දුඃඛිතව ව්‍යසනයට පත්වන්නාහ"යි සිතා ඉවසා සිට පක්ෂීන් ගොදුරු කා නිමවා දියකෙළියට පටන්ගත් කල්හි කෘපණරාවය කළහ. ඒ හඬ අසා සියලු පක්ෂිහුම තුන්කොටසක්ව විසිරගියෝය. ඔවුනතුරෙහිවූ සුමුඛ නම් හංසසෙනාධිපති "මේ භයරාවය කවරකුගේදැ"යි සොයන්නේ තුනක්ව බෙදුනු හංසයන් අතුරෙහි එකම හංසරාජයා තනිව සිටින නියාව දැක "මේ භය වනාහි අපගේ හංසරජ්ජුරුවන්ගේ වනැ"යි නිශ්චයකොට ආපස්සේ

අවුත් බලනුයේ හංසරාජයා බැඳී උන්නා දැක "මහරජ, නොබාමැත. මාගේ ජීවිතය දිපියා නුමුත් නුඹවහන්සේ ගලවාගනිම්"යි. කියා අස්වසමින් ළඟට පැමිණ එහිම මඩමත්තේ හොත්තේය. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "සුමුඛයෙනි, සතුරන් අතට අසුව ගියාවූ මාගේ සහාය පිණිස අවුත් තොපත් ගොදුරුවන්නෙහිය. එහෙයින් වහා පලායව"යි කීහ. එවිට සුමුඛයා "ස්වාමීන්හට පත්වූ විපතෙහි සෙවකයන් ඉවත්වයාම සත්පුරුෂ ධර්මයක් නොව. ස්වාමීහු හා සමගම මමත් මියයෙමි" යනාදි වශයෙන් කථාකරන කල්හි වැදිතෙම මුගුරක් ගෙන ඉතා රෞද්‍ර ලීලායෙන් පක්ෂි දෙදෙනා කරා යුහුව දිවආය. ඒ වැදි එන නියායෙන්ම දෙදෙනාම මරණ පැමිණෙයි දැනුණු හෙයින් සුමුඛතෙම හංසරජ්ජුරුවන් බිය නොවනසේ අවවාදකොට වැද්දහුට මිහිරිවූ මනුෂ්‍ය භාෂාවෙන් "යහලුව, තා විසින් එබූ මලෙහි එසේ මෙසේ ලඝුවූ හංසයෙක් බැඳුණේයයි නොසිතව. අනූදහසක් හංසයන්ට රජවූ ධෘතරාෂ්ට්‍ර නම් හංසරජ්ජුරුවන් වහන්සේය බැඳුණේ. ගුණයෙන්ද, නුවණින්ද සමන්විතසේක. බොහෝ සමූහයකට උපකාරීව සිටිසේක. මරාපිය යුතුනොවනසේක. ඉදින් තෝ මුන්වහන්සේගේ පියාපත් ඇරගන්නා කැමැත්තෙහිවීනම් මාගේ ඇඟපත් උදුරාගනුව. ඉදින් සම්-මස්-නහර-ඇට ආදි කිසිවක් ගන්නාකැමැත්තෙහිනම් මාගේ ඇඟින්ම හැරගනුව. ඉදින් ක්‍රීඩා හංසයකු කරනු කැමැත්තෙහිනම් මා ම සලසාගනුව. ඉදින් නොමරා විකොට සම්පත් ලබනු කැමැත්තෙහි නම් මා විකොට පියා හැරගනුව. ජාති ගොත්‍ර කුලවර්ණ සණ්ඨානාදියෙන් මා සරි හෙයින් තොපට කිසි අලාභයක් නොවන්නේය. එසේ හෙයින් ගුණනුවණින් යුක්තවූ හංසරජ්ජුරුවන්වහන්සේ නොමරා හැරපුනම් මෙලෝ පරලෝ දෙකින් බොහෝ වැඩවන්නේය. ඉදින් මැරුයේවීනම් නරකාදි සතර අපායට පැමිණ බොහෝ දුක් විඳින්නෙහි" යනාදීන් මිහිරි කථා කියා වැද්දහුගේ සිත් මොළොක් කළේය. මේ ආදි නොඑක් මෛත්‍රීසහගත ධර්මාන්විත කථාවෙන් මෘදුමොළොක්ව ගිය සිත් ඇත්තාවූ ව්‍යාධතෙම එම පක්ෂිරාජයා කෙරෙහි අනුකම්පාකොට මලෙන් මුදා ගොඩබිම තණපඳුරක් මතුරෙහි තැබීය. "මේ ප්‍රකාරයෙන් මලහෙලා අප බැඳගැනීමට කාරණ කිම්දැ"යි හංසරාජයා විසින් විචාරනලද ව්‍යාධතෙම කියන්නේ "මෙනුවර බඹදත් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසොවුන්ට ස්වර්ණහංසරාජයකුගෙන් බණ ඇසීමට දොළදුකෙක් උපන. එය සංසිඳුවාලීමට රජ්ජුරුවන්ගේ අණලෙස මෙසේ බැඳගන්නාලදහ"යි කීය. එවිට හංසරාජයන්ගේ සතුට දැනගත් ව්‍යාධතෙම ඔවුන් රජ්ජුරුවන් කරා ගෙනගොස් දක්වා සියලු ප්‍රවෘත්ති සැලකළේය. රජතෙමේද ඔහුගේ විස්මය ජනක බස් අසා සන්තුෂ්ටවූසේක් වැද්දහුට ආහාරපාන වස්ත්‍ර, පිළි,

ගම්, බිම් ආදී සංග්‍රහ වස්තූන් දෙවා යවා හංසයන් බාරගෙන විලඳමී කවා කිරිපැන් පොවා බිසොවුන්ට දක්වා රන්මැදිරියක බහා ධර්මකථා කියවා බොහෝ දවසක්ම අර්ථයෙන් ධර්මයෙන් අවවාද අසා රාජ්‍යයද පුදා ප්‍රසාදකරවා හංසයන් දෙන්නා අහසින් චිත්‍රකූට පර්වතයටම යැවූසේක. (මහා හංසජාතක)

මෙ සේ දූතයා සමග ප්‍රිය සම්භාෂණය කිරීමෙන් ප්‍රසාදයට පමුණුවා ඉක්බිති දූතයා විසින් කළයුතුවන ස්වාභිෂ්ට කාර්ය ප්‍රකාශකරනු කැමැත්තෝ "**මෙලෙසින්**" යනාදිය කියත්.

## අදහස

**6. මෙලෙසින් දියත පරසිඳු ඉටු මිතුරු ස ඳ**
**අ හ සි න් පැමිණි විසිතුරු සිතුමිණක් ලෙ ද**
**වි ල සි න් මෙ තොප ලදුයෙමි පිනකින් මෙ ස ඳ**
**එ බැ වි න් තොපට පවසන අස්නෙක සබ ඳ**

**අන්වය** :–මෙලෙසින් දියත පරසිඳු ඉටු මිතුරුසඳ මෙතොප අහසින් පැමිණි විසිතුරු සිතුමිණක් ලෙද පිනකින් විලසින් මෙසඳ ලදුයෙමි සබඳ! එබැවින් තොපට පවසන අස්නෙක.

**සංලක්ෂ්‍යය** :– සිතුමිණ–චින්තා මණි රත්නය. සිතූ පැතූ දේ පහළ කරන මැණික. 34 වන කවෙහි සංලක්ෂ්‍යය බලනු.

**7. අ ද රව අසාගෙන ලෝවැඩ අදහ සි නි**
**හ ද තුල තබා රැක ලද නිදනක් ලෙ සි නි**
**ම ඳ ලස නොවී මෙ පුරෙන් ගොස් අප බ සි නි**
**එ ද තොප විසින් පැවැසිය යුතුවෙයි තො සි නි**

**අන්වය** :–ලෝවැඩ අදහසිනි අදරව අසාගෙන හදතුල තබා ලද නිදනක් ලෙසිනි රැක මඳ'ලස නොවී මෙපුරෙන් ගොස් එද තොප විසින් තොසිනි අප බසිනි පැවැසිය යුතුවෙයි.

දැන් කාව්‍යනායකයා වැනියටිවූවෝ '**දිනූබිම**' යනාදියද, '**පුල් සැදි**' යනාදි දසපද සැහැල්ල හා '**ලොවැති**' යනාදි පද්‍යයද ආරම්භකරත්.

## කාව්‍යනායක වර්ණනා.

**8. දි නූ බිම මහිම ඇති මුනි මා ර බ ල**
**වැ නූ තැනක් වැනි සතපිා සා ර ප ල**
**සැ නූ නොයෙක් කෙත්වත් සරු සා ර ප ල**
**ද නූ පසිඳු වෙහෙරෙක සැදි කැ ර ශ ල**

**අන්වය :**-මුනි මාරබල දිනූ බිම මහිම ඇති සත පින් සාරපල වැනූ තැනක් වැනි තැනු සාරපල නොයෙක් කෙත්වත් සරු කැරගල සැදි පසිදු වෙහෙරෙක (ඇත සබඳ! එය) දනු.

**සංලක්ෂ්‍යය :**-පුණ්‍යාර්ථී සත්‍වයන්ගේ පුණ්‍යය සම්බන්‍ධවූ උදාර තර ඵලය වර්ණනා කරන ස්ථානයක් මෙන් සාදනලද සාරවත් ඵල ඇති නොඑක් ක්‍ෂෙත්‍ර හා පුෂ්පාරාම ඵලාරාමයන්ගෙන් සමෘද්ධවූ යයි කිමෙන් කුසල් කරන ජනයන්ට ආයති භවයෙහි ලැබෙන ඵල විපාකය මේ ක්‍ෂෙත්‍ර වස්තූන්ගෙන් ඉහාත්මභාවයේදීම බලාගත යුතුයයි ප්‍රකාශ කරන ස්ථානයක් වැනිය යනු අදහසයි. පින් කැමැති ජනයන් විසින් තුනුරුවනට පුදනලද නානාවිධ වතුපිටි ආදිය කරණකොටගෙන කැරගල පදමවනි පිරුවන නමින් ප්‍රසිද්ධවූ විහාරවරයාගේ සමෘද්ධිමද්භාවය මෙයින් ගම්‍යමානයි.

**9. පුල් සැදි විල් කමල්[1]-මල්වතු දිමුතු එ වෙහෙර**

දූ ක දූ ක  දෙලෝ වැඩ පවසන  අමා  ලෙසින්
ලක එක  මඟුල් ගෙය සේ කල  නමා  බ සි න්

**පෙරළුදුරුවර නුදුවූ-ගැඹුරු තැන් දුවූ සතරෙහි**

ඇ සූ ස ග න  සලි ටීකා කරන ලෙ  ස
දෙ සූ අ ස න  තැන් සැක තැන් මුලින පි  ස

නිතිවනරත්න  [2]රුවනින් සඟරුවන් ඇ  ති
නිතිවනරත්න  දිදුලෙන් මොක් මඟන තැ  ති
නිතිවනරත්න  දෙව්රජකුල රැක පැවැ  ති
නිතිවනරත්න  මා හිමි හිමිසඳ පව  ති

**අන්වය :**-පුල් සැදි කමල්විල් මල්වතු දිමුතු එ වෙහෙර දෙලෝ වැඩ දූක දූක අමාලෙසින් පවසන නමා බසින් ලක එක මඟුල්ගෙය සේ කල සතරෙහි පෙරළුදුරුවර නුදුවූ ගැඹුරු තැන් දුවූ ඇසූ සඟන සලි ටීකා කරන ලෙස අසනතැන් සැකතැන් මුලින් පිස දෙසූ නිතිවනරත්න රුවනින් සඟරුවන් ඇති නිතිවනරත්න දිදුලෙන් මොක්මඟන තැති දෙව් රජකුල නිති රැක පැවැති රත්නවන වනරත්න මාහිමි හිමිසඳ නිති (එ වෙහෙර) පවති.

**සංලක්ෂ්‍ය:** -**ටීකා**-අමාරු පද (ග්‍රන්ථි පද) විස්තරකරන විවරණ යයි. "ටීකයති ගමයත්‍යර්ථානිති ටීකා" යනු විග්‍රහයි. අර්ථය අව බොධ කෙරේනුයි **ටීකා** නමි.

විෂම පද ව්‍යාඛ්‍යාන රූපාශං ව්‍යතෙත—ශබ්දරත්නාකර මහානිධි.
ටීකා නිරන්තර ව්‍යාඛ්‍යා—අභිධාන චින්තාමණි.

---

1 පුල්සැදි කමල්විල්  2 රුවන් සඟරුවන් ඇති-මුද්‍රිත

**අනුටීකා**–ටීකාවෙහිවූ ගූඪාර්ථ පදයන්ගේ අර්ථ විවරණය අනු ටීකාසි.

යලි ටීකා–නම් අනුටීකා යී.

10. ලොවැති නොමින් සිරි සැපති න් පිරිසාල
සැමැති ලෙසින් දෙන තිළිණෙ න් සුරසාල
නැවැති දෙසින්[1] දිසි යසසි න් සුවිසාල
එ ය ති සඳුන් දූත මෙහසු න් පවසාල

අන්වය :–සරල යි.

**සංලක්ෂ්‍ය** :–'**පවසාල**'–පවසා යන පූර්වක්‍රියාපදය කෙරෙන් 'ල' ප්‍රත්‍යය හා ධාතු සංඥාකොට විධික්‍රියා 'අ' ප්‍රත්‍යය යෙදීමෙන් සිද්ධයි. ''විඩාලව–බැඳලව–සිටුවාලව'' යනාදියද මෙසේම දතයුතු. සිදත් සඟරාහි :–''මුදුගනී–කියාලන්නේ ඇ ගත–ල පස දු වූසේ'' යනු නිර්දිෂ්ට හෙයිනි.

**A මිතුරු තුම හස්න, මුනි-සස්න හිමි එ හිමිහට-
කියන සුබ හස්න මතු-කියමි පිය දස්න තොප-
මහය පිළිවිස්න දන-විස්මවන ලෙසට මෙම-
පුරෙහි සිරි ඉසුරු සර-වනන මා තෙපුල් මිණි-
කොඩොල් නා සවන්තර.**

අන්වය :–අනාකූල ය.

**සංලක්ෂ්‍ය** :– '**කියමි**'– කිරිය පෙරළි.

''දූතනත්‍ර වර්ණයෙද්දෙව කුශල ප්‍රශ්න පූර්වකම්
වර්ණනානන්තරං තස්‍ය ගන්තව්‍යස්ථාන කීර්තනම්
පශ්චාත්තත්‍රෙජ්‍රාෂ්‍යසීත්‍යුක්ත්වා මාර්ගදෙශාදිවර්ණයෙත්''

යනු හෙයින් කුශල ප්‍රශ්න පූර්වකොට දූතයා පළමුවෙන් වර්ණනා කරන්නේය. ඊට අනතුරුව ගන්තව්‍යස්ථානය ප්‍රකාශකිරීමද පසුව සන්දේශය කියන්නෙමියි මාර්ගදෙශාදිය වර්ණනා කිරීමද යනු ශාස්ත්‍ර නියමය වේ. එබැවින් ''**සැරද හසරද සඳ**'' යනාදි පද්‍ය යෙන් ස්වකාර්යතත්පරවූ දූතයාහට උපද්‍රව නිවාරණය පිණිස ශුභාශංසනයද, ''**තොප තෙපලකින් – වනසාල – මෙතින් – බැඳි මලෙසි-මෙලෙසින්**'' යි ප්‍රාරබ්ධ පද්‍යයන්ගෙන් විශිෂ්ටතර දූත වර්ණනාවද, ඊට අනතුරු ''**අඳරව–දිනුබිම–පුල්සැදි–ලොවැති**'' පද්‍යයන්ගෙන් ස්වීයාධ්‍යාශය හා ගන්තව්‍යස්ථාන කීර්තනයද, ''**මිතුරු තුම**'' යනාදියෙන් සන්දේශය පසුව ප්‍රකාශකරන අයුරුද කීහ. ''**සිරි මද්දන**'' යනාදියෙන් මාර්ග දෙශාදි වර්ණනාව ආරම්භ කළහ.

1 නොමැති දෙසින්

## ජයවර්ධනපුර වර්ණනා.

11. සිරිමද්දන සැපතින් සරි අල කා පුර
රුපුමද්දන කර ජයලත් නොයෙ කා වර
බලවද්දන රඳනා සතුරු සැ කා හැර
ජයවද්දන පුර නම් මෙය මෙල කා තුර

**අන්වය** :-සරලයි.

**සංලක්ෂ්‍ය** :-සිරිමත්දන-සිරිමද්දන
බලවත්දන-බලවද්දන-පරරූප යි.
රිපු මද්දන-ජයවඩ්ඪණ (පා)
රුපුමද්දන-ජයවද්දන

මේ තදගම කළ සැටියි. රුපු මඩන, ජය වඩන යනුවෙන් තදගමවතුදු එලිවැට පිණිස කවෙහි සඳහන් පරිදි යෙදිණ.

සැළලිහිණි සන්දේශයෙහි :—

පොහොසද්දන ඇති තුනුරුවන බැති පෙ මා
මුදු වද්දන සුර පුර පිරි සිරින් හැ මා
ජය වද්දන කොරුමෙන් සුසැදි තව න මා
ජය වද්දන පුරවර දනු මිතුරු තු මා

මෙයද බලන්න.

**'අලකපුර'**- මේ වෛශ්‍රවණ (=වෙසමුණු)ගේ රාජධානියයි. අලකාපුර-අලකමන්‍දා යනුද මෙයමැයි. මහාපද්ම, පද්ම, සංඛ, මකර, කච්ඡප, මුකුන්ද, කුන්ද, නීල, වර යන නව මහානිධානයෙන් විභූෂිත මෙය කෛලාස (කූට) මස්තකයෙහි පිහිටියේය. ශ්‍රී සමෘද්ධිය-ධනසම්පත්ති ආඪ්‍යත්වය ප්‍රකාශ කළමනා තන්හි අලකපුර උපමිත කිරීම කවිසමයාගතයි.

සැළලිහිණි සන්දේශයෙහිද ජයවර්ධන පුර වර්ණනාහි "උතුරු දිගිඳුපුර දිනි මෙපුර වැජඹෙන" යන්නෙන්- උතුරු දිගිඳුපුර (අලකපුර) ධනීශ භාවය සඳහා උපමාකොට තිබේ.

'දඹදෙණි අලකපුර විසු දැනිසුරු විලස' යි පරෙවි සන්දේශයෙහිද දක්වේ.

**ජයවද්දනපුර**- මේ පුරය මෙකල්හි 'කෝට්ටේ' යනුවෙන් ව්‍යවහාර කරනු ලැබේ. මෙය වනාහි කිනම් කලෙක්හි කුමක් සඳහා කවරකු විසින් කරන ලද්දක්ද යත්?

ශ්‍රී සම්බුද්ධ වර්ෂ * 1894 ටත් 1912 ටත් අතර කාලයෙහි ලක් රජයකළ විජයබාහු මහරජතෙම චීන මායා පාසයට අසුවීමෙන්

* මේ වර්ෂ සංඛ්‍යාව රාජාවලියේ වෙනස්ව පැණේ.

ව්‍යසනප්‍රාප්තවිය. ඉත්පසු ලක්දිව රජුන් නැතිහෙයින් අමරගිරි වංශාභිජාත අලගක්කෝනාර මන්ත්‍රීශ්වර තෙම රයිගම්පුරයෙහිද යටකියූ විජයබාහුගේ සුලුපියා රාජ්‍යභාරයට පත්කරනලදුව * ගම්පොල සතරවන භුවනෛකබාහු නමින් ගම්පොළද, ආර්‍යචක්‍රවර්ති නම් කෙනෙක් යාපාපටුනේද රාජ්‍යය කෙරෙමින් විසූහ. මෙයින් ආර්‍ය්‍යචක්‍රවර්ත්තිතෙම එකල මුලුලක්දිව යටත්කිරීමට බොහෝ සේනාබල ඇතියේ ඒ ඒ පළාත්වලින් අයබදු රැස්කරවමින් සවප්‍රධානත්වයෙන් භ්‍රාජිතවිය. එවිට අලගක්කෝනාර මන්ත්‍රීශ්වරයත් තමාගේ මහත්වූ සේනාබලය බලා "මේසා බලවත් සේනාබලය ඇති අප මොහුට අප රටින් අයබදුදීම හීනතර වෘත්තියකැ" යි සිතා ඔහු හා සටන්කිරීමට සැදුගත් කොටුව ජයවර්ධනපුරය වේ. මෙය වනාහි පුරාණ කලයෙහි කවිජන වර්ණිතියවූද මහාජනයා විස්මයපත් කරවන්නාවූද ස්ථානයක්ව පැවතිබැව් ග්‍රන්ථාන්තරගත කථායි.

"ගිරිවංශාභිජාත අලගක්කෝනාර නම් මන්ත්‍රීශ්වරයාන කෙනෙක් මහත්වූ තෙජෝබල වික්‍රමයෙන් ලොකපූජිතව වසන්නාහු-පෙ- ශ්‍රී ලඞ්කාද්වීපයෙහි ලොක ශාසන විලොපකාරීවූ පරශත්‍රෘ ප්‍රතිබාහනය පිණිස ස්වාමී පරාමී ප්‍රතිබද්ධ චිත්තප්‍රවෘත්ති ඇති ශ්‍රද්ධාභක්ති පුරස්සර සකලාභිමතාමී සාදුදීමෙහි සමර්ථවූ ස්ථානොචිත කාසිකාසි විජානනයෙහි දක්ෂ විචක්ෂණ, ගුණ සුවච කීකරු සෙවක මණ්ඩලිකයන් ලවා විධානකරවා කොළඹාභිධාන ද්‍රොණි මුඛාසන්නයෙහි නිරන්තරව දියපිරී සුරක්ෂිතව වටාසිටි තඩාගමධ්‍යයෙහි දූරුග්‍රාමය සිසාරා ගම්භීරතර පර්වත ප්‍රාන්තයක් මෙන් අතිභයානකවූ ගැඹුරු හා පුලුල ඇති මහ අගල බිඳුවා ස්ථිරත්වය පිණිස අගල් පටන් මුදුනෙහි බඳනාලද සර්වශෛලමය මහාප්‍රාකාර මස්තකයෙහි අතරතුර විශ්වකර්ම නිර්මාණයක්මෙන් විචිත්‍රකොට සරසා ඒ ඒ තන්හි කරනලද ඉඩංගනී- පුලිමුගම්- භූමියංත්‍රච්චු- අට්ටාල- වට්ට- වෙට්ටමින් සුරක්ෂිතකොට අභිනව "ජයවර්ධන" යයි යන නමින් ප්‍රසිද්ධ කෝට්ටයක් ලවා එම නුවර මහාපවුර මුදුනෙහි සතරදිග ආරක්ෂා පිණිස සිරිලක අරගත් කිහිරැලිඋපුල්වන්- සමන්- බොක්සැල්- විභීෂණ- සකන්දකුමාර යන සතරවරම් මහරජුන්ට වෙන වෙන දෙවස්ථාන කරවා අනෙක ප්‍රකාර භෙරි තූර්‍ය නෘත්‍ය ගිත වාද්‍යාදියෙන් නිරන්තර පූජෝත්සව පවත්වනසේ ව්‍යවස්ථාකරවා සකල සම්පත්තින් සමෘද්ධකරවා මහත් ජනගහනකරවා-පෙ-යුද්ධ සජ්ජිතව දියෙන් ගොඩින් එක විට අවුත්වන් ආර්‍යචක්‍රවර්තීන් හා දෙමළ මහ සෙනඟ ලුහුබඳවා"

(නිකායසඞ්ග්‍රහය)

---

* මේ සතරවන බුවනෙකබා රජ අලගෙශ්වරය යි සමහරු කියති. එය වැරදි වැටහීමකි.

මෙසේ අලගක්කෝනාර ප්‍රභූරාජයාගේ විස්මයකර මේ ජය ග්‍රහණයෙන් ලඞ්කාවට හා සම්බුද්ධශාසනයටත් ඇතිවූ අභිවෘද්ධිය තහවුරුවීම පිණිසම දෙවිනුවර ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා වෙතින් සෙත් ශාන්ති යාඥා මුඛයෙන් කවීශ්වර කවීන්ද්‍ර විසින් මයුර සන්දේශ කාව්‍යය කරනලදී.

12. මෙ ර ම ත[1] ගෙන වෙණු අලළන කිරිසයු ර
වෙ ර ල ත වැද සිවි තුහු දියකඳ අයු ර
පි රි ය ත සිට බබලසි පිළිබිණි පවු ර
සි රි ව ත[2] මෙපුර සරිවන පුරයෙක් කව ර

**අන්වය :**-වෙණු මෙර මත ගෙන කිරිසයුර අලළන වෙරළත වැද සිවි තුහු දියකඳ අපුර පිළිබිණි පවුර පිරියත සිට බබලසි (එහෙයින්) සිරි වත මෙපුර සරිවන පුරයෙක් කවර?

**සංලක්ෂ්‍ය :-කිරිසයුර**-පෙර එක් කලෙක ශ්‍රී කාන්තා-ස්වකීය කාන්තාව අදෘශ්‍යමානවීමෙන් ශොක සහගතභිතියට පත්වූ ශ්‍රී විෂ්ණු දෙවියා ඇය සෙවීමෙහි ව්‍යාපෘතවූයේය. සකලස්ථානයෙහිම සොයා නොලදින් කිරිමුහුද අලළා බැලියැව්ව (මහා)මෙරු පර්වතය දණ්ඩට ගෙන එයින් කැළඹීල. එවිට සමුද්‍රගත සකල ජලස්කන්ධය අවට පිහිටි වෙරළට රැස්ව උස්වූ පවුරක් ලෙස බැස නො ගොස් සිටගත. ඒ ඇසිල්ලෙහිම සමුද්‍රස්ථමුක්තාමාණික්‍යාදි සකල රත්න සමූහයෝ ජ්වලමානව දෘශ්‍යමානවූහ. තත් ප්‍රකාර උත්තුඞ්ගතර තරඞ්ගාවලියට නගරය භාත්පස්හි නිර්මිත ධවලතරප්‍රාකාරය සමානකරනු ලැබේ. විසාල සමුද්‍රප්‍රදෙශයෙහිවූ ඒසා මහත් ජලස්කන්ධය නිරවශෙෂව අවට රැස්වසිටගත් බැව් ප්‍රකාශකිරිමෙන් තරඞ්ගාවලිය පිළිබඳ විශාලතරත්වයම හඟවනු ලැබේ. මේ උපමා වෙන්ම පුරය භාත්පස තනනලද්දැවූ ප්‍රාකාරය පිළිබඳ විශාලතරත්වයද ධාවල්‍යයද ප්‍රකාශිතයි.

මෙහිම 11 වන කවෙහි :—

**"සිරිමද්දන සැපතින් සරි අලකා පුර"**-යන නගර වර්ණනාත්මක කාව්‍ය පාදයෙන් මේ ජයවර්ධනපුරය තෙම අලකමන්දානම් පුරවරයට සදෘශයයි කියා යළිත් :—**"සිරිවත මෙපුර සරිවන පුරයෙක් කවර"** යන්නෙන් මේ පුරයට සදෘශ පුරයෙක් නොමැතියයි එකම පුරය ගැන එකම කවිතෙම වර්ණනාවක් කරයි, මෙය නොගැළපෙන කීමක්සේ කාව්‍ය තත්ත්වඥ නුවූවන්ට සිතීමට සාවකාශ ස්ථානයක්වූයේද මෙය කවිසමයාගත ධර්මතාවක් ලෙසම සිතියයුත්තේය. මෙහිම :-

26 "උ ය න් වතු කමල් ඵල් අවට උදු ලි ය
රූ වි ර්; බැබලි පුරඟන අපුරූ පිය ලි ය
ලෙ වන් සිතු යතුවුවන සවසිරි සි ලි ය
මෙ ඩි න් මේ පුර පුරඳර පුර සිරි සි ලිය"

යන්නෙන්ද ඒ බව ප්‍රකාශවේ.

---

1 මෙරමතගෙන අලළන සඳ කිරිසයුර

2 සිරිමත මෙපුර සරි පුරයෙක් නම් කවර

ගුත්තිල කාව්‍යයෙහි :—

477. මු ණි ඳු කිවද නො ගෙවෙන සග සිරිසැප තා
සු රි ඳු ඉසුරු දූත් පවසනු කිම අත තා
ප සි ඳු නොවන එක දෙවියකු සිරි සැප තා
දි ලි ඳු බවෙක මුදු දඹදිව රජ සැප තා"

480. "ප ස ග තුරෙහි නදපුරු මිණි කිකිණි ගො සේ
ස ම ග රුවන් පහයෙන් යනෙන නුබ කු සේ
සි න ග ලෙසින් කෙළි නළු විඳින නොක ම සේ
එ ස ග සුරන් සිරි නුබුදුව කියමි නො සේ"

මෙහි 477 වන කවෙන් ස්වර්ගසම්පත්තිය බුදු කෙනෙකුටත් වර්ණනා කළ නොහැකිසේ හඟවා යළිත් 480 වන කවෙන් බුදු කෙනෙකුට වර්ණනා කළහැකි බැව් ප්‍රකාශකර තිබේ. නොයෙක් කාව්‍යග්‍රන්ථ විෂයෙහි දක්නා ලැබෙන මෙබඳු ප්‍රයොග ශිෂ්ට සම්මතය.

13. සි රි ස ඳ මෙපුර වඩනා මඟුලට අතු ළ
ම න න ඳ සොඳුරු පියවිළි ලෙසිනි නිසස ල
පි ය න ද තිසර වැල බිඟුරැල කෙළිවන ළ
ඇ ම ස ඳ දිලෙසි පිපි පඹෙරින් සැදි අග ල

**අන්වය** :–සරලයි.

**සංලක්ෂ්‍ය** :–දිලෙසි–'දුල' දිලීමෙහි ධාතුයි. දුල+එසි=දුලෙසි=දිලෙසි.

**පියවිළි**–සමාසගත 'පාදපට' ශබ්දයෙන් 'පියවිළි'යි තද්භවයි. අනෙක් බොහෝ තැනම සමාසවූ හෝ නුවූ 'පට' ශබ්දයෙන් 'පිළි'යි තද්භවවේ. "සිවුරුපිළි–පිළියක් දුන් පිනෙන්" යනාදි ජෙක ප්‍රයොග සලකනු. හෙළ බසෙහි වනාහි ඇතැම් තැනෙක එක් ප්‍රකාරයකින් තද්භවව ව්‍යවහාර ශබ්දයම අන් සමහර තැනෙක අන් අයුරකින් සිටීමද ජෙක ප්‍රයොගයන් ගෙන් පෙණේ. "දෙවානං පියතිස්ස–දෙවන පෑතිස්" මහාකස්සප–මහ සුප්"; "දෙවානං–දෙදීයන්ගේ"; "කස්සපථෙරො–කසුප්තෙර" මේ ආදිය විමසන්න.

**තිසර**– හංසයාට නමි. "හංසයෝ–තිසර, සෙපත්, හස්" (නාමාවලිය.)

මේ ජයවර්ධන පුරය නිර්මාණයකොට අවසානයෙහි පළමුව ශ්‍රී දෙවිය ලවා ප්‍රවෙශය සිදුකරවන ලද්දේය. ඇය ඒ සඳහා ක්ෂීර සාගරයෙන් පිටත්ව එම පුරයට වඩනා දවස්හි නගරය සරසන නාගරික ජනයා විසින් පුරය හාත්පස්හි ධවල වර්ණපාදපට (පාවාඩ) අතුරන ලදහු වෙති. එය දීර්ඝ පෘථුල ප්‍රමාණයෙන් විශාලතරවූ ශොභනා ලඞ්කාරයක්ම විය. එසේම හාත්පස්හි භ්‍රාජමානවන පරිඛාව තත්පාදපට හා සදෘශව බැබලෙන බැව් මේ උපමාලඞ්කාර

යෙන් කම්පිතය. තත් පරිඛාතොමෝ මනොහර නාදයෙන් ක්‍රීඩා කරන හංස මාලාවන්ගෙන් හා ශංඛ මාලාවන්ගෙන්ද සුපුෂ්පිත පුණ්ඩරීක පුෂ්පයන්ගෙන්ද නිතර බැබලේමය. ශ්‍රී කාන්තාවගේ ප්‍රවෙශ මඞ්ගලයට ආස්තෘතවූ පාදපටයට යථොක්ත පරිඛාව උපමිත විය. මේ කාවෙහි හංසාවලීහුද ක්‍රීඩා ශක්ත ශංඛාවලීහුද පුණ්ඩරීක පුෂ්ප පඞ්ක්තීහුද යන සියල්ල පරිඛාවෙහි විශෙෂණ හැටියට දක්වන ලද්දේය. උපමාවිෂයෙහිවූ ගුණය උපමෙයවස්තු විෂයෙහිද විද්‍යමානවිය යුතුය. පාදපට (මස්තක) යෙහි සුමන මලලිකාදිය හා ලාජයන් විසුරුවා ඊමත්තෙහි කස්තූරිකාවෝ විසුරුවනලදහ. එවිට සුමන-මලලිකා ලාජයන්ගෙන් සැරසුනු පාදපටයට හංස පුණ්ඩරීක-පඞ්ක්තීන්ගෙන් ගහනවූ පරිඛාවද, පාදපට මස්තකයෙහි විසුරුවනලද සුමන පුෂ්පාදීන්ගේ මතුයෙහි බහනලද කස්තූරිකාවන්ට පරිඛාගත පුෂ්ප-සුමන-මලලිකා-ලාජ මස්තකයෙහි කෙළින ශංඛයෝද උපමිතයහයි සැලකියයුතු වේ.

14. සි රි ස ර  සසිරි පිරිපැහැ මුදුන පහ පෙ  ළ
ග න ඳ ර  දුරැර නිති දස දිගු එකෙළි සා  ළ
තු ඟු න ර  සිඟු පෙල'ග ලග සඳරිවි මඬ  ළ
දු ල න ර  නර රිදිරන් හිර වරණ තු  ළ

**අන්වය** :-සරලයි.

**සංලක්‍ෂ්‍ය** :-සිඟු පෙල + අග=සිඟුපෙලග.

මෙම ජයවර්ධන පුරය හාත්පස කරනලද ප්‍රාසාදයන්ගේ මස්තකයන්හි ස්ථාපිත ශංඛයෝ රජතමයද ස්වර්ණමයද වෙත්. රාත්‍රිභාගයෙහි ආකාශයෙන් ගමන්ගත් චන්ද්‍රමණ්ඩලය ඉතාම එම රජතමය ශංඛයන්ගේ අග්‍රස්ථානයෙහි ස්පර්ශය ලදින් යාගත තුහුහුයේම එහි රජතමය ඡත්‍රයක්සේද ස්වර්ණමය ශංඛයන්ගේ අග්‍රස්ථානයෙහි ස්පර්ශය ලදින් ස්වර්ණමය ඡත්‍රයක්සේද ඒ ඒ තන්හි පැණේ. එසේම දහවල් කාලයෙහි ගමන්ගත් සූර්ය මණ්ඩලතෙම රජතමය ශංඛයන්ගේ අග්‍රස්ථාන ස්පර්ශය ලත් ස්ථානයෙහි රජතමය ඡත්‍රයක්සේද ස්වර්ණමය ශංඛයන්ගේ අග්‍රස්ථාන ස්පර්ශය ලත් ස්ථානයෙහි ස්වර්ණමය ඡත්‍රයක්සේද පැණේ. ශංඛයෝ ඡත්‍රයෂ්ටීන්ටද චන්ද්‍ර සූර්ය මණ්ඩලවය ඡත්‍රමණ්ඩලයටද මෙහිදී සමයහ. මෙයින් ප්‍රාසාදයන්ගේ උත්තුඞ්ගභාව සඞ්ඛ්‍යාත පුර සමෘද්ධි මහත්වය ගම්‍යමානයි. මේ පද්‍යයට බොහෝ දුර සමඅදහස් ඇති රචනාද්වයක්ද මෙන්න.

සසදාවෙහි :—

"රුදු පහස කෙපුරේ-සඳ රිවි බිඹු තුඟු සිඟු
රිදී රන් හිර වරණ-තොර නොබෙදා බිජිලග"

---

14. මේ කව මුද්‍රිත පොතේ නො අයේය.

වෘත්තමාලා සන්දේශයෙහි:—

"වර මන්දිර ස්තූපික නිකරකරා-මණිඝටසී සිරෙසු විශාලතරං
නගරම්බරමණ්ඩපපත්‍රසි-සිතජාතමහං ජලතිව ඛණෙ."

15. අ න ත සිරි ඉසුරු සැපතින් වෙමින් බ ර
අ න ත පෙණ මඬුලුපෙල මැඬෙන එක ව ර
ම හ ත ගජන් කන්තල පවනින් පැහැ ර
වි ය ත වැනෙන දදතින් හැම්මෙසි මෙපු ර

**අන්වය** :—අනාකුලයි.

**සංලක්ෂ්‍ය**:—මැඬෙන-මඩ (මැඩීමෙහි) ධාතුයි. හැම්මෙසි-හම්බ (හැම්බීමෙහි-දුරීම්හි) ධාතුයි.

භොගාවලි මස්තකයෙන් පෘථිවිය දරන අනන්තනම් නාගරාජයාගේ එම භොගාවලි පඞ්ක්තිය මේ ජයවර්ධන පුරයෙහි පරිපූර්ණ සම්පත්තිභාරයෙන්යුත් පෘථිවිය දරාගත නොහැකිව නම්නවන්ටවිය. එවිට හස්තින්ගේ කර්ණතාලප්‍රහාර මාරුත වෙගයෙන් චලිතවන ධවජලක්ෂණ හස්තවලින් පෘථිවිය පහත්වන්ට ඉඩනොදී අල්ලා ගත්නාලද්දේයයි හැඟවීමෙන් සම්පත්තිසම්භාර මහත්ත්වය හා හස්තින්ගේ ගහනත්වයද ධවජයන්ගේ බහුලතරත්වයද ද්‍යොතිතයි.

පෘථිවිතලය වනාහි අනන්තනම් නාගරාජයා විසින් ස්වීය ඵණ මණ්ඩල මස්තකයෙහි තබා දරනු ලබනබැව් කවිසමයාගත කථායි. එයින් කීහු පෞරාණිකයෝ :—

" තාවත්සප්ත සමුද්‍ර මුද්‍රිතමහී භූභෘද්භිරභ්‍රංකෂෛ-
ස්තාවද්භිඃපරිවාරිතා පෘථුතරෛර්ද්වීපෛඃ සමන්තාදියම්,
යස්‍යාපාරඵණාමණෞ තිලසිතා තිෂ්ඨක්ෂණ ලක්ෂ්‍යතඃ
ශෙෂඃ සොප්‍යගමද් යදඞ්ඝ්‍රපද්මං රුද්‍රාය තස්මෛ නමඃ"යි.

නෛෂධ චරිත මහාකාව්‍යයෙහිදු :—

"ස්වශ්‍රං වරංභිමනරෙන්ද්‍ර ජායා-දිශඃ පතිර් න ප්‍රවිවෙශ ශෙෂඃ,
ප්‍රයාතු භාරංසනිවෙශ්‍ය සෘෂ්ටිනානභිම්භි ගෞරවමා සඛීස්ඃ"

16. බි ඳ ගනදුරු [1]එලිකරතත් [2]රන්තො ර ණ
ල ද බිසරුන් බිය දුරලසි මිණි තො ර ණ
බි ඳ ගියතැන් හසකුර පහරින් දෙ ර ණ
ම ද පොද ඉස සමතලකොට යෙති ව ර ණ

අන්වය:—(වෙපුර) රන් තොරණ ගනදුරුබිඳ එලිකරතත් මිණි තොරණ ලද අබිසරුන් බිය දුරලයි. හසකුර පහරින් දෙරණ බිඳගිය තැන් වරණ මද පොද ඉස සමතලකොට යෙති.

1 දුරුකරනත්. 2 "රන්" හැම.

“බි ඳ ගන්දුරු එලිකරනත් රත් තො ර ණ
ල ද බිසරුන් බිඟදුරලසී මිණි තො ර ණ

මේ පුරයෙහි රක්ත මාණික්‍යමය තොරණයෝ ඒ අවට රාත්‍රි කාලයෙහි අන්ධකාරය සිඳහෙලා ආලොකය පතුරුවන්නාහුය. එම රක්ත මාණික්‍යමය තොරණයන්ගේ අනතරනතරයෙහි විද්‍යමානවන නීල මාණික්‍යමය තොරණයෝ ඒ අවට අන්ධකාරය පතුරුවමින් කළුවර කෙරෙති. මෙසේ ඇතැම් ඇතැම් තැන ආලොකයද, ඇතැම් ඇතැම් තැන, අන්ධකාරයද ඇති රාත්‍රි භාගයෙහි අභිසාරි කාඞ්ගනාවෝ අභිරත පුරුෂයන් හා සිත්සේ හැසිරෙන්නෝ රක්ත මාණික්‍ය තොරණයන්ගේ කාන්තියෙන් ආලොකවත් ස්ථානයන්හිදී බියවැද ලජ්ජිතව කිපෙත්. අනතුරුව ඇලා නීලමාණික්‍යමය තොරණයන්ගෙන් අන්ධකාරවූ ස්ථානයට පැමිණ සිත්සේ ක්‍රීඩා කෙරෙමින් ප්‍රීතිමත්වෙති. මේ කාව්‍ය පාදදවයද ජානකීහරණ මහා කාව්‍යගත ශ්ලොකයක් ඇසුරුකොට කළසේ පෙණේ. එනම් :—

“යත්‍රක්ෂතොද්බාංහිතතාමසානිරක්තාසමනීලොපල තොරණානි,
ක්‍රොධ ප්‍රමොදෞ විදධුර්විභාභි-ණ්ඩාරි ජනස්‍ය භ්‍රමතොනිශාසු ”

සසඳාවතෙහිද පැණේ :—

“මරා මිණිතොරණ-මිණිතොරණතර මනබඳ
අඳුරුබිඳු කතුරේ-මහවේ රහස්යෝනන්”

17. වු හු වු හය සෙනග කුර රෙන් වැද තිද ස
කි ළු වු වෙතීඅෙ සැඩකරකර පහ ස
දූ මි වු 1සතට නොවදින ලෙසටඅෙ බැ ස
නො ප වු 2වලාකුළු සිවුවසී පුර අහ ස

අන්වය :–සැඩකර හය සෙනග වුහුටු කුරරෙන් වැද තිදස කිළුටු වෙතිඅෙ කරපහස බැස දූමිටු සතට නොවදින ලෙසටඅෙ (සිතා) පුර අහස නොපටු වලාකුළු සිටුවයි.

පුරාකාශ මස්තකයතෙම නිරන්තරයෙන්ම වලාකුළු පෙළින් හැමැසී ගත්තේවිය. එය වනාහි කුමක් සඳහා කවරකු විසින් කරන ලද්දක්ද යත්? නගරය හාත්පස ධාවනය කරන්නාවූ අශ්ව සමූහයාගේ කුරගැටීමෙන් හටගත් ඝනතර ධූලිරාශීහු ආකාශයට විසතිණිව යෙති. එම ධූලීහු මාරුත වෙගයෙන් ගෙනයන ලද්දෝ දෙව්පුරයට පැමිණියෝ නම් එයින්ම දෙව්පුරයතෙම කලිෂ්ටතර වන්නේය. එසේ නැතහොත් සූසියාගේ චණ්ඩතර රශ්මීහු පාවිච්

1. ගතට. 2. වලාපෙල.

යට බසිමින් පෘථිවිවාසි සද්ගුණවත් සත්ත්වයන්ගේ ශරීරයට මහත්වූ පීඩාවක් කෙරෙති. මෙසේ දිව්‍යපුරයට වියයුතු කලිෂ්ට භාවය වැළැක්වීමෙන් හෝ නැතහොත් පුරවාසි ධර්මිෂ්ට සත්ත්වයන්ට වියයුතු පීඩාව දුරුකිරීමෙන් හෝ ශාන්තියක් ඇතිකිරීම පරමාර්ථ කොට ගත් ආකාශයෙහි ගමන්කරන සූර්ය දිව්‍යරාජයා විසින් සානුකම්පා චිත්තයෙන් යුක්තව ආවරණය කරනු පිණිස ඝනතර වලාකුළු පෙළක් අහස්කුස සිටුවන ලද්දේය. වලාකුළු සිටුවීම සූර්යයා විසින් කරනලද්දක්යයි කීමෙන් සූර්යරශ්මියෙන් වලාකුළු දග්ධනුවූ බැව් ප්‍රකාශිතය. සූර්යරශ්මිය අධිකවූකල්හි ඒ කරණ කොටගෙන වලාකුළු දග්ධවෙත්. නමුදු වලාකුළු නෂ්ට නොවන සේ සූර්යයාගේ රශ්මිය පැතිරවීම යථොක්ත කාරණද්වයෙන් එක් කාරණයක් ඉටුකිරීමේ අභිලාෂයෙනැයි උත්‍ප්‍රේක්‍ෂිතය. මෙයින් නාගරික ජනයන්ගේ ධර්මපරමතාවම ප්‍රකාශමානයි.

18. මි ණි බ ද   සඳලුවල පිළිබිඹුව දිසි ස   ද
ව ත ස ඳ   සිරින් තම දිනුවයි මෙපුර ල   ඳ
නු බ මැ ද   1 සිසර හැරතුරුසෙන් ගෙන 2 නොම   ඳ
පු ද අ ද   හසින් සිපිනා වැනි මෙපුර වැ   ද

**අන්වය :**– මිණිබඳ සඳලුවල පිළිබිඹුව දිසිසඳ (කුමක්වැනිද) මෙපුර ලඳ වත සඳ සිරින් තම දිනුවයි නුබ මැද සිසර හැර නොමඳ තුරුසෙන් ගෙන වැද පුද අඳහසින් මෙපුර සිපිනා වැනි.

**සංලක්ෂ්‍යය :**– **සිසර**–මෙය මාගධ හෝ සංස්කෘත 'සඤ්චාර' ශබ්දයෙන් තද්භවවිය. අන්ත රකාරයට ළකාර වීමෙන් 'සිසළ' යසිද අදිම සකාරයට හකාරවීමෙන් 'හිසළ' යසිද, සකාර හකාරද්වයට හකාර ළකාර හා හකාරගත පිළි පෙරළිවීමෙන් 'හසළ' යසිද සිද්ධයි.

'සමත් පිරිකෙව් පිරිවට-සිසළ පිරිවැනි දූවටුන—රුවන්මල
මිට යවූ කවක් 'මයුර සන්දෙශ' යෙහි පැණේ. ඒ මෙසේයි.

දිසි මිණි නිල් සඳලුය ලිය වත කම   ල
දූක නොමලන පුල් පිපුමැයි කර කුහු   ල
සඳ පිළිබිඹු තුරුසෙත් යවගින් සක   ල
උදුරණ ලොහිත් බට වැනි බට පිපුම් අ   ල

මෙ පුරවරයෙහිවූ ප්‍රාසාදගත චන්ද්‍රශාලාවන්ගේ මාණික්‍යයන් ඔබ්බා කළ භූමිභාගයන්හි චන්ද්‍ර බිම්බය තෙම බොහෝවූ තාරකා සමූහය සමගින්ම දක්නා ලැබෙන්නේය. එය කුමක් සඳහා එහි

1 "හිසර"   2 "නිබඳ"

පැණේදයත්? තදාකාර චන්ද්‍රශාලාවන්හි ක්‍රීඩායෙහි නියැලිවූද චන්ද්‍රයාට වඩා දර්ශනීය වක්ත්‍ර ශ්‍රී ඇත්තාවූද පුරස්ත්‍රීන්ගේ වක්ත්‍රශ්‍රීයට චන්ද්‍රයා පැරදුනේ වේ. නිර්මල වස්තුවකට උපමා කළයුතු චන්ද්‍රයා ශශලාඤ්ජනය දරන හෙයින් ක්ලිෂ්ටය. එම කාන්තාවන්ගේ මුහුණු මඳවූද කිලුටක් නැත්තාහ. ක්ලිෂ්ටවූ චන්ද්‍රයා කාන්තාවන්ගේ ක්ලිෂ්ට නුවූ වක්ත්‍රයන්ට උපමා කරනු පිණිස නොගෙන කවිවර යන් විසින් නිගාකොට ඉවත්කරනලද්දේය. එවිට චන්ද්‍රතෙම සාධික කොපාවස්ථාවට පැමිණ ආකාශයෙහි සඤ්චාරයද හැරදමා ස්වීය පරිවාරභූත බහුතර තාරකා සමූහයා කැටිව පුරයට වැද ස්ත්‍රීන් හා යුද්ධයට සැරසී සිටින්නේයයි කවීහු විසින් උත්ප්‍රේක්ෂිතයි. මෙයින් පුරවනිතාවන්ගේ අසදෘශරූප සෞන්දර්යය හා ප්‍රාසාදයන්ගේ විභූති මහත්වයද ඥාපිතයයි දතයුත්තේය.

19. රු ව න් පහ කවුළුවෙන් 1 පෙණෙනා පුරඟ නා
වු ව න් සඳද සඳමඬලද දිසි ගුව නා
නු ව න් පුරා 2 දැකුමෙන් දෙකම එක තැ නා
ලෙව න් සිත සතුටුවෙසි උවමට කිය නා

අන්වය :-(මෙපුර) රුවන්පහ කවුළුවෙන් පෙණෙන පුරඟන වුවන් සඳද ගුවන දිසි සඳමඬලද දෙකම එකතැන දැකුමෙන් ලෙවන් සිත උවමට සතුටුවෙයි.

මේ පුරවරයෙහි රත්නමය ප්‍රාසාද පඞ්ක්තීන්ගේ කවුළු පඞ්ක්ති යෙන් පෙණෙන පුරස්ත්‍රීන්ගේ මුඛ චන්ද්‍රයාද ආකාශයෙහි ගමන්ගත් ප්‍රකෘති චන්ද්‍ර මණ්ඩලයද යන වස්තුද්වය එකම ස්ථානයෙහි පවත්න වුත් බැලීමෙන් ලොකවාසි සත්වයෝ අතිශයින්ම සන්තුෂ්ටවෙත්. මක්නිසාදයත්?—පුරස්ත්‍රීන්ගේ මුහුණ චන්ද්‍රයාට සමයයි කවීන් විසින් කියනලද උපමා සංසන්දනය අතිශයින්ම ගැළපෙන බව එවිට පෙනීයන හෙයිනි. මෙහි ප්‍රාසාද කවාටවලින් පෙණෙන ස්ත්‍රීන්ගේ මුඛ පඞ්ක්තියද අහස්කුස පැණෙන ප්‍රකෘති චන්ද්‍රමණ්ඩල යද යන දෙක එකතැන පෙණෙන්නේ කෙසේද යනුත් සෙවිය යුත්තේය. පුරයෙහි ප්‍රාසාද පඞ්ක්තිය අතිශයින් උත්තුඞ්ගය. එබඳු ප්‍රාසාදයෝ අභ්‍රංලිහය හෙවත් අහස්කුස ලෙවින්නෝයයි කවිසමයා ගතය. චන්ද්‍රයා ගමන්කරන මාර්ගයටත් උස්වූ ප්‍රාසාදයන්ගේ කවාට සමීපයෙන් චන්ද්‍රයා ගමන්කරන මාර්ගය ඇත්තේය. එහෙයින් එම ස්ත්‍රීහු කවුළුවලින් අත්දිගුකොට චන්ද්‍රමණ්ඩලය පිරිමැද ''අපගේ වක්ත්‍රය හා සමානි''යයි කියා අතහරින්නෝද වෙති. මෙසේ හෙයින් චන්ද්‍රයාද ස්ත්‍රීන්ගේ මුඛ චන්ද්‍ර පඞ්ක්තියද යන වස්තූහු එකම තැන දක්නා ලැබෙත්යයි කවීහු විසින් කියනලද්දේය.

1. පෙණෙන—මුද්‍රිත. 2. දකිමින්.

20. ම ණි නි ල් කැ රැ ල් ලෙ න් නැඟිරැස් තුබ වැ සි ය
ලෙ ල ර න් සොහොල් ලෙ න් පැහැවිදුලි ගැ වැ සි ය
ග ජ න ක් පි ඹි ල් ලෙ න් සෙන දියහැලි වැ ඩි ය
ගි ති මේ සි ඟ ල් ලෙ න් තුඹුවන පුර වැ සි ය

**අන්වය** :–අනාකුලයි.

21. අ ප ස ර 1ගත් වලලුත් ලා තමන් ද හා
අ ප ස ර ගෙන සරමින් නිතොර පුර ම හා
අ ප ස ර ගත් තැනටත් බැඳ 2සොරෙති නි ගා
අ ප ස ර වෙති හසඟන පුරඟනන් ම හා

**අන්වය** :–අප සර ගත් වලලුත් තමන් දහා ලා, (සලිත්) අපසර ගෙන පුරමහා නිතොර සරමින්, (තවද) අපසර ගත් තැනටත් බැඳ, නිගා සොරෙති (කියා) හසඟන, පුරඟනන් මහා අපසර වෙති.

**සංලක්ෂ්‍ය** :–ස්ත්‍රීන්ගේ ජඞ්ඝායුග්මයන්හි පැළඳි වලයාභරණයන්ගේ නාදය තෙම හංස නාදයට සමය. ගමන් විලාසය තෙම හංසයන්ගේ ගමන් විලාසයට සමය. පයොධරයෝ හංසයන්ගේ පරිපූර්ණ රූපාකාරයට සමයහ. තදාකාරනාදයද–සඤ්චාර විලාසයද ඇරගෙන හංසාකාර පරිපූර්ණත්වය ඇත්තාවූම පයොධරයන් සැට්ටලා බැඳගැනීමෙන් සැරසුනු පුරස්ත්‍රීන්ගේ පුර විපිසඤ්චාරය තෙම හංස සමූහයාට මහාජනයාගේ හෙලාදැකීමෙහිලා මුල්කරුණක්මය. ලොකයා විසින් හංසයන්ට පූර්වකාලයෙහි සම්මානකරනුලැබුවේ අන් කිසිවකුහටත් අසමවූ ඔවුන්ගේ නාද–ගමන විලාස–පරිපූර්ණත්ව යන ගුණත්‍රයයන් හෙතුකොටගෙන වේ. සලිත් පශ්චාත්කාලයෙක්හි තත්පුරයෙහි ස්ත්‍රීන් හංසයන්ගේ තත් ස්වභාවය උද්ග්‍රහණයකොට පුරුදු කිරීමෙන් හංසයන් දැකීමෙහි ලොකයාගේ පෙර පැවැති අභිලාෂිත්වය හිනතරවිය. හංසයෝද ඒ හෙතුකොට නාදකිරීම හා ගමන්කිරීමත් හැරදමා මනුෂ්‍යයන්ට නොපෙණෙන ලෙස නිලීනව සිටියාහුය යනු මෙයින් කවීනු දක්වන උත්ප්‍රේක්‍ෂාව වේ. "ගමන පැරද හසඟන පිවිසි විල්වන" (පරෙවිසන්දෙස)

**හසඟන** :–මෙය ප්‍රකෘති ශබ්දස්වරූපයෙන්ම සිට ප්‍රථමා බහුවචනය ප්‍රකාශකරනහෙයින් අවිභක්ත විභිවේ.

---

1. වත්. 2. දෙත. මුද්‍රිත.

මයූර සන්දේශ කාව්‍යයෙහි:—

"සි ය සි ය ප ත් සි ය ප ත් සුත්වූ සිරි ති
සි මි සි ය ප ත් සි ය ප ත් මෙත්වන තෙදි ති
රූපුගණ් ප ත් ග න ප ත් වල්වැද සෙදි ති
මෙ ත් ම ග ව ත් ම ග ව ත්. නොපතත් බියෙ ති"

කාව්‍යශේඛර මහා කාව්‍යයෙහි :—

"පිය බමුණු සෙදවා - නෙතිනෙත කඳුදු ර දවා
දුව ලගට කැද වා—මෙසේ අවවාද කී සො දවා

මෙහි "රූපුගණ්-බමුණු" යනු විභක්ති ප්‍රත්‍යයාශ්‍රයෙන් තොරව ප්‍රකෘති රූපයෙන් සිට විභක්ත්‍යර්ථය ප්‍රකාශකරන හෙයින් අවිද්‍යමාන විබිසි දතයුතු.

22. තො ති නි ඳු වර වතිනිඳු සිරි දුරුකෙරෙ ති
ග ති නි ඳු පුර සුරඟන රූව පරදව ති
සු සි නි ඳු තුනු පහසින් සත ගැතිකෙරෙ ති
ප ර සි ද්‍ද මෙපුරඟන රූව කවුරු පවස යි

අන්වය :-(අඟන) නෙතින් ඉඳුවර වතින් ඉඳු සිරි දුරු කෙරෙති, (එසේම) ගතින් ඉඳුපුර සුරඟන රූව පරදවති, (ඇලින්) සුසිනිඳු තුනුපහ සින් සත ගැති කෙරෙති. (එසේ හෙයින්; පරසිදු මෙපුර අඟන රූව කවුරු පවසති.

සංලක්‍ෂ්‍ය :-කවුරු-සංස්කෘත හෝ මාගධ "කතර" ශබ්දයෙන් "කවර" "කවුරු" කියා විප්‍රකාරව තද්භවවේ. "කවර-කවරෙක්-කව රක්-කවුරු-කවරහු" යනාදි සිඬවූ විභක්තිරූපයෝ වෙති.

23. ම න හ ර සුවඳ විහිදෙන නිති දසතුදෙ ස
හැ ම ව ර සුසැදි විසිතුරු සල්පිල් සහ ස
පි ය ක ර ලියන් උන් විඳ ගී නැටුම් ර. ස
බි හි දෙ ර සියෙන් සියසැදි පුර වේ දෙප ස

අන්වය :-නිති දසතුදෙස විහිදෙන මනහර සුවද හැමවර සුසැදි විසි තුරු සල්පිල්සහස ගී නැටුම්රස විඳ උන් පියකර ලියන් වේ දෙපස බිහි දෙර සියෙන්සිය (මෙ) පුර සැදි.

24. පි ළි න් පි ළ  සැදුණු මිණ්කිරණ 1 දිදු  ළි ය
පලින් පල  අඹර පවන’ඹල කෙහෙ  ලි ය
කු ළි න් කු ළ  රුවන් රැස් විහිදි කැරැ  ළි ය
පෙලින් පෙල  උදුල පහ අඳුරු දුර  ලි ය

අන්වය :– පිළින්පිළ සැදුණු කිරණ දිදුලිය මිණි පලින්පල අඹර පවන් අඹල කෙහෙලිය කුළින්කුළ රුවන්රැස් විහිදි කැරැලිය අඳුරු දුරලිය පෙලින් පෙල උදුලිය පහ (26 වන කව හා සම්බන්ධයි.)

25. දෙ රි න්  දෙර පසඟතුරු සිඳු ඝොස ර  ඟ ය
ස රි න්  සර නඟන ලියගී මනර  ඟ ය
ක රි න්  කර ලෙලවි 2 රැස්විදෙන තර  ඟ ය
උ රි න්  උර පැහැර නිති සරණ සෙන  ඟ ය

අන්වය :– දෙරින් දෙර සිඳුඝොස රඟය පසඟතුරු සරින්සර නඟන මනරඟය ලියගී කරින්කර ලෙල අවි රැස්විදෙන තරඟය උරින්උර පැහැර නිති සරණ සෙනඟය.

සංලක්ෂ්‍යය :– පසඟතුරු – ආතතය (එකැස්බෙර), විතතය (දෙඇස් බෙර), ආතත විතතය (ඇස්තුණේබෙර-අතින් සහ කඩිප්පුවෙන් ගහන බෙර), ඝනය (කයිතාලම්), සුසිරය (නළා හොරණෑ) යන පස්වැදෑරුම් තුරු (තූර්ය) වේ.

26. උ ය න්  වතු කමල් විල් අවට උදු  ලි ය
රු වි න්  බැබලි සුරඟන අයුරු පිය  ලි ය
3 ලෙව න්  සිතු සතුටුවන සව්සිරි ඉ  ලි ය
මෙසි න්  මෙපුර පුරඳුරු පුර සිරිසි  ලි ය

අන්වය :– අවට උදුලිය උයන්වතු කමල්විල් රුවින් බැබලි සුරඟන අයුරු පියලිය ලෙවන් සිතු සතුටුවන සව්සිරි ඉසිලිය මෙපුර මෙසින් පුරඳුරු පුර සිරි ඉසිලිය.

සංලක්ෂ්‍යය :– පුරඳුරු – පුරන්දරයා හෙවත් ශක්‍රදිව්‍ය රාජයායි. බෝසතාණන් ආදි උතුමන්ට උපද්‍රව ආදියක් පැමිණිවිට ඔහුගේ පාණ්ඩු කම්බල ශෛලාසනය උණුවේ. එවිට දහසක් නෙත් ඇති හෙතෙම ලොව බලා පැමිණ උවදුරු සංසිඳුවයි. ශීලවතී බිසොව, කුසරජ, දහම් සොඩ රජ, වෙස්සන්තර රජ, ගුත්තිල පඬි ආදීන්ට හෙතෙම පිහිටවිය. ඉන්ද්‍ර නමින්ද ප්‍රකට දෙදෙව් ලොවට අධිපති වූ සක්දෙව් රජුගේ අමරාවතී නම් රාජධානිය පුරඳරපුර නමින් දක්විණ. මෙහි වූ උයන 'නන්දන' නම්. 'නන්ද' යනු පොකුණය. ගුත්තිලයෙහි 401-437 දක්වා කව්වලින් පුරඳරපුර හා පුරඳර ගැන විස්තරයක් පෙණේ. (37 කවේ 'විදුරව්' පිළිබඳ සංලක්ෂ්‍යය බලනු.)

---

1. විදුලිය. 2. විහිදෙනරඟය.
3. ලෙවන් සතුටුවන සව්සිරිම ඉසිලිය
ලෙවන් සතුටුවන සව්සිරින් ඉසිලිය

මෙසේ පුරවර්ණනාව කොට තදනන්තරව තත්පුර වාසතව්‍යවූ නරේශ්වරයා පිළිබඳවූ වර්ණනාතිශයක් කරනු කැමැතිවනසේක් "මුළුලොව" යනාදිය කියත්.

### රජ වර්ණනා.

**27. මුළුලොව 1 පිරිසැපත්-සැපත්තැන්මෙන් නොවුනා,**
**මනහඳනා මහඳනා-2 රඳන සිරිසර මෙපුරේ.**

**අන්වය :-** අනාකුලයි.

**28. ස ත ර දිගත යස හර ල ම් බා පු රු දු**
**ල ත ර රූපුන් ජයගෙන පු ම් බා වි රු දු**
**නොහැර වෙතම සරදෙර ණ ම් බා සි රි දු**
**නි තො ර 3වැජඹි සිරි පැර කු ම් බා නි රි ඳු**

**අන්වය:-** යසහර සතරදිගත ලම්බා පුරුදු ලතර රූපුන් ජයගෙන විරුදු පුම්බා දෙරණම්බා සිරිදු නොහැර වෙතමසර සිරිපැරකුම්බා නිරිඳු නිතොර වැජඹී.

**සංලක්‍ෂ්‍ය:-සිරි පැරකුම්බා නිරිඳු**-මේ නරවීරතෙම බුද්ධ වර්ෂ 1958 දී ලඞ්කාරාජ්‍යශ්‍රියට පත්ව පුරා දෙපණස්වසක් ජනරඤ්ජනය කළ සවන පරාක්‍රමබාහු රජයායි. **කාව්‍යශෙඛරයෙහි:-**

"බුදුවසිනෙක් දහ ස-නවසියඅට පණස්ව ස
රිවිසඳ තෙදයස ස-පතළ නිරිඳෙක්වීයලෝකුස"

යන්නෙන් ප්‍රකාශවන්නේ මේ රජයා පිළිබඳ රාජ්‍යෝදය කාලයයි.

**මහාවංශයෙහි වනාහි:-**

"තතො අපරභාගස්මිං සම්බුද්ධස්ස සිරීමතො,
පරි නිබ්බානතො **චෙක සහස්ස නවසතූපරි**
**තිපඤ්ඤාසතිමෙ වස්සෙ** පඤ්ඤවීර ගුණාලයො."

යනාදියෙන් නිර්දිෂ්ට වර්ෂ සඞ්ඛ්‍යාව එක්දහස්නවසිය තෙපණසකි. මේ රජයාගේම කාලයෙහි ලියාතිබෙන ජ්‍යොතිර්ගණිත ව්‍යාඛ්‍යාන යවූ ගණිත සිංහ නම් සත්‍යයෙහිදු "පරාක්‍රම භුජසෙතන **මණ්ඩාසී** විශොධිතම්" යන්නෙහි "**මණ්ඩාසී**" යනු එක්දහස් නවසිය පණස යයි ගතයුතු. මේ වර්ෂද්වයම යට දැක්වූ කාව්‍යශෙඛරගත වර්ෂ සඞ්ඛ්‍යාවට මඳක් වෙනස්වේ. එක්දහස් නවසිය තෙපණසේදී සහ එක්දහස් නවසියපස් පණසේදී ප්‍රථම ද්විතීය රාජ්‍යාභිෂෙකය ලැබ පස් වසක්ම ශත්‍රු මර්දනය කිරීමෙහි යෙදී සිට එක්දහස් නවසිය අට පණස් වසේදී ලඞ්කා රාජ්‍යය එකච්ඡත්‍රාඞ්ක කළසේ සිතීම ගැළපෙන

1. සිරි සැපත් 2. රඳන රදසිරිමෙපුරේ 3. පවති

හෙයින් මේ වර්ෂ සංඛ්‍යාත්‍රයම ගතයුතුවේ. නානාවිධ ශාසන සංග්‍රහ කෙරෙමින් ජනරඤ්ජනවෘත්තිතත්පරව දෙපණස් වසක් මුලුදෑ රාජ්‍යයකළ මේ රාජ්‍යා ගැනම එකල වැජඹුනු කවිවරයන් විසින් උසස්ලෙස සන්දෙශාදිය තනමින් වර්ණනාකර තිබේ.

රි වි කි ම් බා පුරෑ රිවිකුල කමල ක ර
පි යු ම ම් බා නිතොරම රැඳි උරමැද ර
මෙ න ර ම් බා සිමි රුසිරිනි පැහැස ර
**පෑ ර කු ම් බා** නරනිඳු සඳ දකු මිතු ර-සැළ.

ස ත කු ම් බා සිරිපුරෑ ගුණැති තිරස ර
මෙ න කු ම් බා යොත් පාකල රූපු සපු ර
බ ද කු ම් බා සරි යදිදන නදන ක ර
**පෑ ර කු ම් බා** නරනිඳු දින මෙ පුරව ර-පරෙවි.

ප ව ර ඉසුරු පරසිදු ද ම් බා වි රූ දු
වි රූ දු නිරිඳු මතගජ පු ම් බා මි සි දු
ස ත ත සුසිරිනය නොක ල ම් බා පු රූ දු
වැ ජ ඹි සොඳුරු සිරි **පෑර කුම්බා** නි රි ඳු-ගිරා.

නම්න් **පෑරකු ම් බා**–නෙදින් රූපු නොදත ම් බා
රූදු විරූදු පු ම් බා-වැජඹි පුළුපුර සිරි ඔලො ම් බා-කවිසේ

**සිරිඳු:**–ලක්ෂ්මී-ශ්‍රී කාන්තාව-ශ්‍රී දේවී. මී ලඟ කවෙහි "අඹා" පිළිබඳ සංලක්ෂ්‍යය බලනු යගයේ.

**වැජඹි:**–අතීත කාලරූප මේ ක්‍රියාපදයෙන් වර්තමානාර්ථය ප්‍රකාශ වන හෙයින් මෙය ක්‍රියා විපර්‍යාසයයි. මෙහි ධාතු ප්‍රකෘතිය "වැජඹ" යනුයි. මෙය විජෘම්භ (සංස්කෘත) හෝ විජම්භ (මාගධ) හෝ යන්නෙහි තද්භවවිය.

**B නවද ආඛණ්ඩලාඛණ්ඩ ගුණෂණ්ඩ මණ්ඩිත පණ්ඩිත ජන පුණ්ඩරීක මාර්තණ්ඩ මාර්තණ්ඩකුලොද්භූත භූමණ්ඩලෙශ්වර පරාක්‍රමබාහු නරෙශ්වරයාගේ මෙද එක් වර්ණනා භාෂණයෙකං එද නා කර්ණ භූෂණය කර.**

**29. සි ත් නි ති යෙ න් මුනිඳුදයට න මා ලී ය**
**ස ත් ගු ණ යෙ න් 1සතසිතතොස අ මා ලි ය**
**ග ත් වි කු මෙ න් රූපු නිරිඳුන් 2 ද මා ලි ය**
**මෙ ත් සි ලි ලෙ න් මුළු නොදියක නො මා ලි ය**

---

1. සච්ඡන සිත අමාලය.   2. නමාලිය-වැඩියක්ම.

**අන්වය** :-(මෙනිරිඳු) නිතියෙන් මුනිපුදයට සිත් නමාලිය සත්ගුණයෙන් සත සිත නොස අමා ලිය විකුමෙන් ගත් රුපු නිරිඳුන් දමාලියමෙන් සිලිලෙන් මුදුනෙදියත නෙම ලිය.

**සංලක්‍ෂ්‍ය-අමා**:—මෙය දෙව්ලොව්වැසි දෙවියන්ගේ භොජනය වේ. **පීයූෂ මමෘතංසුධා**—යනු අමරකොෂ හෙයින් "**පීයූෂය-අමෘතය-සුධාය**" යනුද මීටම නම්වේ. මේ අමාරසය වනාහි දෙවියන් විසින් වලඳනු ලබන්නේ දෙවියන්ගේ ජරා ව්‍යාධි දුරුවීමෙන් නිජ්ජරභාවය ඇතිවීමටයයි කියා තිබේ.

"පුරාදෙවා සුරාඃ සර්වේ ජරා මෘත්‍යුභයාර්දිතාඃ,
පරස්පරඤ්ච සඞ්ගාය රත්නාන්‍යාදිත්සවො'' භවන්.

තතඃ සුරාසුරාඃ සර්වේ ක්‍ෂීරොදං සාගරොත්තමම්,
උද්ධෘතාමපිතුං තඤ්ච බභූවුර් මුනි නන්දන!''

"අමෘතාපීං මහායුධං සම්බභූවුර්යෙෂිණම්,
සුරාණාම සුරාණාඤ්ච මිථඃ සංසක්‍තබද්ධචෙතසාම්.''

සනාදි ශිව මහාපුරාණෙක්ති පරිද්දෙන් ඒ මේ අමෘතයාගේ උද්භවයතෙම මෙසේ දතයුත්තේය. පූර්වකාලයෙක්හි සුරාසුර සමූහයන්ටද මනුෂ්‍යයන්ට මෙන්ම ජරාරොග පහළවීමෙන් නිතර නිතර නොයෙක් පීඩා පැමිණෙන්ට විය. ඉක්බිති සියලු සුරාසුර සමූහයෝ රැස්ව ඊට කටයුතු විධි පිළිබඳව මන්ත්‍රණය කරන්නෝ "ක්‍ෂීර සාගරයෙහිවූ අනර්ඝ රත්නයන් පැළඳීමම ප්‍රතිකාරය වන්නේය"යි නිශ්චය කොට්න් සියල්ලෝම එකමතිකවූහ. එය කුමකින් අලළමෝදැයි කථාවක්ද උපන් කල්හි එය විනිශ්චය කරගැනීමට ඊශ්වරයා වෙත පැමිණ ඒබව සැලකොට ඊශ්වරයාගෙන් වරලැබ වාසුකී නම් නාගරාජයා රැහැණක් කොටගෙන එයින් මන්දර පර්වතය වෙළා සාගරය ඇළලූහ. ඊශ්වරාඥපනවූ එම දෙවාසුරයන් එසේ ක්‍ෂීර සාගරය අලළන කල්හි ශ්‍රී දෙවිය-කෞස්තුභ පාෂාණය-සඞ්ඛය පාරිජාත වෘක්‍ෂය-අමෘතය යන මේ වස්තු හා තවත් බොහෝ වස්තූහු එම ක්‍ෂීර සාගරයෙන් පහළවූහ. එයිනුත් ශ්‍රී දෙවිය-කෞස්තුභ පාෂාණය-ශඞ්ඛ යන මොවුන් විෂ්ණු දිව්‍ය රාජයාද, පාරිජාත වෘක්‍ෂය ඉන්ද්‍රයාද ගත්තෝය. අමෘතය වනාහි දෙවාසුර යන දෙපක්‍ෂය විසින්ම ගැනීමට කැමැතිවන ලදින් අසුරයෝ දෙවියන්ට නොදී තනිකොට ගැනීමටද, දෙවියෝ අසුරයන්ට නොදී තනිකොට ගැනීමටද බොහෝ ව්‍යායාමකොට බියකරු යුද්ධයක් කළෝය. එසේවිට ඉන්ද්‍රයා ප්‍රමුඛකොට ඇති දෙවියන් මැඩපවත්වා බලි නම්

අසුර රාජයා ප්‍රධාන කොට ඇති අසුරයන් විසින්ම මහත්වූ තේජස් පෙන්නා එම අමෘතය තෙම අත්පත්කරගන්නා ලද්දේය. එසේ අමෘත රසය පැහැර ගැනීමෙන් අසුරයන්ගෙන් අධික පීඩා ලද්දාවූ ඉන්ද්‍රයා ප්‍රමුඛකොට ඇති දෙවසමූහයෝ ඊශ්වරදෙවයා වෙත ගොස් තමන්ටවූ විපත සැලකළෝය. ඉක්බිති ඊශ්වරයාගේ අනපරිද්දෙන් විෂ්ණු දිව්‍යරාජයා විසින් මනොහර ස්ත්‍රී රූපයකින් යුක්තව ගොස් අසුරයන් මායාවෙන් වසඟකොට මුළාබවට පමුණුවා එම අමෘරසය බෙදාදෙනලෙස අසුරයන්ගෙන් ඇරගෙන දෙවියන්ගේ ජරාව්‍යාධි දුරුවීම පිණිස පානය කරනු පිණිස දෙවියන්ටම දෙනලද්දේවිය. දෙවියෝද එම අමෘත රසය පානය කළෝය. ඒ හෙතුකොටගෙනම අද දක්වාත් එය පානයකරන දෙවියන්ගේ ජරාරුජා දුරුවීමෙන් නිර්ජර භාවය වන්නේයයිද එහෙයින්ම දෙවියෝ නිර්ජරනම් වෙත් යයිද කියා තිබේ. (ශිව මහාපුරාණයෙහි තෙවෙනි ශතරුද්‍ර සංහිතා ගත එක්විසිවන-දෙවිසිවන-තෙවිසිවන අධ්‍යායයන්හි මෙය සවිස්තර රව තිබේ.)

**30.** ම නු ර ද 1සිරිත් සකසින සිත 2 ඇඳ ලී ය
ම න න ද රුසිරඳන ලිය ඇස ඇස ලී ය
පි රි සි ඳ නැනින් සත්වග දුක් දුර ලී ය
ඇ ම ස ඳ මෙරද බෝසත් සිරි ඉසි ලී ය

**අන්වය:**-සරලයි.

**සංලක්ෂ්‍ය:**-රුසිරු + අදන = රුසිරදන.

**මනුරද:**-මේ මනුරජ තෙම මෙම කල්පයෙහි මනුෂ්‍යයන්ගේ ප්‍රාදුර්භාවයට පූර්වයෙන් ස්වයම්භූ නමින් ප්‍රාදුර්භූතවූ ශතරූපා නම් කන්‍යාව හා සමගින් එක්වූයේ ප්‍රියව්‍රත—උත්තානපාද යන පුත්‍රයන් දෙදෙනෙකුත් හා දෙවහූති-අකූති-ප්‍රසූති යන දූන් තිදෙනෙකුන්ද ලද්දේයයි කියා තිබේ. මේ මනු රජයාගේ පුත්‍ර දුහිතෲන්ගෙන් සියලු මනුෂ්‍යයෝ පැවතෙන්නෝ වෙතියි දතයුතු. යටදැක්වූ මනුරජතෙම මනුෂ්‍යයන්ට වුවමනා වන ධර්මයන් උපදවා මනුෂ්‍යයන්ගේ කාසි පටිපාටියද ඇතිකරලීය. රාජධර්ම-ස්ත්‍රීධර්ම-ධර්මාචරණ- යනාදි කටයුතු පිළිවෙළද මේ රජ විසින්ම සම්මතකොට පවත්වන ලද්දේය. ඒ සියල්ලක් මානව ධර්ම හෙවත් මනු රාජචරිත්‍ර නම් වේයයි කියනු ලැබේ.

**31.** රූ පූ ස යු ර ට කඟ මෙරමනකොට නෑ කි ය
න ද යු ද ය ට වැද මඳකුත් නොවැළී කි ය
න ම වි කු ම ට සරි නිරිඳකු නොසැල කි ය
නි ති මු ලු ර ට සක සියැසක් ලෙස රැ කි ය

**අන්වය:**-සුබොධයි.

1. සිරිත්. 2 ඇදලීය.

32. නො ප ම ණ 1 ගිමන් බඳසුන් තැනකට කලෙ ක
එ දෙ ර ණ තෙමා සපැමිණි මෙන් මේ කුලෙ ක
කු රු ප ණ රජුන් පෙර රජ කල මෙ සිරිල ක
ස පැ මි ණ ගුණෙන් වැජඹෙන 2මොහු බෝසතෙක

**අන්වය :**-කලෙක නොපමණ ගිමන් බඳසුන් තැනකට එදෙරණ තෙමා සපැමිණි මේ කුලෙක මෙන් පෙර කුරුපණ රජුන් රජකල මෙසිරිලක සපැමිණ ගුණෙන් වැජඹෙන මොහු බෝසතෙක.

**සංලක්‍ෂ්‍ය:**-එතත්පද්‍යයෙන් මෙම පරාක්‍රමබාහු රජහුගේ වීරභාව සම වර්ණිතය. කාලයක් සූර්යසන්තාපාධික්‍යයෙන් ජලය සිඳීයාම හෙතුකොටගෙන වියලීගිය පෘථිවි ප්‍රදෙශයක්තෙම පසු කලකදී මහාමෙඝ ජලයෙන් නිවීම් සඞ්ඛ්‍යාත ශාන්තියට පත්වන්නේ යම්සේද එමෙන්ම දීර්ඝතර කාලයක්ම කෘපණරාජයන්ගේ රාජ්‍යභාරයෙන් පීඩිත-දුඃඛිත ප්‍රජාවන් ඇති මෙම ශ්‍රී ලඞ්කාඞ්ගනාවද මේ පරාක්‍රමබාහු රජහුගේ ප්‍රාදුර්භාවයෙන් ශාන්ත භාවයට පැමිණි බැව්ම ප්‍රකාශිතය. ලඞ්කාතලයට සාධික පීඩා කළ කෘපණ රාජයෝනම් මිථ්‍යාදෘෂ්ටිකවූ මාඝරජය-චන්ද්‍රභානු නම් ජාවක රජය-ආර්‍ය චක්‍රවර්ති නම් දමිල රාජය යනාදීහු වෙත්. මොවුන් විසින් කලින් කල කරන ලද රාෂ්ට්‍රවිලොප-ශාසන විලොපාදිය ඉතා දරුණුබව :—

"අථ ලඞ්කානිවාසීනං ජනානං යෙහි කෙහිචි,
පාපකම්මෙහි ලුද්ධෙහි සමුස්සන්නතරෙහි තු.

ලඞ්කාරක්ඛානියුත්තාසු දෙවතාසු තහිං තහිං,
තදා උපෙක්ඛමානාසු කත්තුං ආරක්ඛනා විධිං.

මිච්ඡාදිට්ඨි සමාදින්න දුන්නීති නිරතාසයො,
දානාදිකුසලාරඤ්ඤගුම්බදාහදවානලො.

සද්ධම්ම කුමුදසෙණී සඞ්කොචච්ඡිභානුමා,
ඛන්තිපඞ්කජිනීපන්ති කන්තිකන්තනචන්දිමා.

මාඝොනාම මහාමොහා' මොසිකතවිචාරණො,
කාලිඞ්ගකුලසම්භූතො එකො රාජා අධම්මිකො.

චතුවීසතියා යොධ සහස්සානමධිස්සරො,
ඔතරිත්වා කලිඞ්ගම්හා ලඞ්කාදීප මගණ්හි සො:—"ති.

"අථෙකාදසමෙ වස්සෙ සම්පත්තෙ තස්සරාජිනො,
තදා ජාවක රාජෙකො චන්දභානූති විස්සුතො.

1. ගිමන්. 2. මෙ.

මයම්පි සොගතා: එව ඉතිමායං විධාය සො,
සබ්බං ජීවකසෙනාය කක්ඛලාය සමොතරී–’’ති.

“අරියසච්චකකාවත්තිති විසසුතො නාරියො’පි සො,
දමිලාධිපතී කොචි මහාමච්චො මහබ්බලො.

ඔතරිත්වාන තං රට්ඨං පහරිත්වා ඉතො තතො,
පවිසිත්වා මහාදුග්ග වරං සුභගිරිං පුරං–’’සි.

යනාදී මහාවංශ ප්‍රවෘත්තිවලින් පෙනේ. මේ රජුන් විසින් ඒ ඒ කාලවල කරනලද දරුණුවූ නානාවිධ රාජ්‍ය හානිය සහ ශාසන හානියද ඉතා භයඞ්කර වෙත්මය. මේ උපද්‍රවයන්ගෙන් සමහරක් ඊට අනතුරු කාලවලදී පහළවූ ඒ ඒ රජුන් විසින් සන්සිඳුවන ලද නමුත් එයින් ප්‍රජාවන්ට සම්පූර්ණ ශාන්තියක් නොවීයයිද ඒ අතර පහළවූ සමහර රජවරුන් ඒ කිසිවකට අසමර්ථව විසූ බැව්ද කිය යුතුය. මේ පරාක්‍රමබාහු රජයා වනාහි තමන්ගේ රාජ්‍ය කාලයවූ දෙපණස් හවුරුදුතුළ විනාශිත තත් ස්ථානයන් සියල්ලම යථා ස්ථානයෙහි පිහිටුවා තදන්‍යවූද මහත්වූ ලොකශාසනාභිවෘද්ධි කිරීමෙන් ලඞ්කාඞ්ගනාවට විශෙෂශාන්තියක් කළබව පෙනේ.

**බෝසත්:**—“එවරූපෙ ඛන්ධ සන්තානෙ වොහාර සුඛත්ථං සත්ත පුග්ගලාදී වොහාරො ආරොපිතො. එවං වොහාරප්පත්තො සත්තො යාවබොධි ඤාණත්ථාය නවායමති. පනිධානං න කරොති. තාව සත්තොත්වෙව සඞ්ඛං ගච්ඡති. යතො පට්ඨාය බොධිඤාණත්ථාය වායමති. පනිධානං කරොති. තදා බොධිසත්තොනාම හොති. සො යදා බොධිඤාණං පටිලභති තදා බුද්ධො නාම හොති’’ යනු ජිනාලඞ්කාර වණ්ණනා හෙයින් “රූපාදි ස්කන්ධ සන්තානයෙහි ව්‍යවහාර සුඛය පිණිස සත්ත්ව පුද්ගලාදී ව්‍යවහාරය ආරොපිතවිය. මෙසේ ව්‍යවහාරප්‍රාප්ත ස්කන්ධයතෙම **යම්තාක්කල්** බුද්ධඥානය පිණිස ව්‍යායාම නොකෙරේද, ප්‍රණිධාන නොකෙරේද, ඒ තාක් සත්ත්වයා යන සඞ්ඛ්‍යාවට පැමිණේ. යම් කාලෙක පටන් බුද්ධඥානය ලැබීමට ව්‍යායාම කෙරේද, ප්‍රණිධාන කෙරේද, එකල්හි **බොධිසත්ත්ව** නම්වේ. හෙතෙම යම්කාලෙක්හි බොධිඥානය ලබාද එකල්හි **බුද්ධ**නම් වේ’’යයි ප්‍රකාශිත හෙයින් බුද්ධඥාන ලාභයට පාරමිධර්ම යන් පුරණ පුද්ගල තෙම **“බොධිසත්ත්ව”** යයි කියනු ලැබේ. ඒ මේ බොධිසත්ත්වවරුද “එතෙච හෙද පඤ්ඤාධිකා-සද්ධාධිකා-විරියාධිකා වසෙන ඤාතබ්බා’’ යනු හෙයින් ප්‍රඥාධික-ශ්‍රද්ධාධික-වීර්‍ය්‍යාධික වශයෙන් ත්‍රිප්‍රකාරවෙති. ප්‍රඥාධික බොධිසත්ත්වයන්ගේ වනාහි ශ්‍රද්ධාව මන්දය, ප්‍රඥාව තීක්ෂ්ණය, වීර්‍ය්‍යය මධ්‍යමය: එහෙයින් ඒ ප්‍රඥාධික බොධිසත්ත්වයන්ට සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක්ම පාරමී ධර්මයන්

පිරිය යුතු කාලය වන්නේය. ශ්‍රද්ධාධික බෝධිසත්ත්වයන්ගේ ප්‍රඥාව මධ්‍යමය. එහෙයින් ඒ ශ්‍රද්ධාධික බෝධිසත්ත්වයන්ට අටාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක්ම පාරමී ධර්ම පිරියයුතු කාලය වන්නේය. වීර්‍යාධික බෝධිසත්ත්වයන්ගේ ප්‍රඥාව මධ්‍යමය. එහෙයින් ඒ වීර්‍යාධික බෝධිසත්ත්වයන්ට සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක්ම කාලය පාරමීධර්ම පිරියයුතු කාලය වන්නේය.

**33. පු න් ස ඳ වන් වතසිරි පෙන්වා ලොව ට**
**ර න් ක ඳ මෙන් බබලන මෙනිරිඳුන් දු ට**
**ම න් ම ද වෙයි දූන් මදරජුගේ සිත ට**
**ම න් ම ද යයි යනු සුතු වෙයි ඉන් ඔහු ට**

**අන්වය:**–පුන්සඳවන් වතසිරි ලොවට පෙන්වා රන්කඳමෙන් බබලන මෙනිරිඳුන් දුට දූන් මදරජුගේ සිතට මන්මද වෙයි ඉන් ඔහුට මන්මදයයි යනු සුතුවෙයි.

**සංලක්ෂ්‍ය:**–**මන්මද**–නම්අනඞ්ගයායි. මුළාකරවීමය, විකල කරවීමය, වියලීමය, තැවීමය, නොසෙල්වන බවය යන ගි පසක් මොහුට තිබේ. උක්දඬුයෙන් තැනූ දුන්නකින් මේ හී විදියි. ඒ දුන්නේ දුනුදිය භෘඞ්ගාවලියකි.

දර්පයෙන් ගම්වූ අනඞ්ගයාහට 'මන්මද' යනු පෙර අන්වර්ථ වශයෙන් අයොග්‍යවුවද දූන් මේ පැරකුම් රජුගේ රූසපුව දුක්මෙන් දර්ප රහිතවන බැවින් ඒ අන්වර්ථ වශයෙන්ම යොග්‍ය බැව් මින් ප්‍රකාශිතය.

**4. ද න් දෙනසැපි අපගෙන් දූනගෙන මෙබ ඳු**
**ද න් දෙනරඟ කරවයි යනමෙන් පුරු දු**
**ද න් දෙනු දූක මොහු සුරමිණි සුරතුරු දු**
**ද න් නොලබන සුරපුරගිය වැනි පසි ඳු**

**අන්වය:**–සුරමිණි සුරතුරුදු මොහු දත්දෙනු දූක දත්දෙන සැපි මෙබඳු අපගෙන් දූනගෙන දත්දෙනරඟ පුරුදුකරවයි යනමෙන් දත් නොලබන පසිඳු සුරපුර ගියවැනි.

**සංලක්ෂ්‍ය:**–දිව්‍යමාණික්‍යයයි කියනලද චින්තාමාණික්‍යයද කල්පවෘක්ෂයද යන උභය වස්තූහු මෙකල්හි දෙව්ලෙව්හි පවත් නෝය. එහි ඔවුන්ගේ ප්‍රවර්තනය වූකලී කිනම් අර්ථයක් අවබෝධ කරවනු පිණිස වන්නේදයත්?:—දෙව්ලෙව්හි කිසිවකුහටත් අභිප්සිතාර්ථ ප්‍රසවය කිරීමට සමර්ථවූ කිසි වස්තුවක් අවිද්‍යමාන හෙයින්ම දෙවියන්ට දන් දෙනසැටි උගැන්වීම පිණිස වන්නේය. යලිත් මොවුන්ගේ දාන ශිල්පය කවරකුගෙන් උද්ග්‍රහණය කරන ලද්දක්ද

යත්? සකල සත්ත්වයන්ටම අභිමතාර්ථය ප්‍රදානය කිරීමෙන් නිරතුරුවම උදාර ප්‍රසාදයක් පහළකරන පරාක්‍රමබාහු රාජයාණෝරෙන් උද්ග්‍රහණය කරන ලද්දේය. එම සුරමිණි-සුරතුරු යන උභය වස්තූහු පෙර නුදුටුවිරූ පරාක්‍රමබාහු රාජයාගේ දානමහත්ත්වය දැක විස්මයප්‍රාප්ත වූවෝ "දානය කරන ආකාර අපගෙන් ඉගෙන සුර ලෙව්හිදු පරිචය කරවිය''යි ඉගැන්වීමට මෙන් සුරලොවට ගියහයි රාජයාගේ දානමහත්ත්වය කවිහු විසින් උත්ප්‍රේක්‍ෂා ලඞ්කාරයෙන් සැරසීපරිදියි මේ.

**සුරමිණි**:-මෙහි අර්ථය චින්තාමාණික්‍ය යනුයි. මේ අර්ථයම **"සිතුමිණි-සිත්මිණි-දෙවන්මිණි"** යන ශබ්දවලින්ද ප්‍රකාශවේ. චින්තාමාණික්‍යාර්ථවාචි සුරමිණි ශබ්දයක් සිංහල භාෂාවේ අතිශයින්ම විරලමුත්:--

"ලෙ ව් හට තමන් නම කිව රිසිදෙන ව් සි හි
දෙ ව් තුර සුරබි **සුරමිණි** සරිද කෙලෙ සි හි
ප ව් රෝ දුකුදු දුරලන පොකුර'ඹ හ සි හි
දෙ ව් වෙද ඇසෙන පමණෙක වියතුන් බ සි හි

යන සැළලිහිණි සඳෙස්හී කවෙන් **"සුරමිණි"** යනු චින්තාමාණික්‍යයයි දත්නාලැබේ. **"දෙවමිණි"** යන්නට සංස්කෘත භාෂාවෙන් ටීකා ලිවූ පඬිවරයන් **"කෞස්තුභපාෂාණ"** යයි අර්ථලියා තිබේ. **"සුරමිණි-දෙවමිණි"** යන ශබ්දද්වයෙන්ම එකම අර්ථයක් වාච්‍ය වනසේ පෙණෙන නමුත් **"සුරමිණි"** නම් අනෙකක්ද **"දෙවමිණි"** නම් අනෙකක් දැයි සුධිහු විමසත්වා.

**35. ය ස සේ පවතිනාමෙන් මුළුදියත මෙ තු න්**
**වි ල සේ දක්වමින් පෙර පසිඳු බෝස තු න්**
**සොඳ සේ සැප විඳිනලෙස පරපුරෙක දෙ තු න්**
**සි තු සේ දෙවසි යදිනට තිමදගල ඇ තු න්**

**අන්වය**:-මෙමුළුතුන්දියත යසසේ පවතිනාමෙන් පෙර පසිඳු බෝසතුන් විලසේ දක්වමින් දෙතුන් පරපුරෙක සැප සොඳසේ විඳිනලෙස තිමදගල ඇතුන් යදිනට සිතුසේ දෙව්යි.

**සංක්‍ෂේපය**:-**තිමදගලඇත්**-ශුණ්ඩාග්‍රච්ඡිද්‍රාවය-සොඬඅගවූ දෙසිදුර මෙඪ්‍රය හෙවත් ලිංගය යන ස්ථානත්‍රයෙන් ගලිතවන මදජලය ඇති හස්තිතෙම **"තිමදගල ඇත්"** නම් වේ.

**36. දි ය ර ම් බලවිකුම් පෙන්වූ මුළුදෑර ණ**
**ම න ර ම් මෙනරනිඳුගේ දියහිය සර ණ**
**වි හි ගු ම් බුජග දිළියම දිව්සෙ කුරූප ණ**
**සා ග න ම් රුදු විරුදුරද මුදුන 1 හෙන සෙණ**

---

1 කුඹු.

**අන්වය:**-රම් දිය (හොහොත්) දියරම් බල විකුම් මුහුදෙරණ පෙන්වූ (එහෙයින්ම) දියහියකරණ මනරම් මෙනරනිඳුගේ බුජග විහිගුම් ඇලි යමදිවසේ කුරුපණ කගනම් රුදු විරුදුරද මුදුන හෙන සෙණ.

**සංලක්ෂ්‍ය:**-**දියරම්**-රාමරාජයා ජයග්‍රහණයෙහි අතිසමීපය. එහෙයින් ජයරාම-දියරම් ඈ විසින් පසිඳුය. රාමරාවණ යුද්ධය සිහිකරමු. දසගිව්-දසිස් නමින් ප්‍රසිද්ධ පෙර කලෙක ලක්දිව රජකල බලසම්පන්න **රාවණ** රජු හා දෙව්ලොව් වසක් සුදකොට සීතා (ජානකී දේවී) මිදා ගෙන දඹදිවට ආපසුගියේ දශරථ රජහුගේ පුත් **රාමය.** මේ සටනෙහිදී රවුලා (රාවණ) මැරී රම්රද. මේ යුද්ධයෙන් රාම වික්‍රමය ප්‍රකටවිය.

රුදුරු ගුණ දසගිව් ස ද
පසිඳුවූ ලෙස රම් ර ද (ගුත්තිල)

**37.** ස යු ර ම වදින මහගං නැවති නැ න් නැ න
අ ඹු ර ම බියව රිවිසඳ සිටපු නැ න් නැ න
වි දි න ම බැරිව විදුරවි පැකිලි නැ න් නැ න
සු ද ස ම පැමිණ මෙනිරිඳු පැරැදී නැ න් නැ න

**අන්වය:**-සරලයි.

**සංලක්ෂ්‍ය:**-සිටපු-'සිට' යන ධාතු ප්‍රකෘතිය කෙරෙහි පරව යෙදුනු "පු" යනු ප්‍රත්‍යය විශෙෂයක් ලෙස සැලකිය යුතුය. මේ ප්‍රත්‍යය මෙහි කර්මාර්ථයෙහිද "සිටපු මිනිසා-සිටපු ගවයා" යනාදි තන්හි කර්තෘ අර්ථයෙහිද යෙදුනු අයුරු පෙණේ.

**විදුරවි:**-සක්දෙව් රජහුගේ මේ ආයුධයතෙම වජ්‍රමය අසුරි වලින් නිර්මිත හෙයින් 'වජ්‍රායුධය'යි කියනු ලැබේ. වජ්‍ර නම් කිසි වකිනුත් නොබිඳිය හැකි නොකැඩිය හැකි ශ්‍රේෂ්ඨතර ද්‍රව්‍ය ජාතියෙකි. අංගුත්තරතිකනිපාත පුද්ගලවග්ග "සෙය්‍යථාපි භික්ඛවෙ! වජිරස්ස නත්ථි කිඤ්චි අභෙජ්ජං මණි වා පාසාණො වා" මහණෙනි! යම්සේ වජ්‍රයෙන් නොබිඳිය හැකිවූ මැණිකක් හෝ පාෂාණයක් හෝ නැත්තේ වේද"යි වදාළ හෙයින්ද:—

"පෘථිව්‍යං යානි රත්නානි-යෙචා'න්‍ය ලොහජාතයඃ,
තානි වජ්‍රෙණ ලිඛ්‍යන්තෙ-වජ්‍රං නාන්‍යෙන කෙනචිත්."යි

පෘථිවියෙහි මණිමුක්තාදිවූ යම් රත්නකෙනෙක් වෙද්ද යම් ලොහ ජාති කෙනෙකුත්වෙද්ද ඒ සියල්ලෝම වජ්‍රයෙන් කපනු ලැබෙත්. "වජ්‍රය වනාහි අන්කිසිවකින් නොකපනුලැබේ" යනු වෘද්ධ වචන හෙයින්ද වජ්‍රය වනාහි සකල රත්න ජාතින් හා ලොහජාතීන් කැපීමෙහි නොවැළැක්වියහැකි ශක්තියක් ඇති ද්‍රව්‍යයක් බව හා එම ශක්තිය අන්‍ය ද්‍රව්‍යයක අවිද්‍යමානබවත් හැඟේ. එහෙයින් ඉන්ද්‍රයාගේ එම වජ්‍රායුධයතෙම සියලු පුද්ගල-පර්වත-වෘක්ෂාදිය සිඳබිඳහෙලා ජයගැනීමට හැකිවූ අප්‍රතිහත ශක්තියක් ඇති වස්තුවකැයි දත යුතුවේ.

ඒ මේ වජ්‍රායුධය වන කවරෙකුගේ ඇටවලින් කුමක් සඳහා කවරෙකු විසින් කරන ලද්දක්ද යත්? මේ වජ්‍රායුධයතෙම * දධීචි නම් මුනිවරයාගේ ඇටවලින් වෘත්‍රනම් අසුර රජයා නැසීම පිණිස ඉන්ද්‍රයා විසින් ආඥාපනවූ විශ්වකර්මදෙවයා විසින් කරන ලද්දේය. එහි විස්තර කථාතොමෝ මෙසේ දත යුත්තිය.

"තස්‍ය තද්වචනං ශ්‍රුත්වා දධීචො හි මහාමුනිඃ,
වනං ජගාම තපසෙ මහත්ප්‍රීත්‍යා ශිවං ස්මරන්."

"දෙව! දෙව! මහාදෙව! මහ්‍යං දෙහි වරත්‍රයම්,
වජ්‍රාස්ථිත්ව මවධ්‍යත්ව මදීනත්වංහි සර්වථා,
තදුක්තවචනං ශ්‍රුත්වා ප්‍රසන්නඃ පරමෙශ්වරඃ,
වරත්‍රයං දදෞ තස්මෙ දධීචාය තථාස්ත්විති."

යනාදි ශිවමහා පුරාණ රුද්‍රසංහිතා සතීඛණ්ඩ අෂ්ට ත්‍රිංශද්ධ්‍යායයෙහි දක්නා පරිද්දෙන් "බ්‍රාහ්මණ වංශීය" භාර්ගව ගොත්‍රයෙහි ජාතවූ අථර්ව මුනිහු විසින් කර්දම ප්‍රජාපති කන්‍යාව කෙරෙහි උත්පාදිතවූ දධීචිනම් ඇත්තාහු ක්ෂත්‍රිය වංශීය ක්ෂුවනම් රාජයා හා සමග කළ සටනේදී එම රජහු විසින් පරාජයට පත්කරනලදී. දධීචි තෙම වනයට වැද ඊශ්වරාරාධනය පිණිස දුෂ්කර තපස් රැක්කේය. ඉක්බිති ඔහු කෙරෙහි ප්‍රසන්නතරවූ මහේශ්වරතෙම ඔහු ඉදිරියෙහි දෘශ්‍යමාන රූපයෙන් පහළවිය. ඒ දුටු දධීචිතෙම එම දෙවියා පහදවා වජ්‍රාස්ථි බවද-අවධ්‍යබවද-අදීනබවද යන වරත්‍රය ඉල්විය. ඊශ්වර තෙම ඔහුට එම වරත්‍රය දෙන්නේ ඔහුගේ දේහාස්ථි සියල්ලම වජ්‍ර වලින් යුක්තකොට මවා අන්තර්ධානවිය. මහේශ්වරයාගෙන් වරලැබ ප්‍රීතිමත්වූ දධීචි මුනිතෙම වහා ගොසින් යට දැක්වූ ක්ෂුව රාජයාට පයින්ගසා හෙළීය. එවිට ක්ෂුව රාජතෙම තමා ළඟ තුබුනු වජ්‍ර දණ්ඩයකින් දධීචි මුනිහට ගැසීය. එයින් කිසිත් පීඩාවක් දධීචි මුනිහට නොවීය. නැවත ක්ෂුවතෙම දධීචි මුනිහු විසින් නසන ලද්දේය. මෙසේ ජයග්‍රහණය කොට දධීචි මුනිහු සුවර්චානම් ස්වීය පත්නිය හා සමගින් එම ආශ්‍රමස්ථානයෙහි දිව්‍ය මනුෂ්‍යයන් විසින් පුදනු ලබමින් වසන එක්සමයෙක්හි:—

"එකදා නිර්ජරාස්සර්වෙ-වාසවාද්‍යා මුනීශ්වර!,
වෘත්‍රාසුර සහායාශ්ච-දෛත්‍යා රාසන් පරාජිතාඃ."

"තදා සර්වෙසුරාඃ සෙන්ද්‍රා-වධ්‍යමානාස්තාර්ථියාඃ,
බ්‍රහ්මලොකං ගතා ශීඝ්‍රං-ප්‍රොචුඃ ස්වංව්‍යසනං තුතත්."

---

* "දධිච=දධීචි" යන නාමවයම මේ මුනිවරයාට.

"මහා මුනිර්දධීචිසීඃ-ස තපස්වී ජිතෙන්ද්‍රියඃ,
ලෙභෙ ශිවං සමාරාධ්‍ය-වජ්‍රස්ථිතව වරං පුරා.
තස්‍යස්ථිනෛ‍්‍යව යාචධ්වං-ස දාස්‍යති න සංශයඃ"
නිර්මාය තෙදීණඩවජ්‍රං-වෘත්‍රං ජහි නසංශයඃ"

"ඉත්‍යුක්තසෙතන ස මුනිඃ-පරොපකරණෙ රතඃ,
ධ්‍යාත්වා ශිවං ස්වනාථංහි-විසෘජ් කලෙබරම්,
අස්ථිනිර්මිතයෙ ත්වෂ්ටුං-නිදිදෙශ තදස්ථිභිඃ
විශ්වකර්මා තදාඥප්ත-ශ්චකල්පෙ සත්‍රාණි කෘත්ස්නතඃ."

යනුහෙයින් ඉන්ද්‍රයා ප්‍රමුඛකොට ඇති සියලු දෙව සමූහයෝ සාධික තෙජොබල පරාක්‍රමයෙන් යුක්තවූ වෘත්‍රනම් අසුර රාජයා ප්‍රමුඛ කොට ඇති අසුරයන් විසින් පරාජිතවූවෝ සියල්ලෝම කැටිව ගෙන දුකින් පෙළෙමින් බ්‍රහ්මලොකයට ගොස් බ්‍රහ්මයා වැඳ කෘතාඤ්ජලීව එම දුක සැළ කළෝය. බ්‍රහ්මතෙම දෙවියන්ගේ දුක්මුසු එම තෙපුල් අසා මෙසේ කියන්නේ:–"තොපගේ විනාශ පිණිස වෘත්‍රාසුරයා පහළවිය. ඔහු නැසීම පිණිස උපායක් කරනු ලැබේවා. උග්‍රතපස් ඇති දධීචිනම් මහාමුනිතෙම ඊශ්වර ප්‍රසාද යෙන් පූර්වයෙහි වජ්‍රාස්ථිකය ලැබීය. දධීචි මුනිවරයාගේ එම දෙහාස්ථි තෙපි ඉල්වව්. හෙතෙම ඒකාන්තයෙන් දෙන්නේය. එසින් වජ්‍රයක් නිර්මිතකොටගෙන වෘත්‍රාසුරයා නසව්. ඊට සැක යක් නැත්තේය." ඉක්බිති බ්‍රහ්මයාගේ මේ තෙපුල් ඇසූ එම දෙවියෝ සතුටුසිත් ඇතිව එකෙණෙහිම දධීචි මුනිවරයාගේ ආශ්‍රම ස්ථානය කරා ගියෝය. ශක්‍රතෙම දෙවියන් සහිතවූයේ සුවර්චා පත්නිය සමගවූ දධීචි මුනිවරයා දැක ඇදිලිබැඳ වැඳ සිටියේය. මුනිවරතෙම ඔවුන්ගේ අදහස් දැන සුවර්චාව අන්‍යාශ්‍රමයකට යවා දෙවියන්ට අවකාශ තැබීය. ඉක්බිති ඉන්ද්‍රතෙම "මුනිවරයන් වහන්ස! දෙවියන් සහිතවූ අපි වනාහි වෘත්‍රාසුරයා විසින් පරදවන ලද්දෙු දුකින් යුක්තව තුඹවහන්සේගේ ශරණ සොයා ආවෙමු. දෙවයෙනි! ඔබගේ වජ්‍රමය දෙහාස්ථි අපට දුනමැනවි. එසින් ආයුධයක් සාදා අසුරයන් නසන්නෙමු"යි කීවේය. මෙසේ සැලකළ කල්හි පරොපකාර නිරතවූ එම මුනිවරතෙම ශිවදෙවයා ධ්‍යාන කොට මිනිස් සිරුර අත්හැර එකෙණෙහිම බ්‍රහ්මලොකයෙහි උපන්නේය. එකෙණෙහිම දෙවියෝද මල්වැසි වැස්සූහ. අන්‍යවූත් බොහෝ ආශ්චර්යයෝද පහළවූහ.

ඉක්බිත්තෙත් ඉන්ද්‍රතෙම එම මුනිවරයාගේ දෙහයෙන් ඇට වෙන්කර ගැනීම පිණිස සුරභිධෙනුව ලවා ශරීරය ලෙවවා ඇට පමණක් රැගෙන එසින් ආයුධයක් සාදනලෙස විශ්වකර්ම දිව්‍යපුත්‍ර යාට අණ කළේය. විශ්වකර්ම දිව්‍යපුත්‍රතෙම ආයුධයක් සාදා ඉන්ද්‍රයාට

දුන්නේය. ඉන්ද්‍රතෙමේද ඒ ම ආයුධයෙන් වෘත්‍රාසුරයාගේ හිස කපා ජය ගත්තේය. එකෙණෙහි දෙවියන්ට මහත්වූ සැණකෙළිවූහ. ඒ මේ ආවුධයතෙම වජ්‍රායුධයයි දතයුත්තේය.

38. නො නැ ව න ගැඹුරු සයුරට ගොදුරට පිවි ස
නු බ ප න පැමිණ වැජඹෙන ගුරුළකු විල ස
ම ද ව න ගිජිඳු බඳවත් මද නොවිල ස
මො හු අ න සිපත ගොස් නොරඳසි අහස මි ස

**අන්වය:**–ගැඹුරු සයුරට ගොදුරට පිවිස නොනැවත නුබපත පැමිණ වැජඹෙන ගුරුළකු විලස මද මත ගිජිඳු බඳවත් මද ලස නොවි මොහු අත අසිපත ගොස් අහස මිස නොරඳයි.

**සංලක්ෂ්‍ය:**–මේ රජයාගේ ඛඩ්ගශිල්පවෛශාරද්‍යය ප්‍රකාශකිරීමට මේ කව දක්වනලදී. සමුද්‍රගත මහා දෙහ ඇති සජීයකු අල්වා ගැනීමට ගොස් ළඟ වහාම ඩැහැගත් ගුරුළු පක්ෂියා මොහොතක්වත් සමුද්‍රයෙහි නොරඳ අහසටම නැගෙයි. එසේම මේ රජයාගේ අතටගත් කඩුවත් මතත හස්තින්ගේ පවා දෙහයට වැදුණුකල්හි එයින් ඇතුගේ දෙහය දෙපලුකොට නැවති ම මුත් අතර නොරඳන්නේය.

**"බඳ"**මේ දෙනවාචක බඳ ශබ්දය "බොන්දි" (පාලිභාෂාමය) ශබ්දයෙන් තද්භව විය.

"ශරීරං වපුගත්තඤ්චාත්තභාවොබොන්දිවිග්ගහො" යනු අභිධානයි:

39. සා ර වා පසහතුරුගොස රණබිමට බැ ස
න ද වා සිපත ගෙන සහ රුපුරදුන් ය ස
ලෙ ල වා ඔවුන් හදවත් සමගින් පලි ස
මො ල වා උනඹුවන් ලෙහි සෝක ගිනිරැ ස

**අන්වය:**–පසහ තුරු ගොස කරවා රණ බිමට බැස අසිපත රුපු රජුන් යස සහ තදවාගෙන ඔවුන් හදවත් සමගින් පලිස ලෙලවා උන් අඹුවන් ලෙහි සෝක ගිනිරැස මොලවා

**සංලක්ෂ්‍ය:**–පඤ්චාංගික තූර්‍ය නාදය කරවා රණබැස සවකීය ඛඩ්ගය සමග ශත්‍රුරජයන්ගේ යසස තරයේ ගෙනයයි කීමෙන් එම රජයා යුධය පිණිස රණබිමට බැස්සකල්හි ශත්‍රුරජයන්ගේ කීර්තිය නෂ්ටකල බැව් ප්‍රකාශිතයි.

එසේම ඔවුන්ගේ හෘදයවස්තුව සහිත පලිහයත් චලිතකල බැව් දක්විමෙන් එම රජහු දක්නාවිට ශත්‍රුරජයන්ගේ ධෛර්‍යය නෂ්ටවීමෙන් රජුට වසඟවූ බවද කීයේ වේ. ඔවුන්ගේ අඹුවන්ගේ හෘදයෙහි ශෝකාග්නි ස්කන්ධය ප්‍රජ්වලිතකල බැව් කීමෙන්ද ශත්‍රුභංගයෙන් තදම්බිකාවන්ගේ රොදන පරම බිය ඇඟවීය.

**"පලිස"**මෙන "පලිහ" යන තත්සම ශබ්දගත 'හ'කාරයට 'ස'කාර වීමෙන් සිද්ධයි. 'හිරි,-සිරි,-හිරියල්,-සිරියල්" යනාදියෙද හකාරට 'ස' කාර අදෙස්වූ තැනි. (44 කවෙහි සංලක්ෂ්‍යයෙද බලන්න)

**40. උ ඩු ක ර කඩුව පානා මෙන් සග ගි ර ග**
**[1]බ ම ක ර බිමට බිඳිනා තැන් පාන ර ග**
**ය ට ක ර ම පද වැඳ වැටෙව සි කියන ර ග**
**ඇ ම ව ර ලොවට පෙන්ව සි අවිසරම ර ග**

**අන්වය:**-සග ගිරග පානා **මෙන් කඩුව උඩුකර** (යලිත්) බිඳිනා තැන් පානරඟ බිමට බමකර (නවද) ම පද වැඳවැටෙවසි කියන රඟ යටකර අවිසරම රඟ ඇමවර ලොවට පෙන්වසි.

**සංලක්ෂ්‍ය:**-"උඩුකර කඩුව පානාමෙන් සග ගි ර ග" !

යමකු විසින් මෙරුපර්වතරාජයා උස්කොට පෙන්වනු ලැබේ නම් ඒ දක්නා සියල්ලෝම භීතිප්‍රාප්ත වෙත්මය. එසේම මේ රජහු ඛඩ්ගය ඔසවාගත් කල්හි ශත්‍රැහු සාතිශය භීතියට පැමිණෙත්මැයි.

"බමකර බිමට බිඳිනා තැන් පාන රඟ"

පළමු පෙදෙහි නිර්දිෂ්ටවූ ඛඩ්ගය කරකවා බිමට හරවාගත්බව කියයි. කුමක් සඳහාදයත්? ශත්‍රැන් භග්න කරන තැන් පෙන්වීම පිණිසය. ඉදින් ශත්‍රැහු රාජයාගේ දෙපා ළඟ පතිතව ක්ෂමාකරවාගත නොහෙත්නම් ඔවුන්ගේ මරණයද එසින්ම වන්නේය. එහෙසින් කඩුව පොළොවට හරවා තැබීමෙන් ඔවුන්ට පැමිණි යටත්වීම ප්‍රකාශිතයි.

"යටකර ම පද වැඳ වැටෙව සි කියන ර ඟ"

දෙවන පෙදේ නිර්දිෂ්ටාකාරයෙන් පොළොවට අභිමුඛ කොට තබනලද එම ඛඩ්ගය දක්නා ශත්‍රැහු ක්ෂමාග්‍රහණය සඳහා රජුගේ දෙපාළඟ පතිතවීමට අභිලාෂ ඇත්තෝ නමුත් ඛඩ්ගප්‍රහාර යෙන් දෙපලුකොට දමතැයි බියසිත් ඇතිවන්නෝය. එය වළක්වා ඔවුන් සැනසීම පිණිස එම කඩුව වැල්ලෙන් වසා තබයි. එවිට ශත්‍රැහු රජහු ළඟට පැමිණ රජුගේ සරණ මාත්‍රයම ලැබ නිර්භය වන්නාහු වෙති. රජහුගේ අද්විතියවූ ඛඩ්ගශිල්ප සාමර්ථ්‍යය මෙයින් ඥාපිතයි.

---

1 **"බිමකර බිමට—බිමකරවටම":—සිද පාඨයි.**
**"මුණකර බිමට"—මුද්‍රිත.**

**"රඟ"**:–මේ ශබ්දය **"ආකාර"** යන්නෙන් තද්භවවිය. එහි ආද්‍යක්ෂරය ලොප්කොට "ක" කාරයට "ග" කාරාදෙශය හා වර්ණ පෙරැළි විධියෙන් සිද්ධයි. "ක" කාරයට "ග" කාරයවීමද "වෙසක් වෙසඟ, සක–සගය යනාදිය මෙනි.

**"සරම"** :–**"සරභාෂ"**යන්නෙන් තද්භවවී පළමුකොට "සරඹ" කියාසිට ඇතැම් තැන සකාරයට හකාරාදෙශවීමෙන් "හරඹ" කියාද සිද්ධයි. පසුව "බ" කාරලොපයෙන් හා මාත්‍රාංශ වෘද්ධියෙන් "සරම"යයි සිද්ධයි.

**41.** **ර ණ වා පි ය　ලෙහෙවතුරෙන් ගත් තර　ග**
**පු ර වා පි ය　සොන් සිවලුන් සිත් සම　ග**
**කා ර වා පි ය　අඟනන් සිත් විරහ ග　ග**
**බ ඳ වා පි ය　දිය දද අට දිගු යට　ග**

**අන්වය**:–ලෙහෙවතුරෙන් තරඟ ගත් රණවාපිය සොන් සිවලුන් සිත් සමඟින් පුරවාපිය, අඟනන් සිත් විරහ ගඟ කරවාපිය අට දිගු යටග දිය දද බඳවාපිය

**සංලක්ෂ්‍ය**:–රුධිර නමැති ජලයෙන් තරඞ්ගග්‍රහණය කළාවූ යුද්ධභූමිය නැමැති වාපිය (මැව) බලු සිවලුන්ගේ සිත් සමග පිරවිය සි කීමෙන් ශත්‍රුන්ගේ අභාග්‍ය කරණකොටගෙන ඔවුන්ගේ ලෙසින් රණභූමිය පිරීගියේය. ඒ හෙතුකොටගෙනම අඞ්ගනාවන් ගේ චිත්තසන්තාන විරහදුඃඛයෙන් පිරීගියේය. ඒ මේ ශත්‍රු ඝාතයෙන් රාජයාගේ කීර්තිධවජය ලොක කුහරයෙහි සැමතැන පතළේයයි මෙ කවෙහි අදහසයි. මෙයින්ද රජහුගේ අප්‍රතිහත රණශූරභාවයම ගම්‍යමාන වේ.

**"වාපිය"**:–පාලිභාෂාමය **"වාපි"** ශබ්දයෙන් පරව 'අ' ප්‍රත්‍ය හා 'ය' කාරය වීමෙන් සැදුණු කම්විබත් එකබසයි.

**"පුරවාපිය–කරවාපිය–බඳවාපිය"**:–"පුරවා–කරවා–බඳවා" යන පෙරකිරියකෙරෙන් පරව "ප" යන ප්‍රත්‍යය යෙදී නැවත ධාතු සංඥාව ලැබ අතීත විභක්ති ප්‍රත්‍යය ලැබ සිද්ධවූහ. "මුදාගනී" යනාදිය මෙනි. මුදාගනී කියාලන්නේ ඇ පෙරකිරිය පසතින්වූ ගණ–ලපස ඇ දාවූසේ යනාදියෙන් දතයුතුවේ.

**42.** **නැ　වී　සඳල් බිඳනැඟි ගිනි සා　දේ　සි දී**
**පෙ　වී　පණ සිපත මඳතුන් බ　දේ　සි දී**
**ලැ　වී　ඔප කගින් කගවන් යු　දේ　සි දී**
**නි　වී　රුපුන් 1 බියගිනි සුර බ　දේ　සි දී**

---

1 විශොගින් සුරමැදේ–මුද්‍රිත.

**අන්වය**:-යදුල් බිඳ නැඟී ගිනිකඳේසිදි අසිපත නැවි. (පසුව) මදූතුන් බඳේ සිදි පණපෙවි. (යලිත්) කගින් කගවන්යුදේසිදි ඔප ලැවි. (පසුව) සුරබඳේ සිදි රුපුන් බියගිනි නිවි.

**සංලක්ෂ්‍ය**:-"තැවි යදුල් බිඳනැඟි ගිනිකඳේ සි දි":-

ශත්‍රුභසතින් මේ රජයා සමග යුද්ධයට වන්කල්හි රජතෙම ඔවුන්ගේ දෙහය වසාතුබූ ලොහජාලයක් පළමුකොට ස්වීය ඛඩ්ග ප්‍රහාරයෙන් කපාලත්තේය. එවිට ඛඩ්ගය වැදීමෙන් ලොහජාලයෙන් ගිනිනගිසි. ඒ ගින්න කරණකොටගෙන ඛඩ්ගය රත්වීමට පැමිණෙසි. ඒ බව මේපෙදෙන් ප්‍රකාශිතයි.

"පෙවී පණසිපත මදූතුන් බ ඳේ සි දි"

යට දැක්වූ ආකාරයෙන් රත්බවට පැමිණි එම කඩුව ඉබේ නිවීමට ගියේ නම් එය කාර්‍යක්‍ෂම නොවීමෙන් පරාජයට පත්වීමට සිදුවන හෙයින් රජතෙම එම ඇතුන්ගේම ලෙහෙයෙන් එම ඛඩ්ගය පණපොවාගත්තේය. ඒ බව මේ දෙවන පදයෙන් කියවයි.

"ලැවි ඔප කගින් කගවන් යුදේ සි දි"

එසේ පණපෙවූ කඩුව නැවත මුවහත්කර නොගතහොත් එයද ප්‍රමාණ නොවන හෙයින් ඊට උපායක් සොයන රජතෙම සතුරන් සමග ඛඩ්ගයුද්ධය කරයි. එයින් කඩුව ඔපවැටී දිලිහී සිටගනියි. ඒ බව මේ තෙවන පදෙන් කථිතයි.

"නිවී රුපුන් බියගිනි සුර බ ඳේ සි දි"

එසේ වනවිට ශත්‍රුන්ගේ චිත්තාභ්‍යන්තරයෙහි මහත්වූ භය නමැති ගින්නක් හටගත්තේය. කාරුණිකවූ එම රජතෙම ඒ දැක ඔවුන් කෙරෙහි අනුකම්පා සිතින් යුක්තව ඔවුන් සනසාලන අටියෙන් එම කඩුව ඛඩ්ගකොෂයට ප්‍රවිෂ්ටකරයි. ඒ දක්නා ශත්‍රුහු බියෙන් මිදී ශාන්තභාවයට පැමිණෙත්. (මේ අදහස මෙයින් ප්‍රකාශිතයි.)

මෙසේ රජතුං යුද්ධාඞ්ගනයට ප්‍රවිෂ්ටවූ මොහොතේම ශත්‍රු සෙනාවන් භඟනකොට ඔවුන් තමාගේ වසඟභවයටද ගෙන ඔවුන්ට ශරණවන බවද ප්‍රකාශිතයි.

**"සුරබඳ"**:-කඩුකොපුවට නමකැයි පෙණේ.

43. ද ල පැරකුම් බුජසුරතුරෙන රිවි ගො ත
දු ල බුවනෙක බුජකප්තුර එයින් ප ත
ය ල මෙහි නිරිඳු එහි කඳසිරි ගත දිමු ත
[1] ප ල ඉන් ඇතිව වැඩෙනුය මෙ සිරිලක් කො ත

අන්වය:-රිවිගොත දල පැරකුම් බුජ සුරතුරෙන එයින් දුල බුවනෙක බුජ කප්තුර පත යල මෙනිරිඳු එහි දිමුත කඳසිරි ගත මෙසිරිලක් කොත ඉන් පල ඇතිව වැඩෙනුය.

44. මෙනිරිඳු ගුණමහිම—හිමසඳුන සඳනවර
සිදුකරනලෙස අදහස—කොරනොකර අද අදරින්

අන්වය:-මෙ නිරිඳු ගුණ මහිම හිම සඳුන සඳ නවර අදහස සිදු කරන ලෙස අද අදරින් තොර නොකර.

“සඳ”:-“චන්ද්‍ර” යන්නෙන් තද්භවවීය. “සඳ” ශබ්දයක්ද හෙළු බසෙහි පෙණේ. එයින් චන්ද්‍රයා යන අර්ථය පහළවේ, තවත් ස්ත්‍රී අර්ථයෙහි “සඳ” යන්නක් දෘශ්‍යමානයි. ඒ වනාහි “ලඳ” යන්නෙන් ලකාරයට සකාරාදේශවීමෙන් සිද්ධයයි සැලකියයුතු. ලකාර යට සකාරය වීමත් “රැස-රැල” යනාදිය මෙනි. තවත් නිපාත ‘සඳ’ ශබ්දයක්ද පෙනේ. එසේම චිත්තවාචී “සඳ” ශබ්දයක්ද ඇත. එය චිත්තයන්නෙන් තද්භවවී “සිත” යයි සිටිවිට සකාරයට පිළි පෙරළි විදියෙන් හා තකාරයට දකාරාදේශ වීමෙන් සිද්ධයි. යුක්ත අනුගමනයෙන් පිළිගතයුතු ධවලාර්ථදීපක “සිත” යන මාගධ ශබ්දයෙන් තකාරයට දකාරාදේශය හා පිළිපෙරළි විදීයෙන් “සුදු” කියා සිද්ධවූවාක්මෙනි. හෑද-හද-හඳ-සඳ යනුවෙන් චිත්තවාචී ‘සඳ’ ශබ්දය සිද්ධවීයයිද සැලකියහැක. මෙහි ‘හඳ-සඳ’වූයේ ‘හ’කරට ‘ස’කර අදෙස්වීමෙනි.

45. කි ව ත් නොමගෙවෙන පිරි [2] දිය තෙද ය සි නි
ලොවත් මෙ පුර රදුනුත් රැකසිටි වි සි නි
ප ව ත් වන පුදුනි නිති නන්තුරු ගො සි නි
ස ව ත් සුරිඳු මැදුරම වැද වැඳ ගො සි නි

අන්වය :-කිවත් නොම ගෙවෙන දියපිරි තෙද යසිනි ලොවත් මෙපුර රදුනුත් රැකසිටි විසිනි නත්තුරු ගොසිනි නිති පවත්වන පුදුනි සවත් සුරිඳු මැදුරම වැද වැඳ ගොසිනි.

---

1 පැල—මුද්‍රිත. 2 දිමතෙද යසිනි—ඇතැම්.

**සංලක්ෂ්‍ය:-සවන්**-වත් සෘක් ඇරියේ සවත්ය. අත්අරුත් සමස්. මේ දෙවයාට මුහුණු සයක් හා අත්දෙළොසක් විද්‍යමානයහ. උමා මෙහෙසුරු දෙදෙන ප්‍රභවකොට ඇති මේ දෙවිතෙම උදාරතර තෙජෝ බලපරාක්‍රම යුක්තයකු බව කවිසමයෙහි ප්‍රකාශිතය. "මූණුසයකි අත් දොළසකි මයුරපිට වාහනේ" වදන්කවි.

**46.** මු නි ඳ පින් පිඩුව පෙණුනා මෙන් ලොව ට
වි සි ඳ රන් රුවන්රැස් දිගත එලිකො ට
ඇ ම ඳ දිලි සතන් නෙක් සිත් සතුටු කො ට
ද ළ ඳ මැදුරනට වැද නැමද පුදකො ට

**අන්වය:**-මුනිඳු පින් පිඩුව ලොවට පෙණුනාමෙන් රන් රුවන් රැස් විසිඳු දිගත එලිකොට සතන් නෙත් සිත් සතුටුකොටු ඇමඳු දිලි දළඳු මැදුරනට වැද නැමද පුදකොට.

**සංලක්ෂ්‍ය:-'දළඳු මැදුර'**-ශ්‍රී බුද්ධ වර්ෂ 1855 දී ලංකාරාජ්‍යශ්‍රියට පත් පස්වන භුවනෙකබාහු නරවීරයා විසින් කුරුණෑගල රජධානි යෙන් කෝට්ටේ නගරයට ගෙනඑනලද දළදාවහන්සේ එම රජයාගේ අභාවයෙන් පසු රාජ්‍යශ්‍රියට පැමිණි සවන පරාක්‍රමබාහු රජයා විසින් ගෞරවස්ථානයෙහි තබා පුදනුලබමින් වටිනා මන්දිරයක් කරවා එහි වඩා හිඳුවා සම්මාන කරන ලද්දිය. එය මේ කියනලද දළඳා මන්දිරය වේ. එය පෘතුගීසි කාලය දක්වා පැවැත්තේ නමුදු පෘතුගීසි උපද්‍රවයන් පහළවීමෙන් එයින් ඉවත්කොට රත්නපුර ප්‍රදේශයාන්ත දෙල්ගමුව නම් ග්‍රාමවරයට ගෙනගොස් පුදනලද්දේ විමලධර්මසූර්‍ය රජතුමා විසින් මහනුවරට පමුණුවා අදවනතුරුත් එහි වැඩසිටින සේක.

## රාජසභාව.

**47.** සත සිත ලෙසින්ගත—සනහා සුවඳ සිලිලෙන්
කඩා රැගත් රුපුරදයස දුහුල් බ ඳු
වඩා සිනිඳු මුදු සුදු සළු සුපිරිසු දු
කැපිකල රිවිකිරණ—පැපිකල පැළඳ අබරණ
නි කු ත් සුරිඳු මෙන් සුරගඟ තරඟ පිපි න්
අ වු ත් උදුල පිවිතුරු පියවිළිය පිපි න්
ලෙ ල ඹුතුලැල් දළසුඩු සේසතෙයි ය ට
තු ළ සුදුපට තුඟු සිංහාසනේ පි ට
කා ළ ලොව එකොළි රිවිනැගිමෙන් [1]උදයගට
දු ල පැරකුම් බුජ නරනිඳු උන් කල ට

1 පෙරදිගට – මුද්‍රිත.

අන්වය:-සනසිත ලෙසින් ගත පුවද සිළිලෙන් සනහා සඬාරගත් රුපුරජ යස දුහුල් බඳු සිනිඳු මුදු පුදු සුපිරිසුදු සළු වඩා සැපිකල රිජි කිරණ පැටිකල අබරණ පැළඳ සුරගඟ තරඟ පිපින් නිකුත් සුරිඳු මෙන් උදුල පිච්තුරු පියවිළිය පිපින් අවුත් ලෙල මුතුලැල් දළපුබු සේසතෙයි සට අතුළ සුදුපට තුඟු සිංහාසනයේ පිට ලොව එකෙලිකල රිවි උදයගට් නැගිමෙන් පැරැකුම් බුජ නරනිඳු දුල උන් කලට

**සංලක්ෂ්‍ය:-පැටි**-මෙහි පැණෙන මේ "පැටි" ශබ්දයෙන් මුවහ කිරීම් අර්ථය හෙවත් ආවරණාර්ථය ප්‍රකාශිතයි. සැඟවීම් අර්ථය කීවත් වරදක් නැත්තේය. තත්පර්‍ය්‍යාර්ථ ඇති හෙයිනි.

"තුබුන් මලැතිය මේ—පියයුරු බර මොරජනා,
නවලඳ "පැටි" කරත් පත්—නියරජ උතුරුසළුයෙන්"
(සියබස්ලකර)

"පැටිකරත්පත්, මුවහකරත්හොත් යුක්තයි."යනු එහි පුරාණ සන්නයයි. "පැටිසඳසැහෙව් මේ—පටන්ගැන්මෙහි වැටෙනුයේ."
(රුවන්මල)

**සුරිඳු**-නම් ශක්‍රයායි. සුර ඉඳු යනු විසන්ධියි. සුරන්ට ඉඳු සුරිඳු.

**සුරගඟ:**-සුරන්ගේ හෝ සුරලෙව්හි ගඟ සුරගඟ.

**48.** සහස කිරණවන් දිලිමිණි බරණ රැ — සි න්
දිගැස නුවන් තුවුකළ සොඳුරු රූ රැ — සි න්
තිදස ඉසුරු සබ සුරකුමරුවන් ලෙ — සි න්
දෙපස සිටිති සැදි රජකුමරුවෝ ගො — සි න්

අන්වය:-මිණි බරණ රැසින් සහස කිරණවන් දිලි සොඳුරු රූ රැසින් දිගැස නුවන් තුවුකළ රජකුමරුවෝ ගොසින් තිදස ඉසුරුසබ සුරකුමරුවන් ලෙසින් දෙපස සැදි සිටිති.

**49.** නොදැක රුපුන් 1 දිසි සඳසේ ම — ස න් තේ
නොයෙක නමා යස රැස පැදි — ස න් තේ
නිසැක ඒකනායක මැති 2 ම — ස න් තේ
පසෙක සිටිසි පිපිරූක මෙන් ව — ස න් තේ

අන්වය:-මසන්තේ සඳසේ රුපුන් නොදැක දිසි නමා නොයෙක යසරැස දිසන්තේ පැ මහන්තේ ඒකනායක මැති වසන්තේ පිපිරූක මෙන් පසෙක නිසැක සිටිසි.

**සංලක්ෂ්‍ය:**- "නොදැක රුපුන් දිසි සඳසේ ම සන්තේ
නොයෙක නමා යස රැස පැදි සන්තේ

1 යස—මුද්‍රිත. 2 මසන්තේ—අත්පොත්.

අමාවක් දිනයෙහි චන්ද්‍රයාසේ ශත්‍රූන් නොදක්නා දෘශ්‍යමානව තමා පිළිබඳවූ නානාවිධ යශෝරාශිය දිශාන්තයන්හි ප්‍රකාශකළාවූ යනු මෙහි තේරුම වේ. අමාවක් දිනයෙහි චන්ද්‍රයා කිසි ආකාරයකිනුත් නොදක්නා ලැබේ. එසේම මේ රජයාට ප්‍රතිවිරුද්ධවූ කිසිදු සතුරෙක් නොමැත්තේය. එසේ අප්‍රතිහත තෙජො යුක්තව සිට දශදිශාවෙහි අප්‍රතිහතවූ ම කීර්තිමාලාව පැතිරවීයයි මේ රජයාගේ උදාරතර අසහාය පුණ්‍යබලය ම ප්‍රකාශිතයි.

"මසන්තෙ:-"මෙය විසන්ධිකළවිට "මසඅන්ත" කියා සිටියි. මෙහි "මස" යනු සංස්කෘත "මාස" ශබ්දයෙන් තද්භවවීය. එවිට චන්ද්‍රයාය-මාස යනු එහි අර්ථය වේ. "අන්ත" යනු තත්සම ශබ්දයෙකි. චන්ද්‍රයාගේ හෝ මාසයාගේ හෝ අවසානය යනු අර්ථයයි. මාසේ පොහෝදින චන්ද්‍රයා නොපෙණෙන හෙයින් චන්ද්‍රයාගේ අවසානයයි කියා හෝ මාසයාගේ අවසාන දිනය බැවින් මාසාවසානයයි කියා හෝ ගනු ලැබේ. භාෂාවයක ශබ්දවයක් මෙසේ සමාසකිරීමද වරදෙක් නොවේමය.

-"දෙසන්තර" යනාදිය ඊට නිදර්ශනයි.

50. මුනිඳුන් උපුල්වන්—සුරිඳුන් නරනිඳුන් වෙත

බැ තී සි ත රකින තම පණ සතරවැනි කො ට
ස ත වෙ ත පතුරුවන මෙත් කුළුණු හැම වි ට
1 සන්හස් ලියනමැති—තිරිවරංගමු මුඛවෙටි
ව ණ් ඩා තපකිරණවන් තද තෙදින් දූ බි
බ ණ් ඩා ර නායක තනතුරු සිරින් සෙ බි

වි ක්‍ර ම වීර විරිඳුන් දූක නොපෑ පි ටි
2ස ක්‍ර ම විර බස් මිස නො තෙපලන සැ ටි
අ ක්‍ර ම වංක ගුණමඳකුත් නො ගෙනසි ටි
වි ක්‍ර ම සිංහ අදිකාරම් මැතිඳු සි ටි

අන්වය:-මුනිඳුන් වෙත උපුල්වන් සුරිඳුන් වෙත නිරිඳුන් වෙත බැති සිත තමපණ සතරවැනි කොට රකින මෙත් කුළුණු හැමවිට සත වෙත පතුරවන සන්හස් ලියන තිරිවරංගමු මුඛවෙටි මැති චණ්ඩාතප කිරණවන් තද තෙදින් දූබි බණ්ඩාරනායක තනතුරු සිරින් සෙබි වික්‍රම වීර විරිඳුන් දූක-පිටිනොපෑ සක්‍රම වීරබස් මිස නොතෙපලන සැටි අක්‍රම ගුණ වංකගුණ මඳකුත් නොගෙනසිටි වික්‍රමසිංහ අදිකාරම් මැතිඳු (පසෙක) සිටි.

---

1 සන්හස් ලියන නිසිමැතිකුල තිරිවරංගමු-මුද්‍රිත. 2 සක්‍රම නිරවාරු.

**සංලක්‍ෂ්‍ය:-උපුල්වන් සුරිඳු**-මෙහි **උපුල්වන්** යන්න **උත්පල වර්‍ණ** ශබ්දයෙන් තද්භවය. මෙය ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයාහට ව්‍යවහෘත සංඥාන්තරයකි. එම දෙවරාජයා පිළිබඳ වර්‍ණ විශෙෂඥාපර්‍ණය ශිෂ්කොට ගෙනම ලාංකෙය කවිවරයෝ උපුල්වන් යනු විශෙෂ යෙන් ව්‍යවහෘත කළහයි සලකමු. භාරත දෙශීය ප්‍රකාණ්ඩයන් විසින් ද එසේ ම සැලකූ බව

"ඉන්දීවර දලශ්‍යාම—චින්දිරා නන්ද කන්දලම්
වන්දාරුජන මන්දාරං—වන්දෙහං යදුනන්දනම්"

යන ශ්‍රී මලලි නාථයන්ගේ කීමෙන් පෙණේ. මේ ශ්ලොකයෙන් ප්‍රකාශ වන්නේ ශ්‍රී විෂ්ණුදෙවයා මය.

ඇතැම්හු **උත්පලවර්‍ණ-විෂ්ණු** යනු දෙවියන් දෙදෙනකු බැව් කියත්. ඊට හෙතුවක් තද්භවතුන්ගේ විචාර බුද්ධියගේ ශුන්‍යත්වය මෙන්ම කොකිල සන්දෙශයෙහි කාලාන්තර කලිෂ්ටත්වයෙන් දූෂිතවූ පද්‍ය පාදයක් තරයේ ගැනීම බව පෙණේ.

ගෞතම තථාගතයන් වහන්සේ පරිනිර්‍වාණ මඤ්චකයෙහි වැදහොත් සේක් ශක්‍රයා අමතා

"පතිට්ඨිස්සති දෙවින්ද-ලඞ්කායං මම සාසනං"
"දෙවස්සුප්පල වණ්ණස්ස-ලඞ්කා රජ්ජං සමප්පයි"

වදාළ බැවින් සක්දෙව් රජු විසින් උත්පලවර්‍ණ දෙවයාහට එම භාරය කළ බැව් ප්‍රකාශිතය. එසේ භාරගත් උත්පල වර්‍ණ දෙව තෙමේ ලක්දිව් බැස ලඞ්කාව සහිත සම්බුද්ධ ශාසනය පාලනය කරන්නේය. එකල ලක්වැසියන් ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයාගේ ප්‍රතිමා පූජා නො කොට ඇදහීම් මාත්‍රයෙහිම නිරත හෙයින් තමන්ගේ ආනුභාව සම්පන්න ගුණ මහත්ත්වය පෙන්වා ඔවුන් ලවා ප්‍රතිමා පූජා කරවනු වස් විෂ්ණු දිව්‍යරාජතෙම ඛදිර රූප විලාසයෙන් සමුද්‍රයෙන් පහළවෙමින් දෙව්නුවර සමුද්‍රාසන්නයෙහි ගොඩ බැස්සේය. එකල දාපුළුසෙන් රජහු එම ඛදිර රූපය දැක ඉතා ගරු බුහුමන් පවත්වා පෙරහරින් වැඩමවා ගෙනවුත් එහිම දෙවාලයක් කරවා එහි වඩා හිඳුවා පුද පෙරහර කරවීමට ආරම්භ කළ බව ප්‍රසිද්ධය. එම දෙව මන්දිරය අදත් "ශ්‍රී විෂ්ණු දෙවාලය" නමින් සුප්‍රකටය. මේ **පෞරාණික** රචනාද්වයද බලමු.

"ශ්‍රී සාකෙ රාජශෙනා ව්‍යපගතවශේ පූර්‍වපක්‍ෂෙච යුක්තෙ
වෛශාඛෙ මාසිරාජේ රවිදින සහිතෙ රාධනක්‍ෂත්‍ර තාරෙ
මධ්‍යාහ්නෙ ජීවහොරාජ්ජලනිධි මගධාච්චන්දනං කාෂ්ඨරූපං
ප්‍රාප්තං දෙවාතිදෙවං සුරනරමහිතං පූජයෙද් විෂ්ණු ශ්‍රෙෂ්ඨම්"

නි ම ල් හල මුනි ලෙසින් වදහළ මෙලක රකිනුව මෙත් සි තින්
උ පු ල් වන්හෙ දෙව් රජුන් පිළිරුව වඩිනු දැක මහ සයුර තින්
වි ම ල් ගුණසුත් නමින් ඈපුළුසෙන් රජෙක් ආ එ ගෙයිගො තින්
වි පු ල් සිරි දෙව් නුවර කරවා පිහිට කරවිය යහප තින්
(පැරකුම්බා සිරිත)

මේ ප්‍රවෘත්තිවලින්ද ඒ බව මනාව ඔප්පුවේ. යලිත් මයුර සන්දේශයෙහි

"සෙත යදි සක් හට දෙන දිගු බිඟතසි සැ රී
පිරි මුළු සක් වළ පුල්වන් සුරිඳු සි රී"

උත්පලවර්ණ දිව්‍යරාජයා සියලු චක්‍රවාටයෙහි පිරී සිටි බව කීමෙන්ද ශ්‍රී විෂ්ණු බව පහසුවෙන් සිතාගත හැකිය. විෂ්ණු ලොව සියලු තන්හි පැතිරී සිටින බැව් සිද්ධාන්ත කාරණයෙකි. මේ ආදි කරුණු වලින් **උපුල්වන් යනු ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයාටම** ව්‍යවහෘත බව අවබොධවේ.

**සන්නස් ලියන මැති**–මින් හැඟෙන්නේ "සන්හස් ලේකම්" ධුරය දැසිලු මැතිවරයාසි. රාජමුද්‍රාව භාර ලෙඛක පදවිය "සන්හස්" නිලයවේ. වික්‍රමසිංහ ඇමති තුමා, සන්හස් නිලය මුකවෙටි තන තුර හා භාණ්ඩාගාර නායක ධුරයද ධැරූ බවත් පසුව අධිකාරම් ධුරයට පත්වූ බවත් මේ පද්‍යයෙන් ප්‍රත්‍යක්ෂවේ. නන්නූර්තුන් මැති වරයා "සන්හස්" නිලයේ සිටිබව පුරාණ නාමාවලියේ පෙණේ.

**51. කැ මැ ති ලෙසින් පානා අවිසරම 1 න ඳ**
**බ ලැ ති නොපිපි පානා සුද මැදට වැ ද**
**රූ වැ ති අනගි නානා අබරණ පැල ඳ**
**සි පි ති දෙපස සේනා නායක වරූ ද**

**අන්වය:**–අවිසරම නද කැමැති ලෙසින් පානා සුදමැදට වැද නොපිපි පානා බලැති සේනානායක වරූද අනගි නානා රූවැති අබරණ පැළඳ දෙපස සිපිති.

**52. ආ ක ල ගියකලක් දූන අකුසලෙන් මි දී**
**2මී ත ල රකිණ නිරිඳුන් සේම තුති ල දී**
**සී ත ල නිබොරූ නෙපුලෙන් 3 සතට සෙත යෙ දී**
**වා ස ල මුදලිවරූ හැම සිටිති එහි සැ දී**

---

1 නද 2 මී ත ල රකිණ නිරිඳුන් සේම නිති ල දී–මුද්‍රිත
මී ත ල රකිණ සුරිඳුන් සේම තුති ල දී–ඇතැම්
3 "සත සෙතට යෙදී" වැඩියක්

අන්වය:-අකල ගියකලත් දූන අකුසලෙන් මිදී මිතල රකිණ සිරි ඳුන් සේම තුති ලදී සිතල නිබොරු තෙපුලෙන් සතට සෙත යෙදී හැම වාසල මුදලිවරු සැදී එහි සිටිති.

සංලක්ෂ්‍ය:-අකුසලෙන් මිදී-පස්පව් දශඅකුශල අදි පාපයන් ගෙන් මුක්තවූ බැව් හැඟවීමෙන් මේ මුදලිවරුන්ගේ දෛව සදෘශ්‍යය දක්වයි.

53. නො ව ස ස ලේ දූන අයවැයදමේ සැ පි ත්
ස ඳ ස ස ලේ ලෙස එකතුව නොපැ පි පි ත්
මු ව ක ම ලේ බොරු නොවකා සිතේ ලෙ පි ත්
අ ර මු ද ලේ ලේකම් මුදලිවරු සි පි ත්

අන්වය:-සසලේ නොව අයවැයදමේ සැපිත් දූන සඳ සසලේ ලෙස පිපිත් නොපැ එකතුව මුවකමලේ බොරුත් සිතේ ලෙපිත් නොවකා අරමුදලේ ලේකම් මුදලිවරු සිපිත්.

54. වි ම ති නොවී දූනගෙන අදිකරණ අ රු ත්
පැ වැ ති ලෙසම කියමින් හැමතැනම සු රු ත්
නැ වැ ති සිතින් අකුසල් අවගුණත් බො රු ත්
සි පි ති පසෙක වාසල මුඛවෙට්ටි ව රු ත්

අන්වය:-විමතිනොවී අදිකරණ අරුත් දූනගෙන පැවැති ලෙසම සුරුත් හැමතැනම කියමින් අකුසල් අවගුණත් බොරුත් සිතින් නැවැති වාසල මුකවෙට්ටි වරුත් පසෙක සිටිත්.

55. මෙ සේ නොයෙක් මැතිසෙන් පිවිස සිටිස දේ
එ සේ සිටිනා පරසිඳු මැතිවරන් මැ දේ
ල සේ නො හොස් අවසරලත් විටෙක වැ දේ
තො සේ වෙමින් තොප අවසර ගැනුම යෙ දේ

56. වන් ඉඳුසබාවට —සබාවෙන් ගුරුළිඳුගේ,
නරනිඳු සබාවට—නොබාවැද මිතුර! තොද සිතුසේ.

අන්වය:-මිතුර තොද ඉඳුසබාවටවන් ගුරුළිඳුගේ සබාවෙන් නරනිඳු සබාවට නොබා සිතුසේ වැද

සංලක්ෂ්‍ය:-ඉඳුසබාව-ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ සභාවයි. ඊට සුධර්මා යයි කියනු ලැබේ. ශක්‍රයා එම සභාවට පිවිසෙන කල්හි ප්‍රජාපති වරුණාදි දෙවියෝද ප්‍රවිෂ්ටවෙත්. එහි ධර්මදෙශනාවක්ද පවත්වන බව කියාතිබේ. දිව්‍යානුභාවසම්පන්න ඉන්ද්‍රාදි දෙවියන්ගේ එම සභාවට මේ රජයාගේ සභාවද උපමිතය.

57. ඇ සි පි ය පමණකින් පෑ නරඟනන් ර යේ
සි න පි ය වඩන රූසිරෙන් නරනිඳුන් ළ යේ
සි ටි පි ය නො සොල්වා සිටි වරඟනන් ර යේ
දූ ක පි ය මිතුර නෙත සිත 1 තුටුකරන් න ගේ

**අන්වය:**–ඇසිපිය පමණකින් නරඟනන්රගේ පා සිත පියවඩන රූසිරෙන් නරනිඳුන්ළයේ සිටිපිය නොසොල්වා සිටි වරඟනන් රයේ දූක පිය මිතුර නගේ නෙත සිත තුටුකරන්.

58. වැ හෙ න සුනෙර හැලිමෙන් පැතිරගෙන තු බේ
ස ල න සෙමෙර පවනින් ඉතිර ගෙන සෙ බේ
දු ව න සිහිල් සොඳ 2 සුවඳැල් පහස ලැ බේ
හි ම න නිවෙසි නරනිඳු දුටු තැනම තු ඹේ

**අන්වය:**–තුබේ පැතිරගෙන සුනෙර වැහෙන හැලිමෙන් සලන සෙමෙර පවනින් සබේ ඉතිරගෙන දුවන සිහිල් සොඳ සුවඳැල් පහස ලැබේ. නරනිඳු දුටුතැනම තුඹේ හිමන නිවෙසි.

**සංලක්‍ෂ්‍යා:**–

"වැ හෙ න සුනෙර හැලිමෙන් පැතිරගෙන තු බේ
ස ල න සෙමෙර පවනින් ඉතිරගෙන සෙ බේ"

ආකාශ කුහරයෙහි ව්‍යාප්තවගෙන මේරුපර්වතයෙන් හෙවත් මේරුපර්වතයාගේ උභයපාර්ශ්වයෙන් වැහෙන්නාවූ නිර්ඣර සඳෘශවූ චලමානචාමරයයි කීමෙන් රජුළඟ සලනු ලබන චාමරයෝ මේරු පර්වතයාගේ දෙපසින් වැහෙන ජලප්‍රවාහ දෙකකට සමකරනු ලැබෙත්. මේරුපර්වතය සුවර්ණ වර්ණවේ. එම පර්වතයාගේ උභය පාර්ශ්වයෙන් ගලාබසින්නාවූ ජලප්‍රහාරයෝ ධවලවර්ණ වෙත්. රජයාගේ දෙහවර්ණයද සුවර්ණ වර්ණවේ. තත්ප්‍රකාර රජයාගේ දෙපස සලනු ලබන්නාවූ චාමරයෝත් ධවලවර්ණ යුක්තවෙති. එබැවින් සුවර්ණවර්ණ මේරු රජයාට සුවර්ණවර්ණ රාජයාද, ධවලවර්ණ ජලප්‍රභාව යට ධවලවර්ණ චාමරවයද උපමිතය. මෙයින් පරාක්‍රමබාහු රජයාගේ පුණ්‍යමාහාත්ම්‍යාතිශයම ප්‍රතීයමානයි.

**"සෙමෙර":**–චාමර යන මාගධ හෝ සංස්කෘත ශබ්දයෙන් තද්භවවිය. මේය "චමරි" යන මෘගවර්ගයාගේ වාලධියයයි කියනු ලැබෙයි. මෙය ව්‍යාඝ්‍ර වර්ණවශයෙන් ධවලතරයයිද දක්වත්.

1 සතුටුකරනගේ:–"වැඩියක්" 2 සුවඳැති-මුද්‍රිත

59. දි නි ඳු න් [1]කිරණවන් මැති මුව සියපත ට
ය ලි ඳු න් රහස් යටිවන් රජු සවනත ට
කොඬොලින් නික්ම මිණිරැස් පැතිරෙයි අව ට
ව න මෙ න් පහන් වෙයි එම කිරණ න සිත ට

**අන්වය:**– මැති මුව සියපතට දිනිඳුන් කිරණවන් යලි රජු සවනතට දුන් රහස් යටිවත් මිණිරැස් කොඬොලින් නික්ම අවට පැතිරෙයි එම කිරණ න සිතට වනමෙන් පහන් වෙයි.

**සංලක්ෂ්‍ය:**– රාජසභාවෙහි වැඩහුන් රජහුගේ කර්ණයුග්මයෙහි පිලන්ධිත සෞවර්ණ කුණ්ඩලාභරණ යුග්මයෙහි ඔබ්බනලද, මාණික්‍යයන්ගෙන් නික්මෙන රශ්මිමාලාව සභාවෙහි සැමතන්හිම ව්‍යාප්තවූයේ පවතියි. තත්ප්‍රකාර මාණික්‍ය රශ්මීන්ගේ ප්‍රවෘත්තිය ද්විප්‍රකාරයකින් විශිෂ්ටකොට දක්වනු ලැබේ. එනම්:– මන්ත්‍රීන්ගේ මුහුණු නැමැති ශතපත්‍ර ප්‍රබොධයට රජු විසින් දෙනලද සූර්‍යරශ්මියක් වැනියයිද යලිත් මන්ත්‍රීන් විසින් රජුගේ ශ්‍රවණාන්තයට යොදනලද රහස්‍යයෂ්ටියක් වැනියයිද ප්‍රකාශිත ද්විප්‍රකාරයයි. රජහුගේ කර්ණයුග්මයෙහි පිලන්ධිත කුණ්ඩලාභරණයන්හි ඔබ්බනලද මැණික් වලින් නික්මෙන රශ්මිය ලතාවක්සේ නොහොත් කම්බියක් සේ නැතහොත් මල්මාලාවක් සේ සෑදී සිටගෙන මන්ත්‍රීන්ගේ මුහුණු පෙලට වැටී බබලයි. එය කුමක් වැනිදැයි යතහොත්:–

එය මන්ත්‍රීන්ගේ මුහුණු නැමැති පියුම් ප්‍රබොධ කිරීමට රජු විසින් යවනලද සූර්‍ය රශ්මියක් වැනියයි ප්‍රකාශිතය. සූර්‍යරශ්මිය ස්පර්ශයලත් කල්හිම ශතපත්‍රයන්ගේ ප්‍රබොධය වන්නාක් මෙන්ම රාජයාගේ මුඛදර්ශන මාත්‍රයෙන් මන්ත්‍රීන්ගේ ප්‍රබොධාතිශයද මෙයින් සූචිතයි. මේ මණි රශ්මිය පිළිබඳ එක් ප්‍රකාරයකි. ද්විතීය ප්‍රකාරය කෙසේදයත්? රාජසභාස්ථ තනමන්ත්‍රීන්ගේ මුහුණු පෙලට පතිතව ලතාකාරයෙන් පැණෙන එම රශ්මියට රජුගේ කර්ණය දක්වා එකසේම අවිච්ඡින්නව පවතියි. එයම මන්ත්‍රීන් විසින් රජුට යම් යම් රහස් ප්‍රවෘත්ති දක්වන පිණිස මන්ත්‍රීන් විසින් රජුගේ කර්ණයට යවා ගලපා තිබෙන රහස්‍ය යෂ්ටියක්හා සමයයි කිය යුතුයි. මෙයින් රාජයාගේ කර්ණාභරණයන් පිළිබඳ අසදෘශ දීප්තතර භාවය ප්‍රකාශිතයි.

**රහස්යටි**–වැලිපෝන යට කියයුතු නමක්සේ පෙණේ. මෙහි "යෂ්ටි" නම් ලතාව හෝ මල්දමයි. "ගාත්‍රයෂ්ටිඃ, ශරීරලතා"–යනුද "හාරයෂ්ටිඃ, කුසුම මාලයා" යනුද සෘතුසංහාරටීකාදියයි.

---

1 කිරණ මෙන්

60. සි නි ඳු පහන් පැහැ ඇති දෙයම එක්කො ට
ප සි ඳු සබය පිරිබඩ ගන්නා ලෙස ට
නි රි ඳු බරණ රැස් [1]වැතිරෙයි විපින් වි ට
එ සි ඳු බලා සිට තගෙ සිත සතුටු කො ට

**අන්වය** :- සිනිඳු පහන් පැහැ ඇති දෙයම එක්කොට පසිඳු සබය පිරිබඩගන්නා ලෙසට නිරිඳු බරණරැස් විපින්විට වැතිරෙයි. එසිඳු බලාසිට තගෙ සිත සතුටුකොට

**සංලක්ෂ්‍ය**:-රජයාගේ ශරීරස්ථ ආභරණයන්ගෙන් නික්ම යන රශ්මි මාලාව එම රජසභාගත පෘථිවිතලයෙහි වැතිරගෙන හෙවත් පතිතව දෘශ්‍යමානවෙයි. එය කුමක් වැනිදැයි යතහොත්? ලොව ඇතිතාක් කාන්තිමද් ද්‍රව්‍යවර්ගයන් එක්කොට සාදූ පෘථිවිතලයෙහි අලෙපකලාක් වැනියයි කියයුතු යනු මෙහි භාවයයි.

61. ලො ව ට දිපි හි ට ව නු කො ට කොප යන යතු ර
සි ත ට සි ත ට එ ම කො ට වඩමින් අද ර
[3]පි ය ට පි ය ට බ ල කො ට ගෙන සිතෙයි වැ ර
එ වි ට ර ජු ට න ම කො ට රැගෙන අවස ර

**අන්වය**:-තෙ.ප යන යතුර ලොවට පිහිටවනුකොට එම සිතට කොට අදර වඩමින් සිතෙහිවැර පියට පියට බලකොට ගෙන එවිට රජුට නමකොට අවසර රැගෙන

## ගමනාරම්භය.

62. තු ස ර තු ස ර කර සිහිලස කර ඉ ක් ම
අ ඹ ර ත ඹ ර කර දිනකර එන තෙ ක් ම
බැ හැ ර නොහැර සිත සිහිකර පිරිත ක් ම
නි ස ර නි ස ර! මම්තුර! මෙපුරෙන් නි ක් ම

**අන්වය**:-තුසර තුසරකර සිහිලස ඉක්මකර දිනකර අඹර තඹරකර එනතෙක්ම සිත බැහැර නොහැර පිරිතක්ම සිහිකර මම්තුර නිසර නිසර මෙපුරෙන් නික්ම.

**සංලක්ෂ්‍ය**:-**සිහිකර පිරිතක්ම**-යන්නෙන් කරණීයමෙත්තාසූත්‍ර නම් ආරක්‍ෂා ධර්මය පක්ෂියා විසින් ස්මරණාභිබැව් ප්‍රකාශවේ. ඒ බව පරෙවි සන්දේශයෙහි පැණෙන:—

"සි රි බ ර මෙනුවරින් මහරම් ඉටු මි තු රූ
සි හි ක ර යතුරූකර කරණීමෙත් සු තු රූ"

යන්නෙන්ද අවබොධවේ.

---

1 පැතිරෙයි-මුද්‍රිත. 2 "පිහිටවනුහට"-මුද්‍රිත,
3 ජයට සතට-පත්පොත්

## මාර්ග වර්ණනා.

63. සු පි පි ක ම ල් ම හ නෙ ල් පෙති ඇතිරි පි ට
1උ ත් බි ඟු දූ ල් ව ත නි ල් බිජුවට රඟ ට
දි සි ම න ක ල් ව හ ස ල් දෙර ඉදිරි පි ට
2සි ට ම ඳ ක ල් සු වි ස ල් කොන්තගංතො ට

**අන්වය:**–සුපිපි කමල් මහනෙල් පෙති ඇතිරි පිට උත් බිඟුදූල් නිල් බිජුරඟට වත මනකල් වහසල්දෙර ඉදිරිපිට දිසි සුවිසල් කොත්තගං තොට මඳකල් සිට

**සංලක්ෂණ:**– "සු පි පි ක ම ල් මහනෙල් පෙති ඇතිරි පි ට
උ ත් බි ඟු දූ ල් ව ත නිල් බිජුවට රඟ ට"

මෙයින් ප්‍රකාශවන්නේ පද්මොත්පලයන් පිළිබඳවූ වර්ණනාවෙකි. පිපීගිය පද්මපත්‍ර මතුයෙහිද උත්පල පත්‍ර මතුයෙහිද නිරතුරුව භෘංගසමූහයා ක්‍රීඩා කෙරෙමින් සඤ්චාරණය කරයි. එම පුෂ්පපත්‍රයන්හි පැණෙන නීල වර්ණ භෘංගපංක්තිය නීලවර්ණවූ පද්මොත්පල බීජයන් හා සමයයි සැලකිය යුතුබැව් ප්‍රකාශිතයි.

64. ත ද ව නො ගො ස් යන රඟ නොපෙණෙන ර ඟ ට
ම ඳ ව නො ගො ස් මඳනුවණෝ ගති ර ඟ ට
ඇ ද ව නො ගො ස් දුදනන්ගේ සිතු ර ඟ ට
ත ඳ ව නො ගො ස් දියපිට නොසිට ත ර ඟ ට

**අන්වය:**–යනරඟ නොපෙණෙන රඟට තදව නොගොස් මඳනුවණෝ ගතිරඟට මඳව නොගොස් දුදනන්ගේ සිතුරඟට ඇදව නොගොස් තරඟට තඳව දියපිට නොගොස් නොසිට

65. තු ලා ග න ව ලා කුළු විදුලි වි දි ය
නි ලා ම න ක ලා තුරු දෙපස වි දි ය
දු ලා ව න ම ලා මැලි සුවඳ වි දි ය
බ ලා සි රි ප ලා ගොස් එතොට වි දි ය

**අන්වය:**–විදිය විදුලි ගනවලාකුළුතුලා සුවඳ විදිය මලා මැලි දුලාවන දෙපස විදිය මනකලා නිලාතුරු සිරිබලා එතොට විදිය පලාගොස්

**සංලක්ෂණ:**–මෙයින් ප්‍රකාශවන්නේ නදියගේ උභය පාර්ශ්වගත වෘක්ෂයන් පිළිබඳ වර්ණනාවකි. කෙසේද? සුගන්ධය විහිදුවන පුෂ්පයන්ගෙන් බබලන්නාවූද නදියගේ උභය පාර්ශ්වයෙහි ව්‍යාප්තව සිටියාවූද, සිත්කළුවූ නීලවර්ණ වෘක්ෂයන්ගේ ශ්‍රී විලාසයට විස්තීර්ණවූ විද්‍යුත් ඇති නීලවර්ණයෙන් ගහනවූ වලාහක කූටයක් උපමාකොට

---

1 හුත්බිඟුදූල් එතනිල් බිජුවට රඟට. 2 සිට මනකල්

දක්වන ලදී. කෘෂ්ණවර්ණයෙන් ඝනවූ මේඝපටලයෙක්හි ස්වර්ණ වර්ණ විදුලියක් පැතිරී සිටීමමෙන් ගහනවූ නීලවර්ණ පත්‍රපඞ්ක්තීන්ගෙන් යුත් වෘක්ෂයන්හි ස්වර්ණවර්ණ පුෂ්පපඞ්ක්තීන්ගෙන් භ්‍රාජමාන භාවය දතයුතුය. මෙහිදී පුෂ්පයන්ට විදුලියද වෘක්ෂයන්ට මේඝ පටලයද වර්ණවශයෙන් සදෘශකළ අයුරු මනාසේ වැටහේ.

මේ පද්‍යයෙහි 1–2–3 වෙනි පාදාවසානගත "වීදි" යන ශබ්ද ප්‍රකෘතිත්‍රය සංස්කෘත "විකීර්ණ-විස්තීර්ණ" යන ශබ්දවයෙන් හෝ "මාගධ" "විකිණ්ණ-විත්ථිණ්ණ" යන ශබ්දවයෙන් හෝ තද්භවව් පළමුකොට "විහි"යයි හෙළුබසෙහි සිඩයි. පසුව ඇතැම් තැන ඡන්දෝහෙතුවෙන් මධ්‍යාක්ෂරය වන "හ" කාරය ලොප්වීමෙන් හා මාත්‍රාවෘඩිකිරීමෙන් "වීදි" කියාද මාත්‍රාහානිවීමෙන් "විදි" කියාද සිඩවූ අයුරු ව්‍යවහාරයෙහි දෘශ්‍යමානවේ. "වීදි" යන්නට යට දක්වූ තුන්පලම නිදර්ශනයයි සලකත්වා. "විදි" යන්නට වනාහි සැළලිහිණි අස්නෙහි:-

"සැ දි රත තඹර පෙල රන තිසරුන් රුවැ ති
වි දි දියද හර ලෙලදෙන දිගුනරු පටැ ති"

යන්නෙහි "විදි" යන්න නිදර්ශනයි. "විදි, විසිර්ණවූ" යනු එහි සන්න පාඨයි. මෙසේ "විහිදි-වීදි-විදි" යන ශබ්දත්‍රය විස්තීර්ණාර්ථවාචක බව ස්ඵුටය. එම පද්‍යයෙහි සතරවන පෙදෙහි "වීදි" යන්න "වීථි" යන අර්ථ ඇත්තේය. එවිට "වීථි" යන්නෙන්ම එය තද්භවවීයයි සිතිය යුත්තේය.

66. ලැ ග ස න වා යෙහෙකැයි අම්බලම කො ට
ත ර ස ල වා සනසැනහි සන ලෙස ට
උ ද ස දි වා කර මැති කරවූ රුව ට
උ ද ස දි වා කර පොකුණේ ගොසින් සි ට

**අන්වය:**-ලැග යනවා යෙහෙකැයි අම්බලමකොට සන තරසලවා සැනහී සනලෙසට උදසදිවාකර මැති රුවටකරවූ උදසදිවාකර පොකුණේ ගොසින් සිට

**සංලක්ෂ්‍ය:**-'තර' මෙය 'ත්වර' යන සංස්කෘත ශබ්දයෙන් තද්භවවිය. ගමන වේගය යන අර්ථයි.

67. පි යා මැ ද පි යා මුළුලොවට එවිට ම
පි යා ව න පි යා වනගමන නොහැර ම
පි යා යු ග පි යා කෙන නො ගොසින් මග ම
පි යා ස ර පි යා සර කර මිතුරු තු ම

අන්වය:-එවිටම මුදුලෝවට පියා පියාමැද පියා වන පියා වන ගමන නොහැරම පියාපුග පියාගෙන මගව නොගොසින් පියාසර මිතුරුතුම පියාසර කර

68. ස ර ද ව ලා කුළුලෙස පැතිර නො ගො සි නී
දු ව න බ ලා වැලසහ විලම නො ගො සි නී
මි තු ර බ ලා පිපිවන පිරි බිඟු ගො සි නී
ස තු වූ ව ලා වනතින් මඳනැන් ගො සි නී

අන්වය:-මිතුර සරද වලාකුළුලෙස පැතිර නොගොසිනි විලට දුවන බලාවැල සහ නොගොසිනි බිඟු ගොසිනි පිරි පිපිවන බලා සතුටුවලා වනතින් මදනැන් ගොසිනි.

සංලක්ෂ්‍ය:-"ස ර ද වලාකුළුලෙස පැතිර නො ගො සි නී"

ශරද් ඍතුවෙහි වලාකුළු ජලභාරයෙන් තොර හෙයින් ඉතා සැහැල්ලු වෙති. එබැවින් මාරුත වෙගයෙන් වලාකුළු කුඩා කුඩා කැබැලිකොට අහස් කුස පලින් පල විසුරුවා හරිනු ලැබෙත්. පක්ෂියාටද එබඳු වලාකුළුසේ පැතිර නොයායුතුයයි කිමෙන් අහස් කුස තැනින් තැන පියාඹමින් කාලය ගතනොකොට කෙළින්ම යායුතුබව දක්වනු ලැබේ.

ශරත්කාල මෙඝවර්ණනාවක් ඍතුසංහාරයෙහි:-

"ව්‍යෝම ක්වචිද්‍රජතශඞ්ඛ මෘණාලගෞරෛ-
ස්ත්‍යක්තාම්බුභිර්ලඝුතයා ශතශඃ ප්‍රයාතෛඃ,
සංලක්ෂ්‍යතෙ පවනවෙගචලෛඃ පයොදෛ
රාජෙව චාමරවරෛරුපවීජ්‍යමානඃ"-සී.

69. ව න සැ වු ලේ දෙන පිය නද අසා ගෙ නේ
ම ග තැ වු ලේ හැරසිපි තොපට සබඳි නේ
බ ව අ වු ලේ දුරලන මොක්පුරය මෙ නේ
ගු රු බැ වු ලේ සරියට මහ වෙහෙර පෙ නේ

අන්වය:-සබඳිනේ වනසැවුලේ දෙන පියනද අසාගෙනේ මගතැවුලේ හැර සිපි තොපට බව අවුලේ දුරලන මොක්පුරය මෙන් මහවෙහෙර ගුරුබැවුලේ සරියට පෙණේ.

සංලක්ෂ්‍ය:-"සැවුලේ"-මෙහි ශබ්ද ප්‍රකෘතිය "සැවුල්" යනුයි. "සාවල්"[1] යන දෙමළ වචනයෙන් තද්භවයිය.

"තැවුලේ"-මෙහි ශබ්දප්‍රකෘතිය "තැවුල්" කියාවේ. "තපන" යන්නෙන් වූ තද්භව ශබ්දයෙකි. තැවීම යන අර්ථ ඇත්තේය.

**70.** තු න් දෙ ස් දුරැර සිත මුනිපුදට සතු වු ව
පි න් රැ ස් කරන 1සුදනැති ඇමට පෙර වූ ව
න න් ස ස් කෙත් වතිනි නිති සැදුණු නොපවු ව
2ම න් තො ස් කරම දකු වම් පසෙහි ගොත වු ව

**අන්වය:**–සිත තුන්දෙස් දුරැර මුනිපුදට සතුටුව ඇමට පෙරටුව පින් රැස්කරන සුදනැති නන් සස්කෙත් වතිනි නොපටුව නිති සැදුණු ගොත වුව වම් පසෙහි මන්තොස්කරම දකු.

**සංලක්ෂ්‍ය:**–තුන්දෙස්-ලොභ, වෙෂ, මොහ යන දොෂත්‍රයයි. කුසල් සිත් දූෂ්‍යකරන අපීයෙන් දෙස්යයි කියනු ලැබේ.

‘ගොතටුව’’-මෙය වෘක්ෂ විශෙෂයකට නමක්සේ පෙණේ. මේ වර්ගය බහුලව පැවැති හෙයින් තත්ප්‍රදෙශයටද ඒ නාමය ව්‍යවහාරයයි සලකමු.

**71.** පැ ල ඳ බරණ පිපි දෙඹ තුරු වන පිවි ස
සු ව ඳ විහිද මල් කැන් ගවසා සිර ස
බො ළ ඳ ළඳුන් සිටිනා සුරගනන් ලෙ ස
වෙ ළ ඳ ගොඩද සිරි නරඹව දකුණු ප ස

**අන්වය:**–අබරණ පැලඳ පිපි දෙඹතුරුවන පිවිස දුවද විහිදි මල් කැන් සිරස ගවසා බොළඳ ළඳුන් සුරගනන්ලෙස සිටිනා වෙළඳගොඩ සිරි දකුණුපස නරඹ.

**සංලක්ෂ්‍ය:**–‘‘විහිදි’’65 වන කවෙහි සංලක්ෂ්‍යය බලනු.

**72.** අඟට ගෙන රන්මැටි—සිට දිගටකුර අදිමි න්
ගවයන් සිටි පොරට—ඕවිටි බලා සතුටි න්

**අන්වය:**–සරලයි.

**සංලක්ෂ්‍ය:**–අඟට ‘‘මෙය කරණාර්ථයෙහි සපදන් විබනයි. මෙ ‘‘අඟ’’ යන ශබ්ද ප්‍රකෘතිය වනානි ‘‘ශෘංග’’ යන්නෙන් බිඳී ‘‘සඟ-හඟ-අඟ-අං’’ කියා සිටීයි.

**73.** අ ත් සි රි මේ යයි යනලෙසට එගොඩ ට
කි ත් සි රි මේ වන් රජු කරවූ රුව ට
සි ත් පි රි මේ වර යුතු විසිතුරු රඟ ට
කි ත් සි රි මේ වන් වෙහෙරට ගොසින් සි ට

**අන්වය:**–එගොඩට අත්සිරි මේයයි යනලෙසට කිත්සිරි මේවන් රජු රුවට කරවූ විසිතුරු රඟට සිත්පිරි මේවරයුතු කිත්සිරි මේවන් වෙහෙරට ගොසින් සිට.

---

1 සැදුහෙත්-මුදිත; සුදනන්-ඇතැම්. 2 මන්තොස් කරව දක.

සංලක්ෂ්‍ය:-"සිත්සිරි මේවන් වෙහෙර"-එගොඩ කැලණිය නමින් ප්‍රකට සිද්ධස්ථානය.

74. ක ම ද  අ ක ම ද  1 පස්කඳ සබව හෙළිකො  ට
ව ර ද  ව ර ද  හැර පින්කල සව්සත  ට
ස ර ද  ස ර ද  සඳවැනි වතැති 2 මුනි සෙ  ට
නැම ද  නැම ද  සිත අඳරින්ම සිහිකො  ට

අන්වය:-කමද අකමද පස්කඳ සබව හෙළිකොට වරද වරද හැර පින්කල සව්සතට සරද සරද සඳවැනි වතැති මුනිඳු සෙට සිහිකොට සිත අඳරින්ම නැමද නැමද.

සංලක්ෂ්‍ය:-"සරද-සරද"-මේ ශබ්දද්වය "සරද-ශරත්" යන ශබ්දද්වයෙන් තද්භවවිය. "සාරද" යන්නෙහි තේරුම නම් උත්තමාර්ථයක් දෙන්නාවූ යනුයි. ශරත් යන්නෙහි අදහස නම් එනම් කාලයයි ගතයුතුයි.

75. දු ටු ව ප බෝ  දසවන 3 සත සිත නි බ  ඳ
ප ව ති න බෝ  පුදවන් වෙසෙසින් නොම  ඳ
මු නි පි රි බෝ  කල මුනි දුතුවෙන් බ  ඳ
සි රි ම හ බෝ  දුගැප් පැදකුණෙන් වැ  ඳ

අන්වය:-දුටුව සත සිත නිබඳ පබෝදය වන වෙසෙසින් පවතින නොමඳ බෝපුදවන් මුනි පිරිබෝකල සිරිමහබෝ මුනි දුතුවෙන් බඳ සිරිමහබෝ දුගැප් පැදකුණෙන් වැඳ.

76. සි ය ල්  දියත සත වෙත නිතියෙන් දුව  න
නි ම ල්  මුනිඳුගේ සිත මෙත් කුළුණු මෙ  න
වි ස ල්  සමුදුරට ගොස් නිතොරව වදි  න
සි හි ල්  සිලිල් පිරි ගං තෙරෙහි සිට ගෙ  න

අන්වය:-සුගමයි.

සංලක්ෂ්‍ය:-මේ ගංගාවෙහි ශීත ජලය බැසගොස් සමුද්‍රයට පිවිසෙන්නේය. එමෙන් තථාගතයන් වහන්සේගේ නිර්මලවූ කරුණා මෛත්‍රී නැමැති ජලයද සියලු සත්ත්වයන්ගේ හෘදයාභ්‍යන්තරයට වැදීමෙන් යහපත් ශාන්තියක් ඇති වේ.

"සමුදුර":-සමුද්‍ර යන සංස්කෘත වචනයෙන් සිද්ධ විය. "මුහුදු" යනු සමුද්ද යන මාගධ වචනයෙන් සිද්ධ සේ සලකති. 'මහොදධි' යන්නෙන් 'මුහුදු'යි සිද්ධේ. විමසත්වා.

1 පස්කම් සබව-වැඩියක්, 2 මුනිඳුට-ඇතැම්. 3 සත සතුන් බඳ.

# කැලණි ගඟ වැනුම්.

77. ස ම න ල මුදුන සිරි පද ඔබන මඟුල ට
නි ක ස ළ මහ සඟන ගෙන වඩින මුනිඳු ට
පැහැ දු ල සුනිල් මැණිකොන් කළ මහ ලෙස ට
මන දෙ ළ පිරෙසි ගඟ සිරි සර 1 දුවු තොප ට

**අන්වය:**–සමනල මුදුන සිරි පද ඔබන මඟුලට නිකසළ මහ සඟන ගෙන වඩින මුනිඳුට සුනිල් මැණිකොන් කළ මහ ලෙසට පැහැදුල ගඟ සිරි සර දුවු තොපට මනදෙළ පිරෙසි.

**සංලක්ෂ්‍ය:**–මෙයින් කල්‍යාණි නදිය පිළිබඳ වර්ණනාතිශයක් නිර්දිෂ්ට වේ. අති නීල වර්ණ ජලයෙන් පරිපූර්ණව පෘථිවියෙහි මාණික්‍යයන්ගෙන් නිර්මාපිතවූ මාර්ගයක්සේ පෙණේ. එය කුමක් සඳහා තනනලද්දේදැයි කියත්හොත්? තථාගතයන් වහන්සේ සමන්තකූට පර්වතයට වැඩම කරනා දිනයෙහි මණිඅක්ඛික නම් නා රජහු විසින් උන්වහන්සේගේ වැඩමවීම පිණිස මැණික්වලින්ම කරනලද්දක්සේ උත්ප්‍රේක්ෂා කරනලදී. සමන්කූළට තථාගතයන් වහන්සේ වැඩම කළේ බුදුවූ අටවන වර්ෂයෙහි වෙසක් මස පුර පසළොස්වක් දිනයෙහි මණිඅක්ඛික නම් නා රජුගේ අයැදුම පරිදි වේ.

**"නිකසළ"** මෙය "නික්කසට" යන්නෙන් තද්භව විය. කසට නම් කෙලෙස් වලට අභිධානයෙකි. කසළ නැතියේ නිකසළයයි විග්‍රහය වේ. අන් අරුත් සමස්. ඇතැම් තැන 'සැපය' යන අර්ථයද කසට ශබ්දයෙන් ප්‍රකාශ වේ. "පීත රසං කසටං වසදෙහුං" යනු නිදර්ශන යි. තදර්ථය ප්‍රකාශකරනවිට "කෙහට" කියා සිටියි. "තුනු කෙහට මරහට නොදෙන තෙක් තුන් දෙරින් සුසිරි පිරුව යෙහේ" සිදත්සඟරා පාඨයි.

78. එ ලි ක ළ වටම රන්කොත් 2 පහමුදු න් නේ
බැ ඳ න ළ 3 දිගුසට'ගෙහි දද වැනෙ න් නේ
පැ හැ දු ල නොයෙක පහපෙල ගඟ පෙණෙන් නේ
ග ඟ තු ල උදුල පුර වැනි නා රදු න් නේ

**අන්වය:**–වටම් එලිකළ රන්කොත් පහමුදුන්නේ දිගුසටගෙහි බැඳ හළ වැනෙන්නේ දද ගඟ පෙණෙන්නේ පැහැදුල නොයෙක පහපෙල ගඟතුළ උදුල නා රදුන්ගේ පුර වැනි.

---

1 "දුටු කලට"–ඇතැම්. 2 "පහමුදුන්නේ" 3 නෙදිගුසටගෙහි,

සංලක්ෂ්‍යඃ-මේ පුරයෙහිවූ ප්‍රාසාද සමූහය තෙම ගඞ්ගාජලයෙහි ප්‍රතිබිම්බ ව්‍යාජයෙන් නිතර දෘශ්‍යමානවන්නේය. එබැවින් එය නාරජුන්ගේ පුරය මෙනැයි දක්වනු ලැබේ. නාරජුන්ගේ පුරය වනාහි මාණික්‍යයන් ඔබ්බාකළ රත්රිදී කොත් ඇති මාණික්‍යමය ප්‍රාසාද පඞ්ක්තීන්ගෙන් ගඟනාවූයේ පෙන මඩුලු විදහාගෙන ඒ මේ තැන දුවන නාගයින්ගෙන් සම්කීර්ණය. ගඞ්ගා නදියෙහි ප්‍රතිබිම්බිත ප්‍රාසාද පඞ්ක්තිය නාගපුරයෙහිවූ ප්‍රාසාදයන්ට සමය. එම ප්‍රාසාද පඞ්ක්ති මස්තකයෙහි ධවජස්තම්භ යෂ්ටීහු පෙන විදහාගත් නාගයන්ට උපමිතය. එසේවූ ධවජය බඳ්ධයෂ්ටීන්ගේ ප්‍රතිබිම්බයන් ජලයෙහි පතිතවූ විට පැනෙන්නේ පෙන මඩුලු විදහා ගෙන ඒ මේ තැන දුවන නාග සමූහයාගේ විලාසයෙනි. මෙසේ හෙයින් මේ පුරය තෙම නාගපුරයට සදෘශයයි වර්ණිතය.

"ෂට"-යෂ්ටි හෙවත් ධවජ බඳින ලීවගීයයි. එය ස්වර්ණ රජතාදියෙන් සාදනලද බව පෙණේ.

79. සු ර ඹ  සොලන සුර ගඟ 1 තුහු තරඟයෙ  නි
සා ල ඹ  නැඟී ඝන ඕදු විදුදරන් මෙ  නි
කො ලඹ  විසල් වත්තල් පුත්තුරු වෙ  නි
නා ර ඹ  යනෙන වෙලෙඳුන් ඔරු පාරුවෙ  නි

අන්වයඃ-සුරඹ සොලන සුරගඟ තුහු තරඟයෙනි සාලඹ නැඟී ඝන විදුදරන් මෙනි විසල් කොලඹ වත්තල් පුත්රුවෙනි ඔරුපාරුවෙනි යනෙන වෙලෙඳුන් නාරඹ.

සංලක්ෂ්‍යඃ-නාරඹ-"රුකුර නරඹ ඈ නිපන් දෑ පියවි නම්" යනු සිදත්සඟරායි. නිෂ්පන්න ධාතුප්‍රකෘති බව ඉන් ස්ඵුටයි. රඝුවංශ 3 සග 14 වන ශ්ලොකයෙහිවූ "දිශඃ ප්‍රසෙ දුර්මරුතොවවුඃ සුඛාඃ-ප්‍රදක්ෂිණාර්චිර්විරග්නි රාද දෙ" යනු ආශ්‍රයකොට කාව්‍යශෙඛරයෙහි 'හුතත් ගිනි දුම්සැල-දිඹිලිගත් වැද ගොසින් තුබතල' යන පද්‍යය ලියූ බව පෙණේ. ප්‍රදක්ෂිණාර්චිඃ-යන්නට දිඹිලි යනු යෙදී තිබේ. පදද්වයම අර්ථයෙන්ද සමානයි. ක්ෂි-යන්නෙන්-ඹි යනු තද්භවවූ බව මින් දතහැක. නිරීක්ෂ-යන්නෙන් නරඹයි තද්භව වේ. එහි-ක්ෂ-යන්නෙන්-ඹ-යනු සිද්ධවේ. එවිට 'නරඹ' යනු නිපන් දෑ පියවි නොව තබ්වදෑ පියවි බව පෙණේ. විමසත්වා.

80. ලෙ ලෙ නා  නන්දද වැද සුර අඟ  සේ
සි පි නා  සුර අඟනන් ගඟ දෙප  සේ
සො ල නා  ලඳ ලිය ගඟ දිය සිනා  සේ
ද කි නා  නගෙ නෙත සිතෙවයි සතො  සේ

1 තුල්තරඟයෙනි-මුද්‍රිත.

**අන්වය:**-වැද පුර අඟනේ ලෙළෙනා නන්දද ගඟ දෙපසේ සිටිනා පුර අඟනන් ගඟදිය සිනසේ කෙළනා ළඳලිය දකිනා: නගේ නෙත සිත සතොසේ වෙයි.

**සංලක්ෂ්‍ය:**-මේ ගං තෙර සිටගත් පක්ෂියාහට අලංකාරත්‍රයක් දෘශ්‍යමාන වන බැව් මේ කවියෙන් ප්‍රකාශ වේ. එනම්:-පුරකාශයෙන් නගන ලද ධවජයෝද-ගංගාතීරස්ථ කාන්තාවෝද-ගඟතුළ කෙළනා පුරඟනෝද යන තුන් කොටසයි. එයින් පක්ෂිරාජයාගේ සිත සතුටුකර ගැන්ම පෙණේ.

**81.** සි ත ලො බ  වඩමින් දුවුදුවු ව  න් නේ
නි ම ල 'බ  තුරු දිව වෙතට උනු  න් නේ
ලෙ ල ප බ  වන ගත කෙළන ළඳු  න් නේ
ග න ගැ බ  සියරැලි විදුලිය වැ  න් නේ

**අන්වය:**-දුවුදුවුවන්ගේ සිත ලොබ වඩමින් නිමල අඹඅතුරු උනුන් නේ වෙතට දිව කෙළන ළඳුන්ගේ ලෙල පබ වන ගත ගනගැබ සියරැලි විදුලිය වැන්නේ.

**සංලක්ෂ්‍ය:**-නීලවර්ණ යුක්ත මේඝපටලයෙක්හි සියගණන් රැලි දෙමින් වොරදනා විදුලි මෙන් නීලවර්ණ ජලයෙහි ඒ මේ තැන ධාවනය කරන ස්වර්ණවර්ණ කාන්තාවෝ ඇත්තාහ. නීලවර්ණ මේඝපටලයට නීලවර්ණ ජලයද ස්වර්ණවර්ණවිදුලියට ස්වර්ණවර්ණ දෙහ ඇති කාන්තාවෝද උපමිතයහ.

**82.** ලෙ ලෙ නා  මෙන් ගඟ තරඟ කනා  ලි ය
කෙ ළ නා  ලෙස එලි බැස දිවනා  ලි ය
පි හි නා  යන එන 1සොඳුරු වනා  ලි ය
සො බ නා  රූසිරි නො හැකි වනා  ලි ය

**අන්වය:**-ගඟතරඟ කනාලිය ලෙලෙනා මෙන් දිවනාලිය එලිබැස කෙළනා ලෙස පිහිනා යන එන සොඳුරු වනාලිය සොබනා රූසිරි වනාලිය නොහැකි.

**සංලක්ෂ්‍ය:**-ගංගාජලක්‍රීඩාතත්පර කාන්තාසමූහයාගේ ආකාරය දැක්වීමට මෙහි ලා උපමාද්වයක් නිර්දිෂ්ටයි. එනම්:-තරඞ්ග මස්තකයෙහි කනකලතා පඞ්ක්තියක් බබලන්නේ මෙනැයි එක් උපමාවෙකි. කනකලතා නම් රත්නින්ම මල් පල පත්‍රාදිය තනා කරනලද ලතාවෝය. ස්වර්ණවර්ණදෙහ යුක්ත කාන්තාවන්ම යථෝක්තාකාර ලතාවෝ උපමිත වෙත්. අනෙක් උපමාව ජල ක්‍රීඩා කිරීමට පත් දිව්‍ය නාග කාන්තාවෝ වෙති. දිව්‍ය නාගවධූයා

1 සොඳුරු මනාලිය-ඇතැම්.

නම් අති දර්ශනීය ස්වර්ණ වර්ණ රූප යුක්ත කොටසකි. මේ උපමාදීව යෙන්ම ගම්‍යමානවන්නේ එම ස්ත්‍රීන්ගේ රූප ලක්‍ෂණය හා ප්‍රසාද ජනක ක්‍රීඩා විලාසයද වේ.

**"කනාලිය"**-කනායෙන් තැනූ ලිය කනාලිය වේ. මෙහි "කනා" යනු කනක ශබ්දයෙන් භින්නයි. ස්වර්ණ යන අර්ථ ඇත්තේ.

**83.** මි නි සෙ ක් දිය පිනා යෙයි එතර ට
අ ග න ක් දිය පිනා 1 එන මෙතර ට
ප හ ර ක් දුන සරණින් ඔහු සිරස ට
අ නෙ ක ක් ඇඬුවා එ සඳෙහි දුරසි ට

**අන්වය:**-මිනිසෙක් දිය පිනා එතරට යෙයි. දිය පිනා මෙතෙරට එන අඟනක් ඔහු සිරසට සරණින් පහරක් දුන. එසඳෙහි අනෙකෙක් දුර සිට ඇඬුවා.

**සංක්‍ෂෙප:**-ගංගාවගේ මෙතෙර සිට එතෙරට පිනා යන පුරුෂය කුගේ ශීර්ෂයට එතෙර සිට මෙතෙරට පිනා එන ස්ත්‍රියක් ස්වකීය පාද යෙන් පහරක් ගැසීයයි මේ කවියෙන් ප්‍රකාශිතය. එම සල්ලාල පුරුෂයා විසින් තමාගේ අභිමුඛයට පැමිණි කාන්තාවගේ යම්කිසි අවයවයක් රාග චිත්තයෙන් මත්ව ස්පර්ශ මාත්‍රය කළ බව හා එම කාන්තාවද ඊට අප්‍රිය භාවය අඟවන්නාක් මෙන් ඔහුට පාරක් ගැසූ බවද හැඟේ. යලිත් තත්ක්‍ෂණයෙහිම දුර සිටි අන්‍ය කාන්තාවක් ඇඬූ බව කීමෙන්ද ඒ පුරුෂයාගේ නියම බිරින්ද එම ගංගාවෙහිම දුර ස්ථානයෙක්හි ජලක්‍රීඩා සක්තව සිටියේ තම ස්වාමිහු විසින් පර ස්ත්‍රියක්හුගේ අංග ස්පර්ශ කරන බව දැක්කා. එසේ හෙයින් තමපුරුෂයා පරස්ත්‍රියක් හා සිත්බැඳී වසතහොත් එයින් තමන්ට වියහැකි වියොදුක ගැන සිතා සෝදුකින් ඇඬූ බවද ගම්‍ය මානයි.

**"පහර"**-මෙය 'ප්‍රහාර' යන සංස්කෘත ශබ්දයෙන් හෝ 'පහර' යන මාගධ ශබ්දයෙන් හෝ තද්භව විය. එවිට ගැසීම යන අර්ථයක් එයින් පහළ වේ. තවත් "පහාර" යන මාගධ ශබ්දයක්ද ඇත්තේය. එයින් බිඳෙන්නේත් "පහර-පාර" කියාමය. එහි තේරුමවාරාර්ථයයි. 'එකප්පහාරනෙව ආගතා' එකවරටම ආවෝය කියායි. මෙසේ 'පහර-පාර' යන්නෙන් තේරුම් දෙකක් බව සැලකිය යුතුයි.

**84.** අ ග න ක පස ගෑ ලතු සිරසෙහි වෑ කි
මි නි සෙ ක ගඟ දිය කෙළියෙන් නොවැළෑ කි
අ නෙක ක ඇස රතුවිය ලතු නොම වෑ කි
ඇ ය ස ක එතරම වෙන දිය කරණෙ කි

**අන්වය:**-අනාකුලයි.

---

1 "එන-එයි" කියාත් පාඨයි.

**සංලක්‍ෂ්‍ය:**-ජලක්‍රීඩායෙහි නිරතවූ එක් අංගනාවක්හුගේ පාදාලිප්ත ලතුරසය හිංසනී නැවරිගිඃකලත් පුරුෂයා ජලක්‍රීඩායෙන් පහනොවැසී කිංමින් කාමුක පුරුෂතෙම ජලක්‍රීඩනය කරන කාන්තාවක්හුගේ පේරීරාවැටියක් ඇපශී කෙළේය. එවිට එම ස්ත්‍රියද ලතුදිය ගෑ පාදයෙන් ඒ පුරුෂයාගේ හිසට පහරක් ගැසීය. එම ලතුරසය පුරුෂයාගේ ශ්‍රීමතුයෙහි චර්චිතවීයයි සැලකිය යුතුයි. අනෙක් ස්ත්‍රීන්ක්හුගේ ලතුරසය නො නැවිරුණු ඇස්දෙක රතුවීයයි කිමෙන්ද එම පහරලත් පුරුෂයාගේ භාර්‍යාව එවේලෙහි ජලක්‍රීඩා පරවසව දුර සිටියේම හත්ප්‍රවෘත්තිය දැක තමාගේ ස්වාමියා අන් ස්ත්‍රියක් සමග පෙම්බැඳ සිටියේ වනැයි අසථාන හිතිඇට පැමිණ හඬා වැලපුණු බැවින් ඒ හෙතුකොට ගෙනම ඇයගේ නයනද්වය රක්තවණ් වියයිද සැලකිය යුතු.

**"ලතු"**-අලක්ත යන්නෙහි තද්භව විය.

**85. දි ය ම න් දියගති දූනගත් අය නි — ති**
**පැ න ග ං ඉවුරෙන් 1 දිශෙයි ගැඹුරැ — ති**
**ඉ දි මි න් දියතුල දුර ගොස් ඉපිලෙ — ති**
**දි ය බු ං දියකෝකිල ගසමින් යෙ — ති**

**අන්වය:**-දියමත් දියගති නිති දූනගත් අය ගං ඉවුරෙන් පැන ගැඹුරැති දියෙහි ඉඳිමින් දියතුල දුරගොස් ඉපිලෙති. දියබුං දියකෝකිල ගසමින් යෙති.

**සංලක්‍ෂ්‍ය:-'දියබුං-දියකෝකිල'**-ජලයටම අතින් ගැසීමෙන් උපදවන ශබ්ද විශෙෂයෙකි. මෙකී ශබ්දය බොහෝදුරට ඇසේ. ගංගා පොකුණුවල ස්නානය කරමින් මෙසේ ශබ්ද පතුරුවමින් කරන ක්‍රීඩාවට දැනුදු 'දියබුං ගැසීම' නොහොත් 'ජබු ගැසීම'යයි කියත්. 'දියබුං දිය කෝකිල' යනු මෙසේ කෙරෙන ජලක්‍රීඩාවකි. "ගසමින් කොළ කොළ යෙති දිය කෝකිල"යි ගිරා සන්දෙශයෙහිද මේ ක්‍රීඩාව දැක්වේ.

**86. පි හි න න 2උඩුකුරුවෙමි නගනත් ග — ග**
**සි ය ප න ඉඳුවර දිසි තිසරුන් 3ර — ග**
**පැ හැ ප න බිඟුරැළ කොඳුනා මනර — ග**
**4සි රි ග න ගග දිසි දිගැස විලසර — ග**

**අන්වය:**-අඟනන් ගඟ උඩුකුරු වෙමින් පිහිනන සියපත ඉඳුවර දිසි තිසරුන් රඟ මනරඟ කොළනා පැහැපත බිඟු රැළ සිරි ගත ගඟ දිගැස විලස රඟ දිසි.

1 'දිශෙයි'-මුද්‍රිත. 2 'උඩුකුරුවෙමි නගනක්-ඇතැම්. 3 'ලග'-වැඩියක් 4 'සිරිගත ගඟදිගුනෙදිගු විලෙස රග'-මුද්‍රිත. මේ පදය පත්පොත් කි-පු ඉතා අඝලවූයේ පෙණේ.

**සංලක්‍ෂ්‍ය:**-එම නදිතොමෝ ස්ත්‍රියකට සමවූ ආකාර ඇත්තීවේ. කෙසේවූ අංගවලින් නදිතොමෝ ස්ත්‍රියකට සදෘශ්‍යවේද යතහොත්? නදියෙහි ශතපත්‍රද, ඉන්දීවරද හංසයෝද, භෘංගයෝද ඇත්තාහුය. ස්ත්‍රිහු රක්තවර්ණ මුහුණුද-නීලවර්ණ නෙත්‍රද-පරිපූර්ණ පයොධරද චලිත චින භ්‍රැයුග්මද ඇත්තාහු වෙත්. එබැවින් ගංගාවෙහිවූ ශත පත්‍රයන්ට කාන්තාවන්ගේ රක්තවර්ණ මුහුණු සමය. ඉන්දීවරයන්ට කාන්තාවන්ගේ දීර්ඝාකාර නෙත්‍රයෝ සමය. හංසයන්ට කාන්තාවන් ගේ පරිපූර්ණ පයොධරයෝ සමය. ඒ මේ තැන පඞ්ක්ති පඞ්ක්ති වශ යෙන් හැසිරෙන භෘංගයන්ට කාන්තාවන්ගේ නෙත්‍ර පක්‍ෂ්ම චල නය සමය. මෙසේවූ ඒ ගංගාවයේද සාම්‍ය වස්තූන්ගේ විද්‍යමාන භාවයම ගෙන ගංගාව කාන්තාවන්ට සදෘශයයි කවීන බැව් සලකත්වා.

**87.** **තරඟ පැහැර ග　තා — කොකු මඟර ග　තා**
**අඟනක් ලවන　තා — මද නොතිබියර　තා**
**තලින ලදිය ගෙ　තා — බියෙන් වැසූ නෙ　තා**
**පුන් සිසි රැස් ප　තා — ඉදුවර සිරි ග　තා**

**අන්වය:**-අඟනක් ගනා කොකුමගර තරඟ පැහැරගත ලවනතා රනාංඟද නොතිබිය තලින් අල දිය ගෙනා බියෙන් වැසූ නෙතා පුන් සිසි රැස්පතා ඉදුවර සිරි ගනාං.

**සංලක්‍ෂ්‍ය:**-ගංගාවෙහි ක්‍රීඩාශක්ත එක් කාන්තාවක්හුගේ දෙහ යෙහි ගැල්වූ කොකුම් කල්කය ගඟතුළ තරංග ප්‍රහාරයෙන් අප ගතව අධරයෙහි ගැල්වූ ලාකුරසය පමණක් ශෙෂවිය. එවිට ළඟ සිටි එක්තරා පුරුෂයෙක් ප්‍රිය තෙපුල් බෙණෙමින් ළඟට පැමිණ එව අධර රාගය මුවෙන් පානය කළේය. එයින් අධර රාගය මදකුත් නොතිබීයයි හඟවනලදී ඊට අනතුරුව එම පුරුෂයා විසින් එම කාන්තාවගේ මුහුණට සවහස්තතලයෙන් ජලය ඉසිනවිට ඇය දෙනෙත් පියාගත්තාය. එසේ පියාගැනීම මුඛ ස්පර්ශය ඔහුට දෙන අදහසින් වේ. එය කුමක් වැනිදැයි යතහොත්? චන්ද්‍රරශ්මි ස්පර්ශය අපෙක්‍ෂාකෙරෙමින් මුකුලිතව සිටි ඉන්දීවරයක් වැනි වේ. ඉන්දීවර යාගේ චන්ද්‍රරශ්මි ස්පර්ශාපෙක්‍ෂාව මෙන් පුරුෂයාගේ අවයව ස්පර්ශ යත් ඇය අපෙක්‍ෂා කළායයි ගලපා අදහස් ගතයුතුයි.

**88.** **මසෙක් ගොදුරු ප　තා — මෙවුලේ මිණි ග　තා**
**එළඳුන් බිය ප　තා — ගන වෙවුලුම් ග　තා**
**එමතු නොවෙයි ඉ　තා — නිල් සෙවෙලැයි සි　තා**
**කොමලඟනන් මු　තා — සරල් වරල් ග　තා**

**අන්වය:**-සරලයි.

•
•

සංලක්ෂ්‍යා:-ගොදුරු සොයා එක් මත්ස්‍යයෙක්තෙම ස්ත්‍රියක් විසින් පිලණිතවූ මෙබලාදෑමයෙහිවූ (බෝපත්‍රාකාර ස්වභාවයෙහි) ඔබ්බවන ලද්දාවූ මාණික්‍යය මස් වැදල්ලකැයි භ්‍රාන්තියෙන් මුවෙන් ගත්තේය. එවිට එම ස්ත්‍රීතොමෝ කම්පිතවූවා. ඒ ළඟට ඒ මත්ස්‍යයාම ස්ත්‍රීන් විසින් ලිහා හෙලනලද කෙශකලාපය දැක මේ දිය සෙවෙලැයි මුලාවෙන් ඩැහැගත්තේය.

89. පමණින් තම ග ලා — ගත දියතුල ග ලා
සිපිනා මින ක ලා — වුවනන මනක ලා
සයුරෙහි පිරි ක ලා — 1 සඳ වැනි දිසි ක ලා
කෙලන ළඳුන් බ ලා — පයැද නොයෙති ප ලා

අන්වය:-තම ගලාපමණින් ගත දියතුල ගලා සිපිනා මිනකලා මින කලා වුවනන සයුරෙහි කලා පිරි සඳ වැනි දිසිකල කෙළන ළඳුන් බලා පය ඇද පලා නොයෙති බල.

සංලක්ෂ්‍යා:-සාගරයාගේ ඉතුවී නගින කලා පූර්ණචන්ද්‍ර මණ්ඩල යක් ඇත්තේ නම් දියෙහි ගෙල දක්වා නිමග්නවූ කාන්තාවන්ගේ මුහුණු පෙලද එසේයයි සැලකිය යුතුයි.

"ගල" යනු තත්සම ශබ්දයෙකි. මෙය තද්භවවූ විට "ගෙල" කියා සිටියි.

90. ගගේ ගැඹුරු තැ නේ — විමසා තැන තැ නේ
ගොසින් කිමිද ගෙ නේ — සුරතින් වැලි ගෙ නේ
ගලිගෙන කෙළිමි නේ — පාමින් කෙළිමි නේ
දුවුවන් සිත සි නේ — වඩවති වෙසෙසි නේ

අන්වය:-ගගේ තැන තැනේ ගැඹුරු තැනේ විමසා ගොසින් කිමිද ගෙනේ සුරතින් වැලිගෙනේ ගලි කෙළිමින් ගෙන පාමින් කෙළිමින් සිත සිනේ වෙසෙසිනේ වඩවති.

සංලක්ෂ්‍යා:-"මිනේ" මත්ස්‍යයන්ට නමකි. පාලි හෝ සංස්කෘත 'මීන' ශබ්දයෙන් තද්භව විය.

91. සුරගන සුර සම ග—සුරගඟ කෙළින කෙළි සේ
බල ගඟ කෙලන මනරඟ—කොමලඟන රඟ මෙලෙ සේ

අන්වය:-සුරගන සුර සමග සුරගඟ කෙළින කෙළි සේ ගඟ මනරඟ කොමලඟන කෙලන රඟ මෙලෙසේ බල.

---

1 'වැනිසඳ'-ඇ.කෑ.ම්.

## මාගී වණීනා.

92. දූ ක  ඝන එන දනන් ලන ගොදුරෙන් ති  ළි ය
එ ක  රඟ වරල් විදහා පෙනෙමින් එ  ළි ය
සැ ක  නොව කෙළි වතල මින් රැළගත් රැ  ළි ය
දූ ක  ගිය තොපට ගනිනෙතරව මස්කෙ  ළි ය

**අන්වය**:-ඝන එන දනන් දූක ගොදුරෙන් තිළිය එකරඟ වරල් විදහා එළිය පෙනෙමින් සැකනොව කෙළිවතල මින්රැළ ගත් රැළිය මස් කෙළිය දූක ගනිත් එනරව ගිය තොපට

**සංලක්ෂ්‍ය**:-"තිළිය" 'තුස' යන ධාතුවෙහි 'ස' කාරයට 'ල' කාරය පිළිපෙරැළිවීමෙන් සෑදුණු නාම පදයකි.

93. මු නි පු ද ය ට  ස පැ මි ණි න න්  සු ර න් රැ  ස
එ හි පුද කොට  හැ ර ගි ය ර න්  වි ම න් ලෙ  ස
දි ලි හැ ම වි ට  ප හ ද ද  ව න්  ගු ව න් කු  ස
සැ ල ණි ය දුට  පැ මි ණෙ යි ම න්  නු ව න් තො  ස

**අන්වය**:-සුගමයි.

**සංලක්ෂ්‍ය**:-බුදුන් පුදනු පිණිස සම්ප්‍රාප්තවූ දෙවියන් ස්විය විමානයන් හැරදමා ගියාක් වැනිවූ ප්‍රාසාදයකි හැඟවීමෙන් මේ පුරසළු ප්‍රාසාදයන්ගේ ශ්‍රී විභූති මහත්ත්වය ඥාපිතයි.

94. මිණිගණ සහ පැමිණි—සක්විති මිණි රුවන මෙ  න්

ද හ සි න්  අඩ රහත් සඟගණ පිරිවරි  න
අ හ සි න්  වැඩ රැසින් දිගු බිතු තවරමි  න

මිණිඅක් නයිඳු කල—මිණි මඩුව තුල වැඩහි  ඳ

මු නි ඳු  දිව බොජුන් වැළඳූ තැනෙහි න  ද
මු නි ඳු  පිහිටුවා කල දාගැබට වැ  ඳ

දෙ ම හ ල්  තු න් ම හ ල්  මුනිහල් දිලි නිබ  ඳ
ග න නි ල්  දු ල් නි ම ල්  බෝසල් පුදා වැ  ඳ
සු වි ස ල්  ප ස් ම හ ල්  සඟසතු ගෙවල් මැ  ද
ම හ ස ල්  ද න් ස හ ල්  දූකඋන් සඳ සබ  ඳ

**අන්වය**:-මිණිගණ සහ පැමිණි සක්විති මිණි රුවන මෙන් දහසින් අඩ රහස් සඟගණ පිරිවරින රැසින් දිගු බිතු තවරමින අහසින් වැඩ මිණිඅක් නයිඳු කළ මිණි මඩුවතුළ වැඩහිඳ මුනිඳු නද දිව බොජුන් වැළඳූ තැනෙහි මුනිඳු පිහිටුවා කළ දාගැබට වැඳ නිබඳ දිලි දෙමහල් තුන්මහල් මුනිහල් ගන නිල් දුල් නිමල් බෝසල් පුදා වැඳ සුවිසල් පස්මහල් සඟ සතු ගෙවල් මැද මහසල් දන්සහල් දූක සබඳ! උන්සඳ.

**සංලක්‍ෂ්‍ය:-**"මිණිගණ සහ පැමිණි සක්විති මිණිරුවන"-

සක්විති රජහුට හස්තිරත්න-අශ්වරත්නාදී දශවිධ රත්නයන් පිරිවර කොට ඇති චක්‍රරත්නයක් අහසින් පැමිණෙන බැව් කියා තිබේ. පරිවාර සංඛ්‍යා හස්ත්‍යශ්වාදි රත්නයන්ටද තථාගතයන් වහන්සේ චක්‍රරත්නයටද මෙහිදී උපමිතයයි සැලකිය යුතුය.

## සන්ධ්‍යා වර්ණනා

95. සි දු තු ල නොසිට නැගි මෙන් 1 වලබගිනි ව ට
දි සි ය ල පබළු කලඹෙව් ලෙල තරඟ පි ට
බැ ඳ හ ල රතුගලක් ලෙස සඳවෙලෙ'න ව ට
පැ හැදු ල රිවිමඬල සකි පෙණෙන න නෙත ට

**අන්වය:-**වලබගිනි සිදුතුල නොසිට වට නැගිමෙන් යල තරඟ පිට ලෙල දිසි පබළුකලඹෙව් සඳවෙලෙන් අවට බැඳ හල රතුගලක් ලෙස පැහැදුල රිවිමඬල සකි! නෙතට පෙණෙන.

**සංලක්‍ෂ්‍ය:-**වඩබාග්නිය නම් සමුද්‍ර ජලාශ්‍රිතව පවත්නා ගින්නයි. එය සමුද්‍රයෙහි නොසිට ව්‍යක්තාකාරයට පැමිණ සමුද්‍රයෙන් නැංගාක් මෙන්ද-නැගෙන මුහුදෙහිව දීර්ඝමානවූ ප්‍රවාලාංකුර එක් රැස්ව තරංග මස්තකයෙහි පැලඹෙන්නාක් මෙන්ද-නැවතත් සන්ධ්‍යා විලාකුළු නැමැති රැහැනින් බැඳ ඔසවනලද රතුගලක් මෙන්ද සූර්‍ය වර්ණිතවේ. සූර්‍යයාගේ අස්තඩගත සමයෙහි ඇතිවියයුතු වර්ණය මෙයින් ප්‍රකාශිතයි.

96. 2දි ය තු ර පැතිර බස්නා තඹවතුරු මෙ නී
දි න ක ර කිරණ අවර'ඹරට වැද ගියෙ නී
නි ල ක ර දිශත පැතිරෙණ අඳුරු ඉඳුරෙ නී
සැ ඩ ක ර කිරණ වැද නැවි ලොව 3 තෙමන මෙ නී

**අන්වය:-**දියතුර පැතිර බස්නා තඹවතුරු මෙනී දිනකර කිරණ අවර'ඹරට වැද ගියෙනී දිශත නිලකර ඉඳුරෙන් පැතිරෙණ අඳුරු සැඩ කර කිරණ වැද නැවි ලොව තෙමන මෙනී.

**සංලක්‍ෂ්‍ය:-**සූර්‍යරශ්මියගේ බැසයාම මෙයින් වර්ණිත වේ. ලොකයෙහි පැතිර සිටි තාම්‍ර ජලයක් බැසයන්නාක් මෙන් සූර්‍යරශ්මිය බැසයන්නේයයි කීමෙන් එයින් ලොකයාට දුස්තර පීඩාවක්ම පැවැති බැව් ඥාපිතය. යම්විටක තඹවතුරක් පැතිරේ නම් එයින් සියලු සත්‍වයන්ටම අතිශය පීඩාවක්ම සිද්ධවේ. එසේම මේ සූර්‍ය රශ්මියෙහුත් පීඩාවක්ම වූ බැව් ප්‍රකාශිතයි—මූවදෙව්දාවතෙහි:—

මුළුලෝ නිවෙමිනි — මෙන් රිවිහු තෙදිනිදුලු
වැජඹුනු සැඳෑ පැහැනවර — තමසපැල පැදුමදෙදෙනෙන්

---

1 වලබගිනිවැට 2 දිගතුර 3 නිවනවැනි,

97. ඈ ම තැ න   කරන මුනිපුද නරඹන ලෙස   ට
තැ න තැ න   සැවුල් ගණ පැමිණෙන තුරු සිර   ට
දි ලි හෙ න   මුනිමැදුරු පහනින් එහි නොසි   ට
දි ව ය න   අඳුරු මෙන් වවුලන් නිකුත් වි   ට

**අන්වය:**-ඇමතැන කරන මුනිපුද නරඹන ලෙසට සැවුල් ගණ තැන තැන තුරුසිරට පැමිණෙන මුනිමැදුරු දිලිහෙන පහනින් එහි නොසිට දිවයන අඳුරු මෙන් වවුලන් නිකුත් විට.

98. ඈ ද ගෙ න   සිහිල් මඳනල දියදහර හෙ   න
වි ල’ ග න   බියෙන් දිලි නිලිපුල් ඇස්වස   න
අ සු ව න   සලෙලුවන් මෙන් පරඟනන් වෙ   න
හැ කි ලෙ න   පියුම් ගැබ බමරුන් [1] වැස බැඳෙ   න

**අන්වය:**-සිහිල් මඳනල දියදහර හෙන විලගන බියෙන් දිලි නිලිපුල් ඇස් වසන පරඟනන් වෙත අසුවන සලෙලුවන් මෙන් හැකිලෙන පියුම් ගැබ වැස බමරුන් බැඳෙන.

**සංලක්ෂ්‍ය:**- මෙයින්ද සන්ධ්‍යාවර්ණනා විශෙෂයක්ම ක්‍රියමාන වෙයි. ශීතල මන්ද මාරුතයාගේ පැමිණීමද-නීලොත්පල ශංකුචිත භාවයද සල්ලාල ජනයන් පරස්ත්‍රීන්ට වසඟවීමද බමරුන් පද්ම ගර්භයන්හි බැඳීමද සන්ධ්‍යාකාලයෙහි සිද්ධවන හෙයිනි. පද්මගර්භයන්හි වාසය කරන භ්‍රමරයන්ගේ බැඳීම ගැන සිදත්සඟරාවෙහිදු මේ කියන ලදි. "බිඟුනි! මීලොලින් කල් ඉක් තඹරෙරේ තුඟ හොවා" යනුයි.

99. හි ම ක ර   සිනිඳු සොම්රැස් [2]රැස් කරනුව   ට
නි ල’ ඹ ර   කෙතෙහි ඉසි බිජුවට නිසිලෙස   ට
එ ක ව ර   දුලන දිගු දලු ලන ලෙස රුව   ට
ම මි තු ර   පෙණෙ බබලන තුරුවැල ද න   ට

**අන්වය:**-හිමකර සිනිඳු සොම්රැස් රැස් කරනුවට නිලඹරකෙතෙහි නිසි ලෙසට ඉසි බිජුවට එකවර රුවට දුලන දිගු දළුලන ලෙසට බබලන තුරුවැලද මිමිතුර තට පෙණේ.

**සංලක්ෂ්‍ය:**-ආකාශතලයට ප්‍රාප්තවන චන්ද්‍රයාටද රශ්මිසමූහයක්ම ආවශ්‍යක මයි. එබඳු රශ්මිසමූහයක් එක්කරගන්නා අවියෙන් නභොලක්ෂණක්ෂෙත්‍රයෙහි බිජුවට වපුරනු ලැබිය. ඒ බිජුවට රැසිය එකවරටම දීර්ඝප්‍රමාණයෙන් අංකුර උපදවා ලොකයා ප්‍රියකරන හැටියට දෘශ්‍යමාන වේ. ඊට තරුයයි ලොක ව්‍යවහාරය වේ. එය මේ සන්ධ්‍යාසමයෙහි පෙණේයයි පක්ෂියාට ප්‍රකාශකරයි.

---

1 බැස-හැම.   2 "කරනුවට"-යනුත් පාඨයි.

බීජ ජාතින් රැස්කරන ක්ෂෙත්‍රපාලයාද වී වැපිරීමෙන් එය රැස් කර ගන්නේය. එමෙන්ම රශ්මිය රැස්කරන චන්ද්‍රයාද, එය පහල වීමට බීජ ජාතියක් නභොලක්ෂණක්ෂෙත්‍රයෙහි වපුරනු ලැබේ. ඒවායේ අංකුර හටගත් කල්හි ඊට තරුයයි කියනු ලැබේ.

**"කරනුවට"**:-මෙහි ශබ්ද ප්‍රකෘතිය "කරනු" යනුයි. "අට" ප්‍රත්‍යය හා වකාරාගම විධියෙන් සිද්ධයි.

**100.** ම ඳ න ල සබඳ සඳවෙලෙගිනිඳල් නොම ඳ
වැ ද වැ ද පිපිර හුණු තුරු බිජු මෙන් එස ඳ
රෝ ද බැ ඳ රොනැ'ර ගෙනඝන බමර මුළුවැ ද
කො ඳ ව න පිපෙන රඟ බල ඇමනැන සබ ඳ

**අන්වය:**-සබඳ එසඳ මදනල සබඳ සඳවෙල ගිනිදල් වැද වැද පිපිර හුණු තුරුබිජු මෙන් රොදබැඳ රොන් ඇරගෙන ඝන බමර මුළු වැද කොද වන හැමතැන පිපෙන රඟ බල.

**සංලක්ෂ්‍ය:**-කුන්දවනයන්ගේ ප්‍රබොධයක් මෙයින් සූචිතයි. එය භ්‍රමර සමූහයාගේ ස්පර්ශය ලැබ විකසිතවන සේද භවයි. තද්භ්‍රමරයෝ කවරාකාරවෙද්දැයි යතහොත්? සන්ධ්‍යාකාලීන වලාකුළු නැමැති වහ්නි ජ්වාලයන් මන්දමාරුත වේගයෙන් දැල්වී එකට එක ගැටීමෙන් විස්තෘතව අහසට වැද එහිවූ තාරකා නැමැති බීජ පඞ්ක්තිය දවා පුපුරුවා බිමට හෙලනලදී. එසේවූ බීජ පඞ්ක්තිය වහ්නියෙන් දග්ධවූ බැවින් කෘෂ්ණ වර්ණයෙන් යුක්තම වෙ. ඒ සියල්ල පෘථිවිතලයට පතිතවූ කල්හි අඞ්ගාර නාමයෙන් නොව භ්‍රමරනාමයෙන් ව්‍යවහෘතය. ගිනි අඟුරු නැමැති තද්භ්‍රමරයන්ගේ පහසලත් කුන්දකුසුමයන්ගේද විකසිත භාවය සිද්ධමැයි. ගිනි අඟුරු පතිතවූ තැන්හිවූ වී ඇට තදීය ස්පර්ශයෙන්ම පිපිරී විකසිතවීමද ලොක ජාතියි.

**"රොද"** සමූහවාචී "රාජ" යන්නෙන් තද්භවයි. "රජස්" යන්නෙන් "රෙද"යි බිඳුණක් මෙනි.

**101.** ලො ල ව වන දනන් ලේ බීමෙන් නොම ඳ
ර තු ව ගියේඅ සත සැකකරන ල ද
ම තු ව උදු සිරසින් පෙණෙන එම ස ඳ
බ ල ව සඳවෙලෙන් රතුවූ සුපුන් ස ඳ

**අන්වය:**-ලොලව වන දනන් ලේ නොමද බීමෙන් රතුව ගියේඅ සත සැකකරන ලද එමසඳ උදු සිරසින් මතුව පෙණෙන සඳවෙලෙන් රතුවූ සුපුන් සඳ බලව.

**සංලක්ෂ්‍ය:**-රුධිරය අධිකතර ලෙස පානය කිරීමෙන් චන්ද්‍රයාගේ තත්ප්‍රකාර රක්තවර්ණය පහළ වන බව ලෝකයා සලකන නමුත් මාගේ අවබෝධය නම් එසේ නොව රක්තවර්ණවූ සන්ධ්‍යාවලාහකයන් හා එක්වීමෙන් වනබවයයි පක්ෂියාට ප්‍රකාශ කරයි. විරහ ජනයෝ නම් වෙන්වීමට පැමිණි ස්ත්‍රී පුරුෂයෝයි. සඳරැස් දැකීමෙන් ඔවුන්ගේ කාමෝද්දීපනාවස්ථාව පහළ වේ. නමුත් වියෝගාවස්ථාව හෙයින් දැඩිතර ශෝකාග්නිය හටගැනීමෙන් දෙහයද වියළීමට පැමිණේ. එය රුධිර පානයකැයි උත්ප්‍රේක්ෂිතයි.

**102.** [1]ව න යො වු න න් වුවනට කිපි සිසිරක ර
උ න් හි මි ය න් වෙන්වන තැන දුන' වස ර
ම ත කො වු ල න් වෙනලන රහසසවි යු ර
තු රු සි දු රෙ න් එන සඳ රැස් බල මිතු ර

**අන්වය:**-සරලයි.

**සංලක්ෂ්‍ය:**-මෙයින් චන්ද්‍රරශ්මිය පිළිබඳවූ ප්‍රවේශ විලාසාන්තරයක් කවිහට අභිප්‍රේත විය. කෙසේදයත්? වෘක්ෂ ජාතීන්ගේ ශාන්ද්‍රතර පත්‍රයන්ගේ අතරතුරෙන් චන්ද්‍රරශ්මිය පෘථිවියට වැදීම ස්වභාව ධර්මයෙකි. එය කුමක් වැනිදැයි උත්ප්‍රේක්ෂාකරත්හොත්? චන්ද්‍රයා විසින් කෝකිල පක්ෂීන් වෙත යවනලද රහස්‍ය යෂ්ටියකැයි කථිතය. යළිත් එය කුමක් සඳහා යොදන ලදදැයි සලකත්හොත්? පුරුෂයන්ගේ වියෝවට පත්ව දුඃඛිතව කල්යවන තරුණ වනිතාවන්ගේ ශෝභනතර වක්ත්‍ර විලාසයට චන්ද්‍රයා පරාජිතව ලජ්ජිතව කුපිතව සිටින්නේය. හෙවත් චන්ද්‍රයාට වඩා ඉතා ලක්ෂණ එම යුවතීන්ගේ ශෝභනතර වක්ත්‍රයන් නිසා චන්ද්‍රයා පැරදී එම නින්දාව පිරිමසාගැනීමට මාර්ගයක් සොයමින් සිටීය. එවිට පුරුෂයන්ගෙන් වියෝගාවස්ථාවට පත්ව පුරුෂයන්ගේ අභාවය නිසා දුඃඛිතවූ එම ස්ත්‍රීන්ට පීඩා කිරීමට මාර්ගය එම වියෝගාවස්ථාව බව ම දැන ඇලාට අතිශයින්ම දුක්දී සැනසීම පිණිස චන්ද්‍රයාද කෝකිල පක්ෂීන් වෙත රහස්‍ය යෂ්ටියක් වැනිවූ ස්වීය රශ්මිය යවයි. චන්ද්‍රරශ්මි ස්පර්ශය ලත් කොකිල පක්ෂීන් රැවුදීමද ධර්මතාවෙක්මය. චන්ද්‍රයා එම රශ්මි නැමැති යෂ්ටියෙන් අදහස 'කොවුලන්ට ඇනවූ කල්හි කොවුලෝද ශබ්දකරන්නාහුය. එයින් ඔවුන්ගේ වියෝගාග්නිය දැල්වී යාමෙන් වැඩියක් පීඩා ලැබෙයි. එහෙයින් චන්ද්‍රරශ්මිය කොකිලයන් වෙත යවන රහස්‍යයෂ්ටියයි ප්‍රකාශිතයි.

---

1 නව යොවුනත්-යි හැම.

103. සු නෙ ර මතින් 1අලලන වෙණු කිරි සයු ර
ඉ තිර වෙරළ දිවයන මෙන් රළ පත ර
පැ තිර උදය ගිරි සිරසින් දිලි නොහැ ර
2මි තුර බලව එන සොඳ සඳරැස් වතු ර

**අන්වය:**–වෙණු සුනෙර මතින් කිරි සයුර අලලන වෙරළ ඉතිර දිව යන රළ පතර මෙන් පැතිර නොහැර දිලි උදයගිරි සිරසින් එන සොඳ සඳරැස් වතුර මිතුර බලව

**සංලක්‍ෂ්‍ය:**–**වතුර**–'වාදීර' යන සංස්කෘත ශබ්දයෙන් බිඳුනවිය.

---

104. තො ස් වන සුවඳ පිරිබඩ මල්ගෙන අත ට
ල ස් නොව සුවඳ තෙල් පහනින් එකලු කො ට
රැ ස් වන දනන් මුනිපුදයට වෙහෙරත ට
ගො ස් තොඳ මිතුර විබිසණ සුර මැදුරත ට

**අන්වය:**–තොස් වන සුවඳ පිරිබඩ මල් අතට ගෙන ලස්නොව සුවඳ තෙල් පහනින් එකලුකොට දනන් මුනිපුදයට වෙහෙරතට රැස්වන මිතුර තොඳ විබිසණසුර මැදුරතට ගොස්.

**සංලක්‍ෂ්‍ය:**–**විබිසණ සුර**–මේ රාවණ රජුහට සහොදරවූ විභිෂණ දෙවරාජයාවේ. කැලණියේ මේ දෙව්රජු නමින් දෙවොලක් තිබේ. සැලලිහිණි සන්දේශයෙහි 78–94 කව්වලින් විභීෂණදෙවියාගේ වර්ණනාවක් දක්වේ.

105. පින් කෙත් වන් මෙලක—රජ මහ කැලණි වෙහෙරෙ හි

ග ණ නායක පෙර සඟ ගණ පර පුරෙ නි
ග ණ නායක තැන් ලැබ සිටින සැපති නි

උස්කල නිරිඳු කුල—කොස්ගම ඒකනාය ක

මැ තිඳු කු ල ප සි ඳු කල් එනම උපති නි
මු නි ඳු බ ණ පු රු ඳු කර දෙසන සතති නි

සි ත සැ ක හැර දුන කිවි නළු සඳ ලක ර
සි රි ල ක හැම කිවිඳුන්ගෙන් ලත් අද ර
දි ලි ස ක කිරි හිමකර ලෙස යස විස ර
බු ව නෙ ක බුජ තොරහිමි වැජඹෙන නිතො ර

**අන්වය:**–මෙලක පින්කෙත්වන් රජමහ කැලණි වෙහෙරෙහි ගණ නායක පෙර සඟගණ පාපුරෙහි ගණනායකතැන් ලැබ සැපතිනි සිටින නිරිඳු කුල උස්කල කොස්ගම ඒකනායක මැතිඳු කුල එනම උපතිනි පසිඳු කල මුනිඳු බණ පුරුදුකර සතතිනි දෙසන සිත සැකහැර කිව් නළු සඳ ලකර දුන සිරිලක හැම කිවිඳුන්ගෙන් අදර ලත් සකකිරි හිමකර ලෙස යසවිසර දිලි නිතොර වැජඹෙන බුවනෙකබුජ තොරහිමි.

---

1 අලලන සඳ 2 මිතුර බලාලව එන සඳ රැස්වතුර–මුද්‍රිත.

106. පැ වැ ති  නොයෙක් සක්වළ අණසක සත  ත
ලොවැති  සියලු උවදුරු දුරලන පිරි  ත
කැ මැ ති  සගන ගෙන ඉඳ සුරිඳු මැදුර  ත
එ ය ති  සඳුන් පවසා ගිය සඳ නැව  ත

අන්වය:-එයති සඳුන් නොයෙක් සක්වළ සතත අණසක පැවැති ලොවැති සියලු උවදුරු දුරලන පිරිත කැමැති සගන ගෙන සුරිඳු මැදුරත ඉඳ පවසා ගිය සඳ නැවත.

107. සි ත් ම ත්  කරවමින් රැඟුමෙන් සුර  න් රැ ස
වෙ ත් ප ත්  සුරඟනන් මෙන් සුරපුරෙ  න් බැ ස
ග ත් ග ත්  වෙසින් විඳුවා දන නුව  න් ර ස
වි ත් ද ත්  මුළුමුළුව සිට 1නළඟන  න් තො ස

අන්වය:-රැඟුමෙන් සුරන් රැස සිත් මත්කරවමින් සුරපුරෙන් බැස වේත්පත් සුරඟනන් මෙන් ගත්ගත් වෙසින් දන නුවන් රස විඳුවා විත් දත් නළඟනන් මුළුමුළුව සිට තොස

108. ක ර න  සිත උමතු දනයන් රා  ගී ය
න ඟ න  වෙන වෙනම සතිසක් රා  ගී ය
ව ය න  නදට එක්කොට පවසන  ගී ය
අ ස න  සතන් සවනත අමරස  ගී ය

අන්වය:-රාගීය දනන් සිත උමතුකරන වෙන වෙනම සතිසක් රාගිය නඟන යවන නදට එක්කොට පවයන ගීය අසන සතන් සවනත අමරස ගීය.

109. කි ය න  යුතු මෙයයි සුරගඳබ මේ  ල ම
වි ය න  එසබ ඇමගේ තොසෙලවා  ල ම
බ ර න  සතර රඟටම කළ හැසා  ල ම
ව ය න  නොහැර මද්දලසුද්ද තා  ල ම

අන්වය:-සුර ගඳබ මේලම මෙයයි කියන යුතු බරන සතර රඟටම හැසාලම කළ මද්දලසුද්දතාලම නොහැර එසබ වියන ඇමගේ තොස එලවාලම වයන.

110. ර ඟ න  රඟ එ රඟ බිම සොඳුරු  වි දු ලි ය
ර ඟ න  රඟ වැන්න ගනකුලෙහි  වි දු ලි ය
ර ඟ න  දන නුවන් දගැ රුසිරු  ඉ දු ලි ය
ර ඟ න  ලොබ නරඹ රඟ බමුන  ඉ දු ලි ය

1 "වඩවමින්"-ඇතැම්.

**අන්වය :-** සොඳුරු විදුලිය එරඟ හිම රඟනරඟ ගනකුලෙහි විදුලිය රඟනරඟ වැත්ත දන නුවන් දගැ රයන රුසිරු ඉඳුලිය ඔවුනරඟ නරඹ රඟන ලොබ ඉඳුලිය.

**111.** එ ර ඟ මඬල සරනස දීසෙනි තෙක් සො ට
න ර ඟ උලැගි ෂොස ගන් සයුරක් ලෙස ට
ස ම ග ගි නරඟ නාලමට සරිකො ට
මෙර ඟ නළඟනන් රඟකොට නැවැති වි ට

**අන්වය:-** අනාකුලයි.

---

## විබිසණ යැදුම.

**112.** එකසර කෙසර සර—එකසරිනි බියපත් ක ර
අ න ත රකුසුසෙන් බුන් සිට මිනිස් වෙ සි න්
දි ය ත පසිඳු මනරම් රම් රදුන් වි සි න්
සිරිලකට හිමිකර—සුරසෙන් මැද 1 බිසෙස් ක ළ
මෙ ම සිරිලක රජසිරි ලැබ නොයෙක ලෙ ස
ත ම පුදකළ නිරිඳුන්හට පෙර දව ස
බි ද සතුරන් ජයසිරි දි වරින් ව ර
ල ද ගම්බිම් ගජ හය සෙනඟ පිරිව ර
වැ ඳ විබිසණ සුරිඳුගෙ සිරිපා තඹ ර
න ද පියකර තෙපුලෙන් මෙලෙස සැලක ර

**අන්වය:-** මිනිස් වෙසින් සිට එකසර කෙසර සර එකසරිනි අනත රකුසුසෙන් බියපත් කර බුන් දියත පසිඳු මනරම් රම් රදුන් විසින් සිරිලකට හිමිකර සුරසෙන් මැද අබිෂෙස්කළ මෙම සිරිලක රජසිරි ලැබ පෙර දවස නොයෙක ලෙස තම පුද කළ නිරිඳුන්හට සතුරන් බිඳ ජයසිරිදි වරින්වර ගම්බිම් ගජ හයසෙනඟ පිරිවර ලද විබිසණ සුරිඳුගෙ සිරිපා තඹර වැඳ නද පියකර තෙපුලෙන් මෙලෙස සැලකර.

**සංලක්‍ෂ්‍යඃ:-** රම්රදුන්-34 වන පිටේ 'දියරම්' යනු බලනු යෙහේ.

---

1 බිසෙව් කළ.

**113.** මෙම සිරිලක සියල්—සියසතිනි එකසත් ක ර

නි තො ර  ප සි ඳු පියුමම්බා  හි මි ලෙ ස ට
ප  ව  ර  මෙ සිරි පැරකුම්බා  නි රි ඳු හ ට

රජසිරි සැප සමග—සුබසෙත් දී දිගා ක ර

ක ල ක්  යෙහෙන් ලකරජ සිරි විඳින ලෙ ස
නි දු ක්  නිරෝගි කර යොදමින් දිවැ ස

1මෙ ති න  නිතොර හැම උවදුරු ම දුරු කො ට
ක ර න  සතුරු වියවුල් අතුරුදන් කො ට
නි ති න  මෙ නරනිඳු වෙත සෙත දියුණු කො ට
ර කි න  ලෙස අයදු විබිසණ සුරිඳු හ ට

**අන්වය:**-සියල් මෙම සිරිලක සිය සතිනි එකසත් කර නිතොර පියුමම්බා හිමි ලෙසට පසිඳු පවර මෙසිරි පැරකුම්බා නිරිඳුහට රජ සිරි සැප සමග සුබසෙත් දී දිගාකර කලක් ලකරජසිරි යෙහෙන් විඳින ලෙස නිදුක් නිරෝගිකර දිවැස යොදමින් මෙතින නිතොර හැම උවදුරුම දුරුකොට සතුරු කරන වියවුල් අතුරුදන්කොට මෙ නරනිඳු වෙත සෙත නිතින දියුණුකොට රකින ලෙස විබිසණ සුරිඳුහට අයදු.

**සංලක්ෂ්‍ය:**-පියුමම්බා හිමි-පියුමම්බා නම් ශ්‍රී කාන්තාවයි. ඇය ගේ හිමි පියුමම්බා හිමි සි. එනම් විෂ්ණුයි.

**114.** පැලඳ තිසරණ මිණි—අබරණ නමා මුදුනෙ හි

නි ස ග  සොමි ගුණෙන් පසු කළ සුපුන් ස ඳු න්
ස ම ග  මෙ නරනිඳුගේ අග බිසෝ ල ඳු න්

මතු රජසිරි ලබන—මනුරද සිරිනි මනන ඳ

පු බු දු  කරන ගුණසෙන්  ස ව ස න න් 2සි තු
ප සි ඳු  ර ජ  කුමරුවන්  ස හ සි රි න් 3සු තු

මු නි ඳු  ස සු න්  සැදි ලක්දිව පිරි යස ස
මැති ඳු  ව ර න්  සමගින් රජ සෙනඟ රැ ස
පු රු දු  සි රි න්  තොර නො කර ම ඇම දව ස
සු රි ඳු  ස ඳු න්  අයදුව නිති රකින ලෙ ස

---

1 වෙනින  2 සිත  3 සුත.

**අන්වය**:-තමා මුදුනෙහි තිසරණ මිණි අබරණ පැළඳ නිසග සොම් ගුණෙන් සුපුන් සඳුන් පසුකළ මෙ නරනිඳුගේ අගබිසෝ ළඳුන් සමග මතු රජසිරි ලබන මහනඳ මතුරජ සිරිනි ගුණයෙන් සව්සතන් සිතු පුබුදු කරන සිරින් යුතු පසිඳු රජකුමරුවන් සහ මුනි සසුන් සැදි ලක්දිව පිරි යසස මැතිඳුවරන් සමගින් රජ සෙනඟ රැස ඇමදවස පුරුදු සිරින් තොර නොහැර ම නිති රකින ලෙස සුරිඳු සඳුන් අයදුව.

## උදය වර්ණනා.

**115.** මෙ ලෙ ස  අසැද අවුදින් මහ වෙහෙර මැ  ද
සි ර ස  රුවන් මඩුවේ සිතුලෙසින් ඉ  ඳ
ස තො ස  වෙමින් එ වෙහෙර සිරි බලනා ස  ඳ
දි ව ස  හමුව ජරපත් වෙසි නිසා ස  ඳ

**අන්වය**:-මෙලෙස අසැද අවුදින් මහ වෙහෙර මැද රුවන් මඩුවේ සිරස සිතු ලෙසින් ඉඳ සතොස වෙමින් එවෙහෙර සිරි බලන සඳ දිවස හමුව නිසාසඳ ජරපත් වෙයි.

**116.** නො හැ ර  සසලබව හරදි අවරත  ට
එ ත ර  ඉඳුරු පැහැ [1]පහළවූ බැවින් බ  ට
තු ස ර  කිරණ බිඹු රඟ ඇති රගින් දු  ට
මි තු ර!  ගැඹුරු තිලකුණු සිහිවේය ත  ට

**අන්වය**:-එතර ඉඳුරු පැහැ පහළවූ බැවින් සසලබව නොහැර අවර තට හර දී බට තුසර කිරණ බිඹු රඟ ඇති රගින් දුට මිතුර! තට ගැඹුරු තිලකුණු සිහිවේය.

**සංලක්ෂ්‍ය**:-මෙයින් සූර්යෝදයාසන්න කාලය වර්ණිත වේ. ඉඳුරුයයි කපිතවූ සූර්යයාගේ ප්‍රභාව ප්‍රාදුර්භූත බැවින් චන්ද්‍රයා චංචල භාවය අත්නොහැර රශ්මි නැමැති හස්තය අපරාකාශයට ඈනය කොට පෙණෙන කල ත්‍රිලක්ෂණය සිහිවේ යනු භාවයි. සූර්ය රශ්මිය පහළවන කල්හියයි කීමෙන් පූර්ව දිශාවෙන් හිරුගේ උද්ගමනය ප්‍රකාශය. චන්ද්‍රයා චංචල භාවය අත්නොහැර යයි කීමෙන් දින පතාම තමන්ගේ අස්තඞ්ගමය නිර්දිෂ්ටයි. එය චන්ද්‍රයාගේ ස්වාභාවික ගමනකි. පැවැති ස්වභාව අත්හැර යාම චපල කමයයි සලකන ලදී.

**"තිලකුණු"**- ලකුණු තුනක් එක්කොට සලකන ලද්දු තිලකුණු-යි. අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්ෂණත්‍රයයි.

1 පහවූ.

චන්ද්‍රයාගේ පැවැති මනොඥ ගති අයින්හැර පරිහීන භාවයට පත්වීම සලකනවිට එය අනිත්‍ය හෙයින් එසේවීයයි සිතියයුතු බව මෙයින් සූචිතයි.

**"ඉඳුරු"**:-මෙයින් සූර්‍ය්‍යයම ප්‍රකාශිතය. එයින් කිහ. පියුම් මලෙහි:—

හැදිලි-ඉඳුරු-දිවයුරු-සුරලහනිස-සහස්රැස්
රිවි-තෙද-හිරු-උදුගල්-අවර-"දසනම් දන්නේ"-යනුයි.

මේ "ඉඳුරු" යනු "ඉන්ද්‍ර" යන සංස්කෘත ශබ්දයෙන් තද්භව විය. ඉන්ද්‍ර යන්නෙන් සූර්‍ය්‍යාද වාච්‍යවේ. එහෙයින් කිහ. ශබ්දශෝම මහානිධියෙහි:—

"ද්වාදශාක්ෂී මධ්‍යෙ අක්ෂී භෙදෙ"යි

ද්වාදශාත්මධාරි සූර්‍ය්‍යයාගේ එක් මූර්තියක් "ඉන්ද්‍ර-ඉඳුරු" යන්නෙන් ප්‍රකාශිතයි.

**117.** **සු ල බ සයුර රත්මිණි කිරණ රැස් කො ට**
**ව ළ බ නලෙන් පැසවා රැගෙන විතර ට**
**එ ප බ ගලා 1සැදුවා මෙන් ගන රත ට**
**න ර ඹ දිනිඳු රැස් එනරඟ පෙර'ඹර ට**

**අන්වය:**-සයුර සුලබ රත්මිණිකිරණ රැස්කොට වළබනලෙන් විතරට පැසවා රැගෙන එ පබ ගලා ගනරතට සැදුවාමෙන් දිනිඳුරැස් පෙරඹරට එනරඟ නරඹ.

**සංලක්ෂ්‍ය:**-මෙයින් සූර්‍ය්‍යෝදය වර්ණනාවක් කරනලදී. සූර්‍ය්‍යයාගේ රශ්මිස්කන්ධය සමුද්‍රගත වඩබාග්නියට සදෘශකරනලදී. කෙසේද යත් වඩබාග්නිය නම් සමුද්‍රයෙහි ජලාශ්‍රිතවූ වහ්නිවිශෙෂයකි. එසේම සමුද්‍රයෙහි රත්නමාණික්‍යයෝද බහුලවෙති. සමුද්‍රගත එම රත්නමාණික්‍යයන්ගේ රශ්මිය එක්කොට එම වඩබාග්නියෙන් පැසවා ප්‍රමාණයට සාදා එම රශ්මිය සූර්‍ය්‍යමණ්ඩලයෙහි ආලිප්තකොට ගත්තාක් වැනියයි දක්වනලදී. රත්නමාණික්‍යයන් ගින්නෙන් උණුකරගත්කල්හි ඉතා ලක්ෂණ රත්නවර්ණයෙකි.

**"ගලා"**-ගාලා යන පෙරකිරියෙහි හ්‍රස්ව විධියෙන් 'ගලා'යි සිද්ධයි. "ගා" ධාතුව කෙරෙන් 'ආ' ප්‍රත්‍යය යොදා සැදූ පූර්වක්‍රියාව කෙරෙන් පරව යොදනලද 'ලා' යන ප්‍රත්‍යය ධාතු සංඥාවට පමුණුවා නැවතත් පූර්වක්‍රියාවාචී 'ආ' ප්‍රත්‍යය යෙදීමෙන් සිද්ධයි. සිදතෙහි "මුදුගනී-කියා ලන්නේ ඈ පෙරකිරිය පසතින්වූ ගණ ල පස ඈ දුවූසේ"යි දක්වනලදී.

---

1 රැදුවා.

118\. පැ ල හි ඳු ව ත සිසි සස්කර අහස් කො ත
දු ල ස පු ව ත මිණිමුතු වන කොඳ වන ත
නි ල කර ව ත [1]තුඟු පැහැයෙන් ගිරි රඟ ත
උ ණු කර ව ත දස සත [2]කර කර දිග ත

**අන්වය:**–සිසි සස්කර අහස්කෙත පැල හිඳුවත, (යලිත්) මිණිමුතු වන කොඳවනත සපු දුලවත ගිරි රඟත නිලකර තුඟු පැහැයෙන් වත දස සත කර කර දිගත උණුකරවත.

**සංලක්‍ෂ්‍ය:**–'පැල හිඳුවත සිසිසස්කර අහස්කෙත':–චන්‍ද්‍ර නැමැති ගොවියා ආකාශ නැමැති ක්‍ෂෙත්‍රයෙහි තාරකා නැමැති අංකුරයන් සිටුවන කල්හියයි කීවිට මෙහිදී චන්‍ද්‍රයා ගොවියකුටද ආකාශය ක්‍ෂෙත්‍රයටද තාරකාවෝ අංකුරයන්ටද උපමිතයහ. චන්ද්‍රයා රාත්‍රි කාලයෙහි තමා විසින් කටයුතුව පැවැති ආකාශයෙහි සියලු කෘත්‍යයන් නිමකොට උදය ඉටත්ව යන්ට සූදානම්ව තමාගේ ක්‍ෂෙත්‍රයෙහි පැලැටි සිටුවා ගියබව හඟවයි. උදය කාලයෙහි ගොවියන් කෙත් වල පැලැටි සිටවීමද ලොකජාතියි.

"දුල සපුවත මිණිමුතු වන කොඳවනත":–

ප්‍රාතඃ සමයෙහි කුන්දවනයන්හි භෘඞ්ගයන්ගේ ජවලනය මෙයින් සූචිතයි. "සපු"–පා සයක් ඇත්තේ "සපු" යි. අන් අරුත් සමස් අවිභක්තික නිර්දෙශයි.

රුවන්මල "බමර–මීපා–අලි–බිඟු–
මීලොල්–සපා–සපු"යි

මෙහි ප්‍රකට වචනය "සපා" යන නුමුත් "සපු" යනුද අවිරුද්ධය.

## මාගී වණ්නා.

119\. නො ම ඳ හි ය ද මුනිඳු රැඳි දාගැබ ද
ඇ ම ද නෑ ම ඳ සිවු සිල්වත් සඟ ගණ ද
ප බ ඳ වි හි ද පිරි සිරිමා බෝ තුර ද[3]
පැ හැ ද නෑ ම ද එ පුරෙන් යාගන් සබ ද!

**අන්වය:**–අනාකුලයි.

120\. එ ද ද හැඩින් යන රැස්කඳක් ලෙ ස
වි ද පියායුග යන [4]තොප අහස් කු ස
ර ඳ ගිය වලාකුළුසේ ගං දෙප ස
යො ඳ දුලන පොල්වතු දකු දකුණු ප ස

1 තුඟු. 2 කිරණින්. 3 දුම්ද–ඇතැම්. 4 තෝ.

**අන්වය**:-එදා දාගැබින් යන රැස්කඳක් ලෙස අහස්කුස පියාපුග විදා යන තොප ගංදෙපස රදහිය වලාකුළුසේ සොඳ දුලන දකුණුපස පොල් වතු දකු.

**සංලක්ෂ්‍ය**:-"එ දා දා ගැබින් යන රැස් කඳක් ලෙ ස
වි දා පියා යුග යන තොප අහස් කු ස

දා ගැබින් නිෂ්ක්‍රාන්තවූ රශ්මිස්කන්ධයක් සෙයින් යයි කීවිට ධාතුගර්භයෙන් නික්මෙන ධවලවර්ණය සූචිතයි. තිසර (හංස)යාද ධාවල්‍යයෙන් යුක්තහෙයින් ශ්වෙත බුද්ධරශ්මියට උපමිතවිය.

**121.** ග ත් 1ම ත් තලින් ලිය ලිඟ ගී තම න් ලෙ ස
නෙ ත් සි ත් සතුටුකර කෙළි කුමරිය න් රැ ස
වෙ ත් ප ත් තැන් පොරට ගව මී රැළ න් බැ ස
කො ත් ව ත් නොයෙක් ගම් බිම් බලව වම් ප ස

**අන්වය**:-තමන්ලෙස තලින් ලිය ගී ගත්මත් ලිය නෙත්සිත් සතුටුකර කෙළි කුමරියන් රැස ගව මී රැළන් පොරට බැස වෙත්පත් තැන් කොත්වත් නොයෙක් ගම්බිම් වම්පස බලව.

**122** ඇ මු ණු ව මෙන් කොත්වත් වතු පිටි එක ට
පි රු ණු ව සිටි මදකුත් අතුරක් නොකො ට
තු රු ණු ව දිසි අඟනන් සුරඟන 2රඟ ට
ප මු ණු ව දැක පමුණුව තොස තගෙ සිත ට

**අන්වය**:-එකට ඇමුණුව මෙන් කොත්වත් වතු පිටි මදකුත් අතුරක් නොකොට පිරුණුව සිටි සුරඟන රඟට අඟනන් තුරුණුව දිසි පමුණුව දැක තගෙ සිතට තොස පමුණුව.

**123.** තු ර ඟ ගජ නැඟී යන එන නි ස් ඝෝ ෂ
ස ම ග බර'සුලා යන දූසි ද ස් ඝෝ ෂ
සි ත ඟ දෙනුන් වෙත කෙළි වැසි ව ස් ඝෝ ෂ
එ ම ග තැනින් තැන සිටි රට වැ ස් ඝෝ ෂ

**අන්වය**:-තුරඟ ගජ නැඟී එමග යන එන නිස්ඝෝෂ සමග බරඋළුලා යන දූසි දස්ඝෝෂ සිතඟ දෙනුන්වෙත (සිට) කෙළි වැසිවස්ඝෝෂ. (එසේම) තැනිත් තැන සිටි රටවැස්ඝෝෂ.

**124.** දෙ ල දෙ ල උරු මුළු පලකල පබල ද ල
ප ල ප ල පොරණ යන මුව මී ගවර රැ ල
ද ල ද ල උදුල මොල ගජරල කෙළි වන ල
බ ල ලෙ ල පුවල පෙර මඟ වනගල නැබ ල

---

1 මත්වලින්. 2 ලෙසට-ඇතැම්.

**අන්වය**:-දෙළ දෙළ පබල දළ පළකළ ඌරුමුළු පලපල පොර ඇන සත මුව මී ගවර රැළ දළදළ උදුල මොළ ගජරළ කෙළි වනළ ලෙල පුවල නැබල පෙරමඟ වනගල බල.

## වන වර්ණනාවක්.

**125.** මි හි ලො ල් බි ඟු ස රේ ය වන ස රේ ය
ග ඟු ලැ ල් වැ ද සි රේ ය සිරි සි රේ ය
පි පි ම ල් ස පු තු රේ ය විසි තු රේ ය
1ව න තු ල් සිරි කො රේ ය ලොබ කො රේ ය

**අන්වය**:-මිහිලොල් බිඟු සරේය වනසරේය සිරේය වැද ඉසිරේය ගඟුලැල් සිරි පිපිමල් සපුතුරේය විසිතුරේය වන (වූ) තුල් සිරිකොරේය ලොබකොරේය.

**126.** සි රි නි ල් ම ල් ර ඟා ය පිල් න ඟා ය
ක ර සෙ බ ඩු න් ළ ඟා ය මන ර ඟා ය
රි වි දෙ වි හ ට ර ඟා ය සිරි ර ඟා ය
සි වි මෝ න රු න් ම ඟා ය වන ම ඟා ය

**අන්වය**:-සිරි නිල්මල් රඟාය පිල්නඟාය මනරඟාය සෙබඩුන් ළඟාය කර සිරිරඟාය රිවිදෙවිහට රඟාය සිවි මොනරුන් වනමඟාය මඟාය.

**සංලක්ෂණ**:-**රඟාය**-මෙහි ධාතුව 'රඟ' යනුයි. ඔහු කෙරෙන් පරව පූර්වක්‍රියා 'අ' ප්‍රත්‍යයෙහි සිඩයි. යකාරය පද පූරණාර්ථයි. මඟාය යනුත් එසේමැයි.

**127.** කි රි ලෙ ස ස ම ත ලා ය වැලි ත ලා ය
සැ දි සු ව දැ ති ම ලා ය වන ම ලා ය
එ න ව න ස ර ක ලා ය මන ක ලා ය
දු ක නෙ ත් ල ත් ප ලා ය ලැබ ප ලා ය

**අන්වය**:-කිරිලෙස සමතලාය වැලිතලාය සුවදැති වනමලාය මලාය සැදි එන මනකලාය වනසරකලාය දුක නෙත් ලත් පලාය ලැබ පළාය.

**සංලක්ෂණ**:-**පලාය**-පරි අ පූර්ව 'යා' ධාතුවෙන් වූ පූර්වක්‍රියාර්ථයෙහි අ ප්‍රත්‍යය හා 'ර'කාරයට 'ළ' කාරයෙදීමෙන් 'පළායා'යි පලමුකොට සිට ඡන්දෙහෙතුවෙන් මෙහිදී මාත්‍රා හානි විධියෙන් 'පලාය' කියා සිඩයි.

---

1 වන සිරි යද-මුද්‍රිත.

128. පැ හි රෙ න ග ඟු ලැ ලි  ලෙල තුරු සළුසි  ලී
ක ස ම ල් හෙ ල් මැ ලි  මිණිබරණින් දි  ලී
ර ණ හ ස වැ ල කු ලී  බඳමිණි මෙවු  ලී
විල ස ක ලෙ ස බ ලී  බල සැදි වනවි  ලී

අන්වය:–පැතිරෙන ගඟුලැලි ලෙල උතුරුසළු ඉසිලී කසමල් හෙල් මැලි මිණිබරණින් දිලී රණහසවැල මිණිමෙවුලී උකුලී බඳ බලී වනවිලී විලසකලෙස බල.

සංලක්ෂ්‍ය:–වනජතවූ නිර්ඣරයන් සළුවකටද කසමල් හා හෙල්මැලි මාණික්‍යාභරණයටද සුවර්ණ හංසාවලිය ඉහබැඳි මෙඛලාදාමයටද සම කිරීමෙන් එම වනභාගය කාන්තාවක් හා සමානකළ අපූරු කල්පනාකර බලනු මැනවි.

129. සඳ කැන් මෙන් නි සා  එන ගඟුලැලි  නි සා
සි ලි ම ල් රෙ න්1 ව සා  යන මිණි නිල්  ව සා
ව න වි ල් සු ව හ සා  දෙන රැවු සුව  හ සා
එ ව නෙ හි ම ග අ සා  දුක යව අස  අ සා

අන්වය:–නිසා සඳකැන්මෙන් එන ගඟුලැලි නිසා සිලිමල්රෙන් වසායන නිල්මිණි වසා වනවිල් රැවුදෙන සුවහස සුව, හස එවනෙහි මග- අසා දුක අස අසා යව.

130. බුවන කමල් ග තා  රණලිය සිරි ග  තා
අඩසඳ න ල ළ තා  බඳමල් මුතුල  තා
වියොවග යුද ප තා  ඇවිදින නිති ප  තා
දුක වන සර ක තා  අස පිය2 රස ක  තා

අන්වය:–සුගමයි.

131. දු වූ ව න් ම න ද ගා  කරවන යුග ද  ගා
සි රි ව ස සි රි නි ගා  කළ ලෙල සිකිනි  ගා
නිති නම කි මි ල ගා  යන එන කොමළ  ගා
රූ සි රි ම ග ම ගා  වඩින එවන ම  ගා

අන්වය:–සුගමයි.

132. ස ව න  නු ව න  නිතියෙන් කරවන සතු  මූ
ර ව න  බ ම න  කිඟු පිල් බරද පරපු  මූ
යි ම න  නි ව න  සිකිලැලි 3වැලි තල පිකි  මූ
එ ව න  දෙව න  කිමවනයක් වැනිය ඉ  මූ

---

1 මල්රෙනෙන්. 2 සර-වැඩියක්. 3 වැලිතලා පිටු.

අන්වය:-සරලයි.

133. ම ලි නේ නොව දිලිහෙන තුරු මලි නේ
ස ව නේ හෙන බිඟුරැව් මඟ' සව නේ
මු වි නේ ගත් අඹකැන් විලි මුවි නේ
ග ම නේ දුක් නොදැනෙයි දුවු ගම නේ

අන්වය:-මඟ අස වනේ මලිනේ මලිනේ නොව දිලිහෙන තුරු බිඟුරැවු සවනේ හෙන අඹකැන් මුවිනේ ගත් විලිමුවිනේ දුටුගමනේ යන ගමනේ දුක් නොදැනෙයි.

134. න ම න ම සැකබිය හැර යන ව දු රු
ම න ම න කරවන වනසර සො දු රු
න ම ග න බවන'හවන ගිරි දූ දු රු
ම න න ද වනගල දූන යව සො දු රු
(අධිගුම යි.)

අන්වය:-අනාකුලයි.

135. හ ස ස ර දූ න ග න ස ක ස ව ස වනේ
ගො ස ක ර ය න එ න කො ක සු ව ගු වනේ
බැ ස ස ර හ න ව න සැ ක නො ව මු වනේ
තො ස ක ර ව න ම න දූ ක ය ව එ වනේ
(අඹුල් ජාල යි.)

අන්වය:-හස ගුවනේ ගොසකර අස යන එන කොකසර සකසව සවනේ දූනගන සැකනොව බැස වන සරහන මන තොසකරවන මුවනේ දූක එවනේ යව.

සංලක්‍ෂ්‍ය:-"හ ස ස ර දූනගන සකසව සව නේ
ගොස ක ර යන එන කොකසුව ගුව නේ"

ගුවන්තලයෙහි නාදකෙරෙමින් සමීපයෙහි යාම් ඊම් කරන් නාවූ කොක් පක්‍ෂීන්ගේ නාදය මනාකොට දූනගනයයි කීමෙන් ඔවුහු හංසයෝයයි නොරැවටීමට ඔවුන්ගේ ශබ්දමාත්‍රය තේරුම් ගත්[illegible]ලෙස දන්වයි. ඉදින් පරීක්‍ෂා නො කළහොත් ඔවුන්ගේ රූපාකාරයට රැවටීමෙන් හංසයෝයයි සිතා වෙහෙසට පත්විය හැකිය. එය වැලැක්වීම සඳහා මෙසේ කියනලදී.

136. පෙර—ගිරිපියා ඉඳුසුන් වි සි න්
ගි රි—බෙණද හී තැන තැන ශො සි න්
ලෙල—දෙන නොමින් පියලත් ලෙ සි න්
බල—වන කෙහෙල් වන වන ති සි න්

**අන්වය:-**පෙර ඉඳු ගිරි පියා පුත්විසින් ගොසින් තැන තැන ගිරි බෙසද ගී තොමින් ලෙලදෙන පියපත් ලෙසින් වනකෙසෙල් වන වන හිසින් බල.

**සංලක්ෂ්‍ය:-**පූර්වකාලයෙහි ලෝකයෙහි පර්වතයන්ට පියාපත් ඇතිවිල. එහෙයින් ඒවා ගමන්කරමින් ශක්‍ර පුරයට ගොස් ඇවිදි මෙන් දෙවියන්ට ඉතා පීඩාවක් ඇතිවිල. එයින් කොපයට පත් ඉන්ද්‍රතෙම වජ්‍රායුධයෙන් එම පියාපත් කපාහෙළීය. එවක් පටන් පර්වතයෝ ඇවිදීමට අසමර්ථවූහයි පුරාණෝක්තියි. කපනලද එම පියාපත් ඒ ඒ තැන පතිතව වන කදලි පත්‍ර ව්‍යාජයෙන් බැබලෙත් යයි කවිතයි.

**137.** ග න—ග න ගු ව න් තල විදුලි ව න්
ව න—ගැ බ මෙව න් පැන යනෙනු ව න්
දි ගු—පු ළු ලු ව න් ගන නිල් නු ව න්
බ ල—ව න මු ව න් තුටුකර නු ව න්

**අන්වය:-**ගන ගන ගුවන්තල විදුලිවන් මෙවන් වනගැබ පැන යන එනුවන් දිගු පුළුලුවන් ගනනිල් නුවන් වන මුවන් නුවන් තුටුකර බල.

**සංලක්ෂ්‍ය:-**අති නීලවර්ණ ආකාශතලයෙහි රක්තවර්ණ විදුලි සම්සේද ඉතා නිල්වූ වන ගර්භයෙහි පැනයන්නාවූ මෘගයන් බලව යන අර්ථයි. එවිට වනගර්භය ආකාශතලයටද මෘගසමූහයා විදුලියටද පිළිවෙළින් උපමිතයහ. මෘගයන්· විදුලියට උපමාකිරීමෙන් මෘගයන්ගේ සවර්ණවර්ණවද්භාවය ප්‍රකාශවේ.

“ගුවන්-නුවන්” යනු “ගගන-නයන” ශබ්දද්වයෙන් තද්භවවිය.

**138.** දි ලි—පි යු ම රා මිණි පැහැස රා
තම—තු ඩි නි රා අඹ රස උ රා
ඉ ඳු—දු නු යු රා නිලඹර අ රා
බ ල—ස න ගි රා පෙල සිත යු රා

**අන්වය:-**දිලි පියුමරම්ණි පැහැසරා තම තුඩින් අඹ ඉරා රස උරා ඉඳුදුනු පුරා නිලඹර අරා යන ගිරාපෙල සිත පුරා බල.

**සංලක්ෂ්‍ය:-“පියුමරාමිණි”** පද්මරාග මාණික්‍යයෝයි. රතු මැණික්වලට අභිධානයකි මෙයින් කීරපක්ෂීන්ගේ දේහවර්ණය පිළිබඳ අතිරක්තභාවය හඟවා.

**ඉඳුදුනු**-ඉන්ද්‍රචාපය දේදුන්න)යි. මෙයින් හඟවනුයේ විදුලිය ශීඝ්‍රතරව ධාවනය කරන්නාක්මෙන් කීර පක්ෂීන්ගේ අතිශීඝ්‍ර ප්‍රයාණ විශේෂයයි.

139. පි ඟි—කු ළු  බිඟුදූල් මද පොද හෙ  ළා
ගි රි—කු ළු  ලෙස ඝන තුරු පෙලත  ළා
ග ජ—මු ළු  දූක තැන තැන වන ග  ළා
ග න—කු ළු  යසි සිතමින් නොව මු  ළා

**අන්වය :**–බිඟු දූල් පිඟිකුළු මදපොද හෙළා තුරුපෙල තළා ගිරිකුළු ලෙස ඝන ගජමුළු වනගලා තැන තැන දූක ගනකුළුයසි සිතමින් මුළා නොව.

140. ග න—බො ල්  මඩ තවරා සියල  ගේ
ත ද—මු ල්  බිඳ ඇන උල්කර අ  ගේ
පි ළි—ම ල්  වැද උනුනට වැද ළ  ගේ
බ ල—වි ල්  තෙර වන මිවුන් ර  ගේ

**අන්වය:**–විල්තෙර සියලගේ ගන බොල්මඩ තවරා තද මුල් බිඳ අගේ ඇන උල්කර ළගේ වැද උනුනට පිළිමල්වන වන මිවුන් රගේ බල.

**සංලක්ෂ්‍ය:**–බොල්–මෙය "බහල" යන පාලි හෝ සංස්කෘත ශබ්දයෙන් තද්භව විය. ඝනාර්ථය ප්‍රකාශිතයි. තවත් තුච්ඡාර්ථයක් පහළකරන "බොල්" ශබ්දයක් ඇත. එය වනාහි "භුස" යන පාලි වචනයෙන් තද්භවවීයයි සලකත්වා.

මඩ–"මණ්ඩ" යන මාගධ ශබ්දයෙන් බිඳුනේය. මණ්ඩභූමි යනාදිය නිදර්ශනයි.

141. දි ලෙ න  ගිනි සිළුලෙස සු  බා
ය නෙ න  වන ගැබ උනුන'  ඹා
ව ඩ න  දුමුදුමුවන් ලො  බා
ව ඩ න  දූක සැවුලන් සු  බා

**අන්වය :**–සුබා ගිනිසිළුලෙස දිලෙන උනුන් අඹා වනගැබ යනෙන දුමු දුමුවන් ලොබා වඩන සුබා සැවුලන් දූක වඩන.

**සංලක්ෂ්‍ය:**–"දිලෙන ගිනිසිළුලෙස"–මෙයින් එම කුක්කුටයන්ගේ අතිරක්තවර්ණවද්භාවය ප්‍රකාශයි.

**"සැවුලන්"**–69 වන කවෙහි සංලක්ෂ්‍යය බලන්න.

සිඛා–යන්නෙන් 'සිළු'යි තද්භවවිය. ගිනිදූල්ලට නමකි.

142. වි සි ර  දිලිහෙන ගඟු ලැ  ළී
ත ඹ ර  ශොන'වල වන වි  ළී
නි ත ර  පලරස තුරුවැ  ළී
මි තු ර! දූක සව වන ම  ළී

අන්වය :–සරලය.

143. රැ ඳි ගු ව න් තල කිරි ව ලා
සු නු ව මි න් ගෙන සිරි’සු ලා
ව න හි සි න් මඳ පවන ලා
එ න ප හ න් ලොඳ රෙන් බ ලා

අන්වය:–සුනුවමින් සිරිගෙන උපුලා කිරිවලා රැඳි ගුවන් තල වන හිසින් මඳ පවනලා එන පහන් ලොඳ රෙන් බලා.

සංලක්ෂ්‍ය:–ලොඳ–ලොධ්‍ර (=ලොත්සුඹුළු) සි. ලොහිත වර්ණ යුක්ත බැවි කියා තිබේ. මේ ප්‍රදේශයෙහි ලොධ්‍රද්‍රැමයන්ගේ බහුල භාවය මෙයින් සූචිතයි. ලොත් මල් ඇති බැවින් මේ කාලය හෙමන්ත සෘතුව බව සැලකිය යුතු.

144. දිලි ග ගු ල් හැලි බසරි ලා
සැඳි නිම ල් වන සිරි ස . ලා
ඇඳි දු හු ල් ලෙස මනස ලා
දැක වි ස ල් සුදු වැලින ලා

අන්වය:–අනාකුලයි.

145. තැ න තැ න සුව රැල ව න හි ස ගු ව තේ
පැ න ය න ගිරි කුල බැ ස සැ ව ගි ම තේ
ය න එ න මුව රැල පැ න බැ ස එ ව තේ
දූ න ගෙ න ගිරි දෙළ . බැ ස ය ව ග ම තේ
(ගොමූත්‍රිකා)

අන්වය :–වන හිස ගුවතේ සුවරැල තැන තැන බැස ගිමතේ සැව පැන යන ගිරිකුල පැන බැස එවතේ යන එන මුවරැල දූනගෙන ගිරි දෙළ බැස ගමතේ යව.

146. ගි ලූ නෙලුඹුදැලි ප ළ කා ළ
දි ලූ වල ලුහුණු ද ළ ද ළ
සැලූ ඉවුරු බිඳ දෙළ දෙළ
ව ලූ රූ ගණ දකු ප ළ ප ළ

අන්වය :–දල දල ගිලූ නෙලුඹුදැලි පලකල වලලුහුණු දිලූ දෙළදෙළ ඉවුරු බිඳ සැලූ වලූරු ගණ පල පල දකු.

147. කඹුරු ක ලා ඉවුරු හෙ ලා
අ ගි න’ වු ලා මුල් පෙර ලා
ය න ස හ ලා ගවර රැ ලා
දකු නොවලා එවන ග ලා

**අන්වය :**-එවනගලා තඹුරුතලා ඉවුරුහෙලා අගින් අවුලා මුල් පෙරලා සහලා ගන ගවරරැලා නොවලා දකු.

**148.** මු වා කර න රිවි සේ යා
ඉ වා සි ටි න තුරු සේ යා
නි වා හි ම න සැප සේ යා
ගෙවා එ ව න නොල සේ යා

**අන්වය :**-රිවිසේයා මුවාකරන ඉවා සිටින තුරු සේයා හිමන නිවා නොලසේයා එවන ගෙවා සැපසේ යා.

## මාගී වණ්ණනා.

**149.** ඇ සෙ සි කියන රස ගී ලිය තු ඩි න් තු ඩි න්
දි සෙ සි බසින ගව මී රැළ කා ඩි න් කා ඩි න්
පැ සෙ සි රුවට කළ කෙත් වත් ගොඩින් ම ඩි න්
තොසෙසි එ ගම දුට ඒ වැ බ ඩි න් ව ඩි න්

**අන්වය:**-ලිය තුඩින් තුඩින් කියන රසගී ඇසෙසි. කඩින් කඩින් බසින ගවමීරැළ දිසෙසි. ගොඩින් මඩින් කළ කෙත්වත් රුවට පැසෙයි. එ ගම දුට තොස එසි. ඒ වැබඩින් වඩින්.

**150.** පල මී රිය වතු පිටි සියගණන් ල දින්
ඇම කා රිය දූන දනයන් වසන සො දින්
දෙන තු රිය වැනි 1ගවමීරැළ නින දින්
වැලි වෙ රිය දූකා යව පිරි සිතෙසි න දින්

**අන්වය:**-මීරියපල සියගණන් වතුපිටි ලදින් ඇමකාරිය දූන සොඳින් දනයන් වසන දෙන තුරිය වැනි ගවමීරැළ නිනදින් වැලිවේරිය දූකා සිතෙහි පිරිනඳින් යව.

**151.** දු නේ කියනලද වැනි මහ නිදු නේ
මා නේ වඩන රුසිරෙන් සුර සමා නේ
යා නේ එදුට සත ලොබ හැර පියා නේ
සේනේ ගම එදුට දුරුවෙයි අසේ නේ

**අන්වය :**-මහනිදුනේ වැනි කියනලද දුනේ මානේ වඩන රුසිරෙන් සුරසමානේ අයානේ දුට සත ලොබ හැර පියානේ. එ සේනේගම දුට අසේනේ දුරුවෙයි.

**152.** සිහිල් නල පහසින් – පියපත් විදු අහසින්
නරඹව දෙපස ඇමතැන් – ගිය සඳ මිතුර මඳ තැන්.

---

1 ගව මී රැළත් -නදින්.

අන්වය :-මිතුර! සිහිල් නල පහසින් පියපත් විදූ අහසින් මදනැත් සියසඳ දෙපස ඇමතැත් නරඹව.

153. නිති පුද පවතිනා මෙන් කැලණි වෙහෙර ට
පෙර රද මැතිවරන් පුදකල නියම කො ට
එකබඳ පැවත එන මාදෙල්ගස් ගම ට
ඇමසඳ සුසැදි නාකඳපල ගම්නෙ'පි ට

අන්වය:-කැලණි වෙහෙරට නිති පුද පවතිනා මෙන් පෙර රද මැතිවරන් නියමකොට පුදකල මාදෙල්ගස් ගමට එකබඳ පැවත එන ඇමසඳ සුසැදි නාකඳපල ගමින් එපිට—

## කැරගල වර්ණනා.

154. සාර පලස අඹ දඹ රඹද වල් පි ට
මිර ජලස ඇල දෙල කඳු පිපින් බ ට
නැර ලොලස වඩවන දුටු දනන් හ ට
කැර ගලස වැජඹෙන මේ ලෙසින් සි ට

අන්වය:-සාරපලය අඹ දඹ රඹද වල්පිට කඳු පිපින් බට මිරජලය ඇල දෙල දුටු දනන්හට ලොලය නැර වඩවන—කැරගලය මේ ලෙසින් සිට වැජඹෙන.

155. කුළින් කුළම සිහිලඹ වැහෙන කඳු රැස
දෙළින් දෙළම කල් යල් කරන කුඹු රැස
පළින් පළම නල් පොල් ගෙවතු මැදු රැස
නළින් නළම පුල් පියුම්'පුල පඬෙ රැස

අන්වය:-සරලයි.

156. පැසෙසි නිබඳ [1]සුවඳැල් දුල් කෙත් අව ට
ඇසෙසි ළමා වසුපැටියන් හඬ දුර ට
දිසෙසි වෙහෙර එහි සුරවිමනක් ලෙස ට
රසෙසි අමා රසමය ඒ පියස දු ට

අන්වය:-අවට නිබඳ සුවඳැල් දුල් කෙත් පැසෙසි. ළමා වසුපැටියන් හඬ දුරට ඇසෙසි. එහි වෙහෙර සුර විමනක් ලෙසට දිසෙසි. එපියස දුට අමාරසමය රස එයි.

157. නිබඳ පැසුණු පල ලඹ දෙන මිහි රඹ ය
සුවඳ විහිද සිටි විලිකුන් කැන් රඹ ය
නොමඳ තැනින් තැන වලු බර වන රඹ ය
එමැද වෙහෙර දිලි දුරලන සස රබ ය

1 සුවඳැල් කෙත්වත්.

අන්වය :–සරලයි.

සංලක්‍ෂ්‍ය:–කැන් :–"කර්ණිකා" ශබ්දයෙන් තද්භව විය.
වලු :– "වල්ලරී" ශබ්දයෙන් භින්නව ව්‍යවහාර ප්‍රාප්තයි.

158. නොහැර සතන් සිත තිසරණ තිල කුණුස
දෙස ැ ර ඔවුන් පවසන බස් විස කුණුස
නිතො ර නිවන් අස උන් වෙතම රැ කුණුස
වෙහෙ ර පිහිටි එ පියස මේ සල කුණුස

අන්වය:–සතන් සිත නොහැර තිසරණ තිලකුණුය. ඔවුන් දෙස් ඇර පවසන බස් විසකුණුය. උන්වෙතම නිතොර රැකුණුය නිවන් අස. වෙහෙර පිහිටි එපියස මෙ සලකුණුය.

සංලක්‍ෂ්‍ය :–මේ පද්‍යයෙන් ශාන්තතර උපාසක ජනයා භාවනානුයොගිවද ධර්මසාකච්ඡාවෙන් යුක්තවද දුගි 'මගි ජනයන්ට නිතොර දානය දෙමින්ද හැසිරෙන බැව් ප්‍රකාශිතයි.

159. සැ ඳු හැ සි ති න් මල් පුදවත් ගෙන අත ට
ස ත ර අ ති න් මහදන රැස්වන කල ට
දි නි ඳු අ ති න් ගිලිහුණු පියුමක් ලෙස ට
සුබ මොහොති න් වැද හසරද! එ වෙහෙර ට

අන්වය:–අනාකූලයි.

සංලක්‍ෂ්‍ය:–"අතට" මෙය කරණාර්ථයෙහි සබඳ විබත්.

160. මි හ ඹ මුව මඬලමෙන් දිලෙන හැම වි ට
සු ල බ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සි ට
කි ර'ඹ පොකුරු මීරස ලැබ බොන ලෙස ට
න ර ඹ මිතුර! තගෙ නෙත සිත සතුටු නො ට

අන්වය :–අනාකූලයි.

සංලක්‍ෂ්‍ය :– "මිහඹ මුවමඬලමෙන්" :– කාන්තාවක්හුගේ මුඛමණ්ඩලයතෙම ශෙෂ ශරීරාවයවයන්ට වඩා සර්වප්‍රකාරයෙන්ම දර්ශනීය වේ. එමෙන් මේ විහාරයද සෙසු භූමි ප්‍රදෙශයන්ට වැඩියෙන් සකල සම්පත්තියෙන් උද්දීප්තතරව දර්ශනීයත්වයෙන් යුක්ත බැව් මෙයින් ප්‍රකාශිතයි.

"කිරඹ පොකුරු මීරස ලැබ බොන ලෙසට" කිරි මිශ්‍ර ජලය හා පද්ම මධු රසයද හංසජාතියට අත්‍යන්තයෙන් ප්‍රීතිජනකය. එය ලැබුණුවිට අමෘතරසය සේ තුෂ්ටිජනක වේ ම ය.

161. දි මු ත් වෙහෙර වට විසිතුරු මල් ව තු ය
එ හි ත් සුවඳ මල් නිති වෙසි මිණි මු තු ය
ම හ ත් තුරු මියුරු පල ගෙන නැමි අ තු ය
රැ ග ත් සෙවණ නොහැරම සිපි පොල් ව තු ය

**අන්වය** :–දිමුත් වෙහෙරවට විසිතුරු මල්වතුය. එහිත් සුවඳමල් නිති මිණිමුතුය වෙසි. මියුරුපල ගෙන නැමි අතුය. මහත් තුරු රැගත් සෙවණ නොහැරම් සිපි පොල්වතුය.

**සංලක්‍ෂ්‍ය**:– මිණිමුතු:= මිණියෙන් මුතු 'මිණිමුතු' යි විග්‍රහයි. ප්‍රබුද්ධවූ පුෂ්පයෝ යන අර්ථයි. "මිණි" යන්නෙන් බන්ධනාර්ථය ප්‍රකාශයි. මණිය හෙවත් මල් කොපුවද "මිණි" යන්නෙන් ගැනේ.

**රැගත්** :–මෙය ලෝප විධියෙන් සිද්ධයි. මෙහි මූල් ශබ්දය ඇරගත් යනුයි. "රැගත් සුරා පිරුවිතින්" යනු නිදර්ශනයි.

162. නොයෙක් ‘තැනම පිපි මල් පිරුණු පො කු ණු ය
නෙ ය ක් කණුව සැදූහෙත් දෙවන ද කු ණු ය
සු ද ක් ලෙස තිබෙයි මලු මං හැර කු ණු ය
සි ය ක් දන කෙරෙති වැඳ පුද පැද කු ණු ය

**අන්වය** :–සුගමයි.

**සංලක්‍ෂ්‍ය**:–දකුණු – "දක්‍ෂිණ" යන්නෙන් තද්භව විය. දැන වසතුහු වෙත්.

**පැදකුණු** – "ප්‍රදක්‍ෂිණ" යන්නෙන් තද්භව විය.

163. නුදුරුව සි හි ලැ ලි ය ගඟු ලැ ලි ය
වටසැදි ම ල් වැ ලි ය සුදු වැ ලි ය
පිපි වන සි රි ම ලි ය වන ම ලි ය
තුටු වන සි හි වි ලි ය පුල් වි ලි ය

**අන්වය**:–නුදුරුව සැදි සිහිලැලිය ගඟුලැලිය වට මල් වැලිය සැදි සුදවැලිය පිපිවන සිරි මලිය වනමලිය. සිහිවිලිය තුටුවන පුල්විලිය.

164. [1]පවනැ'ද පිපි තු රේ ය නිරතු රේ ය
කුසුමන් පෙති තු රේ ය මලු තු රේ ය
අ ව ට සු පි පි ස රේ ය බිඟු ස රේ ය
සිත එ වෙහෙර කෙ රේ ය ලොබ කෙ රේ ය

---

1 පවන'ද.

**අන්වය:**-පවත් නිරතුරේය පිපිතුරේය කුසුමත් පෙති ඇද මලු-තුරේය අතුරේය අවට සුපිපි සරේය බිඟුසරේය. සිත එ වෙහෙර කෙරේය-ලොබකෙරේය.

**165.** **නො කියා වෙන ක තාය බණ ක තා ය**
**කිය න ස ඟ න හි තාය නිති හි තා ය**
**නො ගොස් ඉවත ව තාය කර ව තා ය**
**සි ටි ස ඳ . එ හි ප තාය නිති ප තා ය**

**අන්වය:**-හිතාය සඟන වෙන කතාය නොකියා නිතිහිතාය බණ කතාය කියන ඉවත නොගොස් නිති පතාය වතාය වතායකර එහි සිටිසඳ.

**166.** **කෙ ල නා බිඟු රැවින් බුදු මතුරූ දපමි න**
**සි ටි නා තුරූ වෙහෙර අතු අතිනි මල් ගෙ න**
**ය ති නා යක එ හිමි බුදුබව ලබන දි න**
**සි ටි නා වැනිය පිට දෙන ලෙසට පතමි න**

**අන්වය:**-කෙලනා බිඟු රැවින් බුදුමතුරූ දපමින අතු අතිනි මල් ගෙන වෙහෙර සිටි නාතුරූ යතිනාගක එහිමි බුදුබව ලබන දින පිටදෙන ලෙසට පතමින සිටිනා වැනිය.

**සංලක්ෂ්‍ය:**-එම විහාරයෙහි බමරුන් හැසිරෙන මල් පිපුණු නාග වෘක්ෂ පඞක්තියක් ඇත්තේය. එය කුමක් වැනිදැයි යතහොත්? බුද්ධධර්මය ඉගෙන භාවනාකරන්නාක් වැනිවූ භාඬගනාදයක් ඇත්තේය. පිදීමට ශාඛා නැමැති අතින් මල්ගෙන සිටිසි. එසේ භාවනාකරමින් මල් පුදමින් කල් යවන්නේ මතු බුදුවන එම නායකස්වාමීන්ද්‍රයන් වහන්සේට බුදුවන දිනයෙහි පිටදීමටයයි කපිනයි ස්වභාවයෙන් බමරුන් හැසිරීමෙන් හා පුෂ්පිතපුෂ්පයන් ගෙන් යුක්තවූ එම නාගස් ඒ යතීන්ද්‍රයා බුදුවන දිනයෙහි පිටදීමට-යෙදී සිටිය සි උත්ප්‍රේක්ෂිතයි.

**167.** **අ සා නිති සඟන පවසන දහම් ක ද**
**තොසා වෙමින් එ වෙහෙර උන් පරෙවි සො ද**
**ව සා මුව පියෙන් දූව වලලු පිට ඉ ද**
**දෙ සා බලන වැනි උතුනට කරන න ද**

**අන්වය:**-සඟන නිති පවසන දහම්කද එ වෙහෙර උන් සොඳ පරෙවි අසා තොසා වෙමින් දූව වලලුපිට ඉඳ මුව පියෙන් වසා නදකරන උතුනට දෙසා බලන වැනි.

**සං:**-එම විහාරයෙහි දූවවලලු ආශ්‍රිතවූ පරපත (පරෙවි) සමූහයා පක්ෂපත්‍රයන්ගෙන් මුහුණු වසාගෙන ශබ්දනගමින් වසයි. එය කුමක්වැනිදැයි යතහොත්? තද්විහාරවරයෙහි වාසොපගතවූ සඞ්ඝසමූහයා විසින් නිතර ප්‍රකාශ කරන ධර්මස්කන්ධය ආදරයෙන් ශ්‍රවණයකොට සිත තබා එය මතකනැති නොවී පවතීදැයි උතුතුන්

එක්ව ප්‍රකාශකොට බලන්නාක් වැනි වේයයි කියනලදී. මෙයින් තද්විහාරවරයෙහි නිත්‍යවාසීවූ සංඝයාගේ ධර්‍මසාකච්ඡාව සහ සජ්ඣායනයත් ගම්‍යමානවේ.

168. දුමු සත සිත සතොසවන ලෙසිනි නිතියෙ නී
සතර'ත එකට සමකොට බෙර ඇසක් මෙ නී
පැහැපත සුද නොහල වැලි අතුල මලු තැ නී
මිහිකත සඳන ලෙව් දුන් උරමඬල වැ නී

අන්වය:-දුටු සත සිත නිතියෙනි සතොසවන ලෙසිනි සතරත එකට බෙරඇසක් මෙනි සමකර පැහැපත සුද නොහල වැලි අතුල මලුතැනී මිහිකත සඳන ලෙව්දුන් උරමඬල වැනී.

169. ස ස ර එ ත ර වන ලෙස වඩනා අදහ ස
නොහැර වෙහෙර රැඳි සඟගණගේ සක ස
නිතොර ස ත ර සිල්කඳ ගෙන සිටින ලෙ ස
ස ත ර ප වු ර බබලයි සිට සතර දෙ ස

අන්වය:-සසර එතරවනලෙස වඩන අදහස නොහැර සකස වෙහෙර රැඳි සඟගණගේ සතර සිල් කඳ නිතොර ගෙන සිටින ලෙස සතරපවුර සතරදෙස සිට බබලයි.

සං :-"සතර සිල්කඳ":-ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ප්‍රත්‍යය සන්නිඃශ්‍රිත ශීලය, ආජීව පාරිශුද්ධ ශීලය යන සතරයි..

**c නවද, කාංස්‍යමණි නූපුරාරාව විරාජිත හංසරාජෝත්තම! මෙද ඒ විහාරයාගේ ආකර්‍ණනීයවූ වර්‍ණනා විශෙෂණක. එ ද තා කර්‍ණයට සවාලඞ්කාර කර.**

## පද්මවතී පිරුවන.

170. ස ර ණ වැඳ ගුරුන් කියවා දිනෙන් දි න
ප ර ණ අලුත් පොත් පෙරලා ප නි න් ප න
ද ර ණ කරනලෙස ඉඳගෙන වෙනින් වෙන
හෙර ණ සික කියන හෙරණෝ තැනින් තැන

අන්වය :- ගුරුන් සරණ වැඳ දිනෙන්දින කියවා පරණ අලුත් පොත් පතින් පණ පෙරලා දරණ කරනලෙස වෙනින් වෙන ඉඳගෙන තැනින් තැන හෙරණසික කියන හෙරණෝ.

171. මෙන් සත කිර'ඹ පිරිසුදුකර සිල් ගු ණ ය
ඉ න් සැක නොවි කරනුව සසර තර ණ ය
න න් සිකපද නිබඳ රකිනා ලෙස ප ණ ය
මු න් සික සිකවළඳ විමසන සඟ ග ණ ය

**අන්වය** :–සකකිර’බමෙන් සිල්ගුණය පිරිසුදුකර ඉන් සැක නොවී සසර තරණය කරනුව තත්සිකපද පණියලෙස රකිනා මුන්සික සිකවළඳ විමසන සඟගණය.

**සං**:– “මුන්සික සිකවළඳ” විනය ග්‍රන්ථයකි.

**172.** එ ස ම න් බදුරු මුනි සදහම් පෙලෙහි ඇ ති
ලෙස සන් සඳ සමස් ඇ දැනුමට පැවැ ති
අ ස මි න් නෑස ටීකා විනිස සැක නැ ති
කස සි න් විරිත සමහරු වනපොත් කෙරෙ ති

**අන්වය** :–එ සමන්බදුරු මුනි සදහම් පෙලෙහි ඇතිලෙස සන්සඳ සමස් ඇ දැනුමට පැවැති කසයින් විරිත සැකනැති නෑස ටීකා විනිස අසමින් සමහරු වනපොත් කෙරෙති.

**173.** ස ස ර’ණ පි වි ස විඳිනා දුක් ඉමක් නැ ති
ති ස ර ණ පිණිස වඩමින් තම සිතෙයි බැ ති
දෙ සර ණ සි ර ස කර වැඳ ගුරුවරන් නි ති
නි ස බ ණ වි නි ස සමහර සඟගණ අස ති

**අන්වය** :–සරලයි.

**සං** :– සසරණ –(සසර+අණ) අණ යනු අර්ණ හෝ අර්ණව යන ශබ්දයන්ගෙන් තද්භව වූවකි. සමුද්‍රය යන අර්ථයි. සංසාරය නැමැති සාගරය යනු ‘සසරණ’ යන්නෙහි අදහසයි.

**නිසබණ** :–එනම් දහම් කොටසකි. නවක භික්ෂූන්ට නියමිතය.

**අසති** :– කිරිය පෙරළියි. අසයි කියා වියයුතු තැන එලිවැට රැක්මේ හෙතුවෙන් වූ විපරීතයයි.

**174.** ප සි ඳු නොයෙක් වත පිළිවෙත තිරස ර ගු
මු නි ඳු සසුන් වැඩ වැඩුමට වැර ස ර ගු
පු බු දු නැණින් තෙර පදවියට විත ර ගු
පු බු දු කෙරෙති තෙර බණ එහි සමහ ර ගු

**අන්වය** :–නොයෙක් වත පිළිවෙත තිරසරගු පසිඳු මුනිඳු සසුන් වැඩ වැඩුමට වැරසරගු පුබුදු නැණින් තෙර පදවියට විතරගු සමහරගු එහි තෙරබණ පුරුදු කෙරෙති.

**175.** සොඳුරු පොරණ ඇඳුරොල් නොහැර පිවිතු රු
වි දු රු නැණින් පිරිසිඳ දුරැර මොහඳු රු
මි යු රු බසින් සැකහැර දෙසත විසිතු රු
ගැ ඹු රු විජම් පෙල’රුත් අසති සමහ රු

**අන්වය** :–සොඳුරු පොරණ පිළිතුරු ඇඳුරෙල් නොහැර විඳුරු නැණින් පිරිසිඳ බොහඳුරු දුරැර මියුරු බසින් සැකහැර දෙසන විසිතුරු ගැඹුරු විජම්පෙල අරුත් සමහරු අසත්.

**සං** :– "විජම්පෙල"– අභිධර්මපිටකයයි.

**176.** ම ද ක් ඇසුව සිදුවන සගසිරි කැමැ ති
නොයෙක් රහින් මොක් සිදුනොකොට නො නැව ති
උ ද ක් දෙසැට මිසදිටුමුල් සිඳ පැවැ ති
අ යෙ ක් සුතුරුපෙල දම් පද'රුත් අස ති

**අන්වය** :–මදක් ඇසුව කැමැති සගසිරි සිදුවන නොයෙක් රහින් මොක් සිදුනොකොට නොනැවති උදක් දෙසැට මිසදිටු මුල්සිඳ පැවැති සුතුරු පෙලදම් පදරුත් අයෙක් අසති.

**177.** පැවැ ති නෙයෙක් ටීකා ගැටපද දූ ක ය
වි ම ති නොවී මඳකුත් එකද නැන ක ය
කැමැති ලෙසින් පවසන හැර සිත සැ ක ය
අ ස ති නොයෙක් සඟගණ විනය පිට ක ය

**අන්වය** :–පැවැති නොයෙක් ටීකා ගැටපද දූකය එකද නැනකය මඳකුත් විමතිනොවී සිතය සැකය හැර කැමැතිලෙසින් පවසන විනය පිටකය නොයෙක් සඟගණ අසති.

**178.** ම ද කු ත් පවර පෙරැ'දුරු උවදෙස් නොහැ ර
දූ න ග ත් ගැඹුරු පද'රුත් හැම නියමක ර
පැ න ව ත් පසිඳු පඬිවර ඉඳ වෙහෙර තු ර
ප ව ස ත් නොයෙක් තකු වියරණ සඳ ලක ර

**අන්වය** :–පවර පෙරැදුරු උවදෙස් මඳකුත් නොහැර ගැඹුරු පදරුත් හැම නියමකර දූනගත් පැනවත් පසිඳු පඬිවර වෙහෙරතුර ඉඳ නොයෙක් තකුවියරණ සඳලකර පවසත්.

**179.** අ සේ ස දෙස පරසිඳු පොරණ පඬිව ර
වි සේ සයෙන් පැවසූ නොයෙක පදි ක ර
දෙ සේ දුරලමිනි සඳ වියරණ ලක ර
ඇ සේ කියන විසිතුරු කව් නළු සත ර

**අන්වය** :–අසේස දෙස පරසිඳු පොරණ පඬිවර පදිකර පැවසූ විසේසයෙන් නොයෙක සඳවියරණ ලකර දෙසේ දුරලමිනි කියන විසිතුරු කව් නළුසතර ඇසේ.

**180.** නුදුටු නොඇසූ තම – එහි මහිම හැම මෙ ලෙසේ
අසා දූක සැක හැර – අනුරපුර මහ වෙහෙර දුටු මෙන්.

**අන්වය** :–තම නුදුටු නොඇසූ එහි මහිම මෙලෙසේ අසා අනුරපුර මහ වෙහෙර දුටුමෙන් සැකහැර දූක—

181. දද යු ත් ග ත් පවනින් ලෙලදෙන අඹ ර
පැහැප ත් කො ත් කිරණින් දුරුකල අඳු ර
දූකනෙ ත් සි ත් තුටුකෙරෙමින් මුනි මැඳු ර
කු ස ල ත් ප ත් කර තර සසර සමුදු ර

**අන්වය** :–පවනින් ගත් අඹර ලෙලදෙන දදයුත් පැහැපත් කොත් කිරණින් අඳුරු දුරුකළ මුනිමැදුර දුක නෙත්සිත් තුටුකෙරෙමින් සසර සමුදුර තර කුසල් අත්පත්කර.

182. උ දු රැදු කඳ වෙලෙප් සුරසිඳු සේම සු දු
මු දු දලු නිල් කොළින් විදු ගනකුලෙක බ දු
බු දු නුදු විසින් පුදකළ බැතිනි නෙතිනි දු
ව දු සිත තොසින් මුනිඳුන් පිටදුන් දුමි දු

**අන්වය** :–සුරසිඳුසේම සුදු උදු රැදු කඳවෙලෙප් මුදුදලු නිල්කොළින් විදු ගනකුල එකබදු බුදුනුදු විසින් බැතිනි පුදකළ මුනිඳුන් පිටදුන් දුමිඳු සිතතොසින් වඳු.

**සං** :– “බුදුනුදු” – “බුදුන්ද” යන්නෙහි “න්” යන්නට මාත්‍රා වෘද්ධිය හා පිළිපෙරළි විධියෙන් සිද්ධයි.

“නෙතිනිදු” – “නෙතින්ද” යන්නෙන් එසේම සිද්ධයි.

## සඞ්ඝරාජ වර්ණනා.

183. විත්තල වෙහෙර වැඩ - වැඩ උන් වනවාසයෙහි
නා ග සේන මහතෙරිඳුන්ට මුනුබු රු
බෝ ග ණ්සුරු දලසෙන්ගමු හුනන්න රු
ඔහු වෙත උන් උතුම් – අලගක්කෝනාර සඳ
බ ඳු අත්තනායක මැති ස ඳු න් ගේ
ර ඳු සොවුරු පද්මවති ල ඳු න් ගේ
හි මි ව න සිහානා සුදසුන් මහ ලේ න
වැජඹෙන ලම්ණි කුලයෙන් සිරිලක සෙහෙ න
සි සි ව න ලොව සසඝ පරසිඳු කුලෙන් එ න
නි සි ව න ඔහුට මුනුබුරුවන මනනඳ න

**අන්වය** :–අනාකුලයි.

**සං** :– **බෝගණ්සුරු** – දෙවානම් ප්‍රියතිෂ්‍ය (=දෙවන පැතිස්) රජු දවස ශ්‍රී මහා බොධීන්වහන්සේ කැටුව දඹදිවින් සපැමිණි කුමරුවන් අටදෙන අතුරෙන් බොධිගුප්ත කුමාරයා ප්‍රධානය. ඒ බොධිගුප්ත කුමාරයාට සිවුරු හරවා මෞර්යවංශාභිජාත සුනන්‍දා කුමාරිය ආවාහකරදී ජයමහලේන තනතුර දුන්නේය. මේ දෙදෙනාගෙන් පැවතෙන පරම්පරාව ‘මෙහෙණවර’ වංශය නමින් ප්‍රසිද්ධවිය.

‘දළසෙන්ගමු’—මේ සියනෑ කෝරළයේ අදිකාරිපත්තුවේ පිහිටි ‘දළුගම’ යි. ‘දළසෙන්ගමු තුනන්නරු’ නම් එම ගමෙහිවූ බොධිපාලක පරපුරෙහිමවූ මෙහෙණවර වංශයට අයත් තුනන්නරු නම් අධිපති තෙමේ යි.

‘අලගක්කෝනාර’—අලකෙශ්වර යනු ද මේයි. ගිරිවංශාභිජාතවූ මේ පරම්පරාවේ මන්ත්‍රීහු දකුණු ඉන්දියාවේ කාඤ්චි (=කොඤ්චිවරම්) පුරයෙන් ලංකාද්වීපයට පැමිණියාහු වෙත්.

‘සිඛානා සුදුසුත් මහලේනා’—මේ අසිග්‍රාහක සුදර්ශනාභිධාන මහා ලෙඛක මන්ත්‍රිය. මහලේන ධුරය, මහා ලෙඛක හෙවත් මහා සම්පාදක (Chief Secretary) තනතුරයි.

‘ලමැණිකුල’—එල්ලෙන්නාවූ කන් ඇති පරපුර ලමැණිකුල—ලම්බකර්ණවංශ නමින් දනිති. සූර්‍යරාජවංශයට අයත් ශාක්‍ය කුලයකි මේ ලමැණිකුලයයි කියත්තේ. සැළලිහිණි සන්දේශයෙහි දැක්වෙන “රිවිකුල ලමැණිගොත් පිරිසුදු ගුවන් මැද” යනාදියෙන් පරාක්‍රමබාහු නරේන්ද්‍රයාද මේ වංශයෙහි උතුමකු බව පෙණේ.

**184. දුල් සියපත් පතුල් – නිරිඳුන් මුදුන් මල්කළ**

**නු ව ණි න් සියල් විදු දනහට මු දු න් ව න**
**තිළි ණෙ න් සුරබි සුරතුරු රඟ අ ඳු න් ව න**

**නිවැරදි නමා බස – ඈමටම කළ අමාරස**

**බ ටු වා ලෙසින් අටුවා ඇදුරකු දෙ ව න**
**සි ටු වා යසස් තු ටු වා පෙල’රුත් දෙ ස න**

**ප සි ඳු ව න ර ත් න ගිරිමෙන් මුළු ලොව ට**
**මු රු දු ව න ර ත් න රුවමෙන් දිලි රුව ට**
**මැ නි ඳු ව න ර ත් න දිව්ලද මුනිරඳු ට**
**න ම දු ව න ර ත් න මාහිමි හිමි සඳු ට**

**අන්වය :**– දුල් සියපත් පතුල් නිරිඳුන් මුදුන් මල්කළ නුවණින් සියල් විදුදනහට මුදුන්වන තිළිණෙන් සුරබි සුරතුරු රඟ අඳුන්වන නිවැරදි නමාබස ඈමටම අමාරසකළ දෙවන අටුවා ඇදුරකු බටුවා ලෙසින් යසස් සිටුවා තුටුව පෙල’රුත් දෙසන රත්නගිරිමෙන් මුළුලොවට පසිඳුවන, රුවට දිලි රත්නරුවමෙන් මුරුදුවන රත්නදිව් ලද මුනිරඳුට මැනිඳු වනරත්නමාහිමි හිමිසඳුට නමදු.

**සං :– වනරත්නමාහිමි**—මේ සංඝරාජයන්වහන්සේ සිඛානා සුදුසුත් මහලේනගේ නප්තෘවරයෙකි. එකී මහලේනගේ දේවිය පදුමවතී නම්. ඈ අලගක්කෝනාර මන්ත්‍රී (පස්වන බුවනෙකබා රජ) ගේ සහොදරියකි.

කැරගල වෙහෙර පදමවති දෙවියට වැඳුම් පිදුම් කිරීම පිණිස කළ බවත් වනරතන මාහිමියන්ට පුදකළ බවත් ශිලා ලෙඛනය කින් පෙණේ. මෙන්න ඒ ගල් සන්නස.

"සිරිසඟබෝ ශ්‍රී විජයබාහු මහරජාණන්ට එකොළොස් වන් තෙදී අත්නායක දළසෙන්ගමු භූතන්තරුන් තමන් ලඟ උන් අළගක්කෝණාර පාදයාගේ සහොදර බුහුතණ්යන් පත්මාවතින් වැද පුදාගන්නා ලෙසට කරවූ විහාර සන්නස පරගොඩ හා මෙහි බද ගෙවතු ගස කොළ කුඹුරු ඕවිටි වල් විල් ආදිවූ සතර මාහිමට ඇතුළත් සරියත් වත්තල නාගසේන මහ තෙර සාමින්ගේ ශාසන බන්ධු පරම්පරාවෙන් පැවත ආ ඇඹුල්ගම කුසලාන්ගම හා මෙහි බද ගෙවතු ගස කොළ වල් විල් කුඹුරු ඕවිටි ආදිවූ සතර මාහිමට ඇතුළත්වූ සරියත් මෙම වත්තල වනවාසයේ නාගසේන මහතෙර සාමීන් සන්නකව පැවැති පානබුනු කෝරළය බද අංගොඩ කුසලාන හා මෙහි බද ගෙවතු ගස කොළ වල් විල් කුඹුරු ඕවිට් ආදිවූ සතර මාහිමට ඇතුළත්වූ සරිය හා මෙකී සියලු ගම්බිම් දඹදෙණි අම්බියේ පටන් කැරගල ශ්‍රී රාජගුරු වනරත්න මහා සාමීන්වහන්සේගේ ශාසන බන්ධු පරම්පරාවෙන් මෙවක් පෙරවා කවර තරම් කෙනෙකුත් ගෙනුත් අවුලක් උවරණයක් නැතුව පැවත ආ සේ සලස්වා මතු වන රජ යුවරජ මහ ඇමැති ආදිවූ හැම තැන් වලින් අසා දැන වෙවු පරිද්දෙන් චිරස්ථායිකොට පවත්වා පින් පුරාගන්නාලෙස දතුව යහපති."

කොළඹට සැතැපුම් 20 ක් පමණ නැගෙණහිරින් නැගෙණහිර සියනෑ කෝරළේ ගහබඩ පත්තුවේ **කැරගල** පිහිටා තිබේ.

**D නවද—ලඞ්කාරලක්ෂණ දක්ෂ විචක්ෂණ ක්ෂත්‍රියරත්නාශමාන වනරත්න සඞ්ඝරාජෝත්තමයාගේ මෙද එක් වර්ණනා කාව්‍යශෙෂ. එද නා කාර්ණපථාලඞ්කාර කර.**

**185. සි යු මි අරුත් වීකා පොත් කල බුහු වී**
**උ තු මි පොරණ ඇදුරන්ගේ රහින් දි වී**
**කි ය මි කෙසේ ඔහු ගුණ නුවණ නො කිලි වී**
**වි ජ මි පෙල අරුත් අනැඹුල ලෙසින් දි වී**

**අන්වය:**—සියුම් අරුත් වීකාපොත් කල බුහුවි උතුම් පොරණ ඇදුරන්ගේ රහිත් දිවි ඔහු නොකිලිටි නුවණ ගුණ කෙසේ කියම? විජම්පෙල අරුත් අනැඹුල ලෙසින් දිවි.

සං :– වීකා—9 කවේ සංලක්ෂ්‍යය බලනු යෙගේ.

**186. වෙසෙසි න් සුතුරු අබිදම් ගංවැද සත ත**
**පි රෙ මි න් පැතිර සිවිනා නොදූක වෙරල ත**
**සෑ දි න න් නය විනය සමුදුර ගැඹර යු ත**
**ඔ හු මි න් තිමිංගල මින් නො කෙළි තැන් නැ ත**

**අන්වය:**—සුතුරු අබිදම් ගං සතත වැද වෙසෙසින් පිරෙමින් වෙරලත නොදූක පැතිර සිවිනා නත්නය සෑදි ගැඹරයුතු විනය සමුදුර ඔහු මින් තිමිංගල මින් නොකෙළි තැන් නැත.

සං :– "සුතුරු" – සූත්‍ර යන සංස්කෘත ශබ්දයෙන් භින්නයි. "සමුද්‍ර – සමුදුර", "භද්‍ර – බදුරු", "ඉන්ද්‍ර – ඉඳුරු" යනාදිය මෙනි. "තිමිංගල" – එනම්වූ අතිවිශාල මත්ස්‍යයෙකි. ඔහු මහාසාගරයෙහි මධ්‍ය ප්‍රදේශයම ඇසුරුකොට වසන්නේයයිද කියා තිබේ.

**187.** **අ ස නු  නැත එ සම කෙනෙකුන් දෙ ර  ට ක ය**
**දි න නු  නියම දූත ඔහු සිටින පි  ට ක ය**
**ඉ ති නු  ගැඹුරු පද'රුත් සුතුරු පි  ට ක ය**
**දූනෙනු  ලොවට එ යතිඳු දෙසන වි  ට ක ය**

**අන්වය** :–එසම කෙනෙකුත් අසනු දෙරටකය නැත. ඔහු දූත සිටින පිටකය දිනනු නියමය. ඉතිනු ගැඹුරු පදරුත් සුතුරු පිටකය ලොවට දූනෙනු එ යතිඳු දෙසන විටකය.

**188.** **විස'ඹ සරණ සසුන'ඹරට රිවි  ම ඬ ල**
**ස ත' අසරණ ගිම් නිවුමට සඳ  ම ඬ ල**
**නැණ'ලුසරණ ඔහු තෙපලම මිහි  ම ඬ ල**
**හැම විසරණ ඔහු නැණ කෙළි කෙළි  ම ඬ ල**

**අන්වය** :– ඔහු විසඹ සරණ සසුනඹරට රිවිමඬල අසරණ සත ගිම් නිවුමට සඳ මඬල ඔහු තෙපලම නැණලු සරණ මිහිමඬල හැමවිසරණ ඔහු නැණකෙළි කෙළිමඬල.

**සං** :– "විසඹ සරණ සසුනඹරට රිවි  මඬල"

වාග්වනිතාවට වාසස්ථාන බවක් හා ශාසනාම්බරයට සූර්යයා වැනියයිද දැක්වීමෙන් ප්‍රාඥභාවයත් පූජ්‍යභාවයත් පරිදීපය.

**"විසඹ"**:– (විසි + අඹ) 'විසි' නම් වචනයයි. 'අඹ' නම් භාර්යාවයි. සරස්වතියට නමකි. "විසිලඳ" යනු මෙනි.

"සරණ":– ගෘහය හෙවත් වාසස්ථානය වේ.

"සරං ගහඤ්චාවසථො සරණඤ්ච පතිස්සයො" අභිධානයි.

"සත අසරණ ගිම් නිවුමට සඳ  මඬල"

මෙයින් ප්‍රකාශවන්නේ වනරත්න මාහිමියන්වහන්සේගේ දාන පාරමිතා පූරණයයි. ඒ බව මේ සන්දේශයෙහිම කථිතවූ

"ගෙයක් කණම සැදූහෙන් දෙවන දකුණුය"

"දෙත් සමතනු ලත්සැපතනු සත්සිතනු"

"ලොවැති නොමින් සිරි සැපතින් පිරි  සාල
කැමැති ලෙසින් දෙන තිළිණෙන් සුර  සාල"
යනාදියෙන් ස්ඵුටවේමැයි.

"නැණළු සරණ බඹු තෙපලම මිහි මඬල"

එම සංඝරාජ මාහිමිපාණන්ගේ වාග්ප්‍රචාරය ප්‍රඥාලෝකයාගේ පැතිරීමට මහිමණ්ඩලය වැනියයි කීහ. ප්‍රඥාලෝකය පැතිරීමට මහිමණ්ඩලය උපකාරයකි. එමෙන් එම සංඝරාජමාහිමියන්ගේ තෙපුලම ප්‍රඥාව ප්‍රකාශවීමට ස්ථානය බව කියයි. මෙයින් ප්‍රඥාසහගත තෙපුල්ම වදාරණ බව ගම්‍යමානය.

"හැම වියරණ ඔහු නැණකෙළි කෙළි මඬල"

උන්වහන්සේගේ ඥානය ක්‍රීඩාවට සියලු ව්‍යාකරණ ශාස්ත්‍රම ක්‍රීඩා මණ්ඩලයක් බවද කියයි. සිංහල – පාලි – සංස්කෘතාදි භාෂා ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි විශාරද ප්‍රඥාවක් ඇතිබව මෙයින් ශූචිතයි.

189. කිම ඔ හු ය ස ස වෙන වෙන අප කියනු දූ නී
ඇති තතුලෙස සව් සතර ම දත් බැවි නී
සු ර ගු රු මි ස නොකෙරෙයි කෙනෙකුන් දෙවෙනී
එ ය ති ඳු බ ස සඳලකරන් උපන් තැ නී

**අන්වය :**–ඔහු යසස වෙන වෙන දූනී අප කියනු කිම? ඇති තතුලෙස සව්සතරම දත්බැවිනි සුරගුරු මිස කෙනෙකුන් දෙවෙනි නොකෙරෙයි. එ යතිඳු බස සඳලකරන් උපන්තැනි.

190. ඇ ස ට පෙණෙනු මිස දිව ඉසිවර කෙනෙ කී
බ ස ට ඔහුගෙ ලොව නැත සරිවන රසෙ කී
දෙසැට දිටුම විමසා නුවණින් නිසැ කී
දු ස ට පොරණ ඔහු වරදුයි හල දෙස කී

**අන්වය :**–සරලයි.

191. ක ලා සැටසතරකී ඉසිවරන් ගු රු
නොලා දෙසක් සඳලකරින් කර සොඳු රු
ග ලා රසෙසී පැවසූ කවිතළු ගැඹු රු
බ ලා පලාපයකැයි නො කළේය ග රු

**අන්වය :**–කලා සැටසතර කී ගුරු ඉසිවරන් දෙසක් නොලා සඳලකරින් සොඳුරුකර රසෙහි ගලා පැවසූ ගැඹුරු කවිතළු බලා පලාපයකැයි ගරු නො කළේය.

192. ම හ ත් අසුර පුර ඇදුරන් ඇර පොර ණා
බ ල ත් අතර මෙවිතර කවරෙක දෙර ණා
දි ග ත් සතර විතරය ඔහුගෙ යස ගු ණා
නක ත් සතර අතරක නොතිබිය නැ ණා

අන්වය :–අනුරපුර මහත් පොරණ ඇදුරන් ඇර අතර බලත් මෙ විතර දෙරණ කවරෙක? ඔහුගෙ යසගුණ දිගත් සතර විතරය නැණ නකත් සතර අතර නොතිබිය.

**193.** වි සි තු රු  ගහ ගණිතින් නොකිවත් සත  ට
පි වි තු රු  ඔහුගෙ තෙපලම මුල්වෙසි වැඩ  ට
කි වි ගු රු  වර පැවසූ නීති සතර  ට
න ම ගු රු  බවම දූන්විය දූන් නරලොව  ට

අන්වය :–විසිතුරු ගහගණිතින් නොකිවත් පිවිතුරු ඔහුගෙ තෙප ලම සතට වැඩට මුල්වෙසි. කිවිගුරුවර පැවසූ නීතිසතරට දූත් නම ගුරුබවම නරලොවට දූන්විය.

**194.** ඇ සු ව  ලබයි සුර ඇදුරන්ගෙනුත් තු  ති
මෙලොව  කොනෙක් ඒ වරදක් නොකිය හෙ  ති
ඇ ති ව  දිවැස් කි බස් මෙන් පිළිගනි  ති
මෙලොව  අදිකරණ ඔහු ඇතිනොකැයි යෙ  ති

අන්වය :–ඔහු බස් ඇසුව සුරඇදුරන්ගෙනුත් තුති ලබයි. මෙලොව කෙනෙක් ඒ වරදැයි නොකියහෙති. අවැස් ඇතිව කිබස් මෙන් පිළිගනිති. මෙලොව අදිකරණ ඔහු ඇති නොකැයි යෙති.

සං :– “මෙලොව අදිකරණ ඔහු ඇති නොකැයි යේ  ති

උන්වහන්සේ පහළවනතුරු අධිකරණ ඇතිබව හා පහළවූ කල්හි නැතැයි හැඟවීමෙන් වර්‍තමානකාලයෙහි මනුෂ්‍යයන් උන් වහන්සේගේම ධර්මාවවාද පිළිගෙන පවත්නාහෙයින් අපරාධ දූරි භූතව සමගියෙන් සමසථව විසූ බැව් දක්වයි.

**195.** ලෙසට සු ත න්  හිත අ හි ත න්  රකින උ  දු
රජ ගු රු තැ න්  ලැබ පුද තැ න්  තෙර නමු  දු
පෙර මහ තැ න්  නොමදුවූතැ න්  කර පුරු  දු
හැම විදු තැ න්  දූන හැම තැ න්  විය පසි  දු

අන්වය:–හිත අහිතන් සුතන්ලෙසට උදුරකින රජගුරුතැන් තෙර නමුදු පුදතැන් ලැබ පෙර මහතැන් නොමදුවූ තැන් පුරුදුකර හැමවිදු තැන් දූන හැමතැන් පසිදුවිය.

**196.** වි රු දු  න මු දු  කියවූ නැන යන දෙවෙ  නි
මෙ බඳු  ය ති ඳු  උතුමෙක් විය සත පිනි  නි
එ යි දු  මෙ යි දු  නො කියා බණ දෙසනුයෙ  නි
මි හි ඳු  මි හි ඳු  මාහිමියන් පැමිණි වෙ  නි

අන්වය:–දෙවෙනි නැන යන විරුදු නමුදු කියවූ මෙබඳු යතිඳු උතු මෙක් සත පිනිනි විය  එයිදු මෙයිදු නොකියා බණ දෙසනුයෙනි මිහිඳු මිහිඳු මාහිමියන් පැමිණි වෙනි.

197\. ප ත් සතතගු මෙත් සිතැත ගු කි ත් කොතගු
දෙ ත් සමත ගු ල ත් සැප ත ගු ස ත් සිත ගු
ග ත් සමත ගු ස ත් සි රි ත ගු සෙ ත් පත ගු
නු ත් සතතගු මු ත් කොවතගු වනත් බ ගු

අන්වය :- සතතගු පත් මෙත් සිතැතගු කිත්කොතගු ලත් සමතගු සැපතගු දෙත් සත්සිතගු ගත් සමතගු සත්සිරිතගු සෙත්පතගු ඔහු වනත් නත් සතතගු මුත් කෙවතගු.

සං:- මෙහි පැණෙන "සතතගු" යනාදියෙහි "ගු" පදපූරණ පිණිස යොදනලද ගකාරයාගේ පිළිපෙරළි විධියෙන් සිඳුයයි සැලකිය යුතුයි.

## සන්දේශය.

198\. අණසක පතල නිති – කෙල සුවහසක් සක්වල
රු ව න් පන්තිසෙහි ගුණකල වෙසෙස් කො ට
රු ව න් සුතුරු පිරුවා සිය දහස් වි ට
නො හැර කිකරු කර – හැම 1සුරනරන් තමහට
ස ත ත ලොවට සෙතදෙන ඒ යති රදු ට
නැව ත නැමඳ මෙලෙසින් සැලකරව සි ට
ම හ ත් තෙදැති පුල්වන් සුරිඳු මුල්කො ට
දි මු ත් සමන් බොක්සල් සුරිඳු'නෙක්කො ට
ස ව ත් සුරිඳු විබිසණ ඈ සුරන්හ ට
පි රි ත් කියා පින්දී සිත සතුටුකො ට

අන්වය :- කෙලසුවහසක් සක්වල නිති අණසක පතළ රුවන් පත්තිසෙහි ගුණ වෙසෙස්කොට කල රුවන්සුතුරු සියදහස්විට පිරුවා හැම සුරනරන් නොහැර තමහට කිකරුකර සතත ලොවට සෙතදෙන ඒ යතිරදුට නැමද නැවත සිට මෙලෙසින් සැලකරව. මහත්තෙදැති පුල් වන්සුරිඳු මුල්කොට දිමුත් සමන් බොක්සල් සුරිඳුන් එක්කොට සවත් සුරිඳු විබිසණ ඈ සුරන්හට පිරිත්කියා පින්දී සිත සතුටුකොට—

199\. පවර සිරිසඟබෝ – සිරි පැරකුම් නිරිඳු වෙත
දි යු ණු කර කුළුණුසිත යොදමින් දිවැ ස
ප මු ණු වමින් සුබ සිරිසෙත ඈම දව ස
සතුරු වියවුල් හැම – අතුරුදන්කර උවදුරු
ප හ න් සිතින් මුනිඳුට පුදකර නිබ ඳ
දෙප න් සියක් අවුරුදු රජඉසුරු වි ඳ
ප ව ති න මෙන් සලසා මේ සිරිලක ට
හැමතැන අණ පවතිනු කොට එකරඟ ට
ඈම දෙන සිට රකිනාලෙස නිසමකො ට
අ ය දි න ලෙස සැලකර ඒ යතිරදු ට

---

1 සුරවරන්-ඇතැම්.

**අර්ථය** :-පවර සිරිසඟබෝ සිරි පැරකුම් නිරිඳුවෙන දිවැස යොද මින් කුළුණුසිත දියුණුකර ඇමදවස සුබසිරිසෙන පමුණුවමින් සතුරු විසවුල් උවදුරු අතුරුදන්කර පහන්සිතින් මුනිඳුට නිබද පුදකර දෙපන් සියක් අවුරුදු රජඉසුරු විඳ පවතිනමෙන් සලසා ඇමතැන එකරගට අණපවතිනුකොට ඇමදෙන නියමකොට රකිනලෙස අයදිනලෙස ඒ යතිරදුව සැලකර.

**සං:-සුවහස**-මෙහි පද සිද්ධිය මෙසේය. (පාලි) සතසහස්ස-සිය සහස්-සියහස්-සිවහස්-සුවහස් සුවහස.

**රුවන් පන්තිස**-රතන සූත්‍රයෙහි පන්තිස් (=35) වැදූරුම් රත්නභාවය.

රතන සූත්‍රයෙහි 6 වන ගාථාවෙහි 12 ද, 9 වැන්නෙහි 3 ද; දස වැන්නෙහි 3 ද, තෙලෙස් (=13 වැන්නෙහි 9 ද, සෙස්සෙහි එකක් එකක්ද බැගින් ගත්කල පන්තිස සම්පූර්ණයි.

**මහක් නෙදැති පුල්වන් සුරිඳු**..............-මෙහි පුල්වන් සුරිඳු මුල්කොට දැක්වුනේ ලංකා ශාසන භාරය ධරන ප්‍රධාන දෙවි යන් හෙයිනි. (45 පිට බලනු.) උපුල්වන්, සමන් බොක්සල්, සවන්, විබිසණ යනු සිරිලකට අරක්ගත් සතර මහ දෙවියෝය. විබිසණ ඈ යන තන්හි ඈ සදින් ඒ දෙවියන් ඇතුළු තවත් ඒ ඒ පළාත් වාසීන් විසින් ගරු කරනු ලැබෙනයම් දෙවි කෙනෙක් වෙත්ද ඔවුනු ගැනෙත්.

**යතිරදු**-යතිරදු නම් සංඝ රාජයෝය. 101 පිටෙහි සංලක්‍ෂ්‍යය බලනු මැනවි.

දූත් සමකාසීාවසානයෙහි දූත මෙහෙවරෙහි නිරතවූ පක්‍ෂි රාජයාහට

"අනෙන කාව්‍යස්‍ය නිත්‍යත්වාත් කුසීාදෘශිෂ මුත්තමම්
සම්ත්‍ර ව්‍යාප්‍යතෙ විදවත්තාය කොවිඡානු රූපිණීම්" යන

සාරසමතා ලඞකාරොකති අනුගමනය කොට ආශිර්වාද කටැවිවූ ග්‍රන්කතීෘ 'මෙයුතු හසුන්' යන පද්‍යය කියයි.

## දූතාශංසනය.

200. මෙ යු තු හසුන් ඝොස් දක්වමින ඇති ර ඟ
දි මු තු යසස් පෙන්වා ලොව තරඟ ර ඟ
එ මු තු කාලඹ වන් හස මිතුර! මනර ඟ
ප ව තු ඝෙමෙහන් සිය නෑ සියොතුන් සම ඟ 1

1 මේ කව වෙනුවට සමහර පිටපතක දැක්වෙන්නේ මෙසේය.

උ ද ග ස නොවී දුරු මඟ ගෙවමින් ගො සි නී
අ ද ග ස මෙ අප සිදුකර හසරද රි සි නී
කා ද ග ස වෙහෙස නොවැ සිය සිය සහතො සි නී
ත ද ග ස වස් පවතු සිරිවිඳ සිතු ලෙ සි නී

**අන්වය :**-ගොස් සුතු මෙ හසුන් ඇති රඟ දක්වමින ලොව දිමුතු යසස් තරඟ රඟ පෙන්වා එ මුතු කලඹ වන් මකරඟ හස මිතුර! සිය නෑ සියොතුන් සමග යෙහෙන් පවතු.

**සං:-යසස්**-යනු කීර්තිය යි. කීර්තියට උපමා වශයෙන් සමන් මල්, කල්හාර, කපුරු, ආකාශ ගංගා, චන්ද්‍රරශ්මි, පිනි, මුතු, සුදු වලාකුළු, කිරි මුහුද, සුදු නෙළුම් ( පඹෙර), කෛලාස පර්වතය, ඊශ්වරයාගේ මහ සිනාව යනාදිය කවි සමයෙහි දක්වේ.

**මුතු කලඹවන් හස මිතුර**-මුතු ධවලය. එ බැවින් හංසයාගේ ශ්වෙතවර්ණ භාවය හා කීර්තිය මින් ගම්‍යමානයි. සුදු හංසයකු මේ සන්දේශයෙහි දූත කාර්යයෙහි යෙදූ බැව් නිශ්චිතයි. මෙහිම 120 කවෙහි

> 'එ දා දාගැබින් යන රැස් කඳක් ලෙ ස
> වි දා පියා යුග යන තොප අහස් කු ස' යන්නෙන්

හංසයා ධවල වර්ණ හෙයින් දාගැබින් නිකුත් ශ්වෙත (සුදු) බුද්ධ රශ්මියට උපමිත බවද පෙණේ. 'තිසර' යනු සුදු හංසයන්ට නම්. මෙහිම අවසාන පද්‍යය බලනු යෙයේ.

**පවතු**-සියලුම සිංහල සන්දේශකාරයන් **සැරද** යනාදීන් සන්දේශය පටන් ගත්තාක් මෙන්ම **පවතු** යන ආශීර්වාදාත්මක විධි ක්‍රියාව කින් යුත් පද්‍යයෙකින් දූතාශංසනය නිමවා තිබේ.

**යෙහෙන්**-සුවයෙන් යුතුව (සුවසේ) යනු අර්ථයි. 'යහ' සදින් පරව කරණ විබත් 'එන්' පසව (යහ+එන්) 'යහෙන්'යි සිද්ධව පිළි පෙරළිව "යෙහෙන්" යනු විය. 'යහ' යනු ශුභ-සුබ-ප්‍රිය-සුන්දරාදි අර්ථයන්හි යෙදේ. (ශුභ පර්‍යාය) යහපච්ච-යාපච්ච, යෙහෙන්, යහ දස්න, යහපත් යනාදියෙහි ඒ දක්නා ලැබේ.

## කතිකනාම සන්දේශීතය.

**201.** ම න ර ම් ලකළ මල්පලරම් රඳන නි සි
නොවකිම් උතුම් 1 ගෙවුයනු'දුල නිතොර දි සි
2ර සි ග ම් නුවර තුර රැඳි පිරි ඉසුරු රැ සි
වි හි ගු ම් සොඳුරු 3 විදුගම වෙහෙර වැ සි

**අන්වය :**- මනරම් ලකළ තිසි මල් පලරම් රඳන නොවකිම් නිතොර දිසි උතුම් ගෙවුයනුදුල ඉසුරු රැසි පිරි රසිගම් නුවර තුර රැඳි විහිගුම් සොඳුරු විදුගම වෙහෙර වැසි.

---

1 ගෙවුයත් කැල. 2 රසිගම් නුවර තරුසැදි පිරි ඉසුරු රැසි.
3 විසිදුගම.

**සං:– රයිගම් නුවර** – ශත වර්ෂ කිහිපයක් මුලුල්ලෙහි සකල නගරාංගශ්‍රීන් උපලක්ෂිතව පැවැති පැරණි නගරයකි. දැනට මෙය පානදුරයට වඩා දුරනුවූ හොරණ අසල එනමින්ම හඳුන්වන (රයිගම්) කෝරළය බඳ සාමාන්‍ය ග්‍රාමයකි. ක්‍රි: ව: 14 වන ශතවර්ෂයෙහිදී මෙනුවර ප්‍රභූරාජාදීන්ට පවා වාසභූමිවූ කීර්තිමත් පුරවරයක් බවට පැමිණියේය. නිශ්ශංක අලගක්කෝනාර ප්‍රභූ රාජයන්ට ජන්ම ප්‍රවේණිවූයේත් මේ පුරවරයයි. ඔහු විසින් මෙහි වසමින්ම අභිනව ජයවර්ධනපුරය (දැන් කෝට්ටේ) තොඩ නගන ලදි "නානා දේශවාසි නිඛිලජන ප්‍රාර්ථනීයවූ සකල නගරාංග සම්පත්තීන් යුක්ත ජන්ම ප්‍රවේණිවූ රෛග්‍රාම පුරප්‍රවරාසන්නයෙහි ග්‍රාමාරණ්‍යවාස වාසි මහා සංඝයා වහන්සේට වෙන වෙන විහාර කරවා" යන නිකාය සංග්‍රහ වාක්‍යයෙන් මෙනුවර අලගක්කෝනාර මන්ත්‍රීන්ගේ ජන්ම ප්‍රවේණි භූමිය බව දත හැකිය. ඇතැම් පිටපත්හි "රාජග්‍රාම පුරප්‍රවරාසන්නයෙහි"යයි දක්නා ලැබෙතුදු "රෛග්‍රාම" යනුම සම්භාව්‍යතර බව පිළිගත යුතුය.

**වීදාගම වෙහෙර**–යථොක්ත රෛග්‍රාම පුරප්‍රවරයට අයත් සුප්‍රසිද්ධ රජමහා විහාරවරය නම් මේ වීදාගම විහාරස්ථානයයි. රයිගම් පුරයේ ප්‍රධාන විද්‍යාස්ථානයව පැවැත්තේත් මේ විහාරයයි. සතර වන සිරි පැරකුම්බා නරපති තුමන්ගේ ආචාර්ය භාවොපගත මහ වීදාගම මහා ස්ථවිර (මහ වීදාගම හාමුදුරුවෝ), මේ හංස සන්දේශ කාව්‍ය ආදී චිරප්‍රසිද්ධ ග්‍රන්ථයන් නිපදවාලූ රාජ පූජිත වීදාගම මෛත්‍රෙය මහා ස්ථවිර යනාදී උත්තමයන්ට වාස භූමිවූයේත් මේ විහාරවරයයි. ශ්‍රී ඝනානන්ද පිරිවෙණ තුබුණේත් මෙහි ම ය. රයිගම් පුරය දීප්තිමත්කළ අලගක්කෝනාර මන්ත්‍රීශ්වරයන්ගේ කාලයටත් පූර්වයෙහි පටන් වීදාගම විහාරය ප්‍රසිද්ධ විහාරස්ථානයක්ව පැවැති ආ බව ඉතිහාසානුගතව සිතිය හැක.

**202.** ස ත් වෙ න මෙ ත් නිරතුරු පතළ එක ලෙ සි න්
ද ත් නෙ ක ස ත් හෙළ සකුමගද ඇ නි සි න්
කි ත් ග ස කොත් බඳ දිගුඔට'ග සහතො සි න්
මෙ ත් ම හ නෙ ත් පාමුල තෙරිඳු සඳ වි සි න්

**අන්වය :**–නිරතුරු එක ලෙසින් සත් වෙත මෙත් පතල හෙළ සකු මගද ඇ නෙක සත් තිසින් දත් සගතොසින් දිගු ඔටග කිත් ගස කොත් බද මහනෙත් පාමුල මෙත් තෙරිඳු සඳ විසින්.

**සං:–මෙත්**–මෛත්‍රිය වනාහි චිත්තයාගේ අතිශය ස්නෙහවද් භාවයයි ක්‍රොධයට ප්‍රතිපක්ෂ ධර්මයවූ මේ මෛත්‍රිය සියලු සත්ත්වයන් කෙරෙහි හිතවද් භාවයෙන් හටගනියි. සිත ඉතා සිනිදු බවට

පමුණුවයි. සියලු දෙනා කෙරෙහි වැඩ කැමැති බව අපෙක්‍ෂා කරයි. "සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා, නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා." යනාදී වශයෙන් සකල ලොකයාගේම අභිවෘද්ධිය පතයි.

සම සතළිස් කමටහන් අතුරෙන් මෙද එක් කර්මස්ථානයක් වශයෙන් බුද්ධ ධර්මයෙහි සඳහන්වී තිබේ. මීට අරමුණුවන සත්ත්වයාගේ ගණනක්-ප්‍රමාණයක් නැති හෙයින් (හෙවත් අප්‍රමාණ සත්ත්වයා කෙරෙහි වැඩිය යුතුවන හෙයින්) මෙයට "අප්‍රමාණ භාවනා" යයිද කියනු ලැබේ.

බුදුබව සාධාලන දශ පාරමිතා ධර්මයන්ගෙන් මෛත්‍රියද එකකි. සතර බ්‍රහ්ම විහරණයන් ගෙනුදු ප්‍රථමාඩකය ගත්තේ මෙයයි. දූහැ මෙන් සෙමෙන් රට රක්නා රජ කෙනෙකුන්ට ඇතිවිය යුතු දශරාජ ධර්මයන් අතුරෙනුදු අක්‍රොධයයි දක්වුණේ මේ මෛත්‍රියමැයි.

**කොත්**-මෙහි "කොත්" සද ධවජම (=කොඩි) වාචකවේ. මාගධ හෝ සංස්කෘත 'කෙතු' යන්නෙන් තද්භවවිය.

ආයුධ විශෙෂ වාචක 'කුන්ත' ශබ්දයෙන් බිඳුණු 'කොත්' ශබ්දයක්ද ඇත්තේය. එය මෙහි පෙණේ. "ගත්සිය අතින් **කොති** නැනැ මෙර සිදුරුකළ" (පරෙවි සඳෙස)

මයුර සන්දේශයෙහි-

"සව් මිණි **කොත්** කැන් දිලි ගුවන ගැටෙමිනේ" මෙහිවූ 'කොත්' සද ශෘඞ්ගාර්යෙහි වේ. 'ථූපිකා' යන්නෙහි අන්ත්‍යාක්‍ෂරය ලොප්වී වර්ණ විපරිතව පිළිපෙරැළිවී 'පොත්' යයි සිට 'ප' කාරයට 'ක' කාරාදෙශවී 'කොත්' සි සිද්ධවූ බැව් පෙණේ. සමහරු මෙය 'කෙතු' ශබ්දයෙන් තද්භවවී යයි කියති.

**මෙත් මහනෙත් පාමුල තෙරිඳු**-මහා නෙත්‍ර ප්‍රාසාද මූල මෛත්‍රෙය මහා ස්ථවිරයන් හින් ගැනේ. මේ හංස සන්දේශ කර්තෘයි. (මහ) නෙත් පාමුල, විල්ගම් මූල, ගලතුරුමූල ආදි විසින් ව්‍යවහාර වූයේ ඒ ඒ ආයතනයන්හි සංඝ සමූහයාගේ ප්‍රධානයනි. මහා නෙත්‍ර ප්‍රාසාදයෙහි සඟ ගණයේ ප්‍රධාන (මූල) ධූරය මෛත්‍රෙය මහා ස්ථවිරයන් විසින් ධරනලද බව "මෙත් මහනෙත් පාමුල තෙරිඳු" යන්නෙන් මැනවින් අවබොධවේ.

කුශාග්‍ර බුද්ධිමත් පණ්ඩිතවරේණ්‍ය මුන්වහන්සේගේ ශ්‍රී නාමය සම්රණය කරනුවස් 1927 අප්‍රේල් මස 23 වන දින විද්‍යාගමදී සිංහල ශාස්ත්‍රිය සම්මෙලනය මගින් මහොත්සවයක් පවත්වන ලදී.

293. සි නි දු ගැබර පද'රුත් සමග පද ර ස
සු සැ දු ලකල කිවි ලක'රෙක් කොට සක ස
ප සි දු වනරත්න යතිඳුට දෙවන ලෙ ස
මෙබ දු නමින් 1සැලසී තිසර සන්දෙ ස

**අන්වය:**–සිනිදු ගැබර පදරුත් සමග පදරස සුසැදු කිවිලකර එක් කොට සකස ලකල පසිදු වනරත්න යතිඳුට දෙවන ලෙස තිසර සන්දෙස මෙබදු නමින් සැලසී.

**සං:–වනරත්න යතිඳු**–කැරගල පද්මවති පරිවෙණාධිපති ශ්‍රී වනරත්නාභිධාන සංඝරාජ (=මාහිමි) යන් වහන්සේ. ෂඩ් භාෂා පරමෙශ්වර වාගීශ්වර තොටගමුවේ සිරි රහල් හිමියන් සඞ්ඝරාජ පදවියට පත්වූයේ මෙහි දැක්වුණු වනරතන මාහිමියන්ගේ ඇවෑමෙනි.

වනරත්න මාහිමි සඳ............යනාදියෙහි "මාහිමි" සඳින් මෙසේ දැක්වූ බැවින් මුන්වහන්සේ සංඝරාජ බව සුප්‍රතීතය. පෙරකල "මාහිමි" යනු ව්‍යවහෘතවූයේ සඞ්ඝ රජ කෙනෙකුන්හට පමණක් බව පැරැණි වහරින් ඔප්පුවේ. නමුත් අද එය අවිශෙෂයෙන් දූන උගත් හෝ ආරාමාධිපති හෝ වයස් ගතවූ හෝ හිතෛෂීවූ සියලුම භික්ෂූන් වහන්සේ කෙරෙහි බොහෝ සෙයින් යොදනු දක්නා ලැබේ. එය ඉතා අශොභන ව්‍යවහාරයක් බව සැලකිය යුතුය.

අද තත්ත්වයේ හැටියට නිකායක මහා නායක ස්වාමින් වහන්සේ කෙනෙකුන්ට හැර සෙසු භික්ෂූන් වහන්සේට "මා හිමි" යයි අවිශෙෂයෙන් ව්‍යවහාර කිරීම යොග්‍යයයි නොහැඟේ.

පෙරකල උත්තමයන්ටම වහර කළ 'මහත්, මැති' යනාදි ශබ්ද යන්ට මෙකල ලබා තිබෙන දශාව මේ 'මාහිමි' සඳටද ලැබූබව කිය හැකිය.

**තිසර**–සුදු හංසයන්ට නම්.

"**තිසර**, සෙ පතු, (දු) හස්"—රුවන් මල් නිඝණ්ඩු
"තිසර, සෙපත්, හස්, (නම් බල තිසරුන්ට)-පුරාණ නාමාවලි

— ශුභම් —

1. සැලසිණි.

වර්ණනා සහිත

# හංස සන්දේශය

පදාර්ථ ව්‍යාඛ්‍යා

### වර්ණනා සහිත

# හංස සන්දේශය.

---

## පදාර්ථ ව්‍යාඛ්‍යා

1. පුන්සඳ-(ෂොඩශ කලා) පරිපූර්ණ චන්ද්‍රයාට බඳුවූ; පිරිසුදු පහන්-පරිශුද්ධ දෙහප්‍රභා ඇත්තාවූද; පියකරු-(කාමුක ජනයන්ගේ) අභිලාෂ වර්ධනය කරන්නාවූ; පියන්-ප්‍රියාවන් (කාන්තාවන්) ගේ; පිය-ප්‍රිය (සිත්කළු) වූ; පිරි පියයුරු සිරින්-පරිපූර්ණ පයොධරයන්ගේ ශොභාවෙන් හෙවත් විලාසයෙන්; හොබනා-ශොභමාන (උද්දීප්ත) වූද; හසරද සඳ-හංසරාජ චන්ද්‍රය (හංස රාජොත්තමය); (තෝ-යුෂ්මත් තෙම) සැරද-(සර්වොපද්‍රව නිවාරණයෙන්) චිරකාලයක් ජීවත් වෙහිවා.

2. හසරද-හංස රාජය; තොප-යුෂ්මත්හුගේ; තෙපලකින්-වචන මාත්‍රයකින්; ලොවට-සත්ත්ව ලොකයට; සැප-සෞඛ්‍යයෙක්; සැපයෙයි-සම්පාදිත වන්නේය; (යලිත්) තොප-යුෂ්මත්හුගේ; තුඩ තුළට-තුණ්ඩාභ්‍යන්තරය (මුඛය තුළ) ට; කිරිරස-(ජලය හා මිශ්‍ර කොට දෙනු ලැබෙන) ක්ෂීර රසය තෙම; දියසැර-ජලයෙන් පෘථක්ව; වදිය-ප්‍රවිෂ්ට වන්නේය; (එසේම) තොප-යුෂ්මත්හුගේ; පිට-පෘෂ්ඨ දෙශය; පිහිටකර-ප්‍රතිෂ්ඨාස්ථාන කොට; හෙවත් ආධාර යක් කොට; බඹ-බ්‍රහ්මරාජ තෙම; තෙදිය-ජගත්‍රයෙහි; ඇවිදිය-සඤ්චාරය කරන්නේය; (නැවතද) තොප-යුෂ්මත්හුගේ; රුවලත්-රූප ලාඤ්ඡනය ලද්දාවූ; හසත්-ලාඤ්ඡනයද හෙවත් රාජකීය හංස මුද්‍රාව පවා; සත්-ලොකයාහට; සැප-සෞඛ්‍යය; සැපත්කර-සම්ප්‍රාප්තකොට (පමුණුවා); දේ-දානය කරයි. (යලිදු) තොප-යුෂ්මත්හු; උන්-ස්ථිතවූ; වැඹට-ශෛලස්තම්භයට; පිටදී-පෘෂ්ඨ දානය කොට; විදි(චතුර්දිශා වන්ට) විදින ලද්දාවූ; සැර සතර-ශරචතුෂ්ටයය; බිම-භූමියෙහි; හෙන අතර-පතිතවන අතරෙහි; තොප-යුෂ්මත්හු; දිව-ධාවනය කොට; ගෙනඑති-ග්‍රහණය කොට එන්නාහයි; යෙත-(ධීරයෝ) ප්‍රකාශ කරන්නාහ. (නැවතද) තොප-යුෂ්මත්හුගේ නම-හංස යන අභිධානය; ඉදිරිකළ-අභිමුඛ කළාවූ; නමටත්-(පූර්වපදවූ) නාමයටත්; උතුම-උත්තමාර්ථය; යෙති-(ශාස්ත්‍ර විද්වත්හු) ප්‍රකාශ කරති; (එසේම) තොප-යුෂ්මත්හුගේ; කුල පැමිණි-වංශොද්භූතවූ; මහසත්හුද-(ජවන හංසනම්වූ) මහා බොධිසත්ත්වයෝද; හිරු-(ශ්‍රීඝ්‍රතර වෙග ඇති) සූර්යයාද; දිනති-(ස්වගමන් වෙගයෙන්) පරයන්නාහ; (නැව

තද) තොප-යුෂ්මත්හුගේ; සැටි-ආකාරය(පරිපූර්ණ විලාසය); රැගෙන-ග්‍රහණය කොට; සිටි තැනටත්-ස්ථිත ස්ථානයට (පයෝධරයන්ට) ද; රුති අභිලාෂය; කෙරෙති-(කාමුක ජනයෝ) කරන්නාහුය; මිතුර-මිත්‍රය; ඉන්-ඒ හෙතුකොටගෙන; අප සිත-අස්මත්හුන්ගේ චිත්තයෙහි; බැති-අභිලාෂය; තොප වෙත-යුෂ්මත්හු කෙරෙහි; වැඩෙසි-වර්ධනය වේ.

3 මරකතමිණි-මරකත නම්වූ මාණික්‍ය විශෙෂය; මියුරු ලෙස-මධුරාකාරයෙන් හෙවත් මධුරතර පුෂ්ප මධුවක් හා පද්ම මෘණාල සෙයින්; (තොප-යුෂ්මත් හට) ගොදුරුවනකල-ගොචර (ආහාර) වන කල්හි; (යලිත්) පිපි-පුෂ්පිතවූ; පියුම්-පද්මයන්ගේ; නිස-මස්තකයෙහි; ඉඳ-නිෂණ්ණව; පොකුරු මී-පුෂ්කර මධුව (මල් පැනිය); (තොප-යුෂ්මත්හු) බොනකල-පානය කරන කල්හි; (යලිත්) රිවි-සූර්යයා; පසුකර-පශ්චාද්භාගයෙහිලා (පරාජිතකොට ලා); අහස-ආකාශ තලයෙහි; සෙද-ශීඝ්‍රව; ගමන් යනකල-(යට දැක්වුණු පද්‍යයෙහි ප්‍රකාශිත පරිද්දෙන්) ධාවනය කරන කල්හි; මනකල-මනඃකාන්තවූ; මිතුර-මිත්‍රය; තොප-යුෂ්මත්හුගේ; යස-(ජගත් කුහරයෙහි ව්‍යාප්තතර) කීර්තිය; (මම-අස්මත්තෙම); කෙලෙස-කොයිලෙස කින්; පවසම්-ප්‍රකාශ කරම්ද? (ප්‍රකාශකළ නොහැක්කේමය.)

4. උන්ගෙන්-(සුවර්ණ හංස ජාතියට අනන්තර පූර්වජාතියෙහිවූ හංසී දුහිතෲන් සඞ්ඛ්‍යාත) ඔවුන් දෙදෙනා කෙරෙන්; වන-භවිත වෑවූ; අයාපත-අනිෂ්ට ඵලය හෙවත් තමාගේ පියාපත් උදුරා ගැනීමෙන් විසඳුතු අධික දුඃඛය; මෙතින්-කෘපාධ්‍යශය හෙතුකොට ගෙන; නොගෙන-ග්‍රහණය නොකොට (හිතට නොගෙනම); රන් වන්-සුවර්ණ වර්ණවූ; පියාපත-පක්ෂපත්‍රයන්; ගැන-සඞ්ඛ්‍යාකොට හෙවත් මසකින් දෙමසකින් එකක් එකක් බැගින්; ගිනින්-(ස්වීය) දෙහයෙන්; දිදී-දානය කරමින් හෙවත් පතිතකොට කොට; දයා පත-කෘපාන්විතවූ; සිත-චිත්තයෙන් යුක්තව; නිතින්-නිත්‍යයෙන්; සියන්-(පූර්වජන්මයෙහිවූ) ස්වීය බන්ධූන්; රැකියෙහි-රක්ෂාකළේ වෙහිය; (එසේ හෙයින්ම) මෙ තොප-මේ යුෂ්මත්හුගේ; යාපත-සාධු ගුණය; සිතින්-(කිසිවකුගේ) චිත්තයෙන්; සිතන්ටත්-චින්තය කරන්ටද පවා; බැරි-භාරයි. (අශක්‍යයයි සේයි.)

5. මලෙසි-(සෙය්‍යසක නම් බ්‍රහ්මදත්ත රජුගේ අණ ලැබ බෙම නම් වැද්දහු විසින් තබන ලද) උගුලු මලයෙහි; බැඳී-බද්ධව; උන්-ස්ථිතවූ; රජු වෙතම-(හංසයන් අනූදහසකට නායකවූ ධෘත රාෂ්ට්‍ර නම්) හංස රාජයා වෙතම; පෙම්බැඳී-ප්‍රෙමයෙන් බද්ධව; (එහෙයින්ම) මිදී නොගිය-මුක්තව නොගියාවූ; හස-(හංස සෙනාධිපතිවූ සුමුඛ නම්) හංසයා; දැක-දර්ශනය කොට; (සුමුඛ නම් හංසයා

ගේ ධර්මාන්විත අවවාද කථා ශ්‍රවණය කොටයයි සේසි.) වැදි (ඛෙම නම්) ව්‍යාධ තෙම; මලෙන්-උකුලු මලයෙන්; මිදී-(ධෘතරාෂ්ට්‍ර නම් හංස රාජයා) මුක්ත කළේය; එගුණ-තද්ගුණයට; ලැදී-ලෙන්ගතුවූ; බඹදත් රජ-(සෙය්‍යසක නම්) බ්‍රහ්මදත්ත රාජයා; රජෙන්-ස්වීය බාරාණසී රාජ්‍යයෙන්; පිදී-(ධෘතරාෂ්ට්‍ර හංසරාජයාහට) පූජාකළේය. (සම්මාන කළේය); (යලිත්) දහම් රැඳි-ධර්මයෙන් රංජිතවූ; තොප-යුෂ්මත් තෙම; මෙත-(ස්වීය) මෛත්‍රියෙන්; වැතිර-ව්‍යාප්තව හෙළත් ගැවසී ගත්සේක්; පුද-(මධුරාහාරාදි) පූජාවන්; ලදී-(එම රාජයා වෙතින්) ලද්දේය.

## අදහස.

6. මෙලෙසින්-මේ නිර්දිෂ්ටාකාරයෙන්; දියත පරසිදු-ජගද් ව්‍යාප්ත කීර්ති ඇති; ඉටුම්තුරු සඳ-ප්‍රියවූ මිත්‍රොත්තමය; මෙතොප-මේ යුෂ්මත්හු; අහසින් පැමිණි-ආකාශයෙන් ප්‍රාදුර්භූතවූ; විසිතුරු-අලඞ්කාරවූ; සිතුමිණක් ලෙද-චින්තාමාණික්‍ය රත්නයක් පරිද්දෙන්; පිනකින් විලසින්-(පූර්වොපචිත) පුණ්‍යමහිමයකින් මෙන්; මෙසඳ-ඒ තත් කාලයෙහි; ලදුයෙමි-(අස්මිත් තෙම) ලද්දෙමි; සබඳ-මිත්‍රය; එබැවින්-ඒ භාවයෙන්; තොපට-යුෂ්මත්හට; පවසන-(මා විසින්) ප්‍රකාශ කරනු ලැබෙන හෙවත් ප්‍රකාශකළ යුතුවූ; අස්නෙක-සන්දේශයක් ඇත්තේය.

7. ලෝවැඩ අදහසින්-පරාර්ථ සාධනාධ්‍යාශයෙන්; අදරව-චිත්තාදර යුක්තව; අසාගෙන-ශ්‍රවණය කොට ගෙන; හදතුළ-(යුෂ්මත්හුගේ) හෘදයාභ්‍යන්තරයෙහි; තබා-ස්ථාපිත කොට; ලද-ලද්දාවූ; නිදනක් ලෙසින්-නිධානයක් පරිද්දෙන්; රැක-රක්ෂණය කොට; මඳලස නොවී-(ශීතාදි කිසිත් උපද්‍රවයකින්) මන්දාලස්‍ය යුක්ත නොව; මෙපුරෙන්-මේ පුරවරයෙන්; ගොස්-ප්‍රයාණය කොට; එ ද-තත් සන්දේශයද; තොප ඊසින්-යුෂ්මත්හු විසින්; තොසිනී-සන්තුෂ්ටියෙන් යුක්තව; අප බසින්-අස්මතුන්ගේ වචනයෙන්; පැමැසිය යුතුවෙයි-ප්‍රකාශකළ යුත්තේ වේ.

## කාව්‍ය නායක වර්ණනා.

8 මුනි-මුනිරාජයන් විසින්; මාරබල-මාරසේනාව; දිනූ-ජය ග්‍රහණය කරනු ලැබූ; බිම-භූමියෙහිවූ; මහිම ඇති-ආනුභාව ඇත්තාවූද; (ජයශ්‍රී මහා බෝධි මණ්ඩස්ථානයෙහි මෙන් සත්ත්වයන්ගේ ක්ලෙශ ශත්‍රුමර්දනයෙහි සාමර්ථ්‍යය ඇති ස්තූප-ප්‍රතිමාලය-බෝධි ද්‍රුමෙන්ද්‍ර යනාදි පූජ්‍ය වස්තූන්ගෙන් උපලක්ෂිතවූ යනුය.) සත-(පුණ්‍යාර්ජිවූ) සත්ත්වයන්ගේ; පින්-පුණ්‍යය පිළිබඳව; සාරපල-ඵල

සමෘද්ධිමද්භාවය; වැනූ තැනක් වැනි-වර්ණිතස්ථානයක් බඳුවූ; හැනූ-සාදන ලද්දාවූ; (වාපිත-රොපිතවූ) සාරපල-සමෘද්ධවූ ශස්‍යනාරි කෙලාදි ඵල සම්පත් ඇත්තාවූ; නොයෙක්-බහුතරවූ; කෙත්වත්-ක්ෂෙත්‍ර වස්තූන්ගෙන්; සරු-සාරවූ (සශ්‍රිකවූ)ද; කැරගල-කැරගල නම් ප්‍රදෙශයෙහි; සැදි-සජ්ජිතවූද; පසිඳු-ජගත් ප්‍රසිද්ධවූද; වෙහෙ රෙක්-විහාරයක් තෙම; (ඇත-ඇත්තේය;) සබඳ-(මාගේ මිත්‍රය;) දනු-(එය) ජානනය කරන්.

9. පුල්-ඵුල්ලව; සැදි-සජ්ජිතවූ; කමල් විල්-පද්ම තඩාගයන් ගෙන්ද; මල්වතු-පුෂ්පාරාමයන් ගෙන්ද; දිමුතු-දීප්තිමත්වූ; එ වෙ හෙර-තද් විහාරයෙහි; දෙලෝවැඩ-උභය ලොකාභිවෘද්ධිය; දක දක-නිරීක්ෂණය කොට කොට; අමා ලෙසින්-අමෘතාකාරයෙන්; පව සන-ප්‍රකාශ කරනු ලැබෙන; තමා බසින්-ස්වීය වචනය කරණ කොටගෙන; ලක-ශ්‍රී ලඞ්කාව; එක මිඟුල්ගෙයසේ කළ-එකම මඞ්ගල ගෘහයක්සේ කළාවූද; සතරෙහි-ශාස්ත්‍රයෙහි; පෙරුදුරුවර-පූර්වාචාර්යවරයන්; නුදුටු-දර්ශනය නොකළාවූ; ගැඹුරුතැන්-ගම්භීර ස්ථානයන් හෙවත් ග්‍රන්ථිස්ථානයන්; දුටු-දර්ශනය කළාවූද; ඇසූ සහන-ප්‍රතිපෘච්ඡා කරන සංඝයාට; යලිටීකා කරනලෙස-අනුටීකා කරන පරිද්දෙන්; අසන තැන්-ප්‍රතිපෘච්ඡිතස්ථානයන්; සැකතැන්-සංකිත ස්ථානයන්; මුලින් පිස-මූලොත්මූලනය කොට; දෙසූ-දෙශනා කළාවූද; (ප්‍රති පෘච්ඡනය කරන ස්ථානයන් නිඃශංකිතවන සේ අනුටීකාවක් පරිද්දෙන් සවිස්තරව කියාදෙන්නාවූ යනුයි.) නිති-නිරන්තරයෙන්; වන-විනය ලක්ෂණවූ; රත්න රුවනින්-ශ්‍රෙෂ්ඨවූ රත්නාභරණයෙන් යුක්තවූ; සඟරුවන් ඇති-සංඝරත්නය ඇත්තාවූද හෙවත් සංඝවූද; (සංඝ නායකවූ යනුයි.) නිති-අනවරතයෙන්; වනරත්න-විනය ලක්ෂණ රත්නයන්ගේ; දිදුලෙන්-ප්‍රකාශ දීප්තියෙන්; මොක්-මොක්ෂ (නැමැති මාර්ග)ය; මඟන-නිරීක්ෂණයෙහිලා; තැති-ව්‍යායාම ඇත්තාවූද; දෙව්රජකුල-දිව්‍යරාජ වර්ගයන්; නිති-නිත්‍ය යෙන්; රැකි-රක්ෂාකොට; පැවැති-ප්‍රවෘත්තවූද; (පරිත්‍රාණ ධර්ම ගණ සජ්ඣායනය කිරීමෙන් දෙවියන් නිතර ප්‍රසාදයට පමුණුවන්නාවූ යනුයි.) (එහෙයින්ම) රත්නවන-චින්තාමාණික්‍ය රත්නයක් බඳුවූද; වනරත්න-වනරත්නාභිධාන; මාහිමි හිමිසඳ-සංඝරාජ මහා ස්ථවිර පාදයන් වහන්සේ; නිති-නිරන්තරයෙන්; (එ වෙහෙර-තද් විහාරවර යෙහි) පවැති-වාසය කරණ සේක.

10. ලොවැති-ලොකයෙහි විද්‍යමානවූ; නොමින්-ප්‍රමාණ රහිතවූ; සිරි සැපතින්-ශ්‍රී සම්පත්තියෙන්; පිරි-පූර්ණවූ; සාල-ගෘහයක් බඳුවූද; කැමැති ලෙසින්-(යාචකයන්ගේ) අභිප්‍රාය පරිද්දෙන්; දෙන-දානය කරන්නාවූ; තිළිණෙන්ත්‍යාග සම්පත්තිය හෙතු කොටගෙන; සුරසාල-සුරද්‍රුමයක් බඳුවූද; දොසින්-(ස්ලිෂ්ම) දොෂයෙන්; නැවැති-නිවෘත්ත

වූ; (අති නිමීලවූ යනුයි.) සුවිසාල-අති මහත්වූ; යසසින්-කීර්තියෙන්; දිසි-දෘශ්‍යමානවූද; එ යතිසඳුන්-එම ශ්‍රී වනරතන සංඝරාජ මහා ස්ථවිරපාදයන්; දැක-දර්ශනය කොට හෙවත් උන්වහන්සේකරා එලඹ; මෙහෙසුන්-ඒ මේ සන්දේශය; පවසාල-ප්‍රකාශකළ මැන.

A මිතුරු තුම හස්න-මිත්‍රොත්තම හංසරාජය; මුනිසස්න හිමි-සම්බුද්ධ ශාසනයට නායකවූ; එහිමිහට-ඒ සංඝරාජ මහා ස්වාමීන්ට; කියන-සැලකරන්නාවූ; සුබහස්න-මනොහර සන්දේශය; මිතු කියම්-පසුව කථනය කරන්නෙමි; පියදස්න-ප්‍රිය දර්ශනීයවූ; තොප-යුෂ්මත්හුගේ; මඟය පිළිවිස්න-ගමන් මාර්ගය විචාරන්නාවූ; දන-ජනයා; විස්මවන ලෙසට-විස්මිතවන පරිද්දෙන්; මෙම පුරෙහි-එතත් පුරවර යෙහි; පිරිඉසුරුසර-පරිපූර්ණවූ ඓශ්වර්ය සාරය; වනන-වර්ණනා කරන්නාවූ; මාතෙපුල්-මාගේ ආලාප නැමැති; හෙවත් අලඞ්කාර යුක්ත වචන නැමැති; මිණිකොඬොල්-මණිමය කුණ්ඩලාභරණයෙන්; තා සවන්-යුෂ්මත්හුගේ ශ්‍රවණ යුගලය; සද-සජ්ජිත කරන්.

## ජයවර්ධන පුර වර්ණනා.

11. සිරිමත්-ශ්‍රී සමෘද්ධවූ; දන-ජනයාගෙන් හා; සැපතින්-සෞඛ්‍යාතිශයයෙන්; අලකපුර-අලකමන්දා නම් (වෛශ්‍රවණයාගේ) පුරයට; සරි-සදෘශවූද; නොයෙක්වර-අනෙක වාරයෙහි; රුපු මිද්දන කර-ශත්‍රු මර්දනයකොට; ජයලත්-ජයග්‍රහණය කළාවූ; බලවත්-බල සම්පන්නවූ; (පරාක්‍රමාන්විතවූ) දන-ජනයන් හෙවත් රාජභටයන්; සතුරු සැකහැර-ශත්‍රුභය නිවාරණය කොට; රදනා-වාසයකරනු ලබන්නාවූද; මෙය-මේ නගරය තෙම; මෙලක තුර-මේ ශ්‍රී ලංකා භ්‍යන්තරයෙහි; ජයවද්දන පුරනම්-ජයවර්ධන නම්වූ පුරය වන්නේය.

12. වෙණු-ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා; මෙරමත-මෙරුමන්ථය; ගෙන-ග්‍රහණය කොට; කිරිසයුර-ක්ෂීර සාගරය; අලළන-ආලොඩනය කරන කල්හි; වෙරලත-වෙලාන්තයෙහි; වැද-ඝට්ටිතව; සිටි-ස්ථිතවූ; තුඟු-උත්තුඞ්ගවූ; දියකඳ අයුර-ජලස්කන්ධයාගේ ආකාරයෙන්; පිළිමිණි පවුර-ස්ඵටික මාණික්‍යමය ප්‍රාකාරය තෙම; පිරියත-(පුරය) හාත්පස්හි; සිට-ස්ථිතව; බබලයි-භ්‍රාජමාන වෙයි; (එහෙයින්) සිරිවත-ශ්‍රී මුඛය; හෙවත් ශොභායුක්ත වක්ත්‍රයක් ඇති මිත්‍රය; මෙපුර-මේ ජයවර්ධන පුරයට; සරිවන-සදෘශවන්නාවූ; පුරයෙක්-(අන්‍ය) පුරයෙක් තෙම; කවර-කවරේද?

13. මෙපුර-මේ නගරයට; සිරිසඳ-ශ්‍රී දෙවිය; වඩනා-ප්‍රවෙශය කරන්නාවූ; මිඟුලට-මඞ්ගලය පිණිස; අතුල-ආස්තරණය කරනලද; නිකසල-පවිත්‍රවූ; සොඳුරු-ශොභනවූ; පියවිළි ලෙසිනි-පාදපට ව්‍යාජයෙන්; මනකඳ-මනොහරවූද; පියනද-ප්‍රියජනක නාද ඇති; තිසර වැල-හංසාවලීන්ගේ හා; බිඟුරැල-භෘංගාවලීන්ගේ; කෙළි-ක්‍රීඩා

යෙන්; වතළ-ව්‍යක්තවූද; පිපි-විකසිතවූ; පඬෙරින්-පුණ්ඩරීකයන් ගෙන්; සැදි-සඤ්ජාතවූද; පිරි-(ජල) පරිඛා තොමෝ; හැමසඳ-නිරන්තරයෙන්; දිලෙයි-ජ්වලමානවෙයි.

14. (මෙපුර-මේ ජයවඩ්ඪන පුරයෙහි); සිරිසර-ශ්‍රී සාරයෙන්; සපිරි-සම්පූර්ණවූ; සිරිපැහැ-අනූන කාන්ති ඇත්තාවූ; පහපෙල-ප්‍රාසාද පඞ්ක්තීන්ගේ; මුදුන-මස්තකයෙහි; ගනඳුර-ඝනාන්ධකාරය; දුරැර-දූරීභූතකොට; නිති-නිරන්තරයෙන්; දසදිගු-දශදිශාවන්; එකෙලිකළ-ඒකාලෝක කළාවූ; තුඟුතර-අත්‍යුච්චවූ; සිඟුපෙල-ශෘඞ්ගපඞ්ක්තීන්ගේ; අග-අග්‍රස්ථානයෙහි; ලග-ලග්නවූ; සඳරිවිමඬල; චන්ද්‍ර සූර්‍යමණ්ඩලද්වය; දුලතර-අත්‍යන්තයෙන් ජ්වලමානවූ රශ්මි ඇති; රිදී රන් හිරවරණ-රජත සුවර්ණච්ඡත්‍රද්වයක් හා; තුල-සදෘශයි;

15. අනත-අනන්තවූ; පිරි-පරිපූර්ණවූ; සැපතින්-ඓශ්වර්‍ය සම්පත්තිය කරණකොටගෙන; බරවෙමින්-බර ඇත්තේ වෙමින්; අනත-අනන්ත නම් නාගරාජයාගේ; පෙණ මඬුලුපෙල-පෙණ මණ්ඩල පඞ්ක්තිය; එකවර-එක පහර(ම); මැඩෙන-මර්දිත වන කල්හි; නෙවත් හම්නවන කල්හි; මහත-මහත්වූ; ගජන්-හස්තීන් ගේ; කන්තල පවනින්-කර්ණතාල ප්‍රහාර මාරුත (වේග) යෙන් පැහැර-ප්‍රහාර දානය කරන ලදුව; වියත-නභස්ථලයෙහි; වැනෙන-චලමානවූ; දදතින්-ධ්වජලක්ෂණ හස්තයන් කරණකොටගෙන; මෙපුර-මේ ජයවඩ්ඪන පුරයතෙම; හැම්මෙයි-අවලම්බිත වෙති.

16. (මෙපුර-මේ පුරයෙහි) රත්තොරණ-රත්නමාණික්‍ය තොරණ පඞ්ක්තිය; ගනඳුරු-ඝනාන්ධකාරය; බිඳ-භග්නකොට; එලිකර තත්-ආලෝක කරන්නාහු නමුදු; මිණිතොරණ-මාණික්‍යමය තොරණ පඞ්ක්තිය; ලද-තරුණවූ; අබිසරුන්-අභිසාරිකාවන්ගේ; බිය-(ආලෝකස්ථානයක් වීමෙන්වූ) භීතිය; දුරලයි-දූරීභූත කරයි; හය කුර පහරින්-අශ්වයන්ගේ ඛුර ප්‍රහාරය කරණකොටගෙන; දෙරණ-ධරණීතලයෙහි; බිඳගිය තැන්-භග්න ස්ථානයන්; විරණ-හස්තීහු; මද පොද-මද ජල බින්දූන්; ඉස-විසීර්ණකොට; සමතලකොට-සම භූමිභාග කොට; යෙති-ප්‍රයාණය කෙරෙති.

17. සැඬකර-සූර්‍යතෙම; හයසෙනඟ-අශ්ව සේනාඞ්ගය විසින්; චුනුවු-විභිදුවනලද; කුරරෙණු-ඛුර ඝර්ෂණයෙන් ජනිත දුහුවිල්ල; වැද-ප්‍රවිෂ්ටව; තිදස-දිව්‍යපුරය; කිලුටු වෙතියේ-ක්ලිෂ්ටවෙතියේ; (නොහොත්) කරපහස-රශ්මි ස්පර්ශය; බැස (පෘථිවි තලයට) අවතීර්ණව; දැඹිටු-ධර්ෂිෂ්ටවූ; සතට-(නාගරික) සත්ත්වසමූහයට; නොවදින ලෙසටයේ-සම්ප්‍රාප්ත නොවන ලෙසටයේ; (සිතා) පුර අහස-(මේ ජයවඩ්ඪන) පුරයෙහිවූ නභස්තලයෙහි; නොපවු-අමන්දවූ; වලාකුළු-වලාහක කූටයන්; සිටුවයි-ස්ථාපනය කරයි.

18. මිණිබඳ-නීලමාණික්‍යයෙන් බන්ධවූ; හෙවත් නිල් මැණික් ඔබ්බා කරන ලද්දාවූ; සඳලුවල-චන්ද්‍ර ශාලාවන්හි; පිළිබිඹුව-ප්‍රතිබිම්බිතව; දිසි-දෘශ්‍යමානවූ; සඳ-චන්ද්‍රබිම්බය තෙම; (කුමක් වැනිද?) මෙපුර-මේ ජයවර්ධන පුරයෙහි; ලඳ-තරුණඞ්ගනාවෝ; වතසඳ-වක්ත්‍ර ලක්ෂණ චන්ද්‍රයා පිළිබඳවූ; සිරින්-ශොභාවිලාසය කරණකොටගෙන; තම-තමන්; දිනුවයි-පරාජිත කළාහුයයි; (කුපිතව) නුබමැද-නභො මධ්‍යයෙහි; සිසර හැර-සඤ්චාරය වර්ජිතකොට; නොමඳ-බොහෝවූ; තුරුසෙන්-තාරකා සේනාව; ගෙන-ග්‍රහණයකොට; වැද-ප්‍රවිෂ්ටව; යුද අදහසින්-යුද්ධාභිලාෂයෙන්; මෙපුර-මේ ජයවර්ධන පුරයෙහි; සිටිනාවැනි-සම්භාවිය කරයි හඟිමි.

19. (මෙපුර-මේ ජයවර්ධන පුරයෙහිවූ) රුවන් පහ-රත්නමය ප්‍රාසාදයන්හි; කවුළුවෙන්-කවාටාවලියෙන්; පෙණෙන-දෘශ්‍යමාන වන්නාවූ; පුරඟන-පුර වනිතාවන්ගේ; මුවින් සඳද-වක්ත්‍ර චන්ද්‍රයාද; ගුවන-නභස්ථලයෙහි; දිසි-දෘශ්‍යමානවූ; සඳමඬලද-(ස්වාභාවික) චන්ද්‍රමණ්ඩලයද; (යන) දෙකම-(මේ) උභය වස්තූන්ම; එකතැන-(ආකාශ සඞ්ඛ්‍යාත) එක ස්ථානයෙහිම; දැකුමෙන්-දර්ශනය කිරීම හේතුකොටගෙන; ලෙවන්-ලොකවාසී ජනයාගේ; සිත-චිත්තය තෙම; කියන-(කවීන් විසින්) කියනු ලබන්නාවූ; උවමට-චන්ද්‍රොපමාවට; (හෙවත් පුරස්ත්‍රීන්ගේ ශොභාසම්පන්න මුඛයට චන්ද්‍රයා සදෘශය යන උපමාදර්ශනයට;) සතුටුවෙයි-සන්තුෂ්ටවන්නේයි.

20. නිල්මිණි-නීලමාණික්‍යමයවූ; කැරැල්ලෙන්-ශෘඞ්ග පඞ්ක්තියෙන්; නැඟි-(හාත්පස) උද්ගතවූ; රැස්-රශ්මි කදම්බයතෙම; නුබ-නභස්ථලය; වැසිය-ඡාදිත කළේය; ලෙල-ලලිතවූ; රන් කොඩොල් ලෙන්-ස්වර්ණ වර්ණ ධවජ පඞ්ක්තින් කෙරෙන් (නිෂ්ක්‍රාන්තවූ); පැහැ විදුලි-විද්‍යුද් ආකාර ප්‍රභාතොමෝ; ගැවසිය-ගහණවිය; ගජන්-හස්තීන්ගේ; අත්-ශුණ්ඩ ලක්ෂණවූ; පිහිල්ලෙන්-ප්‍රණාලිකායෙන්; හෙන-පතිතවන්නාවූ; දියහැලි-ජල නිර්ඣරතෙම; වැසිය-වර්ෂණ විය; මෙ සියල්ලෙන්-මේ සියලු අලඞ්කාරයන් කරණකොටගෙන; පුරවැසිය-පුරවාසි ජනයා; නිති-නිත්‍යයෙන්; තුටුවන-සන්තුෂ්ට වන්නේය.

21. අප-අස්මතුන්ගේ; සර-නාදය; ගත්-ග්‍රහණය කළාවූ; වලලුත්; වලයතුත්; තමන්දහා-ස්වීය ජඞ්ඝාවන්හි; ලා-බහාගෙන; (පිලන්ධනය කොටගෙන); (යලිත්) අප-අස්මතුන්ගේ; සර-සඤ්චාර (විලාස)ය; ගෙන-ග්‍රහණය කොට; පුරමඟා-පුර (වීථි) මාර්ගයෙහි; නිතොර-තොරනොව; සරමින්-සඤ්චාරය කරමින්; (තවද) අප-අස්මතුන්ගේ; සර-ස්වරූපය; හෙවත් පරිපූර්ණ දෙහ විලාසය; ගත්-ග්‍රහණය කළාවූ; තැනවන්-ස්ථානයටත් (ශරීරාවයවයටත්-)පයොධර

යන්ටයයි සේයි) බැඳ-බන්ධනය කොට (ගෙන); නිඟා-නිග්‍රහය; කෙරෙති-කෙරෙත්නාහයි; (කියා) හස හන-හංසධෙනුහු; පුරඟනන්-පුරාඞ්ගනාවන්; මනා-නිරීක්‍ෂණයකොට; අපසර වෙති-නිශ්ශබ්දවෙති. හෙවත් නාදය හා ගමනද හැරදමා දොම්නස්ව සිටිත්.

22. (අඟන-පුරාංගනාවෝ;) නෙතින්-(ස්වීය) නෙත්‍රය හෙතු කොටගෙන; ඉඳුවර-ඉන්දීවරයන්ගේද; වතින්-වක්ත්‍ර හෙතුකොට ගෙන; ඉඳු-චන්ද්‍රයාගේද; සිරි-ශොභා විලාසය; දුරුකෙරෙති-බැහැර ලත්; (එසේම) ගතින්-දෙහශ්‍රිය හෙතුකොටගෙන; ඉඳුපුර-ඉන්ද්‍රපුර යෙහිවූ; සුරඟන-සුරාඞ්ගනාවන්ගේ; රුව-රූප සෞන්දර්යය; පරද වති-පරාජිත කෙරෙත්; (යලිත්) සුසිනිඳු-සනිගධතරවූ හෙවත් අති මෘදුවූ; තුනුපහසින්-දෙහ ස්පර්ශය හෙතුකොටගෙන; සත-(කාමුක) සත්ත්වයා; ගැතිකෙරෙති-ගැත්තවුන් කරත්; (එසේ හෙයින්) පරසිඳු-ප්‍රසිද්ධවූ; මෙපුර-මේ පුරයෙහිවූ; අඟන-අඞ්ගනාවන්ගේ; රුව-රූප ශ්‍රිය; කවුරු-කතර සත්ත්වකෙනෙක්; පවසති-ප්‍රකාශකෙරෙත්ද?

23. නිති-නිරන්තරයෙන්; දසනුදෙස-දිශානුදිශාවන්හි; විහි දෙන-විකීර්ණවන්නාවූ; මනහර-මනොහරවූ; සුවඳ-සුගන්ධයන් ඇත් තාවූ; හැමවර-සැමකල්හි; සුසැදි-(නානා ද්‍රව්‍යයන්ගෙන්) සජ්ජිතවූ; විසිතුරු-විචිත්‍රවූ; සල්පිල් සහස-ආපණ ශාලා සහස්‍රයෙන්ද; ගී නැටුම් රස-ගීත නෘත්‍ය රසය; විඳ-විඳනයකොට; උන්-උපවිෂ්ටවූ; පියකරු-(දුටුවන්ට) ප්‍රිය ජනකවූ; ලියන්-කාන්තාවන්ගෙන්ද; වේ දෙපස-වීථි උභයපාර්ශ්වයෙහිවූ; බිහිදොර-බහිර්ද්වාරයන්; හෙවත් තොරණයන්; සියෙන් සිය-ශතයෙන් ශතයෙන්ද; (මෙ)පුර-මේ ජය වර්ධන පුරයතෙම; සැදි-ජ්ජිතවී.

24. පිළිත්පිළ-වෙදිකාවක් වෙදිකාවක් පාසා; සැදුණු-සජ්ජිතවූ; කිරණ-කාන්ති කරණකොටගෙන; දිදුලිය-ප්‍රකර්ෂයෙන් ජ්වලමානවූ; මිණි-(නීලාදි) මාණික්‍යයන් ඇත්තාවූද; පලින්පල-තන්හි තන්හි; අඹර-ආකාශයෙහි; පවන්-මාරුත (වෙග)යෙන්; අඹල-ආවනතවූ (කම්පිතවූ); කෙහෙලිය-ධ්වජයන් ඇත්තාවූද; කුළින්කුළ-(ප්‍රාසාද) කූටයක් කූටයක් පාසා; රුවන්රැස්-(රත්න) මාණික්‍ය කාන්තිය; විහිදි-විකීර්ණවන්නාවූ; කැරලිය-ශෘඞ්ගයන් ඇත්තාවූද; අඳුරු-අන්ධ කාරය; දුරලිය-විධ්වංශනය කොට; පෙළින් පෙළ-පඞ්ක්ති පඞ්ක්ති විසින්; උදුලිය-උජ්ජලිතවූද; පහ ප්‍රාසාද පඞ්ක්තිහුය:– 26 වන කව හා සම්බන්ධයි.

25. දොරින් දොර-ද්වාරයක් පාසා; සිඳුගොස රහය-සමුද්‍රඝොෂා කාරවූ; පසඟතුරු-පඤ්චාංග තූර්යයෝය; සරින් සර-නාදයෙන් නාද යට; නඟන-කියනු ලබන්නාවූ; මනරඟය-සිත්කලුවූ; ලියගි-ලයාන්

චිත ගීතයෝය; සරින් කර-හස්තයක් හස්තයක් පාසා; ලෙල-ලලිත (කර)වූ; අවි-ආයුධයන්ගේ; රැස්විදෙන-රශ්මි ව්‍යාප්තවන්නාවූ; තර ඝය-ක්‍රීඩා යුධ ඇත්තාවූ; උරින් උර-උරයෙන් උරය; පැහැර-ඝට්ටිතව; නිති-නිත්‍යයෙන්; සරණ-සංචාරණය කරන්නාවූ; සෙනඟය-සේනාංගයෝය.

26. අවට-(පුරය) හාත්පස්හි; උදුලිය-උජ්වලිතවූ; උයන්වතු-උද්‍යාන වාස්තු හා; කමල්විල්-පද්ම තඩාගයෝය; රුවින්-රූපශ්‍රීයෙන්; බැබලි-භ්‍රාජිතවූ; සුරඟන අයුරු-සුරාඞ්ගනාවන් සදෘශවූ; පියලිය-ප්‍රිය කාන්තාවෝය; (යන) ලෙවන්-ලෝකවාසීන්ගේ; සිතු-චිත්තය; සතුටුවන-සන්තුෂ්ට වන්නාවූ; සව් සිරි-සකලෛශ්වර්‍ය්‍යය; ඉසිලිය-උද්වහනය කළාවූ; මෙපුර-මේ ජයවර්ධන පුරය; මෙයින්-මේ සම්පත්තිය-සමෘද්ධිය හේතුකොටගෙන; පුරඳුරුපුර-ශක්‍ර පුරයෙහිවූ; සිරි-ශොභාව; ඉසිලිය-උද්වහනය කළේය.

## රාජ වර්ණනා.

27. මුලුලොව-සකල ලොකයෙහි; පිරි-පරිපූර්ණවූ; හෙවත් අනූනවූ; සැපත්-සම්පත්තිය; සැපත් තැන්මෙන්-රැස්වූ ස්ථානයක් සේ; තෙවුනා-විරාජිතවූද; මනඟදනා-චිත්තාකර්ෂණය කරන්නාවූද; සිරිසර-ශ්‍රී දේවිය විසින්; රඳන-රඤ්ජමාන වන්නාවූද; මෙපුරේ-මේ ජයවර්ධන පුරයෙහි;

28 යසහර-(සවිය) යශො (මුක්තා)හාරය; සතර දිගත-චතුර් දිශාන්තයෙහි; ලම්බා-ලම්බනය කොට; හෙවත් ලම්බනය කිරීමෙහි ලා; පුරුදු-පරිචිතවූද; ළතර-සතබ්ධ චිත්තාන්විතවූ; රුපුන්-ශත්‍රූන්; ජයගෙන-ජයග්‍රහණයකොට; (ජයග්‍රහණය කිරීමෙන්) විරුදු-වෛරින්; පුම්බා-පිඹහැරියාවූද; දෙරණම්බා-ධරණී කාන්තා ලක්ෂණවූ; සිරිඳු-ලක්ෂ්මී කාන්තාව; නොහැර-වර්ජිත නොකොට(ම) වෙතමකර-සමීපස්ථවූවාමකොට; සිරිපැරකුම්බා නිරිඳු-ශ්‍රී පරාක්‍රම බාහු නම් නරෙන්ද්‍රතෙම; නිතොර-නිරන්තරයෙන්; වැජඹි-විජෘම්භමානවේ.

B තවද-යලිදු: ආඛණ්ඩල-ඉන්ද්‍රයාට බඳුවූ; අඛණ්ඩ-නොකඩවූ; ගුණෂණ්ඩ-ගුණසකන්ධයෙන්; මණ්ඩිත-සැරසුනාවූද; පණ්ඩිත ජන-පණ්ඩිත-සමූහ නැමැති; පුණ්ඩරීක-(ශ්වෙත) පද්මයන්ගේ ප්‍රබොධයට; මාර්තණ්ඩ-සූර්‍ය සදෘශවූද; මාර්තණ්ඩ කුලොද්භූත-සූර්‍ය වංශ සම්භවවූද; භූමණ්ඩලෙශ්වර-පෘථිවියට නායකවූද; පරාක්‍රම බාහු නරෙශ්වරයාගේ-පරාක්‍රමබාහු නම් රජ්ජුරුවන් පිළිබඳවූ;

මෙද-වක්ෂ්‍යමාණ වත්තේත්; එක් වර්ණනා භාෂණයෙක-එක් ගුණ කීර්තනයෙකි. එද-තද්ගුණ කීර්තනයද; තා-ආයුෂ්මත්හුගේ; කණ් භූෂණයකර-කර්ණයන්ට කුණ්ඩලාභරණයක් කරව හෙවත් සාව ධානව අසා සිත්හි ධාරණය කරන්.

29. (මෙනිරිඳු-මේ පරාක්‍රමබාහු රජතෙම); නිතියෙන්-නිත්‍යයෙන්; මුනිපුදයට-බුද්ධපූජා කරනු පිණිස; සිත්-(ස්විය) චිත්තය; නමාලිය-යොමුකළේය; සත්ගුණයෙන්-(දයාදාක්ෂිණ්‍යාදි) ස්වාමිගුණ කරණකොටගෙන; සත-සත්ත්වයන්ගේ; සිත-චිත්තයෙහි; තොස-සන්තෝෂ ලක්ෂණවූ; අමා-අමෘත (රස)ය; ලීය-ප්‍රක්ෂිප්ත කළේය; විකුමෙන්-වික්‍රමයෙන්; ගත්-ගෘහීතවූ; (ජීවග්‍රහණයෙන් ගන්නා ලද්දාවූ) රුපු නිරිඳුන්-ශත්‍රු රාජයන්; දමාලිය-දමිත කළේය; මෙත් සිලිලෙන්-මෛත්‍රී ලක්ෂණ ජලයෙන්; මුලුතෙදියත-සමස්ත ජගත්‍රය; තෙමාලිය-ආර්ද්‍ර කළේය.

30. මනුරද සිරිත්-මනුරාජ සම්මත සච්චාරිත්‍රයන්; සත-සත්ත්වයන්ගේ, සිත සිත-චිත්තයක් චිත්තයක් පාසා; ඇඳලීය-ලෙඛිත (ප්‍රවෙශ)කළේය; මනනඳ-මනොඥවූ; රුසිරු-රූපශ්‍රී නැමැති; අඳන-අඤ්ජනය; ලිය-කාන්තාවන්ගේ; ඇස ඇස-නෙත්‍රයක් නෙත්‍රයක් පාසා, ලීය-ආලිප්ත කළේය; නැණින්-(දයා පූර්වක) ප්‍රඥාවෙන්; පිරිසිඳ-පරිච්ඡින්නකොට; සත්වග - ප්‍රජාසමූහයාගේ; දුක්-(විපත්ති මූලක) දුඃඛයන්; දුරලීය-දූරීභූත කළේය; (එසේහෙයින්) මෙරද-මේ පරාක්‍රමබාහු රජතෙම; ඇමසඳ-හැමකල්හි; බෝසත් සිරි-බොධිසත්ත්ව විලාශය; ඉසිලීය-ධාරණය කළේය.

31. රුපු සයුරට-ශත්‍රු ලක්ෂණ සමුද්‍ර (මථන)යට; කග-ඛඩ්ගය; මෙරමතකොට-මෙරුමථන කොට; තැකිය-කල්පනා කළේය; තද-ස්තබ්ධවූ; යුදයට-සංග්‍රාම භූමියට; වැද-ප්‍රවිෂ්ටව; මඳකුත්-ස්තොකමාත්‍රයකුදු; නොවැළකිය-ප්‍රතිහත නොවීය; තමවිකුමට-ස්විය වික්‍රමයට; සරි-සදෘශවූ; නිරිඳකු-අන්‍ය නරෙන්ද්‍රයකු; නොසැලකිය-සංලක්ෂණය නොකළේය; නිති-නිරන්තරයෙන්; මුලුරට-සකල රාෂ්ට්‍රයෙහිවූ; සත-සත්ත්වයන්; සියැසක්ලෙස-ස්විය චක්ෂුර් විලාශයෙන්; රැකිය-රක්ෂිත කළේය.

32. කලෙක-දීර්ඝකාලයක් මුළුල්ල; නොපමණ-ප්‍රමාණ රහිතවූ; ගිමන්-ග්‍රීෂ්මය කරණකොට ගෙන; ඔදසුන්-ඕජස් ශූන්‍යවූ; තැන තට-ස්ථානයකට; එදෙරණ තෙමා-තද්ධරණී තලය සික්තකොට; සපැමිණී-සම්ප්‍රාප්තවූ; මේ කුළෙක මෙන්-මේඝ කූටයක් පරිද්දෙන්; පෙර-පූර්වයෙහි; කුරුපණ රජුන්-කෘපණ රාජයන්; (හෙවත් කෘර රාජයන් විසින්) රජකළ-රාජ්‍යකරනු ලැබූ; මෙසිරිලක-මේ

ශ්‍රී ලඞ්කාද්වීපයට; සපැමිණ-ප්‍රාදුර්භූතව; ගුණෙන්-ගුණයෙන්; වැජඹෙන-විජෘම්භමානවූ; මොහු-මේ පරාක්‍රමබාහු රජතෙම; බෝසතෙක-බොධිසත්ත්වයෙකි.

33. පුන්සඳවන්-පූර්ණචන්ද්‍රාකාරවූ; වතසිරි-වක්ත්‍ර ශොභාව; ලොවට-ලොකයාට; පෙන්වා-දර්ශනය කරවා; රන්කඳ මෙන්-සුවර්ණ ස්කන්ධයක් සේ; බබලන-භ්‍රාජමානවූ; මෙ නිරිඳුන්-මේ පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාණන්; දුට-දර්ශනය කළහොත්; දුන්-මේ වර්තමාන කාලයෙහි; මද රජුගේ-කාමදෙවයාගේ; සිතට-චිත්තයට; මන්මද-මානමාද්‍යය; වෙසි-වන්නේය; ඉන්-එසේහෙයින්; ඔහුට-ඒ කාම දෙවයාට; මන්මදයසි යනු-මන්මදයසි කථනය කිරීමතෙම; යුතු වෙයි-යොග්‍යවේ.

34. සුරඹිණි-දෙව මාණවිකාවයද; (විනතාමාණවිකාවයද) සුරතුරුදු-කල්පවෘක්ෂයද යන වස්තූහු; මොහු-මේ රජයා; දන්දෙතු-දානය කරන නියාව; දැක-අවලොකනයකොට; දන්දෙන සැටි-දාන වස්තු පරිත්‍යාගකරන ආකාරය; මෙබඳු-මේ ප්‍රකාරයයි; අපගෙන්-අස්මතුන්ගෙන්; දැනගෙන-ජානනයකොට (උද්ග්‍රහණය කොට); දන් දෙන රස-දානයකරන ආකාරය; පුරුදුකරවයි-(මේ සුරලෙව්හිදු තොපි) පරිචිත කරවයයි; යනමෙන්-කීමටමෙන්; දන් නොලබන-දානයක් නොලබන්නාවූ; හෙවත් දන්දෙන්නෙකු නැත්තාවූ; පසිඳු-ප්‍රසිද්ධවූ; සුරපුර-දිව්‍ය පුරයට; ගිය වැනි-ගමනය කළවුන් වැන්නේය.

35. මෙමුලු තුන් දියත-මේ සමස්ත ජගත්‍රයයෙහි; යසසේ-(දාන පාරමිතා ජනිත) කීර්තිය; පවතිනාමෙන්-ප්‍රවෘත්තවන පරිද්දෙන්; පෙර-පූර්වයෙහි; පසිඳු-ජගත් ප්‍රසිද්ධවූ; බෝසතුන්-(ශිවිරාජ-විශ්වාන්තර රාජාදි) බොධිසත්ත්වයන්ගේ; විලසේ-(දාන පාරමිතා සංඛ්‍යාත) විලාසය; දක්වමින්-(ලොකයාට) පෙන්වමින්; දෙතුන් පරපුරෙක-ද්විත්‍රිපරම්පරාවෙක්හි; සැප-ලෞකික සම්පත්තිය; ගොද සේ-යහපත්කොට; (සිත්වූ පරිද්දෙන්) විඳිනලෙස-වින්දනය කරන පරිද්දෙන්; නිමදගල ඇතුන්-ත්‍රිමද ගලිත හස්තීන්, යදිනට-යාචකයනට; සිතුසේ-සිත්වූ නියායෙන්; දෙවයි-දානය කරවයි.

36. රම්-රාමරජයාගේ; දිය-ජල විලාසය; නොහොත්-දියරම්-ජයරාමයාගේ; බල-බලය; විකුම්-වික්‍රම යන මෙය; මුලු දෙරණ-සකල ධරණීතලයට; පෙන්වූ-ප්‍රකාශ කළාවූ; (එහෙයින්ම) දියහිය කරන-ලොකයාට හිත (වෘද්ධි)යක් කරන්නාවූ; මනරම්-මනොරම්‍යවූ; මෙ නරනිඳුගේ-මේ රජයාගේ; බුජග-භුජාග්‍රයෙහි විහිගුම්-පතලාවූද; දිලි-ජ්වලිතවූද; යම දිවසේ-යමයාගේ ජිහ්වාව සෙයින්, කුරු පණ-ක්ෂුර තරවූද; කගනම්-ඛඩ්ගය නම්; රුදු-රෞද්‍රවූ; විරුදුරද-ශත්‍රු රජයන්ගේ; මුදුන-මස්තකයෙහි; හෙන-පතිතවන්නාවූ; හෙන-අශනි (ප්‍රහාර) යෙකි.

37. සයුරට-සාගරය කරා; වදිනා-ප්‍රවිෂ්ටවන්නාවූ; මහගං-මහාගඞ්ගාවන්; නැවතිතැන්-(යාගත හුහුහුයෙන්) නිවෘත්ත ස්ථානයක්; නැත-අවිද්‍යමානය, අඳුරට-අන්ධකාරයට; බියව-භීතව; රිවිඳ-චන්ද්‍ර සූර්‍ය දෙදෙන; සිටපු තැන්-ස්ථිත ස්ථානයක්; නැත-නැත්තේය; විදිනට-විනි විද්ධනයට; බැරිව-අසමත්ව; හෙවත් ප්‍රතිහතව; විදුරවි-වජ්‍රායුධය; (ඉන්ද්‍රායුධය) පැකිලි තැන්-ප්‍රස්ඛලිත ස්ථානයක්; නැත-නැත්තේය; (එපරිද්දෙන්ම) මෙනිරිඳු-මේ පරාක්‍රමබාහු රාජයා; යුදයම-යුද්ධයට; පැමිණ-ප්‍රාප්තව; පැරදි තැන්-පරාජිත ස්ථානයක්; නැත-නැත්තේය.

38. ගැඹුරු-ගම්භීරවූ; සයුරට-සාගරයට; ගොදුරට-(සජී සංඛ්‍යාත) ගොචර (ග්‍රහණය) පිණිස; පිවිස-ප්‍රවිෂ්ටව; නොනැවත-එහි ලග්න නොවී; නුබපත-නභො මාර්ගයට; පැමිණ-ප්‍රාප්තව; වැජඹෙන-විජෘම්භමාන වන්නාවූ; ගුරුළකු විලස-ගරුඩ රාජයකු ලෙසින්; මදමත-මදයෙන් මත්තවූ; ගිජිඳු-ගජේන්ද්‍රයාගේ; බඳවත්-ශරීරයෙහිදු පවා; මඳලස නොවී-මන්දාලස්‍ය යුක්ත නොව; මොහු-මේ රාජයාගේ; අත-හස්තයෙහිවූ; අසිපත-ඛඩ්ග පත්‍රය තෙම; ගොස්-ගමනය කොට; අහස මිස-ආකාශයෙහි මුත්; නො රඳයි-(අන් තැනෙක්හි) ප්‍රස්ඛලිත (නිවෘත්ත) නොවේ.

39. පසඟ තුරුගොස-පඤ්චතූර්‍ය නාදය; නරවා-පවත්වවා; රණබිමට-යුද්ධභූමියට; බැස-අවතීර්ණව; අසිපත-ඛඩ්ගපත්‍රය; රුපු රදුන්-ශත්‍රු රාජයන්ගේ; යස සහ-කීර්තිය හා සමඟ; නදවාගෙන-සනාබ්ධව ග්‍රහණය කොට; ඔවුන්-ඒ ශත්‍රු රාජයන්ගේ; හදවත් සමගින්-හෘදය වස්තුව හා සමග; පලිස-ඵලකය; ලෙලවා-කම්පිත කරවා හෙවත් ලීලෝපෙතකොට; උන්-ඒ ශත්‍රුන් පිළිබඳවූ; අඹුවන්-අම්බිකාවන්ගේ; ළෙහි-හෘදයෙහි; සෝක ගිනිරුස-ශොකාග්නි ස්කන්ධය; මොලවා-උද්දීප්ත කරවයි.

40. සගගිරග-මෙරුපර්වතාග්‍රය; පානාමෙන්-දක්වන්නාක් මෙන්; කඩුව-ඛඩ්ගය; උඩුකර-උද්ගත කොට; (යලිත්) බිඳිනා තැන්-(ශත්‍රුන්) භග්න කරන ස්ථානය; පානරඟ-ප්‍රකාශකරන්නාක් මෙන්; බිමට-භූමියට; බමකර-භ්‍රමණයකර; (තවද) ම පද-මාගේ පාදයුග්මය; වැඳ-අභිවාදනය කොට; වැටෙවයි-පතිතවවූයයි; කියන රඟ-කථනය කරන්නාක් මෙන්; යටකර-අධස්තාද්භාගයෙහිලා හෙවත් (පාංශුවෙන්) ප්‍රච්ඡන්නකොට; අවිසරම රඟ-ආයුධ සරභ්‍යාසයාගේ ළහිමය; ඇමවර-සෑම කල්හි; ලොවට-ලොකයාට; පෙන්වයි-දර්ශනය කරවයි.

41. ලෙහෙවතුරෙන්-(ශත්‍රූන්ගේ) රුධිර නැමැති ජලය කරණකොටගෙන; තරඟගත්-තරඞ්ග ග්‍රහණය කළාවූ; රණවාපිය-යුද්ධභූමි නැමැති සරසිය; සොන් සිවලුන් සිත් සමග-ශ්වාන ශෘගාලයන්ගේ චිත්තයන් හා සමග; පුරවාපිය-පූරණය කළේය. අඟනන්-වනිතාවන්ගේ; සිත්-චිත්තය; විරහගඟ-කරවාපිය-විරහනදියක් කරවීය. අටදිගුයටඟ-අෂ්ටදිශා නැමැති යෂ්ට්‍යග්‍රයෙහි; දියදද-විජයධවජයන්; බඳවාපිය-බන්ධනය කරවී.

42. යදල්-ලොහජාලයන්; බිඳ-භග්නකොට; නැඟි-උද්ගතවූ, ගිනිකඳේසිදී-වග්නිස්කන්ධයේදී, අසිපත-ඛඩ්ගපත්‍රය; තැවී-තප්ත කළේය; (පසුව) මදහුන්-මත්තහස්තීන්ගේ; බඳේසිදී-දේහයේදී; පණපෙවී-ප්‍රාණපායනය කරවීය; (යලිත්) කඟින්කගවන්-ඛඩ්ගයෙන් ඛණ්ඩනයන්වූ; යුදේසිදී-යුද්ධයෙහිදී; ඔපලැවී-ඔප්නැගුවේය. (පසුව) සුරබඳේසිදී-ඛඩ්ගකොෂයෙහිදී; රුපුන්-ශත්‍රූන්ගේ; බියගිනි-භීති නැමැති වග්නිය; නිවී-නිර්වාපනය කළේය.

43. රිවිගොත-සූර්ය්‍යවංශොද්භූතවූ; දළපැරකුම්බුජ-මහලු පරාක්‍රමබාහු නැමැති; සුරතුරෙක-කල්පවෘක්ෂයෙක්විය; එසින්-තත් පරාක්‍රමබාහු නැමැති කල්පවෘක්ෂයෙන්; දුලු-ජවලිතවූ; බුවනෙක බුජ-භුවනෛකබාහු නැමැති; කප්තුර-කල්පද්‍රැමයෙක්තෙම; පත-ප්‍රාප්තවිය; යල-නැවත; මෙනිරිඳු-මේ පරාක්‍රමබාහු නරවීරතෙම; එහි-තද්භුවනෛකබාහු නැමැති සුරද්‍රැමයෙහි; දිමුත-දීප්තිමත්වූ; කඳසිරි--ස්කන්ධශ්‍රීය; ගත-ග්‍රහණය කළේය; මෙ සිරිලක් කෙත-මේ ශ්‍රී ලඞ්කා නැමැති ක්ෂේත්‍රයතෙම; ඉන්-එම පරාක්‍රමබාහු නැමැති ස්කන්ධයෙන් (ජනිතවූ); පල ඇතිව-ඵලයුක්තවූවා; වැඩෙනුය-වෘද්ධි ප්‍රාප්ත වන්නේය;

44. මෙනිරිඳු-මේ නරෙන්ද්‍රයාගේ;. ගුණමහිම-ගුණානුභාවය නැමැති; හිමසඳන-ශීතචන්දනානුලෙපය; සඳ-(යුෂ්මත්හුගේ) චිත්ත සන්තානයෙහි; තවරා-අලිප්තකොටගෙන; අදගස-අධ්‍යාශය; සිදු කරනලෙස-සිද්ධකරන පරිද්දෙන්; අද අදරින්-හිතාදරයෙන්; නොරනොකර-නොරවූවක් නොකොට.

45. කිවත්-(කොතෙක් කාලයක් මුලුදුම) කථනය කළත්; නොමගෙවෙන-ක්ෂය භාවයට නොයන්නාවූ; දිය-ජගත්කුහරයෙහි; පිරි-පරිපූර්ණවූ; ගෙවත්-ව්‍යාප්තවූ; තෙදයසින්-තෙජස් හා යසස් කරණකොටගෙන; ලොවත්-ලොකසත්ත්වයන්ද; මෙපුර-මේ ජය වර්ධන පුරයෙහි; රදුනුත්-රාජයන්ද; රැකසිටිවිසිනි-රක්ෂණයකොට සිටි හෙයින්; නත්තුරුගොසිනි-නානාවිධ තූර්ය්‍යඝෝෂණයෙන්; නිති,-නිරන්තරයෙන්; පවත්වන-පවත්වනු ලබන්නාවූ; පුදැති,-පූජාඇත්තාවූ; සවත් සුරිඳු,-ෂඩ්වක්ත්‍ර සුරෙන්ද්‍රයාගේ; මැදුරට-මන්දිරයට; වැද-ප්‍රවිෂ්ටව; වැඳ-(එම දෙවරාජයාට) ප්‍රණාමයකොට; ගොසින්-(එයින් නික්ම) යාත්‍රාකොට.

46. මුනිඳු,-මුනින්ද්‍රයන් වහන්සේගේ; පින්,-(පාරමිධර්ම සම්භාරණයෙන් සමුපජාත) පුණ්‍යය; පිඬුව-පිණ්ඩීභූතව; ලොවට-ලොකයාට; පෙණුනාමෙන්-දෘශ්‍යමාන වූවාසේ; රන්රුවන්රැස්-සුවර්ණයන් හා මණිමුක්තාදිරත්නයන්ගේ රශ්මිය; විහිදු-විශීර්ණකොට; තෙවත් පතුරුවාහැර; දිගත-දිශාන්තයන්; එලිකොට-ආලොකවත්කොට්න්; සතන්-(සම්ප්‍රාප්ත) සත්ත්වයන්ගේ; නෙත්සිත්-චිත්ත නෙත්‍රයන්; සතුටුකොට-සන්තුෂ්ටකොට; ඇමදු-සැම දළිස්හි; දිලි-ජ්වලිතවූ; දළදා මැදුරතට-ශ්‍රී දන්තධාතු මන්දිරයට; වැද-ප්‍රවිෂ්ටව; නැමිද-(දළදාවහන්සේට) ප්‍රණාමයකොට; පුදකොට-පූජාවත්කොට;

## රාජසභාව.

47. සත-සත්ත්වයන්ගේ; සිත ලෙසින්-චිත්තය (දයාගුණයෙන් සනසන්නාක්) මෙන්; ගත,-(ස්වීය) දෙහය; සුවඳ සිලිලෙන්-සුගන්ධ ජලයෙන්; සනහා,-සන්තර්පණය කොට; තෙවත් සුගන්ධජල ස්නානයෙන් ශාන්තකර; කඩාරැගත්-ආච්ඡාදකොට ගත්නාලද; රුපුරජ-ශත්‍රුරාජයන්ගේ; යස-යශොලක්ෂණවූ; දුහුල්බඳු-දුකූලාකාරවූ; සිනිඳු-ස්නිග්ධවූ; මුදු-මෘදුවූ; සුදු-ශ්වෙතවූ; සුපිරිසුදු-අතිපරිශුද්ධවූ; සළු-ශාටකයන්; වඩා-ආච්ඡාදනයකොට; තෙවත් ඇඳ පැළඳගෙන; කැටිකළ-රාශිකෘතවූ; රිවිකිරණ-සූර්යරශ්මිය; පැවිකළ-මුව්හකළාවූ; අබරණ-ආභරණයන්; පැළඳ-පිලන්ධයකොට; සුරගඟ-ආකාශ ගංගාවගේ; තරඟපිටින්-තරංගමස්තකයෙන්; නිකුත්-නිෂ්ක්‍රාන්තවූ; සුරිඳුමෙන්-සුරරාජයා පරිද්දෙන්; උදුල-උජ්ජ්වලවූ; පිවිතුරු-පවිත්‍රවූ; පියවිළිය පිටින්-පාදපටමස්තකයෙන්; අවුත්-ආගමනය කොට; ලෙල-ලලිතවූ; මුතුලැල්-මුක්තාලම්බා ඇති; දළපුඩුසේසතෙසි-දන්ත බද්ධශ්වෙතච්ඡත්‍රයාගේ; යට-හෙට්ඨාභාගයෙහි; අතුළසුදුපට-අතුරණලද ශ්වෙතාස්තරණ ඇත්තාවූ; තුඟු-උත්තුඞ්ගවූ; සිංහාසනේ පිට-සිංහාසන මස්තකයෙහි; ලොව-ලොකය; එකෙලිකළ-එකාලොක කළාවූ; රිවි-සූර්යයා; උදයගට-උදයපර්වතාග්‍රයට; නැඟිමෙන්-උද්ගතවූවාක්මෙන්; පැරකුම්බුජ නරනිඳු-පරාක්‍රමබාහු රජයා; දුලු-ජ්වලමානව; උන්කලට-නිෂණ්ණ කාලයෙහි:—(මතු කව හා සම්බන්ධයි.)

48. මිණිබරණ රැසින්-මාණික්‍යාභරණ කාන්තිය කරණකොට ගෙන; සහස කිරණවන්-සහස්‍රකිරණයා (සූර්යයා) මෙන්; දිලි-ජ්වලිතවූද; සොඳුරු-මනොහරවූ; රූ රැසින්-රූපකාන්තිය කරණකොට ගෙන, දිගැස-දීර්ඝාක්ෂන්ගේ; නුවන්-නෙත්‍රයන්; තුටුකළ-සන්තුෂ්ටකළාවූද; රජකුමරුවෝ-රාජකුමාරවරු; ගොසින්-(රාජමෙහෙයට) පැමිණ; තිදස ඉසුරුසබ-ශක්‍රදෙවෙන්ද්‍රයාගේ සභාවෙහි තෙවත් සුධර්මා නම් දෙව්සභාවෙහි; සුරකුමරුවන් ලෙසින්-දිව්‍යකුමාරයන්ගේ විලාසයෙන් යුක්තව; දෙපස-උභයපාර්ශ්වයෙහි; සැදි-(රාජමෙහෙයට යොග්‍යපරිද්දෙන්) සජ්ජිතව; සිටිති-ස්ථිත වෙත්.

49. මසන්නෙත්-අමාවක්දිනයෙහි; සඳසේ-චන්ද්‍රයා පරිද්දෙන්; රුපුත්-ශත්‍රූන්; නොදුක-දර්ශනය නොකොට; දිසි-දෘශ්‍යමානව; තමාතමන්ගේ; නොයෙක යසරුස-අනෙකවිධ යශොරාශිය; දිසන්නේ-දිශාන්තයන්හි; පෑ-ප්‍රකාශ කළාවූද; මහන්තේ-මහාත්මන්වූද; ඒක නායක මැති-ඒකනායකාභිධාන මන්ත්‍රීතෙම; වසන්තේ-වසන්ත නම් ඍතුවෙහි; පිපිරූකමෙන්-පුෂ්පිත වෘක්ෂයක් පරිද්දෙන්; පසෙක-ඒක් පාර්ශ්වයෙක්හි; නිසැක-නිඃශංකව; සිටිසි-ස්ථිතියකරයි.

50. මුනිඳුන්වෙත-මුනීන්ද්‍රයා කෙරෙහිද; උපුල්වන් සුරිඳුන් වෙත-උත්පලවර්ණ සුරෙන්ද්‍රයා කෙරෙහිද; නිරිඳුන්වෙත-පරාක්‍රම බාහු රජයා කෙරෙහිද; බැතිසිත- භක්තිචිත්තය; තමපණසතර වැනිකොට-ස්වීය- ප්‍රාණය චතුර්ථකොට; රකින-රක්ෂණය කරන්නා වූද; මෙත්කුළුණු-මෛත්‍රිය සහ කරුණාව; හැමවිට-සැමකල්හිම; සතවෙත පතුරුවන-සත්ත්වයන් කෙරෙහි ඵරණය කරන්නාවූද; සන්හස් ලියන-සන්නස් පත්‍ර ලිපිකරන්නාවූ; තිරිවරංගමු මුකවෙටි මැති-තිරිවරංගමු මුකවෙටි මන්ත්‍රියන අපර නාමයක් ඇත්තාවූද; චණ්ඩාතපකිරණවත්-සූර්යරශ්මි සදෘශවූ; තදතෙදින්-ඝනබද්ධතෙජස් කරණකොටගෙන; දපි-දර්පිතවූද; බණ්ඩාරනායක තනතුරු සිරින්-බණ්ඩාරනායකස්ථානාන්තරශ්‍රීයෙන්; හෙබි-ශොභිතවූද; විකුම-වික්‍රම යුක්තවූ; වීරවිරිදුන්-වීරවෛරීන්; දක-දර්ශනයකොට; පිටිනොපෑ-පරාඞ්මුඛනුවූද; හෙවත් නිර්භයව ඉදිරිපත්ව සතුරන් නෂ්ටකළාවූද; සක්‍රම-ක්‍රමාන්විතවූ; හෙවත් යුක්ති යුක්තවූ; වීරබස් මිස-වීරපුරුෂයන්ට අයත් තෙපලක් විනා තදන්‍යදීන වචනයක්; නොතෙපලන සැටි-ප්‍රකාශ නොකරන ස්වභාව ඇත්තාවූද; අක්‍රමගුණ-ක්‍රමවිරොධි ගුණයක් හා; හෙවත් අයොග්‍ය ගතියක් හා; වංකගුණ-වඞ්කගතියක්; මඳකුත්-ස්වල්පයකුත්; නොගෙනසිටි-ග්‍රහණය නොකොට සිටියාවූද; විකුමසිංහ අදිකාරම් මැතිඳු-වික්‍රමසිංහ අධිකාරම් මන්ත්‍රීන්ද්‍රතෙම; (පසෙක-පාර්ශ්වයෙක්හි) සිටී-ස්ථිතිය කරයි.

51. අවිසරම-සරාභ්‍යාශය; තඳ-සන්තුෂ්ටව; කැමැති ලෙසින්-අභිප්‍රෙතපරිද්දෙන්; පානා-ප්‍රකාශකරන්නාවූද; යුදමැදටවැද-යුද්ධ මධ්‍යයට ප්‍රවිෂ්ටව; නොපිටිපානා-(භීතියෙන්) පරාඞ්මුඛ නොවන්නාවූ; බළැති-භටසේනා ඇත්තාවූද; සේනානායකවරුද-සේනානායක මන්ත්‍රිවීරයෝද; අනගි-අනර්ඝවූ; නානා රුවැති අබරණ-නන්වැදෑරුම් ශොභාසම්පන්න ආභරණයන්; පැළඳ-පිළන්ධනයකොට; දෙපස (රජයාගේ) දෑලවරෙහි; උභයපාර්ශ්වයෙහි; සිටිති-ස්ථිතිය කරන්නාහ.

52. ආකල-වර්තමානකාලයද; ගියකලත්-අතීතකාලයද; දැන-ජානනයකොට; අකුසලෙන්-අකුසලයන්ගෙන්; මිදී-මුක්තාවූද; (අකුසල් නොකොට නුවණින් කල්යැවූද යනුයි.) මිතලරකිණ-පෘථිවිරක්ෂණය කරන්නාවූ; නිරිඳුන්සේම-නරේන්ද්‍රයන් පරිද්දෙන්ම; තුති-සතුතිය; ලදී-(ලොකයාගෙන්) ලද්දාවූ; සිතල-(මෛත්‍රීගතියෙන්) සිහිල්වූ; නිබොරු තෙපුලෙන්-සත්‍යවූ වචන කාරණකොට ගෙන; සතට-සත්ත්වයාහට; සෙත-ශාන්තිය; යෙදී-යුක්තකළාවූද; හෙවත් දුන්නාවූද; හැම-සියලු; වාසලමුදලිවරු-වාසලමුදලීන්ද්‍රයෝ; සැදී-(නානාවිලාසයෙන්) සජ්ජිතව; එහි-ඒ සභාවෙහි; සිටිති-ස්ථිතියකරත්.

53. සසලේනොව-චඤ්චලනොව; හෙවත් ගම්භාරභාවව; අය වැයදමේ-අයකම්වැයකම්වය පිළිබඳවූ; සැටින්-ආකාරයන්; (තත්වයන්) දැන-පරිඥානයකොට; සඳසසලේලෙස-චන්ද්‍රශශලෙඛාවය පරිද්දෙන්; පිටින්නොපෑ-පරාඞ්මුඛනොව; එකතුව-එකමතිකව; ඔවකමලේ-මුඛපද්මයෙහි; බොරුත්-අසත්‍යයද; සිතේ-චිත්තයෙහි; ලෙවින්-මාත්සර්යයද; නොවකා-මුක්ෂිතනොකොට; අරමුදලේ ලේකම් මුදලිවරු-අරමුදල් පිළිබඳ ලෙඛක මුදලීන්ද්‍රයෝ; සිටිත්-(එම සභාවෙහි) ස්ථිතියකරත්.

54. විමතිනොවී-සංසයප්‍රාප්තනොව; අදිකරණඅරුත්-අධිකරණයන් පිළිබඳ අර්ථයන්; හෙවත් නීතික්‍රමය; දැනගෙන-ජානනයකොටගෙන; පැවැතිලෙසම-ප්‍රවෘත්තාකාරයෙන්ම; සුරුත්-ශොභන අර්ථයන්; හැමතැන ම-සකලාවසථාවයන්හි ම; කියමින්-ප්‍රකාශකරමින්; අකුසල්-(සියලු) අකුශලයන්ද; අවගුණත් (ඊර්ෂ්‍යාදි) දුර්ගුණයන්ද; බොරුත්-අසත්‍යයන්ද; සිතින්-(ස්වීය) චිත්තයෙන්; නැවැති-නිවෘත්තවූ; (වැළැක්වූ); වාසලමුකවෙට්ටිවරුන්-වාසලමොහොට්ටාලවරයෝත්; පසෙක-(සභාවෙහි) එක් පාර්ශවයෙක්හි; සිටිත්-ස්ථිතවෙත්.

55. මෙසේ-මේ උක්තප්‍රකාරයෙන්; නොයෙක්මැතිසෙන්-අනෙක මන්ත්‍රිසේනාවන්; පිවිස-(රාජසභාවට) ප්‍රවිෂ්ටව; සිටිසඳේ-ස්ථිතකල්හි; එසේ සිටින-තත්ප්‍රකාරයෙන් පැලඹෙන්නාවූ; පරසිදු-ප්‍රසිද්ධවූ; (ගරුතරවූ) මැතිවරන් මැදේ-මන්ත්‍රිශ්වරයන් මධ්‍යයට ළසේනොගොස්-(තොපට) සිත්වූ පරිද්දෙන් ප්‍රවිෂ්ටනොවී; අවසර ලත් විමෙක-අවකාශලැබූ වෙලාවෙක්හි; වැදේ-සම්ප්‍රාප්තව; තොසේවෙමින්-සන්තුෂ්ටවෙමින්; තොප-යුෂ්මත්හු විසින්; අවසර ගැනුම්-(ගමන් පිණිස) සමුගැන්ම; යෙදේ-යුක්තවේ..

56. මිතුර-මිත්‍රය! තොද-යුෂ්මත් තෙමේද; ඉඳුසබාවටවත්-ශක්‍රයාගේ සුධර්මානම් සභාවට ප්‍රවිෂ්ටවූ; ගුරුළිඳුගේ සබාවෙන්-ගරුඩපක්ෂිරාජයාගේ ලීලායෙන්; නරනිඳු සබාවට-රාජයාගේ සභාවට; නොබා-නිතනොව; සිතුසේ-සිත්වූ පරිද්දෙන්; වැද-ප්‍රවිෂ්ටව;

57. ඇසිපිය පමණකින්-අක්ෂිපක්ෂ (ස්පන්දන) මාත්‍රයෙන්; නරහනත්රඟේ-මනුෂ්‍යස්ත්‍රීන්ගේ ආකාරය; පෑ-ප්‍රකාශකළාවූද; (දිව්‍යාඞ්ගනාවන්ට වඩා වෙනසනම් ඇසිපිය හෙළීම පමණකි.) සිත-චිත්ත යුට; පියවඩන-ආනන්දකරවූ; රුසිරෙන්-රූපශ්‍රියෙන් යුක්තව; නරනිඳුත්ලඟේ-නරෙශ්වරයා වෙතෙහි; සිටිපිය නොසොල්වා-ස්ථිත පාදයන් චලිත නොකොට; සිටි-ස්ථිතවූද; වරඟනන්-උත්තම කුලකාන්තාවන්ගේ; රඟේ-ආකාරය; හෙමින් දර්ශිතයවූ සෞන්දර්යවිලාසය; දැක-නිරීක්ෂණකොට; පියමිතුර-(මාගේ) ප්‍රිය මිත්‍රය; තගේ-යුෂ්මත්හුගේ; නෙතසිත-නෙත්‍රයන් හා චිත්තය; තුටුකරන්-සන්තුෂ්ටකරව.

58. තුබේ-නභස්ථලයෙහි; පැතිරගෙන-ව්‍යාප්තවගෙන; සුතෙර; මහාමෙරු පර්වතයාගේ (උභයපාර්ශ්වයෙන්) වැහෙන-වැහෙන්නාවූ; හැලිමෙන්-ජලනිර්ඣර සෙයින්; සලන-විජෘම්භමානවූ; සෙමෙර-චාමරයන්ගේ; පවනින්-මාරුතය කරණකොටගෙන; සෙබේ-රාජසභාවෙහි; ඉතිරගෙන-අතිරික්තකොටගෙන; දුවන-ධාවනය කරන්නාවූ; සිහිල්-ස්නිග්ධවූ (මෘදුවූ) සොඳ-සුන්දරවූ; සුවඳැල් පහස-සුගන්ධශීතලස්පර්ශය; ලැබේ-ප්‍රතිලබ්ධව; නරනිඳු-නරෙන්ද්‍රයා; දුටුතැනම-දර්ශනය කළ මොහොතෙහිම; තුඹේ-යුෂ්මත්හුගේ; ගිමන-ශ්‍රමය තෙම; (හෙවත් සන්තාපය) නිවෙයි-නිවෘත්ත වෙයි.

59. මැති-(රාජසභාස්ථ) මන්ත්‍රිවරුන්ගේ; මුව-මුහුණු නැමැති; සියපතට-ශතපත්‍ර සමූහ (ප්‍රබොධ)යට; දිනිඳුන් කිරණවන්-(රාජයා විසින් ප්‍රදත්ත) සූර්යරශ්මියන් වැනිවූද; යලි-නැවත; රජු-(එම) නරෙන්ද්‍රයාගේ; සවනතට-කර්ණාන්තයට; දුන්-(එම මන්ත්‍රීන් විසින්) ප්‍රදත්තවූ; හෙවත් යොදන ලද්දාවූ; රහස්යටිවන්-රහස්‍යලතාවක් වැනිවූද; මිණිරැස්-මාණික්‍යරශ්මිය; කොඬොලින්-(රාජයාගේ) කුණ්ඩලාභරණයෙන්; නික්ම-නිෂ්ක්‍රාන්තව; අවට-(සභාවගේ) හාත්පස්හි; පැතිරෙයි-ව්‍යාප්ත කෙරෙයි; එමකිරණ-තත්ප්‍රකාරමාණික්‍ය රශ්මිය; න සිතට-යුෂ්මතාගේ චිත්තයට; වනමෙන්-ප්‍රවිෂ්ටවූවාසේ; පහන්වෙයි-ප්‍රසාදවන්නේය.

60. සිනිඳු-ස්නිග්ධවූද; පහන්-ප්‍රසන්නවූද; පැහැඇතිදෙය ම-ප්‍රභාන්විත ද්‍රව්‍යයන් ම; එක්කොට-එකරාශිකොට; පසිඳු-ප්‍රසිද්ධවූ; සබය-සභාව; පිරිබඩගත්නාලෙසට-පරිභණ්ඩ ග්‍රහණයකරන්නාක් මෙන්; නිරිඳු-නරෙන්ද්‍රයාගේ; බරණරැස්-අභරණ කාන්තිය; විටින්

පිට–වාරයෙන් වාරයෙහි; වැතිරෙයි–(භූමියෙහි) පතිතවෙයි; එසිඳු–තත්ප්‍රකාර ශ්‍රී සම්‍ෘද්ධියද; බලාසිට-නිරීක්‍ෂණයකොට සිටිතව; තගෙ–යුෂ්මත්හුගේ; සිත-චිත්තය; සතුටුකොට-සන්තුෂ්ටකොට:–

61. තොප–යුෂ්මත්හු; යන–(අපගේ අයැදුමෙන්) කරනු ලබන්නාවූ; යතුර–ප්‍රයාණය; ලොවට–ලොකයාහට; පිහිටවනුකොට–ප්‍රතිෂ්ඨාස්ථානයක්කොට; එම–තත්ප්‍රයාණයම; සිතට සිතට–සිතක් සිතක් පාසා; කොට-(ප්‍රතිෂ්ඨිත) කොටගෙන; (තත්ප්‍රයාණයම සිතෙහි ආලම්බනයක්කොට ගෙන යනුයි.) (යලිත්) අදර වඩමින්–සාදර චිත්තය වර්ධනය කෙරෙමින්; සිතෙහිවැර–(ඒ පිණිසවූ) චිත්තවීර්‍යය; පියට පියට–පියෙන් පියට; හෙවත් පදප්‍රහාරයෙන් ප්‍රහාරයට; බල කොටගෙන–ශක්තිසම්පන්න කොටගෙන; එවිට–තත්ක්‍ෂණයෙහි; රජුට–රාජයාහට; නමකොට–ප්‍රණාමයකොට; අවසර රැගෙන–(ප්‍රයාණයට) අවකාශ ග්‍රහණයකොට;

## ගමනාරම්භය.

62. තුසර–තුෂාරය; තුසරකර–චන්ද්‍රයන මොවුන්ගේ; සිහිලස–ශීතලභාවය; ඉක්මකර-අතික්‍රාන්තකොට; දිනකර-දිවාකරය; (සූර්‍යයා); අඹර–නභොලක්‍ෂණවූ; තඹරකර–පද්මාකරයට; එනතෙක්ම–ආගමනයකරන වේලාවෙහිම; හෙවත් සූර්‍යොදය වේලාවෙහිම; සිත-(යුෂ්මත්හුගේ) චිත්තය; බැහැර නොහැර–බාහිරාරම්මණයෙක්හි නොයවා; පිරිතක් ම-පරිත්‍රාණ ධර්‍මයක්ම; සිහිකර-ස්මරණයකොට; ම මිතුර! අස්මත් මිත්‍රවූ; තිසරතිසර-හංසශ්‍රෙෂ්ඨය; (යුෂ්මත්තෙම) මෙ පුරෙන්-මේ ජයවර්ධන පුරයෙන්; නික්ම–නිෂ්ක්‍රාන්තව:–

## මාර්ගී වර්ණනා.

63. සුපිපි-මනාසේ විකසිතවූ; කමල්–පද්ම හා; මහනෙල්පෙති-උත්පලයන්ගේ පත්‍රනැමැති; ඇතිරිපිට–ආස්තරණ මස්තකයෙහි; උන්–උපවිෂ්ටවූ; බිඟුදල්–භෘඞ්ගජාලාවන්; නිල්–නීලවර්ණවූ; බිජු රඟවමින-බීජයන්ගේ ආකාරයෙන් වනකල්හි; භෘඞ්ගයන්-(නීලවර්ණ බීජපඞ්ක්තියක්සේ බැබලෙන කල්හිය සේයි) මනකල් – චිත්තකාන්තවූ; වහසල්දොර–ගොපුරද්වාරයාගේ; ඉදිරිපිට–අභිමුඛස්ථානයෙහි; දිසි–දෘශ්‍යමානවූ; හෙවත් පෙනෙන්නාවූද; සුවිසල්–අතිමහත්වූ; කොත්තගංතොට–කොන්තගං නැමැති නදී තීර්ථයෙහි; මඳකල්–ස්වල්ප කාලයක්; සිට–සිටිතව:–

64. යන රඟ–ප්‍රයාණයකරන ආකාරය; නොපෙණෙන රඟට අදෘශ්‍යමානවන ආකාරයෙන්; තදව–ශීඝ්‍රව; නො ගොස්–යාත්‍රානොකොට; (යලිත්) මඳනුවණ-මන්දබුද්ධියගේ; ගතිරඟට-ගමන්පරිද්දෙන්; මඳව–මන්දව; හෙවත් ඉතා ප්‍රමාදව; නො ගොස්–ප්‍රයාණය

නොකොට; (නැවතද) දුදනන්ගේ-දුර්ජනයන්ගේ; සිතුරඟට- චිත්තාකාරයෙන්; ඇදුව-වඞ්කව; නො ගොස්-ගමනය නොකොට; (එසේම) තරඟට-(එමනදියෙහිවූ) තරඞ්ග ක්‍රීඩාවට; නදුව-සාභිලාෂව; දියපිට-ජලමස්තකයෙහි; නො ගොස්-යාත්‍රාද නොකොට; නො සිට-ස්ථිතියද නොකොට:—

65. විදිය-විශීර්ණවූ; හෙවත් විහිදීගියාවූ; විදුලි-විද්‍යුත්ඇති; ගන-(නීලවර්ණයෙන්) ගාඪවූ; වලාකුළුතුලා-වලාහකකූට සදෘශවූ; සුවඳවිදිය-සුගන්ධවිහිදීම් ඇති; මලාමැලි-කුඩා මහත් පුෂ්පයන්ගෙන්; දුලාවන-ජ්වලමානවූද; දෙපස-(එම නදියගේ) උභයපාර්ශ්වයෙහි; විදිය-විශීර්ණව සිටියාවූද; මනකලා-සිත්කළුවූද; නිලා-නීලවර්ණවූද; තුරු-වෘක්ෂපඞ්ක්තීන්ගේ; සිරි-ශ්‍රී විලාසය; බලා-අවලෝකනය කොට; එතොට; (නදියගේ) පාරිමතීරයෙහිවූ; විදිය-වීථි (මාර්ග) යෙහි; පලාගොස්-ප්‍රයාණයකොට:—

66. ලැග-ලැගුම්ගෙන; යනවා-ප්‍රයාණය කිරීම; යෙහෙකැයි-යහපතියයි; (සිතා) අම්බලම්කොට-විශ්‍රාමශාලාව තනා; සත-සත්ත්වයන්; හෙවත් මගින්; තරයලවා-ගමන්වෙහෙස දුරලා; සැනහී-සන්තර්පිතව; හෙවත් ජලස්නානයකොට; යනලෙසට-ප්‍රයාණය කරන පරිද්දෙන්; උදයදිවාකරමැති-උදයදිවාකර නම් මන්ත්‍රීහු විසින්-රුවට-ශොභනාකාරයෙන්; කරවූ-කාරාපිතවූ; උදය දිවාකරපොකුණේ-උදයදිවාකර නම් පුෂ්කරණීයෙහි; ගොසින්-ප්‍රවිෂ්ටව; සිට-ස්ථිතියකොට; හෙවත් ජලක්‍රීඩාදියකොට නිමවා:—

67. එවිටම-තත්ක්ෂණයෙහිම; හෙවත් යථොක්තාකාරයෙන් ජලක්‍රීඩාකොට නිමවූ ඇසිල්ලෙහිම; මුලුලොවට-සමස්තලොක වාසීන්ට; පියා-ප්‍රියවූ; (රුචිරවූ) පියා-(ඔබගේ) පක්ෂපත්‍රයන්; මැද-මාර්ජනයකොට; (ජලක්‍රීඩනයෙහි අවුල්වූ පක්ෂපත්‍රයන් නිරවුල්කොට යයි සේයි) (යලිත්) පියාවන-(දර්ශනය කරන්නවුන්ට) ප්‍රසාදජනක වන්නාවූ; පියා-පක්ෂචලනයෙන්; වන-වන්නාවූ; ගමන-ප්‍රයාණයද; නොහැරම-වර්ජිත නොකොටම; (පක්ෂ ප්‍රසාරණයෙන් ඇතැම් තැන අහසින් යමින්ද යතුයි.) (එසේම) පියාදුග-පක්ෂද්වය-පියාගෙන-ආකුඤ්චිතකොටගෙන; මඟම-මාර්ගාවතීර්ණවද; නොගොසින් ප්‍රයාණය නොකොට; (පියාපත් අකුලාගෙන ඇතැම් තැන මාර්ගයෙන් යමින්ද යතුයි) පියාසර-පියවූ ආචාර ඇති; හෙවත් ප්‍රියතර ගතිගුණ ඇත්තාවූ; මිතුරුතුම-මිත්‍රොත්තමය; යුෂ්මත් තොම (යථොක්තාකාරයෙන්) පියා-ප්‍රියවූ; සර-යාත්‍රාව, කර-කරතුමැන.

68. මිතුර-(මාගේ) මිත්‍රය! සරද-ශරත්කාලයෙහිවූ; වලාකුළු ලෙස-වලාහකකූටයක් පරිද්දෙන්; පැහිර නොගොසිනි-ව්‍යාප්තව නොගොස්; (කඩකඩව දුවන වලාකුළක්සේ තැනින් තැන පියෑඹීමෙන් ශූන්‍ය නොවෙමින් යනුයි.) (යළිත්) විලටදුවන-තඩාගයක් කරා ධාවනය කරන්නාවූ; බලාවැලසහ-බලාක පඞ්ක්තියක් හා සමගින්; නොගොසිනි-ප්‍රයාණයද නොකොට; හෙවත් කාඩි ප්‍රමාදයවන හෙයින් විලටද නොගොසින්; බිඟු-භෘඞ්ගයන්ගේ; ගොසිනි-ඣඞ්කාරනාදයෙන්; පිරි-පූර්ණවූ; පිපිවන-පුෂ්පිතවනය; බලා-නිරීක්ෂණයකොට; සතුටුවලා-සන්තුෂ්ටව; වනතින්-වනාන්තයෙන්; මඳතැන්-ස්වල්ප (දුර) ස්ථානයකට; ගොසින්-ප්‍රයාණය කොට:—

69. සබඳිනේ-මිත්‍රයාණෙනි; වනසැවුලේ-වලිකුකුළන් විසින්; දෙන-දෙනුලබන්නාවූ; පියනද=ප්‍රියවූනාදය; අසාගෙනේ-ශ්‍රවණය කොටගෙන; මහතැවුලේ-මාර්ගතාපය; හෙවත් මාර්ගයෙහි ගමනින් විඩාව; හැර-වර්ජිතකොට; සිටි-සිටියාවූ; තොපට-යුෂ්මත්හට; බව අවුලේ-සංසාරගහනය; හෙවත් සසරෙහිවූ දුඃඛස්කන්ධය; දුරලන-දූරීභූතකරන්නාවූ; මොක්පුරයමෙනේ-මෝක්ෂපුරය සදෘශවූ; මහ වෙහෙර-(කීර්ති ශ්‍රී මේඝවර්ණ නම්වූ) මහා විහාරය; ගුරුබැවුලේ සරියට-ගුරුබැවුල නම් ප්‍රදේශයෙහිදී; පෙණේ-දෘශ්‍යමානවේ.

70. සිත-චිත්තයෙහි; තුන්දොස්-(ලෝභ-ද්වේෂ-මෝහ-සඞ්ඛ්‍යාතවූ) දෝෂත්‍රය; දුරැර-දූරීභූතකොට; මුනිපුදට-සම්බුද්ධ පූජාවට; සතුටුව-සන්තුෂ්ටව; ඇමට-සකලජනයන්ට; පෙරටුව-පුරඃසරව; හෙවත් අන්‍ය ග්‍රාමයන්හි වැසිවූ ජනයන්ට වැඩියෙන්; පින්-පුණ්‍යයන්; රැස්කරන-වර්ධනය කරන්නාවූ; සුදනැනි-සාධුජනයන් ඇත්තාවූද; (සාධුජනයන්ගෙන් ගහනවූද යනුයි.) නන්-නානාවිධවූ; සස් කෙත්-ශස්‍යක්ෂේත්‍රයන් හා; වතිනි-වස්තූන්ගෙන්ද; හෙවත් පණස-ලබුජ-තාම්බූලාදියෙන් සැදුම්ලත් භූමිභාගයන්ගෙන්ද; නොපවුව-අමන්දව; (ගහනවයයිසේයි.) නිති-නිත්‍යයෙන්; සැදුණු-සජ්ජිතවූද; ගොතවුව-එනම් ග්‍රාමය; වම්පසෙහි-(මාර්ගයෙහි ගමන්ගත් යුෂ්මත්හුගේ) වාම පාර්ශ්වයෙහි; මන්තොස්කරම-චිත්තසන්තෝෂය කොටම; දකු-නිරීක්ෂණය කරන්.

71. අබරණ-ආභරණයන්; පැලඳ-පිලන්ධනයකොට; පිපි-විකසිතවූ; දොඹතුරුවන-පුන්නාගවෘක්ෂ බහුල වනයට; පිවිස-ප්‍රවිෂ්ටව; සුවදවිහිදි-සුගන්ධවිහිදෙන්නාවූ; මල්කැන්-පුෂ්පමඤ්ජරීන්; හෙවත් මල්කැණැත්තාන්; සිරස-ශීර්ෂයෙහි; ගවසා-ප්‍රවේශකර; බොළඳ ළඳුන්-බාලවූකාන්තාවන්; සුරඟනන්ලෙස-සුරාඞ්ගනා ව්‍යාජයෙන්; සිව්නා-සජීතිය කරනු ලබන්නාවූ; වෙළඳගොඩ-එනම් ග්‍රාමයෙහිවූ; සිරි-ශ්‍රී විලාසය; දකුණසස-දක්ෂිණ පාර්ශ්වයෙහි; නරඹව-නිරීක්ෂණයකර.

72 අඟට-ශෘංගයට; රත්මැටි-රක්තවර්ණමෘත්තිකාවන්; ගෙන-ග්‍රහණය කොට; සිටි-ස්ථිතව; දිගට-ආයාමයට; කුරඅදිමින්-ඛුරා කර්ෂණය කෙරෙමින්; ගවයන්-වෘෂභයන්; පොරඹ-ප්‍රහාරදීම පිණිස; නෙවත් පොරඇනගැන්ම සඳහා; සිටි-ස්ථිතිය කරනු ලබන්නාවූ; ඔවිටි-තදාසන්න නිම්නභූමි ප්‍රදේශයන්; සතුටින්-සන්තුෂ්ටියෙන් යුක්තව; බල-නිරීක්ෂණයකොට;

73. එගොඩට-පරතීර (සළුවිහාර)යට; අත්සරි-දිශාසාම්‍යය; මේයයි-මේතෙමේයයි; යනලෙසට-කථනය කරන්නාක්මෙන්; කිත් සිරිමේවන් රජු-කීර්ති ශ්‍රී මෙඝවර්ණ නම් රාජයා විසින්; රුවට-මනොඥාකාරයෙන්; කරවූ-කාරාපිතවූ; විසිතුරුරඟට-විචිත්‍රාකාර යෙන්; සිත්පිරි-චිත්තප්‍රීණනය කරන්නාවූ; මේවර යුතු-බුද්ධපූජා සම්මාර්ජනාදි විධානයෙන් යුක්තවූ; කිත්සිරිමේවන් වෙහෙරට-කීර්ති ශ්‍රී මෙඝවර්ණ නම්වූ විහාරයට; ගොසින්-ප්‍රයාණයකොට; සිට-ස්ථිතව;

74. කමද-කාමභවයෙහිද; අකමද-අකාමභවයෙහිද; හෙවත් රූපාරූප භවයන්හිද; පස්කඳ-රූපාදි ස්කන්ධපඤ්චකයාගේ; සබව-(උදයව්‍යයධර්මතා සඞ්ඛ්‍යාත) ස්වභාවය; හෙළිකොට-ප්‍රකාශකොට; වරදවරද-කුඩා මහත් පාපයන්; හැර-වර්ජිතකොට; පින්කළ-පුණ්‍යයන්කළාවූ; සව්සතට-සකල සත්ත්වයන්ට; සරද-නිර්වාණදායක වූද; සරද-සරත්කල්හි; සඳවැනි-චන්ද්‍රයා සදෘශවූ; වතැති-වක්ත්‍රය ඇත්තාවූ; මුනිසෙට-ශ්‍රෙෂ්ඨවූ මුනිරාජයා; සිහිකොට-ස්මරණයකොට; සිතඅදරින් ම-චිත්තාදරයෙන් ම; නැමඳ නැමද-නමස්කාරකොට කොට:—

75. දුටුව-දර්ශනය කළහොත්; සත-සත්ත්වයන්ගේ; සිත-චිත්තය; නිබඳ-නිරන්තරයෙන්; පබෝදය වන-ප්‍රබොධය කරවන්නාවූද; වෙසෙසින්-විශෙෂයෙන්; පවතින-ප්‍රවෘත්තමානවූ; නොමඳ-අමන්දවූ; බෝ පුදවත්-නා නා විධ පූජා වස්තූන් ඇත්තාවූද; මුනි-මුනිරාජයා විසින්; පිරි බෝ කළ-පරිභොග කරන ලද්දාවූද; සිරිමහ බෝ-ශ්‍රී මහා බොධි රාජයා හා; මුනිදුතුවෙන්-සර්වඥධාතු (නිධාන) යෙන්; බඳ-බඳනා ලද්දාවූ; දාගැප්-ධාතුගර්භ සංඛ්‍යාත චෛත්‍යරාජයාද; පැද කුණෙන්-ප්‍රදක්ෂිණාවෙන්; වැඳ-ප්‍රණාමය කොට.

76. සියල්දියත-සකලජගත්හි; සතවෙත-සත්ත්වයන් කෙරෙහි; නිතියෙන්-නිරන්තරයෙන්; දුවන-ධාවනය කරන්නාවූ; නිමල්-නිර්මල වූ; මුනිඳුගේ-මුනීන්ද්‍රයාගේ; සිත-චිත්තයෙහි; මෙත්කුළුණුමෙන-මෛත්‍රී කරුණාගුණයන් සෙයින්; විසල්-විශාලවූ;' සමුදුරට-සමුද්‍රය කරා; ගොස්-ප්‍රයාණයකොට; නිතොරව-තොරනැතිව; වදින-ප්‍රවිෂ්ට වන්නාවූ; සිහිල් සිලිල්-ශීතල ජලයෙන්; පිරි-පූර්ණවූ; ගංතෙරෙහි-ගඞ්ගාතීරයෙහි; සිටගෙන-ස්ථිතියකොට:—

77. සමනල මුදුන-සමනාකූට පර්වත මස්තකයෙහි; සිරිපද ඔබනමඟුලට-ශ්‍රී පාද ලාඤ්ඡන ප්‍රතිෂ්ඨාපන මඞ්ගලය පිණිස; නික සළ-නිකෙලෙසිවූ; හෙවත් ප්‍රහීන රාගද්වේෂාදිය ඇත්තාවූ; මගසඟන-ආර්යසංඝරත්නය; ගෙන-ග්‍රහණය කොටගෙන; වඩින-ප්‍රවේශය කරන්නාවූ; මුනිඳුට-මුනිරාජයාට; හෙවත් මුනීන්ද්‍රයාගේ ගමන් සඳහා; සුනිල්මැණිකෙන්-අති නීල මාණික්‍යයන්ගෙන්; කළ-කරන ලද; මහලෙසට-මාර්ගයක් මෙන්; පැහැදුල-ප්‍රභාවෙන් උජ්වලිතවූ; ගඟ-කල්‍යාණි නදියගේ; සිරිසර-ශ්‍රීසාරය; දුටු-දර්ශනයකළාවූ; තොපට-යුෂ්මත්හුගේ; මනදොළ-මනොදොහයතෙම; පිරෙයි-පූර්ණ වෙයි.

78. වටම-හාත්පස්හිම; එලිකළ-ආලොකය පැතිරවූ; රන් කොත්-ස්වර්ණ ශෘඞ්ගයන් ඇත්තාවූ; පහමුදුන්නේ, ප්‍රාසාද මස්තකයෙහි (යුක්ත) කළාවූ; දිගුසටගෙහි-දීර්ඝවූ යෂ්ට්‍යග්‍රයන්හි; බැඳහළ-බන්ධයකොට හරින ලදුව; වැනෙන්නේ-(මාරුතවේගයෙන්) චලමානවූ; දද-ධවජයන් ඇත්තාවූද; ගඟ-ගඞ්ගාජලයෙහි; පෙණෙන්නේ-(ප්‍රතිබිම්බ වශයෙන්) දෘශ්‍යමානවූද; පැහැදුල-ප්‍රභාවෙන් ජ්වලිතවූද; නොයෙක පහපෙල-අනෙක ප්‍රාසාද පඞ්ක්තිතොමේ; ගඟතුළ-ගඞ්ගාභ්‍යන්තරයෙහි; උදුල-උජ්ජ්වලිතවූ; නාරදුන්ගේ පුර වැනි-නාගරාජයන්ගේ පුරය වැන්නේය.

79. සුරඹ-සුරවනිතාවන් විසින්; සොළනා-ක්‍රීඩා කරනු ලබන්නාවූ; සුරගඟ-ආකාශ ගඞ්ගාවගේ; තුහු-මහත්වූ; තරඟයෙනි-තරඞ්ගයන් කරණකොටගෙන; කළඹ නැගී-කාලාභ්‍රයට ආරූඪව; යන-ගමනය කරන්නාවූ; විදුදරන්මෙනි-විද්‍යාධරයන්සේ; විසල්-විශාලවූ; කොළඹ-කොළම් පුරයෙහිද; වත්තල්-එනම් ප්‍රදෙශයෙහිද; පුත්තුරුවෙනි-එනම් ප්‍රදෙශයෙහිද සිට; ඔරුපාරුවෙනි-ද්‍රොණියෙන් හා මහාද්‍රොණියෙන්; යනෙන-ගමනා ගමනය කරන්නාවූ; වෙළඳුන්-වාණිජයන්; නරඹ-නිරීක්ෂණය කරන්.

80. වැද-සවිජිතව; පුරඅහසේ-පුරාකාශයෙහි; ලෙලෙනා-ලලිතවන්නාවූ; නන්දද-නානා ධවජයන්ද; ගඟදෙපසේ-ගඞ්ගාවගේ උභය පාර්ශවයෙහි; සිටිනා-ස්ථිතිය කරන්නාවූ; පුරඅඟනන්-පුරාඞ්ගනාවන්ද; ගඟදිය-ගඞ්ගාජලයෙහි; සිතසේ-සිත්වූ නියායෙන්; කෙළනා-ක්‍රීඩා කරන්නාවූ; ළදලිය-බාලස්ත්‍රීන්ද; දකිනා-දර්ශනය කරන්නාවූ; තයේ-යුෂ්මත්හුගේ; නෙතසිත-නෙත්‍රය හා චිත්තය; සතොසේ වෙසී-සන්තුෂ්ට වන්නේය.

81. දුමුදුමුවන්ගේ-දර්ශනයකළකළ ජනයන්ගේ; සිත-චිත්තයෙහි; ලොබ-(දර්ශනාභිලාෂ සංඛ්‍යාත) ලොභය; වඩමින්-වර්ධනය කෙරෙමින්; නිමල-නිර්මලවූ; හෙවත් ප්‍රසන්නතරවූ; අඹඅතුරු-ජලාන්තරයෙන්; උතුන්නේවෙතට-අන්‍යොන්‍යයන්ගේ සමීපයට; දිව-ධාවනය කොට; කෙළන-ක්‍රීඩාකරන්නාවූ; ළඳුන්ගේ-කාන්තාවන්ගේ; ලෙලපබ-ලලිත ප්‍රභා ඇත්තාවූ; වත-වක්ත්‍ර සහිත; ගත-(අවශේෂ) ශරීර පඞ්ක්තිය; ගනගැබ-මෙඝ ගර්භයෙක්හි; සියරැලි-ශතසඞ්ඛ්‍යාත රැලි ඇත්තාවූ; විදුලිය වැන්නේ-විද්‍යුල්ලතා හා සමය.

82. ගඟතරඟ-ගඞ්ගාතරඞ්ග මස්තකයෙහි; කනාලිය-කනකලතාවන්; ලෙලෙනාමෙන්-ලලිතවන්නාක්මෙන්ද; දිවනාලිය-දිව්‍ය නාග කාන්තාවන්; එලිබැස-අභ්‍යවකාශස්ථානයට අවතීර්ණව; කෙළනා ලෙස-ක්‍රීඩාකරන්නාක්මෙන්ද; පිහිනා-ජලසන්තරණයකොට; යනඑන-(උභයතීරයට) ගමනාගමනය කරන්නාවූ; සොඳුරුවන-සුන්දරාකාරවන්නාවූ; ලිය-කාන්තාවන්ගේ; සොබනා-ශොභනවූ; රුසිරි-රූපශ්‍රිය; විනාලිය නොහැකි-වර්ණනාකළ නොහැක්කේය.

83. මිනිසෙක්-(එක්) පුරුෂයෙක් තෙම; දියපිනා-ජලතරණය කොට; එතරට-පරතීරයට; යෙයි-ගමනය කෙරෙයි. (එකල්හිම) දියපිනා-ජලතරණයකොට; මෙතරටඑන-ඔරිමතීරයට එන්නාවූ; අඟනක්-(එක්) අඞ්ගනාවක්; ඔහු-ඒ පුරුෂයාගේ; සිරසට-ශිර්ෂයට; සරණින්-පාදයෙන්; පහරක්දුන-ප්‍රහාරයක් දුන්නේය; එසඳෙහි-තත්ක්ෂණයෙහි; අනෙකක්-අන්‍යස්ත්‍රියක් තොමෝ; දුරසිට-දුරස්ථානයෙහි සිටිනාවූවා; ඇඬුවා-රොදනයකළා.

84. අඟනක-(ජලක්‍රීඩා තත්පර එක්) අඞ්ගනාවක්හුගේ; පයගැ-පාදාලිප්තවූ; ලතු-අලක්තරසය; සිරසෙහි-ශීර්ෂයෙහි; වැකි-මුද්‍රිතවූ; හෙවත් තැවරුනු ලැබුවාවූ; මිනිසෙක්-පුරුෂයෙක්; තෙම; ගඟ-ගඞ්ගාවෙහි; දියකෙළියෙන්-ජලක්‍රීඩනයෙන්; නොවැළකි-නිවෘත්ත නොවිය; අනෙකක-අන්‍යකාන්තාවක්හුගේ; ඇස-නෙත්‍ර යුග්මය තෙම; ලතුනොමවැකි-අලක්තකාලිප්ත නොලද්දේම; රතුවිය-රක්තවර්ණවිය; ඇයසක-තත්කාන්තාවගේ නෙත්‍රයන්හිවූ; එරතට-තත්ප්‍රකාර රක්තභාවයට; වෙනදිය-අන්‍ය ජලයක්තෙම; හෙවත් ශොකාග්නියෙන් සන්තප්තවූවාශ්‍රු ජලයම; කාරණාකි-නිමිත්තකි.

85. දියමන්-ජලප්‍රමාණයද; හෙවත් ගඞ්ගාවෙහි ගැඹුරුතැන් හා සථලස්ථානද; දියගති-ජලගතියද; හෙවත් ජලය පිළිබඳවූ මන්ද ශීඝ්‍රතාදි වේගයද; නිති-නිත්‍යයෙන්; දැනගත් අය-ජානනයකළ ජනයෝ; ගංඉවුරෙන්-ගඞ්ගාතීරයෙහි සිට; පැන-පතිතව; ගැඹුරැයි

දියෙහි-ගම්භීර ජලයෙහි; ඉඳිමින්-නිමග්න වෙමින්; දියතුළ-ජලාන්තරයෙන්ම; දුර-දුරස්ථානයට; ගොස්-ප්‍රයාණයකොට; ඉපිලෙති-උත්පාලාපිතවෙති; හෙවත් මතුවෙත්; (සලිත්) දියබුංදිය කෝකිල-දියබුංදිය කෝකිල සඞ්ඛ්‍යාතබවනි විශෙෂය; ගසමින්-පවත්වමින්; යෙති-යන්නාහ.

86. අඟනන්-(ජලක්‍රීඩාපරවස) කාන්තාවන්; ගඟ-(එම) නදියෙහි; උඩුකුරුවෙමින්-ඌර්ධවමුඛවෙමින්; පිහිනන-තරණයකරන කල්හි; සියපත-ශතපත්‍රයන්ගේද; ඉඳුවර-ඉන්දීවරයන්ගේද; දිසි-(තන්හි තන්හි) දෘශ්‍යමානවූ; තිසරුන්-හංසයන්ගේද; රඟ-ආකාරය හා; (සලිත්) මනරඟ-සිත්වූ නියායෙන්; කෙළනා-ක්‍රීඩනයකරන්නාවූ; පැහැපත-ප්‍රභාවත්වූ; බිඟුරැළ-භෘංගශ්‍රෙණීන්ගේ; සිරි-ශොභා විලාශයද; ගත-ග්‍රහණයකළාවූ; ගඟ-(එම) නදීතොමෝ; දිගැසවිලස-කාන්තාවන්ගේ ලීලාවට සමවූ; රඟ-ආකාරයෙන්; දිසි-දෘශ්‍යමානවී.

87. අඟනක්-එක් අංගනාවක්හුගේ; ගතා-ශරීරයෙහි; (ආලිප්තකළාවූ;) කොකුමහරා-කුංකුමාංගරාගය; තරඟ-තරංගය විසින්; පැහැරගත-විලුම්පනයකොට ගත්කල්හි; ලවනතා-(ඇයගේ) අධරතලයෙහි; රතා-රක්තවර්ණය; මඳ-මඳකුත්; නොතිබිය-(සල්ලාල පුරුෂයකු විසින් අධරපානයකළ හෙයින්) ශෙෂනොවීය; (සලිත්) තලින්-(එම සල්ලාල පුරුෂයාගේ) හස්තතලයෙන්; අල-ගසනලද; දිය-ජලය; ෂෙතා-(මුහුනට) පතිතවනකල්හි; බියෙන්-භීතියෙන්; වැසූ-ඡාදිතවූ; නෙතා-නෙත්‍රයුග්මය තෙම; (කෙසේද?) පුන්සිසිරැස්-පූර්ණචන්ද්‍රරශ්මිය; පතා-ප්‍රාර්ථනාකොට සිටියාවූ; ඉඳුවර-ඉන්දීවරයක්හුගේ; සිරි-ශ්‍රී විලාසය; ගතා-ග්‍රහණය කළේය.

88. මසෙක්-එක් මත්ස්‍යයෙක් තෙම; ගොදුරු-ගොචරයක්; පතා-ප්‍රාර්ථනයකොට; හෙවත් ගොදුරක යන අදහසින්; මෙවුලේ-(කාන්තාවක්හුගේ) මෙඛලාදාමයෙහි; මිණි-මාණික්‍යය; ගතා-(මුවෙන්) ඩැහැගත්තේය; (එවිට) බියපත-භීතිප්‍රාප්තවූ; එළඳුන්-එම කාන්තාවගේ; ගත-ශරීරයතෙම; වෙවුලුම්ගතා-කම්පාග්‍රහණය කළේය; එමතුනොවෙසි-එපමණක්ද නොවෙසි; ඉතානිල්-අධික නීලවර්ණවූ; සෙවෙලැයි-ශෛවාලයයි; සිතා-චින්තනයකොට; කොමළඟනන්-කොමලාඞ්ගනාවන් විසින්; මුතා-මුදාහරන ලද්දාවූ; සරල්-රැලිසහිතවූ; වරල්-කෙශකලාපයන්; ගතා-ග්‍රහණය කළේය.

89. තම-තමන්ගේ; ගලාපමණින්-කණ්ඨප්‍රමාණයෙන්; ගත-ශරීරය; දියතුළ-ජලාභ්‍යන්තරයෙහි; ගලා-ගිල්වා; සිටිනා-ස්ථිතවූ; මනකලා-මනොඥකාන්තාවන්ගේ; මනකලා-මනඃකාන්තාවූ; වුවනත-වක්ත්‍රතලය; සයුරෙහි-සාගරයෙහි; කලාපිරි-කලාපරිපූර්ණවූ; සඳවැනි-චන්ද්‍රයාසේ; දිසිකල-දෘශ්‍යමානකල්හි; කෙළනළඳුන්-ක්‍රීඩා කරන කාන්තාවන්; බලා-නිරීක්ෂණයකොට; පය-පාදයන්; ඇද-ආකර්ෂණයකොට; පලානොයෙති-(බලාසිටින්නෝ) ඉවත ගමන් නොකරන්නාහ; බල-(මේ ආශ්චර්යය) බලව.

90. ගඟේ-ගඞ්ගාවෙහි; තැන තැනේ-තන්හි තන්හි; ගැඹුරු තැනේ-ගම්භීරස්ථානයන්; විමසා-පරීක්‍ෂාකොට; ගොසින්-පිහිනා ගොස්; කිමිද ගෙනේ-නිමග්නව; සුරතින්-දක්‍ෂිණ හස්තයෙන්; වැලි-වාලුකාවන්; ගෙනේ-ග්‍රහණයකොට; යළි-නැවත; කෙළිමිනේ-ක්‍රීඩාමත්ස්‍යයන්; ගෙනපාමින්-ග්‍රහණයකොට පෙන්වා; කෙළිමිනේ-ක්‍රීඩාකාමින්; දුටුවන්-දර්ශනයකළවුන්ගේ; සිත-චිත්තයෙහි; සිනේ-ස්නේහය; වෙසෙසිනේ-විශේෂයෙන්; වඩවති-වර්ධනයකරවත්.

91. සුරඟන-සුරාඞ්ගනාවන් විසින්; සුරසමග-දෙවියන් හා එක්ව; සුරගඟ-ස්වර්ණදියෙහි; කෙළින-ක්‍රීඩාකරනු ලබන්නාවූ; කෙළිසේ-ක්‍රීඩාපරිද්දෙන්; ගඟ-ගඞ්ගාවෙහි; මනරඟ-සිත්කලුවූ; කොමළඟන-කොමලාංගීන් විසින්; කෙළනරඟ-ක්‍රීඩාකරන ආකාරය; ලමෙලෙසේ-මේ උක්තප්‍රකාරයෙන්; බල-නිරීක්‍ෂණයකරන්,

## මාර්ග වර්ණනා.

92. යනඑනදනන්-ගමනාගමනය කරන ජනයන් විසින්; දක-අවලෝකනයකොට; ලන-ප්‍රක්‍ෂිප්‍යමාණවූ; ගොදුරෙන්-ගොචරයන් කරණකොටගෙන; තිළිය-තුෂ්ටව; එකරඟ-එකාකාරයෙන්; වරල්-පුච්ඡයන්; විදහා-විකීර්ණ කොටගෙන; එලිය-(ජනයන්ගේ) අභිමුඛ ස්ථානයෙහි; පෙනෙමින්-දෘශ්‍යමාණවෙමින්; සැකනොව-ශඞ්කාරහිතව; කෙළිවතල-ක්‍රීඩාතත්පරවූ; මින්රැළ-මත්ස්‍යසමූහයා කරණකොටගෙන; ගත්-ගෘහීතවූ; රැලිය-ජලවිජටා ඇත්තාවූ; මස්කෙළිය-එනම් නදීතීර්ථස්ථානය; දක-නිරීක්‍ෂණයකොට; ගඟින්-තත්කල්‍යාණී නදියෙන්; එතරව-උත්තරිතව; ගිය-ප්‍රයාණයකළාවූ; තොපට-යුෂ්මත්හට:—

93. මුනිපුදයට-බුද්ධපූජා පිණිස; සපැමිණි-සම්ප්‍රාප්තවූ; නන් සුරන්රැස-නානා දෙවසමූහයන්; පුදකොට-පූජාකොට; එහි-තත් ස්ථානයෙහිම; හැරගිය-වර්ජිතකොට ගියාවූ; රන්විමන්ලෙස-ස්වර්ණවිමානාකාරයෙන්; හැමවිට-සැමකල්හිම; දිලි-ජ්වලිතවූ; පහ-ප්‍රාසාදයන්ගේ; දදවත්-ධ්වජයන් ප්‍රවිෂ්ටවූ; ගුවන්කුස-ගගනකුක්‍ෂි ඇත්තාවූ; කැලණිය-කල්‍යාණිපුරය; දුට-දර්ශනයකළ කල්හි; මනනුවන්-චිත්තනේත්‍රයන් පිළිබුඳවූ; තොස-සන්තුෂ්ටිය; පැමිණෙයි-ප්‍රාප්ත වෙයි. (තොපට සන්තුෂ්ටිය වන්නේය යනු භාවයි.)

94. මිණිගණසහ-(පරිවාරභූත) හස්ති රත්නාදිය සමගින්; පැමිණි-ප්‍රාදුර්භූතවූ; සක්විතිමිණි රුවන මෙන්-චක්‍රවර්තිරාජයාගේ මාණික්‍යරත්නය සෙයින්; දහසින්අඩ-සහස්‍රයෙන් අර්ධයක්-හෙවත් පන්සියයක් (පමණ); රහත්සඟගණ-අර්හත්භික්‍ෂු සඞ්ඝසඞ්ඛ්‍යාතවූ; පිරිවරින-පරිවාරය හා සමග; රැසින්-(ෂඞ්විධ බුද්ධ) රශ්මීන් කරණකොටගෙන; දිගුබිතු-දිශා නැමැති භිත්තීන්; තවරමින ආලිප්ත

කෙරෙමින්; අහසින් වැඩ-ආකාශයෙන් ආගමනයකොට; මිණිඅක් නසිඳු-මණිඅක්ඛික නාගරාජයා විසින්; කළ-නිර්මාපිතවූ; මිණිමඩුව තුළ-රත්නමණ්ඩපාභ්‍යන්තරයෙහි; වැඩහිඳ-ප්‍රවිෂ්ටවහිඳ; මුනිඳු-(ගෞතම) මුනිරාජයන් වහන්සේ විසින්; නද-සන්තුෂ්ටියෙන්; දිව බොජුන් වැළඳූතැනෙහි-දිව්‍ය භොජනවලඤ්ජිත ස්ථානයෙහි; මුනිඳු පිහිටුවාකළ-සර්වඥධාතු නිධානකොට බඳනාලද්දාවූ; දාගැබට-ධාතු ගර්භයට; වැඳ-වන්දනයකොට; නිබඳ-නිත්‍යයෙන්; දිලි-ජ්වලිතවූ; දෙමහල්-ද්විභූමකවූද; තුන්මහල්-ත්‍රිභූමකවූද; මුනිහල්-බුද්ධප්‍රතිමා මන්දිරයන් හා; ගන-මෙඝයකට බඳුවූ හෝ ශාන්ද්‍රවූ; නිල්-නීල වර්ණයෙන්; දුල්-ජ්වලිතවූ; නිමල්-නිර්මලවූද; බෝසල්-බොධිද්‍රැමයන්; පුදා-පූජාකොට; වැඳ-වන්දනයකොට; සුවිසල්-අතිමහත්වූ; පස්මහල්-පඤ්චභූමකවූ; සහසතුගෙවල්-සඞ්ඝසන්තක ප්‍රාසාදයන්ගේ; මැද-මධ්‍යස්ථානයෙහිවූ; මහසල්-මහාශාලා ඇත්තාවූ හෙවත් දීර්ඝතර ශාලා ඇත්තාවූ; දන්සහල්-දානශාලාවන්; දක-අවලොකනයකොට; සබඳ-මිත්‍රය!; (පුෂ්මත්හු) උන්සඳ-නිෂණ්ණකල්හි:—

## සන්ධ්‍යා වර්ණනා

95. වළබගිනි - වඩබාග්නිය; සිඳුපුළනොසිට- සාගරාභ්‍යන්තරයෙහි අසපිතව; වට-වෘත්තාකාරව; නැඟිමෙන්-(ආකාශයට) උද්ගතවූ වාක්මෙන්ද; යළ-නැවත; තරඟපිට-තරඞ්ගමස්තකයෙහි; ලෙල-ලලිතව; දිසි-දෘශ්‍යමානවූ; පබළුකළඹෙව් - ප්‍රවාලකලාපයක් පරිද්දෙන්ද; (තවද) සඳවෙලෙන්-සන්ධ්‍යාවලාහක (ලක්ෂණ සූත්‍ර)යෙන්; අවට - හාත්පස්හි; බැඳ - බන්ධනයකොට; හළ-හරනාලද; රතුගලක්ලෙස-පද්මරාග මාණික්‍යයක් පරිද්දෙන්ද; පැහැදුල-ප්‍රභාවෙන් උජ්ජ්වලිතවූ; රිවිමඬල-සූර්යමණ්ඩලයතෙම; සකි-(මාගේ) මිත්‍රය!;තනෙතට-පුෂ්මත්හුගේ නෙත්‍රයට; පෙණෙන-දෘශ්‍යමානවෙයි.

96. දියතුර - ලොකාභ්‍යන්තරයෙහි; පැතිර - ව්‍යාප්තව; (සිට) බස්නා - ස්‍යන්දමානවූ (බැසයන්නාවූ); තඹවතුරුමෙනි - (අත්‍යන්ත පීඩාජනකත්වය හෙයින්) තාම්‍රජලප්‍රවාහයක් වැනිවූ; දිනකරකිරණ-සූර්යරශ්මිය; අවරඹරට-අපරාකාශයට; වැද-ප්‍රවිෂ්ටව; ගියෙනි-ගමනයකළ හෙයින්; දියත-ලොකය; නිලකර-නීලවර්ණ යුක්තකොට; ඉඳුරෙන්-ඉන්ද්‍රදිශායෙන්; පැතිරෙණ - ව්‍යාප්තව එන්නාවූ; අඳුරු-අන්ධකාරයතෙම; සැඹකරකිරණවැද - සූර්යරශ්මි ස්පර්ශයවීමෙන්; තැවි-තප්තවූ (පීඩිතවූ); ලොව-ලොක (සත්ත්වයා); තෙමනමෙනි (නිවීම පිණිස) තෙමාලන්නාක් වැනිවේ.

97. ඇමතැන-(විහාරස්ථානයෙහි) සියලුතන්හි; කරන-කරනු ලබන්නාවූ; මුනිපුද-බුද්ධපූජාවන්; නරඹනලෙසට-නිරීක්ෂණය කිරීමට මෙන්; සැවුල්ගණ - සාවල්පක්ෂි සමූහයා; හෙවත් කුක්කුට පක්ෂීන්; තැනතැන - තාන්හි තාන්හිවූ; තුරුසිරට-වෘක්ෂශීර්ෂයන්ට;

පැමිණෙන-ප්‍රාප්තවනකල්හි; (තවද) මුනිමැදුරු-බුද්ධප්‍රතිමාලයන්හි; දිලියෙන-ජ්වලමානවූ; පහනින් - ප්‍රදීප කාරණකොටගෙන; එහි-එම ප්‍රතිමාලයන්තුළෙහි; නොසිට-අසථිතව; දිවයන-ධාවනයකොට යන්නාවූ; අඳුරුමෙන් - අන්ධකාරය පරිද්දෙන්; වවුලන් - එනම් පක්ෂීන්; නිකුත්විට-නිෂ්ක්‍රාන්තකල්හි;

98. සිසිල්මඳනල-ශීතල මන්දමාරුතය; ඇදගෙන-ආකර්ෂණය කොටගෙන; දියදහර - ජලධාරාවන්; හෙන - පතිතවන කල්හි; (යලිත්) විලඟන-තඩාගාම්බිකාවන්; බියෙන්-(අන්ධකාර ස්පර්ශයට) භීතිය කාරණකොටගෙන; දිලි-ජ්වලිතවූ; නිලිපුල්ඇස්-නීලෝත්පල නැමැති නෙත්‍රයන්; වසන-නිමීලනයකරන කල්හි; (තවද) පරඟනන් වෙත-පරස්ත්‍රීන් කෙරෙහි; අසුවන-බද්ධවන්නාවූ; සලෙලුවන්මෙන්-සල්ලාල පුරුෂයන් පරිද්දෙන්; හැකිලෙන-සඞ්කුචිතවන්නාවූ; පියුම් ගැබ-පද්මගර්භයන්හි; වැස-වාසයකොට; බමරුන්-භෘඞ්ගයන්; බැඳෙන-බද්ධවනකල්හි:—

'99. හිමකර-චන්ද්‍රයා විසින්; සිනිඳු-ස්නිග්ධවූ; සොමිරැස්-සෞම්‍ය රශ්මීන්; රැස්කරනුවට-රාශිකරනය පිණිස; නිලඹරකෙතෙහි-නීලාම්බර ලක්ෂණ ක්ෂෙත්‍රයෙහි; නිසිලෙසට-යොග්‍යපරිද්දෙන්; ඉසි-විසුරුවන ලද්දාවූ; බිජුවට-බීජපඞ්ක්තියක්; එකවර-එකප්‍රකාර යෙන්; (එකවරම); රුවටදුලන-ශොභනාකාරයෙන් ජ්වලමානවූ; දිගු-දීර්ඝවූ; දලුලන ලෙසට-අඞ්කුර නිර්ගමනය කරන්නාක්මෙන්; බබලන - භ්‍රාජමානවූ; තුරුවැලද-තාරකාවලියද; මමිතුර-මාගේ මිත්‍රය!; තට-යුෂ්මත්හට; පෙණේ-දෘශ්‍යමානවේ.

100. සබඳ-මිත්‍රය!; එසඳ-තත්කාලයෙහි; මඳනලසබඳ-(සන්ධ්‍යා) මාරුතය හා සම්බන්ධවූ; (සන්ධ්‍යා මන්දමාරුතයෙන් ජ්වලිතවූ); සඳ වෙලෙ-සන්ධ්‍යාවලාහක නැමැති; ගිනිදැල්-වග්නිජ්වාලයෙන්; වැද වැද-සච්චිතවෙමින්; (වැදීමෙන්) පිපිර-ස්ඵුටිතව; හුණු-(ධරණීතල යෙහි) පතිතවූ; තුරුබිජුමෙන් - තාරකාබීජයන්ගේ ව්‍යාජයෙන්; ගෙරුදබැඳ-පඞ්ක්තිබන්ධනයකොට; රොත්-රේණූන්; ඇරගෙන-ග්‍රහණයකොට; යන-ගමනයකරන්නාවූ; බමරමුලු-භ්‍රමරසමූහයා; වැද-සච්චිතව; කොඳවන - කුන්දවනය; හැමතැන - සකලස්ථානයෙහි; පිපෙනරඟ-පුෂ්පිතවන ආකාරය; බල-නිරීක්ෂණය කරන්.

101. ලොලව - ලෞල්‍යයුක්තව; වනදනන් - විරහජනයන්ගේ; ලේ-රුධිරය; මඳ-අමන්දව හෙවත් බොහෝකොට; බීමෙන්-පානය කිරීම හේතුකොටගෙන; රතුවගියේදෝ-රක්තවර්ණ යුක්තවූයේ දෝයි; සත-සත්ත්වයන් විසින්; සැකකරනලද-ශඞ්කාකරනලදුව; එමසඳ-තත්ක්ෂණයෙහි; උදැසිරසින්-උදය පර්වත මස්තකයෙන්; මතුව - උද්ගතව; පෙණෙන - දෘශ්‍යමානවූද; සඳවෙලෙන්-සන්ධ්‍යා වලාහකයන් කාරණකොටගෙන; රතුවූ-රක්තවර්ණවූද; පුපුන්සඳ-පරිපූර්ණ චන්ද්‍රයා; බලව-නිරීක්ෂණයකරන්.

**102.** නවයොවුනන්-විරහවූ යුවතින්ගේ; වුවනට-වක්ත්‍රයන්ට; කිපි-කුපිතවූ; සිසිරකර-චන්ද්‍රයා විසින්; උන්-ඔවුන්ගේ; හිමියන්-වල්ලභයන් පිළිබඳවූ; වෙන්වනතැන-වියොගයට හෙතුවූ; අවසර-අවකාශාවස්ථාව; දැන-ජානනයකොට; මතකොවුලන් වෙත-මත්ත කොකිලයන් සමීපයට; ලන-ප්‍රයොගකරන්නාවූ; රහසයවියුර-රහස්‍ය යෂ්ටි ව්‍යාධියෙන්; තුරුසිදුරෙන් එන-වෘක්ෂච්ඡිද්‍රයන්ගෙන් ආගමනය කරන්නාවූ; සඳරැස්-චන්ද්‍රරශ්මිය; මිතුර-මිත්‍රය!; බල-නිරීක්ෂණය කරන්.

**103.** වෙණු-ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා; සුනෙරමතින් - මෙරුපර්වත නැමැති මන්ථයෙන්; කිරිසයුර-ක්ෂීරාර්ණවය; අලළන-කලඹනකල්හි; වෙරළ - වෙලාන්තය; ඉහිර - අතිරික්තව; දිවයන - ධාවනයකොට යන්නාවූ; රලපතරමෙන්-තරඞ්ග පඞ්ක්තිය පරිද්දෙන්; පැතිර-(ලොකධාතුවෙහි) ව්‍යාප්තව; නොහැර-අස්ඛලිතව; දිලි-ජ්වලිතව; උදයගිරි සිරසින්එන-උදයපර්වත මස්තකයෙන් ආගමනය කරන්නාවූ; සොඳ-සුන්දර (තර)වූ; සඳරැස්වතුර-චන්ද්‍රරශ්මි නැමැති ජල (ප්‍රවාහ)ය; මිතුර-(මාගේ) මිත්‍රය!; බලව-නිරීක්ෂණය කරන්.

**104.** තොස්වන-තුෂ්ටිජනක වන්නාවූ; සුවඳපිරිබඩ-සුගන්ධපරිභාණ්ඩයන් හා; මල්-(සුගන්ධ) පුෂ්පයන්ද; අතට-හස්තයට; ගෙන-ග්‍රහණයකොට; ලස්නොව-ආලස්‍යයුක්තනොව; සුවඳ තෙල්පහනින්-සුගන්ධතෛල ප්‍රදීපයෙන්; එකලුකොට-එකාලොකකොට; දනන්-මහාජනයන්; මුනිපුදයට-බුද්ධාපචායනය පිණිස; වෙහෙරතට-තද් විහාරාභ්‍යන්තරයට; රැස්වන - රාශිභූතවනකල්හි; මිතුර-මිත්‍රය!; තොඳ-යුෂ්මත්හු; විබිසණපුරමැදුරතට-විභීෂණ දෙවමන්දිරාභ්‍යන්තරයට; ගොස්-ප්‍රයාණයකොට; :—(එකසර කෙසරසර යන්න හා සම්බන්ධයි.)

**105.** මෙලක-මේ ශ්‍රී ලඞ්කාද්වීපයට;පින්කෙත්වත්-පුණ්‍යක්ෂෙත්‍රයක්වූ; රජමහ කැලණිවෙහෙරෙහි-රාජමහාකල්‍යාණි විහාරයෙහි; ගණනායක-සඞ්ඝනායකවූ; පෙරසඟගණ පරපුරෙනි-පුරාතන සඞ්ඝසමූහයාගේ පරම්පරාවෙන්; ගණනායකතැන්-ගණනායකධුරය; ලැබ-ලබ්ධව; සැපතිනි-සමෘද්ධතායෙන් යුක්තව; සිටින-වාසොපගතවූද; නිරිඳුකුල-රාජවංශය; උස්කළ - උච්චස්ථානගතකළාවූ; කොස්ගම කොස්ගම නම් ප්‍රදෙශයෙහි (ජනිත)වූ; ඒකනායක-එකනායකාභිධානවූ; මැතිඳුකුල-මන්ත්‍රීන්ද්‍රයාගේ පරම්පරාව; ඊතමඋපතිනි-එතමන්ගේ උත්පත්තිය කරණකොටගෙන; පසිඳුකළ-ප්‍රසිද්ධියට ප්‍රාප්තකළාවූද; මුනිඳුබණ-බුද්ධධර්මය; පුරුදුකර-ප්‍රගුණකොට; සතතිනි-නිරන්තරයෙන් හෙවත් හැමදවස්හි; දෙසන-(ලොකයාට) දෙශනාකරන්නාවූද; සිත-චිත්තයෙහි; සැකහැර-ශඞ්කාවිච්ඡෙදයකොට; කිව්

නළුසඳලකර-කාව්‍ය-නාටක-ච්ඡන්දෝ-ලඞ්කාර ශාස්ත්‍රයන්; දැන-ජානනයකොට; සිරිලක-(මේ) ශ්‍රී ලඞ්කාවෙහි; හැම කිවිඳුන්ගෙන්-සමස්තකවීන්ගෙන්; අදරලත්-ගෞරව ලද්දාවූද; සකකිරි-ශඞ්ඛක්ෂීරය; හිමකරලෙස-චන්ද්‍ර යන මොවුන් හා සදෘශවූ; යසවිසර-කීර්ත්‍යාවලියෙන්; දිලි-ජ්වලිතවූ; නිතොර-නිරන්තරයෙන්; වැජඹෙන-විජෘම්භමාණ වන්නාවූද; බුවනෙකබුජතෙරසිමි-භුවනෛකබාහු ස්ථවිර ස්වාමිවූද:-(අනන්තර පද්‍යයෙහි "එයති සඳුන් පවසා ගිය සඳ" යනු හා සම්බන්ධයි.)

**106.** එයතිසඳුන්-තත්යතීන්ද්‍රයන් වහන්සේ; නොයෙක් සක්වළ-අනෙකචක්‍රවාඨයන්හි හෙවත් කෙළ ලක්ෂයක් සක්වළෙහි; සතත-නිරන්තරයෙන්; අණසක-ආඥාචක්‍රය; පැවැති-ප්‍රවෘත්තවූද; ලොවැති-ලොකයෙහි විද්‍යමානවූ; සියලු උවදුරු-සකලොපද්‍රවයන්; දුරලනු-දූරීභූතකරන්නාවූද; පිරිත-(රත්නසූත්‍රාදි) පරිත්‍රාණ ධර්මය; කැමැතිසඟනගෙන-අභිමත සඞ්ඝයා කැඳවාගෙන; සුරිඳු මැදුරත ඉඳ-(විභීෂණ) සුරෙන්ද්‍රයාගේ (එම) භවනයෙහි නිෂණ්ණව; පවසා ගියසඳ-සජ්ඣායනයකොට ගියකල්හි; නැවත-යළිදු (කියයුත්තක් ඇත):—

**107.** රඟුමෙන්-නෘත්‍යයහෙතුකොටගෙන; සුරන්රැස-දෙවසමූහයන්ගේ; සිත්-චිත්තය; මත්කරවමින්-මත්තකරවමින්; සුරපුරෙන්-දිව්‍යපුරයෙන්; බැස-අවතීර්ණව; වෙත්පත්-අභිමුඛයට පැමිණියාවූ; සුරඟනන්මෙන්-අප්සරාවන් පරිද්දෙන්; ගත්ගත්වෙසින්-ගෘහීත වෙශයෙන්; දන-(දර්ශනයකරන) ජනයන්ගේ; නුවන්-නෙත්‍රයන්ට; රස-(නාට්‍ය) රසය; විඳුවා-විඳනයකරවා; වින්දත්-(ගන්ධර්ව විද්‍යාව) ජානනයකළාවූ; නළඟනන්-නාටකාඞ්ගනාවන්, මුළුමුළුව-සමූහ සමූහව; සිට-ස්ථිතව; තොස-සන්තුෂ්ටියෙන් යුක්තව:—

**108.** රාගියදනන්-සරාගජනයන්ගේ; සිත-චිත්තය; උමතුකරන-උන්මත්ත කරන්නාවූ; වෙනවෙනම-වෙන්වෙන්ව; සතිසක්රාගිය-සප්තත්‍රිංශත්ප්‍රභෙදවූ රාගනිඃශ්‍රිතගීතයන්; නඟන-ආරොපණයකරන්නාවූ; වයනනදට-වාද්‍යමාන නාදයට; එක්කොට-ඝටිතකොට; පවසන-ප්‍රකාශකරනු ලබන්නාවූ; ගිය-ගීතයතෙම; අසන-ශ්‍රවණය කරන්නාවූ; සතන්-සත්ත්වයන්ගේ; සවනත-කර්ණයන්හි; අමරසගිය-අමාරසාකාරයි.

**109.** සුරගදඹ-දිව්‍යගන්ධර්වයන්ගේ; මේලම-වාද්‍යොපකරණ විශෙෂයතෙම; මේයයි-මේතෙමේයයි; කියතයුතු-කථනයකළයුතුවූ; බරත සතරරඟටම-භරතශාස්ත්‍රයෙහි ආකාරයටම; හැසලම-සන්නද්ධකොටගෙනම; කළ-කරනලද; මද්දලසුද්දතාලම-මද්දලභෙරිසං

වාද්‍යත නිම්ල තුසිය; නොහැර-පහනොකොට; එසබ-තත්සභාවෙහි; විඨත-(වාද්‍යරසවිශෙෂයෙහි) දක්ෂවූ; ඇමගේ-සකලජනයන්ගේ; තොස-සන්තුෂ්ටිය; එලවාලම-ආවහනයකොටම; වයත වාදනය කරන කල්හි:—

110. සොඳුරුවිදු-සුන්දර විද්‍යාවන් ඇත්තාවූ හෙවත් භරතශාස්ත්‍රය මනාසේ දත්තාවූ; ලිය-කාන්තාවන්; එරඟබිම-තත්ප්‍රකාර නෘත්‍ය මණ්ඩලයෙහි; රඟනරඟ-නෘත්‍යකරන ආකාරයතෙම (කෙසේද?) ගනකුලෙහි - මෙඝකූටයෙක්හි; විදුලිය-විද්‍යුල්ලතාවන්; රඟනරඟ වැන්න නෘත්‍යකරන ආකාරය හා සමය; දන-(නෘත්‍යය දර්ශනය කරන) ජනයන්ගේ; නුවන්-නයනයන්; දහැ-බන්ධකොට; රඟන-නෘත්‍යකරන්නාවූ; රුසිරු-රූප ශ්‍රී ඇත්තාවූ; ඉඳුලිය-(ඉන්ද්‍රයාගේ) උර්වශ්‍යාදි අප්සරාවෝ; ඔවුන-තත්කාන්තාවන්ගේ; රඟ-නෘත්‍යය; නරඹ-නිරීක්ෂණයකොට; රඟනලොබ-(ගමකියවූ) නතීනෙප්සාව; ඉදු-සෘජුව(ම)-(ශෙෂනොකොට); ලිය-බැහැරකළෝය.

111. එරඟමඩල-එම නෘත්‍යමණ්ඩලය; සරතසදියෙනි-ශ්‍රාන්ති ජනිතස්වෙද ජලයෙන්; තෙත්කොට-ආර්ද්‍රභූතකොට; උලැඟිතරඟ-උල්ලඞ්ඝිත තරඞ්ග ඇතිව; ගොසගත්-ඝොෂග්‍රහණයකළාවූ; සයුරක් ලෙසට-සාගරයක් පරිද්දෙන්; සමග-සම්ග්‍රවූ; ගිතරඟ-ගීතය හා නෘත්‍යය; තාලමට-වාදිත්‍රය යනවිට; සරිකොට-සමානකොට; මෙරඟ-මේ ප්‍රකාරයෙන්; නළඟනන්-නාටකාඞ්ගනාවන්; රඟකොට-නෘත්‍යය දක්වා; නැවැතිමර-නිවෘත්තවූ කල්හි:—

## විබිසණ යැදුම

112. මිනිස්වෙසින්-මනුෂ්‍යවෙශයෙන් හෙවත් දසරථ රාජයාහට පුත්‍රරත්නයක්ව; සිට-ස්ථිතව; එකසරකෙසර-එකචාර සිංහයෙක් හා සදෘශවූ; සර-ශ්‍රෙෂ්ඨවූ; එකසරිනි-ඒකම නාදයෙන්; අනත-අනන්තවූ; රකුසුසෙන්-රාක්ෂසසෙනාවන්; බියපත්කර-භීතිප්‍රාප්ත කොට; බුන්-භග්නකළාවූ; දියතපසිඳු-ජගත්ප්‍රථිතවූ; මනරම්-මනොහරවූ; රම්රදුන් විසින්-ශ්‍රීරාම රාජයා විසින්; සිරිලකට-මෙම ශ්‍රී ලඞ්කාද්වීපයට; හිමිකර-ස්වාමිකොට; සුරසෙන්මැද-දෙවසෙනා මධ්‍යයෙහි; අබිසෙස්කළ-අභිෂික්ත කරනු ලැබූද; (එහෙයින්) මෙම සිරිලක-මේ ශ්‍රී ලඞ්කාද්වීපයෙහි; රජසිරි-රාජශ්‍රීය; ලැබ-ලබ්ධව; පෙරදවස-පූර්වකාලයෙහි; නොයෙකලෙස-අනෙකාකාරයෙන්; තම පුදකළ-තමහට පූජාකළාවූ; (අවනතවූ) නිරිඳුන්හට-නරෙන්ද්‍රයන්ට; සතුරන්බිඳ-ශත්‍රුභග්නයකොට; ජයසිරි-විජයශ්‍රීය; දී-දානයකොට; වරින්වර-වාරයෙන් වාරයෙහි හෙවත් නොයෙක් වාරයෙහි; ගම් බිම්-ග්‍රාමභූමිද; ගජ-හස්තිහුද; හසසෙනඟ-අශ්වසෙනාඞ්ගයන්ද; පිරිවර-පරිවාර ජනයන්ද; ලද-ලද්දාවූද; විබිසණ සුරිඳුගේ-විභීෂණ

නම් සුරේන්ද්‍රයාගේ; සිරිපා තඹර-ශ්‍රීමච්චරණාරවින්දද්වය; වැඳ-ප්‍රණාමයකොට; නඳ-සන්තුෂ්ටව; පියකර තෙපුලෙන්-ප්‍රියජනක වචනයෙන්; මෙලෙස-මේ ව්‍යාජ්‍යමාණාකාරයෙන්; සැලකර-විඥාපනය කරන්. (කෙසේද?)

113. සියල් මෙම සිරිලක-මෙම සියලු ලඞ්කාව; සිය සතින්-ස්වීයචඡත්‍රයෙන්; එකසත්කර-එකච්ඡත්‍රකොට; නිතොර-නිරන්තරයෙන්; පියුමම්බා හිමිලෙසට-ශ්‍රී විෂ්ණු දෙවයා පරිද්දෙන්; පසිඳු-ප්‍රසිද්ධවූ; පවර-ප්‍රවරවූ; මෙසිරි පැරකුම්බා නිරිඳුහට-මෙම ශ්‍රී පරාක්‍රමබාහු නරේන්ද්‍රයාණන්ට; රජසිරිසැප සමග-රාජශ්‍රීසම්පත්තිය සමගින්; සුබසත්-ශුභ සෞඛ්‍යය; දී-දානයකොට; දිගාකර-දීර්ඝායුෂකකොට; කලක්-කාලයක් මුලුල්ලෙහි (ම); ලකරජසිරි-ශ්‍රී ලඞ්කා රාජ්‍යශ්‍රිය; යෙහෙන්-මනාකොට; විඳිනලෙස-විඳිනයකරන පරිද්දෙන්; නිදුක් නිරෝගිකර-නිර්දුඃඛ නීරොගීවූවකුකොට; (යලිත්) දිවැස-දිව්‍යචක්ෂුස; යොදමින්-යුක්තකෙරෙමින්; (දිවැසින් බලා යතුයි) මෙතින-කරුණාධ්‍යාශයෙන් යුක්තව; නිතොර-නොරනොව; හැමඋවදුරුම-සකලොපද්‍රවයන්ම; දුරුකොට-දූරීභූතකොට; සතුරු-ශත්‍රුරාජයන් විසින්; කරන-කරනු ලබන්නාවූ; වියවුල්-(අන්තරාය සඞ්ඛ්‍යාත) ව්‍යාකූලයන්; අතුරුදන්කොට-අන්තර්ධානකර; මෙනරනිඳුවෙත-මේ රාජයා කෙරෙහි; සෙත-ශාන්තිය; නිතින-නිත්‍යයෙන්; දියුණුකොට-දවිගුණකොට; රකිනලෙස-රක්ෂාකරන පරිද්දෙන්; විබිසණ සුරිඳුහට-විභීෂණ සුරේන්ද්‍රයන්ට; අයදු-ආයාචනය කළමැන.

114. තමං-තමන්ගේ; මුදුනෙහි-මස්තකයෙහි; තිසරණ-ත්‍රිවිධ රත්න නැමැති; මිණිඅබරණ-මාණික්‍යාභරණය; පැළඳ-පිලන්ධනය කොට; නිසග-නෛසර්ගියවූ; සොමිගුණෙන්-සෞම්‍යගුණය හෙතු කොටගෙන; සුපුන්සඳුන්-පූර්ණචන්ද්‍රයා; පසුකළ-පශ්චාද්භූතකළාවූ; මෙනරනිඳුගේ-මේ පරාක්‍රමරාජයාගේ; අගබිසෝ ළඳුන් සමග-අග්‍රමහිෂිකාව හා සමගින්; මතු-ආයතිකාලයෙහි; රජසිරි ලබන-(ලඞ්කා) රාජශ්‍රී ප්‍රතිලාභය කරන්නාවූද; මනනඳ-මනොනන්දනවූ; මිනුරජ සිරිනි-මනුරාජයාගේ ශොභාවෙන් (යුක්තව සජිතව); ගුණයෙන්-(දයාදාක්ෂිණ්‍යාදි) ගුණයන් හෙතුකොටගෙන; සවිසතන්සිතු-සකල සත්ත්වයන්ගේ චිත්තය; පුබුදුකරන-ප්‍රබුද්ධකරන්නාවූද; සිරින්යුතු-සම්පත්තියෙන් යුක්තවූද; පසිඳු-ප්‍රසිද්ධවූද; රජකුමරුවන් සහ-රාජකුමාරයන් හා සමග; මුනිඳු සසුන්සැදි-සම්බුද්ධ ශාසනයෙන් අලඞ්කෘතවූ; ලක්දිව-(මෙම) ලඞ්කාද්වීපයෙහි; පිරියස-පරිපූර්ණ යසස් ඇත්තාවූ; මැතිඳුවරන් සමගින්-මන්ත්‍රීන්ද්‍රයන් හා සමග; රජ

සෙනඟරැස-රාජසේනා සමූහය; ඇමදවස-සකලදිනයන්හි; පුරුදු සිරිත්-පරිචිත සච්චරිත්‍රයෙන්; තොරනොකරම-වර්ජිතනොනො වම්; නිති රකිනලෙස-නිරන්තරයෙන් රක්‍ෂාකරන පරිද්දෙන්; සුරිඳු සඳුන්-(විභීෂණ) සුරරාජයාට; අයදුව-යාච්ඤාකරන්.

**115.** මෙලෙස-මේ උක්තප්‍රකාරයෙන්; අයැද-ආයාචනයකොට; අවුදින්-ආගමනයකොට; මහවෙහෙරමැද-මහාවිහාර මධ්‍යයෙහි; රුවන්මඩුවේ-රත්නමණ්ඩපයාගේ; සිරස-ශීර්ෂයෙහි; සිතුලෙසින්-සිත්වූ පරිද්දෙන්; ඉඳ-නිෂණ්ණව; සතොසවෙමින්-සන්තුෂ්ට වෙමින්; එවෙහෙරසිරි-තද්විහාරය පිළිබඳ ශොභාවිලාශය; බලන සඳ-නිරීක්‍ෂණය කරන කල්හි; දිවස හමුව-දහවල් කාලය සම්මුඛව; නිසාසඳ-රාත්‍රි නැමැති කාන්තාතොමෝ; ජරපත්වෙසි-ජරාප්‍රාප්ත වන්නීය.

**116.** එතර-තත්ක්‍ෂණයෙහි; ඉඳුරු-සූර්යයාගේ; පැහැ-ප්‍රභාව; පහළවූ බැවිනි-(ආකාශතලයට) ප්‍රාදුර්භූත හෙයින්; සසලබව-(ස්වීය) චඤ්චලභාවය; නොහැර-වර්ජනය නොකොට; අවරතට-අපරදිශාවට; කර-(හස්තලක්‍ෂණ) රශ්මිය; දී-දානයකොට; බට-අවතීර්ණවූ; තුසරකිරණබිඹු-චන්ද්‍ර බිම්බය පිළිබඳවූ; රඟ-ආකාරය; ඇතිරඟින්-විද්‍යමාන විලාසයෙන්; දුට-දර්ශනයකළ කල්හි; මිතුර-මිත්‍රය!; තට-යුෂ්මත්හට; ගැඹුරු-ගම්භීරවූ; තිලකුණු-(අනිත්‍ය දුඃඛ-අනාත්මතා සඞ්ඛ්‍යාත) ත්‍රිලක්‍ෂණය; සිහිවේ-ස්මරණය වන්නේය

**117.** සයුර-සාගරයෙහි; සුලබ-සුලභවූ; රත්මිණි කිරණ-රත්නමාණික්‍යයන්ගේ කාන්තිස්කන්ධය; රැස්කොට-රාශිකෘතකොට; වළබ නලෙන්-වඩබාග්නියෙන්; විතරට-(යොග්‍ය) ප්‍රමාණයට; පැසවා-පචනයකොට හෙවත් උණුකර; රැගෙන-ග්‍රහණයකොට; එපබ-තත්ප්‍රභාව; ගාලා-ආලිප්තකොට; ගනරතට-ඝනරක්ත වර්ණය (කිරීම) පිණිසද; සැදුවාමෙන්-සජ්ජිත කළාසේ (වූ); දිනිඳුරැස්-සූර්යරශ්මිය; පෙරඹරට-පූර්වාකාශයට; එනරඟ-ආගමනය කරන ආකාරය; නරඹ-නිරීක්‍ෂණය කර.

**118.** සිසි-චන්ද්‍රලක්‍ෂණවූ; සස්කර-ශස්‍යකාරයා හෙවත් ගොවියා; අහස්කෙත-ආකාශ ලක්‍ෂණ ක්‍ෂෙත්‍රයෙහි; පැල-(තාරකා ලක්‍ෂණ) අඞ්කුරයන්; හිඳුවන-රොපනය කරන කල්හි; (යළිත්) මිණිමුතුවන-ප්‍රබුද්ධවන්නාවූ; කොඳවනන-කුමුදවනාභ්‍යන්තරයන්; සපු-ෂට්පදී සමූහයා කරණකොටගෙන; දුලවන-ජ්වලමාන කල්හි; (තවද) ගිරි-පර්වත ලක්‍ෂණවූ; රඟන-නෘත්‍යභූම්‍යභ්‍යන්තරයෙහි; තිලකර-මයුර සමූහයා; තුඟු පැහැයෙන්-උත්තුඞ්ග ප්‍රභාවෙන් යුක්තව; වන-වන කල්හි; (නැවතද) දසසතකර-සූර්යයා; කර-(ස්වීය) රශ්මිය කරණකොටගෙන; දිගන-දිගාන්තයන්; උණුකරවන-උෂ්ණකරවන කල්හි;

# මාර්ග වර්ණනා

119. නොමඳ - අමන්‍දවූ; හියද - හිතාභිසාධකවූ; මුනිඳු - සර්‍වඥ ධාතූන්ගෙන්; රැඳි - රඤ්ජිතවූ; දාගැබද-ධාතු ගර්‍භය හා; ඇමද-(චෛත්‍යාඞ්ගන විහාරාඞ්ගන) සම්මාර්ජනයකොට; නැමඳ-අභිවන්‍දනය කොට; සිටි-ස්ථිතවූ; සිල්වත්-ශීලවත්වූ; සඟ ගණද-සඞ්ඝ සමූහයාද; විහිද-විසුරුණාවූ; පබද-ශාඛා ප්‍රබන්ධයෙන්; පිරි-සම්පූර්ණවූ; සිරි මා බෝතුරද-ශ්‍රී මහා බොධිද්‍රැම රාජයාද; පැහැද-චිත්ත ප්‍රසාදයෙන් යුක්තව; නැමඳ-ප්‍රණාමය කොට; සබඳ-! මිත්‍රය!; එපුරෙන්-එම කල්‍යාණී පුරයෙන්; යාගන්-යාත්‍රා ග්‍රහණයකරන්.

120. එදා-තත්දිනයෙහි; දාගැබින්-ධාතු ගර්භයෙන් (නිස්ක්‍රාන්තව) යන-ගමන් ගත්තාවූ; රැස් කඳක් ලෙස-රශ්මි ස්කන්ධයක් පරිද්දෙන්; අහස්කුස-ආකාශ කුක්ෂියෙහි; පියා යුග විදා-පද්මයුග්ම ප්‍රසාරණය කොට; යන-ප්‍රයාණය කරන්නාවූ; තොප-යුෂ්මත්හු; ගං දෙපස-(කල්‍යාණී) නදී උභය පාර්ශ්වයෙහි;රඳාගිය-රඳවා තබන ලද්දාවූ; වලාකුළෙස්-(නීල) වලාහක කූටයන් පරිද්දෙන්; සොඳා-මනාගේ; දුලන-ජ්වලමානවූ; දකුණුපස-දක්ෂිණ පාර්ශ්වයෙහිවූ; පොල්වතු-නාලිකෙර වස්තූන්; දකු නිරීක්ෂණය කර.

121. තමන් ලෙස-තමාගේ ආකාරයට; තලින්-වාද්‍යවිශෙෂය කරණකොටගෙන; ලියගී-ලයාන්විත ගීතයන්; ගත් මිත්-ගෘහීත ප්‍රමාණය ඇති; ලිය-කාන්තාවන්ද; නෙත්සිත් සතුටුකර-චිත්ත නෙත්‍රයන් සන්තුෂ්ටකොට; කෙළි-ක්‍රීඩාකරන්නාවූ; කුමරියන් රැස-කුමාරිකාවන් සමූහයද; ගව මී රැළින්-ගව මහිෂ සමූහයන්; පොරට බැස-පොර ඇනීම පිණිස අවතීර්ණව; වෙත්පත්-සම්පව පැමිණෙන ලද්දාවූ; තැන්-ස්ථානද; කෙත්වත්-ක්ෂෙත්‍ර වස්තූද; ගම්බිම්-ග්‍රාම භූමින්ද; වම්පස-වාමපාර්ශ්වයෙහි; බලව-නිරීක්ෂණය කරන්.

122. එකට ඇමුණුවමෙන්-එක්කොට අමුණන ලද්දක් මැනිව; කෙත්-ක්ෂෙත්‍රද; වත්-ගෘහවස්තූද; වතුපිටි-(පුෂ්පාරාම ඵලාරාම සංඛ්‍යාත) වාස්තු සමූහයද; මඳකුත්-ස්වල්පයකුත්; අතුරක් නොකොට-අතර නොදක්වා; පිරුණුව-පරිපූර්ණව; සිටි-ස්ථිතිවූ; සුරඟන රඟට-අප්සරාවන්ගේ ආකාරයෙන්; අඟනන්-කාන්තාවන්; තුරුණුව-තරුණ භාවයෙන් යුක්තව; දිසි-දෘශ්‍යමානවූද; පමුණුව-පමුණුව නම්වූ ග්‍රාමය; දුක-දර්ශනයකොට; තගේ-යුෂ්මත්හුගේ; සිතට-චිත්තයට; තොස-සන්තුෂ්ටිය; පමුණුව-ප්‍රාප්තකරන්.

123. තුරඟ-අසුන් හා; ගජ-හස්තින්ට; නැගී-ආරූඪව; එමග-ඒ මාර්ගයෙහි; යන එන-ගමනාගමනය කරන්නාවූ; නිස්සෙය්‍ය-(ප්‍රමාණික) ජනශ්‍රෙය්‍ය; සමඟ-එක්ව; හෙවත් කැටිව; බර-(ද්‍රව්‍ය) භාරයන්; උසුලා-උද්වහනය කොට; (සලිත්) යන-ප්‍රයාණය කරන්නාවූ; දැසි දස්සෙය්‍ය-දැසි දැසයෝය; (තවද) සිතඟ-සිත්වූ නියායෙන්; දෙතුන් වෙත-ධෙනූන් සමීපයෙහි; (සිට) කෙළි-ක්‍රීඩා කරන්නාවූ; වැසි වස්සෙය්‍ය-වැස්සියන් හා වස්සෝය; (එසේම) තැනින් තැන-ස්ථානයෙන් ස්ථානයෙහි; සිටි-ස්ථිතවූ; රට වැස්සෙය්‍ය-රාෂ්ට්‍ර වාසීහුය.

**124.** දෙළු දෙළු-දෙළුක් දෙළුක් පාසා; පබලු-මහත්වූ; දළ-දංෂ්ට්‍රාවන්; පළකළ-ප්‍රකාශකළාවූ; (මහත්වූ දංෂ්ට්‍රාවන්ගෙන් දෘශ්‍යමානවූ සතුසි); ඌරුමුලු-ශූකර සමූහයන්ගේද; පලපල-තන්හි තන්හි; පොර ඇනයන-සටන් කෙරෙමින් යන්නාවූ; මුව-මෘගයෝය මී-මහිෂයෝය; ගවර-ගවය යන මොවුන්ගේ; රැළ-සමූහගේද; දළ දළ-දංෂ්ට්‍රා පඞ්ක්තිය කරණකොටගෙන; උදුල-උජ්වලිත වන්නාවූ; මොළ-චණ්ඩවූ; ගජ රළ-හස්ති සමූහයාගේද; කෙළි-ක්‍රීඩාවෙන්; වතළ-ව්‍යාප්තවූද; ලෙල-ලීලෝපෙතවූද; පුවළ-ප්‍රෞඪවූද; (ඝනතර වූද); නැබළ-විශාලවූද; පෙරමග-පටි පථයෙහිවූ; වනගළ-වනඝටාව; බලු-අවලෝකනය කරන්.

## වන වර්ණනාවක්

**125.** මිහිලොල්-(පුෂ්ප) මධුරසයෙහි ලොලවූ; බිඟු සරැය-භෘඞ්ගයන්ගේ නාදයෙන් යුක්තවූ; වනසරැය-වන තඩාගයන් ගෙන්ද; සිරැය-මස්තකයෙහි; වැද-සච්චිතව; ඉසිරැය-විස්තීර්ණවූ; ගඟුලැල්-ගඞ්ගානිර්ඣරයන් ඇත්තාවූ; ගිරි-පර්වතයන් ගෙන්ද; පිපිමල්-පුෂ්පිත පුෂ්ප ඇත්තාවූ; සපුතුරැය-චම්පක වෘක්ෂයන් ගෙන්ද; විසිතුරැය-සවලඞ්කෘතවූ; වන-තත්වනයෙහි (වූ); තුල්-මහත්වූ; සිරිකෙරැය-සොභාවිලාසය කෙරෙහි; ලොබ-දර්ශනාභිලාෂය; කෙරැය-(දර්ශනයකරන සත්වතෙම) කරන්නේය; හෙවත් උපදවන්නේය.

**126.** ගිරිනිල්මල් රඟාය-ගිරි කර්ණිකාපුෂ්පාකාරවූද; පිල්-පිච්ඡයන්; නඟාය-උද්ගතකොට; මනරඟාය-චිත්තාභිලාෂවූ; සෙබඩුන්-මයුරධෙනුන්; ළඟාසකර-ආසන්න කොටගෙන; ගිරිරඟාය-පර්වතයන්හිවූ නෘත්‍යස්ථානයන්හි; රිවිදෙව්හට-සූර්යදිව්‍ය රාජයාහට; රඟාය-නෘත්‍යය දක්වා; සිපි-අවස්ථිතවූ; මොනරුන්-මයුරයන්; වන මඟාය-වන මාර්ගයෙහිදී; මගාය-නිරීක්ෂණය කොට (යලිත්)

**127.** කිරිලෙස-ක්ෂීරාකාරයෙන්; සමතලාය-සමප්‍රදෙශ ඇත්තාවූ; වැලිතලාය-වාලුකාස්ථලයෙහි; සුවඳැති-සුගන්ධ යුක්තවූ; වනමලාය-(ජාතිසුමන) ආදී වනජ පුෂ්පමයවූ; මලාය-මාලාදාමයන්ගෙන්; සැදී-සජ්ජිතව; එන-ආගමනය කරන්නාවූ; මනකලාය-මනඃ කාන්තවූ; වනසර කලාය-වනචර කාන්තාවන්; දැක-දර්ශනයකොට; නෙත් ලත් පලාය-නෙත්‍ර ප්‍රතිලාභ ඵලය; ලැබ-ලබ්ධව; පලාය-පලායව.

**128.** පැතිරෙන-ව්‍යාප්තවන්නාවූ; ගඟුලැල්-නිර්ඣර නැමැති; ලෙල-ලීලායුක්තවූ; උතුරුසළු-උත්තරීය සාටකයන්; ඉසිලී-උද්වහනය කළාවූද; කසුමල්-කාශපුෂ්ප හා; හෙල්මැලි-කල්හාර පුෂ්ප නැමැති; මිණි බරණින්-මාණික්‍යාභරණයෙන්; දිලි-ජ්වලිතවූද; රණහසවැල-ස්වර්ණ හංසාවලී නැමැති; මිණිමෙවුලී-මණිමෙඛලාදාමය; උකුලී-ශ්‍රෝණී තලයෙහි; බඳ-බන්ධනය කළාවූද; බලී-මහත්වූද; වනසිරි-වනතඩාගය තෙම; සැදී-(උත්තරීය මාණික්‍යාභරණ, මණිමෙඛලා යන මෙයින්) සජ්ජිතවූ; විලසක ලෙස-විලාසිනියක මෙන්; බලු-නිරීක්ෂණය කරන්.

129. නිසා - නිශාභාගයෙහි; සඳකැන් මෙන් – චන්ද්‍ර කාන්තීන් පරිද්දෙන්; එන-පතිත වන්නාවූ; ගඟුලැලි-නිර්ඣරයන්; නිසා-ආශ්‍රිතව; ගිලි-ගලිතවූ; මල්රොන්-පුෂ්පරේණු සමූහයෙන්; වසායන-ජනනකරන ලදුව; වස-ගැවසුනාවූ; නිල්මිණි-නීල මාණික්‍යයන්ද; වනවිල්-වන තඩාගයන්හි; රැව්දෙන-රාවදානය කරන්නාවූ; සුවහස-සහස්‍ර සඞ්ඛ්‍යාතවූ; සුව-ගිරවුන් හා; හස-හංසයන්ද; එවනෙහි-තත් වනයෙහිවූ; මඟඅස-මාර්ග ආසන්නයෙහිදී; දක-නිරීක්ෂණය කොට; අස අසා-(ඔවුන්ගේ රාවයද) ශ්‍රවණය කෙරෙමින්; යව-ගමනය කරන්.

130. වුවන-වක්ත්‍රයෙන්; කමල්-පද්මයන්ගේද; ගතා-දෙහ(ශ්‍රී)යෙන්; රණලිය-ස්වර්ණලතාවන්ගේද; සිරි-සොභා විලාසය; ගතා-ග්‍රහණය කළාවූ; (යලිත්) අඩසඳ-අර්ධචන්ද්‍රාකාරවූ; නලළතා-ලලාට තලයෙහි; බඳ-බන්ධනයකරනලද; මල්-(රක්තවර්ණ) පුෂ්පදාම සහිත; මුතුලතා-(ගජ) මුක්තාලතිකාවන් (සහිත) ඇත්තාවූ; වියොවිග යුද-අනඞ්ග යුද්ධය; පතා-ප්‍රාර්ථනාකොට; නිතිපතා-සෑම දවස්හි; ඇවිදින-සඤ්චාරණය කරන්නාවූ; වනසර කතා-ව්‍යාධාඞ්ගනාවන්; දක-දර්ශනයකොට; පිය-ප්‍රියවූ; රස කතා- රසවත් කථාවන්; අස-(ඔවුන් වෙතින්) ශ්‍රවණය කරන්.

131. දුටුවන්-දර්ශනයකළවුන්ගේ; මන-චිත්තය; දඟාකරවන-බද්ධකරන්නාවූ; දඟයුග-ජඞ්ඝායුගලයක් ඇත්තාවූ; සිරිවස-ශ්‍රීවත්සය පිළිබඳවූ; සිරි-ශොභා විලාසයට; නිගාකළ-නිග්‍රහකළාවූ; ලෙල-ලීලොපෙතවූ; සිහින් ඉඟ-කෘශ මධ්‍ය ප්‍රදෙශ ඇත්තාවූද; නිති-අනවරතයෙන්; තමහිමි ළඟා-තමන්ගේ වල්ලභයන් සමීපයෙහි; යන එන-ගමනාගමනය කරන්නාවූ; කොමළඟා-කොමලාඞ්ගීන්ගේ; රුසිරි-රූපශ්‍රිය; මඟමඟා-නිරීක්ෂණය කොට කොට; එවනමඟා-තද්වන මාර්ගයෙහි; වඩින-ප්‍රයාණය කරන්.

132 නිතියෙන-නිත්‍යයෙන්; සවන-ශ්‍රවණයද; නුවන-නයනයන්ද; සතුටුකරවන-සන්තුෂ්ට කරවන්නාවූ; රවන-නාද කරන්නාවූද; බමන භ්‍රමණය කරන්නාවූද; බිඟු-භෘඞ්ගයන් හා; පිල්බරද-මයුරයන් හා; පරපුටු-කොකිලයන් ඇති; ගිමන-ඝර්මයද; නිවන-නිවාරණය කරන්නාවූ; සිහිලැලි-ශීතල ජලවත්වූ; වැලිතල-වාලුකා ස්ථලයන්; පිහිටු-ප්‍රතිෂ්ඨිතවූ; එවන-තත් වනයතෙම; ඉටු-ප්‍රියකරවූ; දෙවන හිම වනයක් වැනිය-ද්විතීය හිමාලයක් වැන්නේය.

133. මඟ-(ඔබ ප්‍රයාණය කරන) මාර්ගයාගේ; අස-ආසන්නවූ; වනේ-වනයෙහි; මලිනේ-පුෂ්පයන් කරණකොටගෙන; මලිනේ නොව-ආක්ලිෂ්ටව හෙවත් ශොභනාකාරයෙන්; දිලිහෙන-ජ්වල

124. දෙළ දෙළ-දෙළක් දෙළක් පාසා; පබල-මහත්වූ; දළ-දංෂ්ට්‍රාවන්; පළකළ-ප්‍රකාශකළාවූ; (මහත්වූ දංෂ්ට්‍රාවන්ගෙන් දෘශ්‍යමානවූ සතුයි); ඌරුමුලු-ශූකර සමූහයන්ගේද; පලපල-තන්හි තන්හි; පොර ඇනයන-සටන් කොරෙමින් යන්නාවූ; මූව-මෘගයෝය මී-මහිෂයෝය; ගවර-ගවය යන මොවුන්ගේ; රැළ-සමූහයේද; දළ දළ-දංෂ්ට්‍රා පඞ්ක්තිය කරණකොටගෙන; උදුල-උජ්වලිත වන්නාවූ; මොළ-චණ්ඩවූ; ගජ රළ-හස්ති සමූහයාගේද; කෙළි-ක්‍රීඩාවෙන්; වතළ-ව්‍යාප්තවූද; ලෙල-ලීලොපෙතවූද; පුවළ-ප්‍රෞඪවූද; (ඝනතර වූද); නැබළ-විශාලවූද; පෙරමග-පටි පථයෙහිවූ; වනගළ-වනඝටාව; බල-අවලොකනය කරත්.

## වන වර්ණනාවක්

125. මීහිලොල්-(පුෂ්ප) මධුරසයෙහි ලොලවූ; බිඟු සරෙර්ය-භෘඞගයන්ගේ නාදයෙන් යුක්තවූ; වනසරෙර්ය-වන තඩාගයන් ගෙන්ද; සිරෙර්ය-මස්තකයෙහි; වැද-සව්විතව; ඉසිරෙර්ය-විස්තීර්ණවූ; ගඟුලැල්-ගඞගාන්ර්ඣරයන් ඇත්තාවූ; ගිරි-පර්වතයන් ගෙන්ද; පිපිමල්-පුෂ්පිත පුෂ්ප ඇත්තාවූ; සපුතුරෙර්ය-චම්පක වෘක්ෂයන් ගෙන්ද; විසිතුරෙර්ය-සවලඞකෘතවූ; වන-තත්වනයෙහි (වූ); තුල්-මහත්වූ; සිරිකෙරෙර්ය-සොභාවිලාසය කෙරෙහි; ලොබ-දර්ශනාභිලාෂය; කෙරෙර්ය-(දර්ශනයකරන සත්වතෙම) කරන්නේය; හෙවත් උපදවන්නේය.

126. ගිරිනිල්මල් රඟාය-ගිරි කර්ණිකාපුෂ්පාකාරවූද; පිල්-පිච්ඡයන්; නඟාය-උද්ගතකොට; මනරඟාය-චිත්තාභිලාෂවූ; සෙබඩුන්-මයුරධෙනුන්; ළඟාසකර-ආසන්න කොටගෙන; ගිරිරඟාය-පර්වතයන්හිවූ නෘත්‍යස්ථානයන්හි; රිවිදෙව්හට-සූර්ය්‍ය රාජයාහට; රඟාය-නෘත්‍යය දක්වා; සිවී-අවසර්පිතවූ; මොනරුන්-මයුරයන්; වන මඟාය-වන මාර්ගයෙහිදී; මගාය-නිරීක්ෂණය කොට (යලිත්)

127. කිරිලෙස-ක්ෂීරාකාරයෙන්; සමතලාය-සමප්‍රදෙශ ඇත්තාවූ; වැලිතලාය-වාලුකාස්ථලයෙහි; සුවඳැති-සුගන්ධ යුක්තවූ; වනමලාය-(ජාතිසුමන) ආදී වනජ පුෂ්පමයවූ; මලාය-මාලාදාමයන්ගෙන්; සැදී-සජ්ජිතව; එන-ආගමනය කරන්නාවූ; මනකලාය-මනඃ කාන්තවූ; වනසර කලාය-වනචර කාන්තාවන්; දැක-දර්ශනයකොට; නෙත් ලත් පලාය-නෙත්‍ර ප්‍රතිලාභ ඵලය; ලැබ-ලබ්ධව; පලාය-පලායව.

128. පැතිරෙන-ව්‍යාප්තවන්නාවූ; ගඟුලැල්-නිර්ඣර නැමැති; ලෙල-ලීලායුක්තවූ; උතුරුසළු-උත්තරීය සාටකයන්; ඉසිලී-උද්වහනය කළාවූද; කසුමල්-කාශපුෂ්ප හා; හෙල්මැලි-කල්හාර පුෂ්ප නැමැති; මිණි බරණින්-මාණික්‍යාභරණයෙන්; දිලි-ජ්වලිතවූද; රණහසවැල-ස්වර්ණ හංසාවලී නැමැති; මිණිමෙවුලී-මණිමෙඛලා දාමය; උකුලී-ශ්‍රොණී තලයෙහි; බඳ බන්ධනය කළාවූද; බලී-මහත් වූද; වනසිරි-වනතඩාගය තෙම; සැදී-(උත්තරීය මාණික්‍යාභරණ, මණිමෙඛලා යන මෙයින්) සජ්ජිතවූ; විලසක ලෙස-විලාසිනියක මෙන්; බල-නිරීක්ෂණය කරත්.

129. නිසා-නිශාභාගයෙහි; සඳකැන් මෙන්-චන්ද්‍ර කාන්තීන් පරිද්දෙන්; එන-පතිත වන්නාවූ; ගඟුලැලි-නිර්ඣරයන්; නිසා-ආශ්‍රිතව; ගිලි-ගලිතවූ; මල්රොන්-පුෂ්පරේණු සමූහයෙන්; වසායන-ජනනකරන ලදුව; වස-ගැවසුනාවූ; නිල්මිණි-නීල මාණික්‍යයන්ද; වනවිල්-වන තඩාගයන්හි; රැව්දෙන-රාවදානය කරන්නාවූ; සුවහස-සහස්‍ර සඞ්ඛ්‍යාතවූ; සුව-ගිරවුන් හා; හස-හංසයන්ද; එවනෙහි-තත් වනයෙහිවූ; මඟඅස-මාර්ග ආසන්නයෙහිදී; දක-නිරීක්ෂණය කොට; අස අසා-(ඔවුන්ගේ රාවයද) ශ්‍රවණය කෙරෙමින්; යව-ගමනය කරන්.

130. වුවන-වක්ත්‍රයෙන්; කමල්-පද්මයන්ගේද; ගතා-දෙහ(ශ්‍රී)යෙන්; රණලිය-ස්වර්ණලතාවන්ගේද; සිරි-සොභා විලාසය; ගතා-ග්‍රහණය කළාවූ; (යලිත්) අඩසඳ-අර්ධචන්ද්‍රාකාරවූ; නලළතා-ලලාට තලයෙහි; බඳ-බන්ධනයකරනලද; මල්-(රක්තවර්ණ) පුෂ්පදාම සහිත; මුතුලතා-(ගජ) මුක්තාලතිකාවන් (සහිත) ඇත්තාවූ; වියොවිග යුද-අනර්ඝ යුද්ධය; පතා-ප්‍රාර්ථනාකොට; නිතිපතා-සැම දවස්හි; ඇවිදින-සඤ්චාරණය කරන්නාවූ; වනසර කතා-ව්‍යාධාඞ්ගනාවන්; දක-දර්ශනයකොට; පිය-ප්‍රියවූ; රස කතා- රසවත් කථාවන්; අස-(ඔවුන් වෙතින්) ශ්‍රවණය කරන්.

131. දුටුවන්-දර්ශනයකළවුන්ගේ; මන-චිත්තය; දහාකරවන-බද්ධකරන්නාවූ; දහයුග-ජඞ්ඝායුගලයක් ඇත්තාවූ; සිරිවස-ශ්‍රීවත්සය පිළිබඳවූ; සිරි-ශොභා විලාසයට; නිගාකළ-නිග්‍රහකළාවූ; ලෙල-ලීලොපෙතවූ; සිහින් ඉන-කෘශ මධ්‍ය ප්‍රදෙශ ඇත්තාවූද; නිති-අනවරතයෙන්; තමහිමි ළඟා-තමන්ගේ වල්ලභයන් සමීප යෙහි; යන එන-ගමනාගමනය කරන්නාවූ; කොමළඟා-කොමලාඞ්ගීන්ගේ; රූසිරි-රූපශ්‍රිය; මඟමඟා-නිරීක්ෂණය කොට කොට; එවනමඟා-තද්වන මාර්ගයෙහි; වඩින-ප්‍රයාණය කරන්.

132 නිතියෙන-නිත්‍යයෙන්; සවන-ශ්‍රවණයද; නුවන-නයන යන්ද; සතුටුකරවන-සන්තුෂ්ට කරවන්නාවූ; රවන-නාද කරන්නාවූද; බමන භ්‍රමණය කරන්නාවූද; බිඟු-භෘඞ්ගයන් හා; පිල්බරද-මයූරයන් හා; පරපුටු-කොකිලයන් ඇති; ගිමන-ඝර්මයද; නිවන-නිවාරණය කරන්නාවූ; සිහිලැලි-ශීතල ජලවත්වූ; වැලිතල-වාලුකා සථලයන්; පිහිටු-ප්‍රතිෂ්ඨිතවූ; එවන-තත් වනයතෙම; ඉටු-ප්‍රියතරවූ; දෙවන හිම වනයක් වැනිය-ද්විතීය හිමාලයක් වැන්නේය.

133. මඟ-(ඔබ ප්‍රයාණය කරන) මාර්ගයාගේ; අස-ආසන්නවූ; වනේ-වනයෙහි; මලිනේ-පුෂ්පයන් කරණකොටගෙන; මලිනේ නොව-අක්ලිෂ්ටව කෙවත් ශොභනාකාරයෙන්; දිලිහෙන-ජ්වල

මානවූ; තුරු-වෘක්ෂයන්හි; බිඟු-භෘඞ්ගයන්ගේ; රැව්-රාවය; සවනේ හෙත-(ඔබගේ) ශ්‍රවණයෙහි පතිතවන කල්හිද; අඹකැන්-ආම්‍රඵල මඤ්ජරීන්; මුව්නේ-මුඛයෙන්; ගත්-ග්‍රහණය කළාවූ; විලිමුව්නේ-වලිමුඛයන්; දුටු ගමනේ-දර්ශනයකළ කල්හිද; යන ගමනේ-යන්නාවූ ගමනෙහි; දුක් නොදනෙයි-දුඃඛ ජානනයක් නොවේ.

**134.** තම තම-ස්වකීය ස්වකීයවූ; සැකබිය-සඞ්කාභීතිය; (ඔවුනොවුන්ගේ ස්වාභාවික චපල භාවය); හැර-දුරලා; යන-ගමන්ගත්තාවූ; වඳුරු-වානරයන්ගෙන්ද; මන-(දුටුවන්ගේ) චිත්තය; මත්කර වන-මත්තකරවන්නාවූ; වනසර සොඳුරු-වනචර කාන්තාවන්ගෙන්ද; තමගන-ගාඪාන්ධකාරයට; බවන-ස්ථානය; අඟවන-ප්‍රකාශකරන්නාවූ; ගිරිදූදුරු-පර්වත ජර්ජරයන්ගෙන්ද; මනනඳ-මනොනන්දනය කරන්නාවූ; සොඳුරු වනගල-මනොඥවනඝටය; දක-අවලොකනය කොට; යව-ප්‍රයාණය කරන්.

**135.** හස!-හංසය!; ගුවනේ-ආකාශයෙහි; ගොසකර-නාදකොට; අස-(යුෂ්මත්හට) සමීපව; යන එන-යාම් ඊම් කරන්නාවූ; කොකවකපක්ෂීන්ගේ; සර-නාද විශෙෂය; සකසව-සකස්කොට හෙවත් නොරැවටෙන පරිද්දෙන්; සවනේ-ශ්‍රවණය කිරීමෙන්; දනගන-ජානනය කොටගෙන; (ඔවුන්ගේ ශබ්දයෙන් හංසයෝයයි නොරැවටී ශබ්ද විශෙෂය තේරුම්ගෙන යයි සේයි) (යලිත්) සැකනොව-නිඃසඞ්කිතව; බැස-අවතීර්ණව; වනහරහන-වනප්‍රදෙශය අලඞ්කෘත කරන්නාවූද; මන-(දුටුවන්ගේ) චිත්තය; තොස කරවන-සන්තුෂ්ට කරවන්නාවූද; මුවනේ-මෘගයන්; දක-දර්ශනයකොට; එවනේ-තත් වනයෙහි; යව-ප්‍රයාණය කරන්.

**136.** පෙර-පූර්වකාලයෙහි; ඉඳු-ශක්‍රයා විසින්; ගිරි-පර්වතයන්ගේ; පිය-පක්ෂපත්‍රයන්; සුන් විසින්-ඡින්නකළ හෙයින්; ගොසින්-ගමනය කොට; තැන තැන-තන්හි තන්හි; ගිරිබෙඳ-පර්වත කටකයන්හි; හී-පතිතව; නොමින්-බොහෝසෙයින්; ලෙලදෙන-ලීලා දානය කරන්නාවූ; පියපත් ලෙසින්-පක්ෂපත්‍රව්‍යාජයෙන්; වන කෙහෙල් වන-වනකදලි වනයන්; වනහිසින්-වනමස්තකයෙන්; බල-නිරීක්ෂණය කරන්.

**137.** ගන-මෙඝයෙන්; ගන-සාන්ද්‍රවූ; ගුවන්-ගගන තලයෙහි; විදුලිවන්-විද්‍යුත්සෙයින්; මෙවන්-මේ උක්තාකාරවූ; වනගැබ-වන ගර්භයෙහි; පැන-පතිතව; යන එනුවන්-යාම් ඊම් කරන්නාවූද; දිගු පුළුලුවන්-දීර්ඝ පෘථුලතා යුක්තවන්නාවූ; ගනනිල්-ඝන නීල(වර්ණ)වූ; නුවන්-නෙත්‍ර යුග්ම ඇත්තාවූද; වන මුවන්-වනමෘගයන්; නුවන් තුටුකර-(ඔබගේ) නෙත්‍ර ප්‍රීණනය කොට; බල-නිරීක්ෂණය කරන්.

188. දිලි-ජ්වලිතවූ; පියුමරාමිණි-පද්මරාග මාණික්‍යයන්සේ; පැහැසරා-ප්‍රභාස්වරවූ; හෙවත් අත්‍යන්තයෙන් භ්‍රාජමානවූ; තම තුඩිනි; ස්වීය චංචුයෙන්; අඹ-ආම්‍රඵලයන්; ඉරා-විදාරණය කොට; රස-(තදීය) රසය; උරා-චූෂණය කොට; (යලිත්) ඉඳු දුනුපුරා-ඉන්ද්‍ර ධනු සෙයින්; නිලඹර-නීලාකාශයට; අරා-ආරූඪව; යන-පියාඹන්නාවූ; ගිරාපෙල-කීරපක්ෂි පඞ්ක්තිය; සිතපුරා-සිත්වූ පරිද්දෙන්; බල-නිරීක්ෂණය කරන්.

139. බිඟුදැල්-භෘඞ්ගාවලීන් විසින්; පිහිකුළු-ප්‍රතිච්ඡන්නවූ; මද පොද - මද ජලබින්දූන්; හෙළා - පතිතකොට; තුරුපෙළ - වෘක්ෂ පඞ්ක්තිය; තළා-මර්දනය කෙරෙමින්; ගිරිකුළු ලෙස-පර්වත කූටාකාරයෙන්; යන-ප්‍රයාණය කරන්නාවූ; ගජමුළු-හස්ති සමූහයන්; වනගලා-වනඝටයෙහි; තැන තැන-තත්හි තත්හි; දක-දර්ශනය කොට; ගන කුළුයයි-(මේ) මෙඝකූටයෝ වෙතියි; මුළානොව-මූඪනොවන්.

140. විල්තෙර - තඩාග තීරයන්හි (සපිතව); සියලඟේ-සකල ශරීරයෙහි; ගන-මේඝවර්ණවත්වූ, හෙවත් කෘෂ්ණවර්ණවූ; බොල්මඩ-බහල කර්දමයන්; තවරා-ආලිප්තකොට; තද-ඝනබද්ධවූ; මුල්-වෘක්ෂ මූලයන්; බිඳ-භග්නකොට; අඟේ-ශෘඞ්ගයන්; ඇන-(එහි) අනිමින්; උල්කර-තීක්ෂණ කොට (ගෙන) ළඟේ-සමීපයට; වැද-ප්‍රවිෂ්ටව; උතුනට-අන්‍යොන්‍යයන්ට; පිළිමල්වන-ප්‍රතිමල්ලවන්නාවූ, හෙවත් ප්‍රතිවිරුද්ධව ප්‍රහාර දානය කරන්නාවූ; වන මීවුන්-වන්‍ය මහිෂයන්ගේ; රඟේ-ආකාරය; බල-නිරීක්ෂණය කරන්.

141. සුබා-ශොභනවූ; ගිනි සිළු ලෙස-වහ්නිශිඛා පරිද්දෙන්; දිලෙන-ජ්වලවත්වූද; උතුන්-අන්‍යොන්‍යයන්; අඹා-පලවමින්; වන ගැබ-වනගර්භයෙහි; යනෙන-ගමනාගමනය කරන්නාවූද; දුටු දුටුවන්-දර්ශනය කළ කළ වුන්ගේ; ලොබා-දර්ශනාභිලාෂය; වඩන-වර්ධනය කරන්නාවූද; සුබා-දර්ශනීයවූද; සැවුලන්-(වන්‍ය) කුක්කුට පක්ෂීන්; දක-නිරීක්ෂණය කොට; වඩන-ප්‍රයාණය කරන්.

142. විසිර-විස්තීර්ණව; දිලිහෙන-ජ්වලමානවූ; ගඟුලැලි-නිර්ඣර යන්ද; තඹරරෙණ්-තාමරස රේණුවෙන්; අවුල-ආකූලවූ හෙවත් ගහනවූ; වනවිලි-වන තඩාගයන්ද; පලරස-රසවත් ඵලයන්ගෙන්; නිතොර-අතරක් නැත්තාවූ; තුරුවැලි-වෘක්ෂලතාවන් හා; වනමලි-වන්‍ය පුෂ්පයන්ද; දක-දර්ශනය කොට; මිතුර-මිත්‍රය! යව-යාත්‍රාකරන්.

143. සුණුවමින්-සුධා කර්මයෙන්වූ; සිරි-ධවල ශොභාව; ගෙන-ග්‍රහණය කොට; උසුලා-උද්වහනය කරන්නාක් වැනිවූ; කිරිවලා-ධවල වලාහකයන්; රැඳි-රඤ්ජිතවූ; ගුවන්තල-ගගන තලයෙහිවූ; වන හිසින්-වන මස්තකයෙන්; මඳ පවනලා-මන්ද මාරුතය කරණ කොටගෙන; එන-එන්නාවූ; පහන්-ප්‍රාසාද ජනකවූ; ලොඳරෙණ්-ලොධ්‍ර පුෂ්පයන්ගේ රේණූන්; බලා-නිරීක්ෂණයකොට;

144. දිලි-ජ්වලිතවූ; ගඟුල් හැලි-නිර්ඣරයන් නැමැති; ඔසරි-උත්තරීය ශාටකය; ලා-(ඇඟයෙහි) බහාගෙන; සැදි-සජ්ජිතවූ; නිමල්-නිර්මලවූ; වනසිරි-වන ලක්ෂ්මී නැමැති; කලා-කාන්තාවන් විසින්; ඇඳි-ආච්ඡාදිතවූ; දුහුල්ලෙස-දුකූලයක්සේ; මනකලා-මනඃකාන්තවූ; විසල්-විශාලවූ; සුදුවැලිතලා-ධවල වාලුකාස්ථලයන්; දුක-අවලෝකනය කොට;

145. වනහිස ගුවනේ-වනමස්තකාසන්න ගගන තලයෙන්; සුව රැළ-ගිරා සමූහයා; තැන තැන-තන්හි තන්හි; බැස-අවතීර්ණව; ගිමනේ සැව-ග්‍රීෂ්මෝපහරණය කොට; පැනයන-පැනයනු ලබන්නාවූ; ගිරිකුළා-පර්වත කූටයන්ද; පැන-ජලස්නානය පිණිස; බැස-අවතීර්ණව; එවනේ-තත් වනයෙන්; යන එන-යාම් ඊම් කරන්නාවූ; මුවරැළ-මෘග යූථයන්ද; ගිරිදෙළ-පර්වතනිර්ඣරයන්ද; දුනගෙන-ජානනයකොට; බැස-(එහි) අවතීර්ණව; ගමනේයව-ගමන් කරව.

146. දළ දළ-දංෂ්ට්‍රාවක් දංෂ්ට්‍රාවක් පාසා; ගිලු-උද්ධෘතවූ; නෙලුම්දලි-මෘණාල ජාලයන්; පළකළ-ප්‍රකාශ කළාවූද; වන ලුහුණු-වන්‍ය ලශුනයන්ගෙන්; දිලු-ජ්වලමානවූද; දෙළ දෙළ-දෙළක් දෙළක් පාසා; ඉවුරුබිඳ-තීරස්ථානයන් භග්නකොට; සැලු-හෙලුවාවූද; වලුරුගණ-වන්‍ය සූකර සමූහයා; පල පල-තන්හි තන්හි; දකු-දර්ශනය කරන්.

147. එවනගලා-තත්වන ඝටයෙහි; තඹුරුතලා-තාමරස තඩාගයන්හි; ඉවුරුහෙළා-කූලයන් බිඳ දමා; අඟින්-ශෘඞ්ගයෙන්; අවුලා-අවුලුවාගෙන; මුල්-මූලයන්; පෙරළා-පරිවර්තනය කොට; සහළායන-කැවිව යන්නාවූ; ගවරරැළා-ගවර සමූහයන්; නොවලා-නොවරද්දා; දකු-දර්ශනය කරන්.

148. රිවි-සූර්යයාගේ; සේයා-(අතප සංඛ්‍යාත) ඡායාව; මුවාකරන-ආවරණය කරන්නාවූ; ඉවා සිටින-ගහනව පවත්නාවූ; තුරු-වෘක්ෂයන්ගේ; සේයා-සෙවනෙහි; ගිමන-ඝර්මය; නිවා-නිර්වාපණය කොට; සැපසේයා-සුවවූ පරිද්දෙන්; නොලසේයා-අනලස්ව; එවන-තත් වනය; ගෙවා-පසුකරව.

## මාගී වර්ණනා

149. ලිය-ස්ත්‍රීන්ගේ; තුඩින් තුඩින්-මුඛයක් මුඛයක් පාසා; කියන-කියනු ලබන්නාවූ; රසගි-රසවත් ගීතිකා සමූහය තෙම; ඇසෙසි-(ශ්‍රෝත්‍රපථට) ශ්‍රූයමානවේ; (යලින්) කඩින් කඩින්-ඛණ්ඩයෙන් ඛණ්ඩය; බසින-අවතීර්ණවන්නාවූ; ගව මී රැළ-ගව මහිෂ සමූහයා; දිසෙසි-දෘශ්‍යමාන වෙයි; ගොඩින් මඩින්-ගොඩ මඩ දෙක්හි; කළ-කරන ලද්දාවූ; කෙත්වත්-ක්ෂෙත්‍රවාස්තු සමූහයතෙම; රුවට-දර්ශනීයාකාරයෙන්; පැසෙසි-පරිණතවෙයි; එගම-තත්ප්‍රකාර ග්‍රාමය; දුටු-දර්ශනයකළ කල්හි; තොස-සන්තුෂ්ටිය; එයි-වර්ධනයවේ; එ වැබඩින්-එම වැබඩ නම් ප්‍රදෙශයෙන්; වඩින්-ප්‍රයාණය කරන්.

150. මීරියපල-මධුරඵලවත්වූ; සිය ගණන් - ශත සංඛ්‍යාතවූ; වතුපිටි-ඵලාරාම පඞ්ක්තින්; ලදින්-ප්‍රතිලබ්ධව; ඇම කාරිය-සකල කාර්‍ය්‍යයන්; දැන-ජානනයකොට; සොඳින්-මනාසේ; දන-ජනයන් විසින්; වසන-වාසය කරනු ලබන්නාවූද; දෙන-දානය කරනු ලබන්නාවූ; තුරිය වැනි-තූර්‍ය්‍යනාද සදෘශවූ; ගව මී රැළ-ගව මහිෂ සමූහයාගේ; නිනදින-නාදයෙන් යුක්තවූද; වැලිවේරිය-වැලිවේරිය නම් ග්‍රාමය; දැක-දර්ශනයකොට; සිතෙහි-චිත්තයෙහි; පිරිනදින්-පරිපූර්ණ සන්තුෂ්ටියෙන් යුක්තව; යව-යාත්‍රාකරන්.

151. මහ නිදනේ වැනි-මහත් නිධානයක් සදෘශයයි; කියනලද-ප්‍රකාශකරන ලද්දාවූ; දනේ-දාන ක්‍රියා විෂයෙහි; මානේ වඩන-අභිමාන වර්ධනය කරන්නාවූද; රුසිරෙන්-රූපශ්‍රියෙන්; සුර සමානේ-දෙවියන් වැනිවූද; අනේසත-අනෙක සත්ත්වයන්; දුට-දර්ශනයකළහොත්; සත-සත්ත්වයා; ලොබ-ලෝභය; හැර පියානේ-පහකටහැකිනොවේ; එ සේනේගම-තත්ප්‍රකාරවූ සේනේගම නම් ග්‍රාමය; දුට-දර්ශනයකළ කල්හි; අසේනේ-(ඔබගේ) ශ්‍රාන්තභාවය; දුරුවෙයි-දූරිභූතවෙයි.

152. මිතුර!-මිත්‍රය!; සිහිල්නල-ශීතමාරුතය පිළිබඳවූ; පහසින්-ස්පර්ශයෙන් (යුක්තව); පියපත්-පක්ෂපත්‍රයන්; විදා-ප්‍රසාරණය කොට; අහසින්-ආකාශය කරණකොටගෙන; මඳතැන් ගියසඳ-අදූරස්ථානයට ගමනයකළ කල්හි; දෙපස-(මාර්ගයාගේ) උභය පාර්ශ්වයෙහි; ඇම තැන්-සකල ස්ථානයන්; නරඹව-නිරීක්ෂණය කරන්.

153. කැලණි වෙහෙරට - කල්‍යාණී මහා විහාරයට; නිති - නිරන්තරයෙන්; පුද පවතිනා මෙන්-උපහාරයක්ව ප්‍රවෘත්තවන පරිද්දෙන්; පෙර-පූර්වයෙහි; රද මැති වරන්-රාජයන් හා මන්ත්‍රිවරයන් විසින්; නියමකොට - නිශ්චයකර; පුදකළ - පරිත්‍යක්තවූද; මාදෙල්ගස් ගමට-මාදෙල්ගස් ගම නම් ප්‍රදෙශයට; එකබඳ-එකාබද්ධව; පැවතඑන-ප්‍රවෘත්ත වන්නාවූද; ඇමසඳ-සැමකාලයෙහි; සුසැදි-(නානාවිධඵල සම්පන්න භාවයෙන්) සුසජ්ජිතවූද; නාකඳ පලහමින්-නාකඳපල ග්‍රාමයෙන්; එපිට-පරභාගයෙහි;

## කැරගල වර්ණනා

154. සාරපලය-සාරඵල ඇත්තාවූ; අඹ-ආම්‍රවෘක්ෂයෝය; දඹ-ජම්බුවෘක්ෂයෝය; රඹද-රම්භාවෘක්ෂ යන මොවුන්ගෙන් යුක්තවූ; වල්පිට-වන ප්‍රදෙශ ඇත්තාවූද; කඳු පිටින්-පර්වත මස්තකයෙන්; බට-අවතීර්ණවූ; මීර ජලය-මධුර ජලයෙන් යුක්තවූ; ඇල දොළ-ඇලිනිර්ඣර ඇත්තාවූද; දුටු දනන්හට-දර්ශනයකළ ජනයන්ගේ; ලොලය-ලෞල්‍යය; නැර-පහනොකොට; වඩවන-විවර්ධනය කරන්නාවූද;

155. කුළින් කුළම-පර්වත කූටයක් කූටයක් පාසාම; සිහිලඹ වැහෙන-ශීතල ජලය වහනය වන්නාවූ; කඳුරුය-නිර්ඣරයෝය; දෙළින් දෙළම දෙළක් දෙළක් පාසාම; කල් යල් කරන-යලමහ දෙක්හි (බීජ වාපනය) කරනු ලබන්නාවූ; කුඹුරුය-ක්ෂෙත්‍රයෝය; පළින් පළම-ස්ථානයක් ස්ථානයක් පාසාම; තල් පොල්-තාලවෘක්ෂ නාලිකෙර වෘක්ෂ යුක්තවූ; ගෙවතු-ගෘහවාස්තු සහිත; මැදුරුය-මන්දිරයෝය; තළින් තළම-තඩාගයක් තඩාගයක් පාසා; පුල්-ඵුල්ලවූ; පියුම්-පද්ම හා; උපුල-උත්පල සහිත; පඬෙරුය-පුණ්ඩරීක යෝය. (යනු මොහු වෙත්.)

156. අවට-භාත්පස්හි; නිබඳ-නිරන්තරයෙන්; සුවඳැල්-සුගන්ධ ශාලි පඞ්ක්තීන්ගෙන්; දුල් - ජ්වලිතවූ; කෙත් - ක්ෂෙත්‍රපඞ්ක්තිය; පැසෙසි - පරිණතවෙයි; ළමා-බාලවූ; වසුපැටියන්-වත්ස තරයන්ගේ; හඬ-ශබ්දයතෙම; දුරට-දුරස්ථානයට; ඇසෙයි-ශ්‍රැයමානවෙයි; එහි (තත්ප්‍රකාර ලක්ෂණ යුක්තවූ) ඒ ප්‍රදෙශයෙහි; වෙහෙර-විහාරය තෙම; සුරවිමනක් ලෙසට-දිව්‍ය විමානයක් පරිද්දෙන්; දිසෙයි-දෘශ්‍යමාන · වෙයි; (එසේ ඇති කල්හි) එ පියස-තත්ප්‍රදෙශ; දුට-දර්ශනයකළ කල්හි; අමාරසමය-අමෘතරස සදෘශවූම; රස-රසය තෙම; එයි-ආගමනය කෙරෙයි, හෙවත් සිතට ජානනය වෙයි.

157. නිබඳ-නිරන්තරයෙන්; පැසුණු-පරිණතවූ; පල-ඵලයන්; ලඹදෙන-අවලම්බනය කරන්නාවූ; මිහිරඹය-මධුර ආම්‍රවෘක්ෂයෝය; (එසේම) සුවඳ විහිද-සුගන්ධයන් විසර්ජනයකොට; සිටි-ස්ථිතවූ; විලිකුන්-පරිණතවූ; කැත්-කර්ණිකා ඇත්තාවූ; රඹය-රම්භාවෘක්ෂයෝය; නොමඳ-අමන්දව; තැනින් තැන-තන්හි තන්හි; වලුබර-වල්ලරී භරිතවූ; වන රඹය-වනකදලි වෘක්ෂයෝය; එමැද-තන්මධ්‍යයෙහි; හෙවත් ආම්‍ර වෘක්ෂ කදලි වෘක්ෂ යන මොවුන්ගේ මධ්‍යයෙහි; සසරබය-(සත්ත්වයන්ගේ) සංසාර භීතිය; දුරලන-දූරීභූත කරන්නාවූ; වෙහෙර-විහාරය තෙම; දිලේ· ජ්වලමානවේ.

158. සතන්-(තද්විහාරස්ථ) සාධුජනයන්ගේ; සිත-චිත්තයෙහි; නොහැර-පහනොකොට පවත්නාවූ; තිසරණ-ත්‍රිශරණ සහිත; තිලකුණුය-(අනිත්‍ය, දුඃඛ, අනාත්ම සංඛ්‍යාත) ත්‍රි ලක්ෂණයෝය; ඔවුන්-ඒ සාධුජනයන් විසින්; දොස් ඇර-දොෂ වර්ජනයකොට; පවසන-ප්‍රකාශකරන්නාවූ; බස්-වචනයෝ; විසකුණුය-විචක්ෂණය, හෙවත් නිපුනතරය; උන්වෙතම-ඔවුන්ගේ සමීපයෙහිම; නිතොර-තොර නොව; රැකුණුය-රක්ෂිතවූ; නිවත් අය-නිර්වෘත ජනයෝය; වෙහෙර පිහිටි ඒ පියස-විහාරය ප්‍රතිෂ්ඨිතවූ තත් ප්‍රදෙශයෙහි; මේ සලකුණුය-මෙසා ලක්ෂණයෝය.

159. සැදුහැසිතින්-ශ්‍රද්ධාචිත්තයෙන් යුක්තව; මල් පුදවත්-උපහාර වස්තූන්; අතට-හස්තයෙන්; ගෙන-ග්‍රහණය කොට; සතර අතින්-චතුර්දිශාවෙන්; මහදන-මහා ජනයා; රැස්වන කලට-රාශිභූතවන කල්හි; දිනිඳු අතින්-සූර්‍ය්‍යදිව්‍යරාජයාගේ හස්තයෙන්; ගිලි-ගලිතව; හුණු-පතිතවූ; පියුමක් ලෙසට-පද්මයක් පරිද්දෙන්; හසරද!-හංසරාජය; (යුෂ්මත්තෙම) සුබ මොහොතින්-ශුභ මුහුර්තයකින්; එ වෙහෙරට-තත් විහාරවරයට; වැද-ප්‍රවිෂ්ටව.

160. මිතුර!-මිත්‍රය!; මිහඟ-මහීකාන්තාවගේ; මුව මඬලමෙන්-මුඛමණ්ඩලය පරිද්දෙන්; හැමවිට-නිරන්තරයෙන්; දිලෙන-ජ්වලමානවූද; සුලබ-සුලභ්‍යවූ; හෙවත් බහුතරවූ; ඉසුරු-ඓශ්වර්‍ය්‍යයෙන්; පිරි-පරිපූර්ණව; සැදි-සජ්ජිතවූද; ඒ වෙහෙර-තත් විහාරයෙහි; සිට-ස්ථිතව; කිරඹ-ක්ෂීර ජලය හා; පොකුරු මීරස-පුෂ්කර මධුරසය; ලැබ-ලබ්ධව; බොන ලෙසට-පානය කරන පරිද්දෙන්; තගේ-යුෂ්මත්හුගේ; නෙතසිත-චිත්ත නෙත්‍රයන්; සතුටුකොට-සන්තුෂ්ට කොට ලා; නරඹ-(වක්ෂ්‍යමාන අලඞ්කාර විශේෂය) දර්ශනය කරන්.

161. දිමුත්-දීප්තිමත්වූ; වෙහෙර-විහාරය; වට-හාත්පස්හි; විසිතුරු-විචිත්‍රවූ; හෙවත් පුෂ්ප පල්ලවාදියෙන් සජ්ජිතවූ; මල්වතුය-පුෂ්පාරාමයෝය; (තවද) එහිත්-තත් පුෂ්පාරාමයන්හිදු; සුවඳමල්-සුගන්ධ බහුල පුෂ්ප සමූහයතෙම; නිති-නිරන්තරයෙන්; මිණිමුතුය වෙසි-බන්ධන මුක්තවෙයි (ප්‍රබුද්ධවෙයි); (යලිදු) මියුරුපල-මධුරඵලයන්; ගෙන-ග්‍රහණය කොට; නැමි අතුය-නම්න ශාඛා ඇත්තාවූ; මහත්තුරු-මහා වෘක්ෂයෝය; (නැවතත්) රැගත් සෙවණ-ගෘහිත ඡායාව; නොහැරම-වර්ජිත නොකොටම; සිටි-ස්ථිතවූ; පොල්වතුය-නාරිකෙලාරාමයෝය.

162. නොයෙක් තැනම-නානා ස්ථානයන්හි; පිපිමල්-පුෂ්පිත පුෂ්පයන්ගෙන්; පිරුණු-පූර්ණවූ (ගහනවූ); පොකුණුය-පුෂ්කරණීහුය; ගෙයක් කණම-ගෘහකොණයන්හිම; සැදූහෙන්-ශ්‍රද්ධාවෙන් යුක්තව; දෙවන-ප්‍රදානය කරවූ; දකුණුය-දක්ෂිණාවෝය, හෙවත් දාන වස්තූහුය; කුණුය-කචවරයන්; හැර-වර්ජිතකොට; මලුමං-බොධ්‍යඞ්ගන චෛත්‍යාඞ්ගනාදිය හා මාර්ග පඞ්ක්තිය; සුදක් ලෙස-ශ්වෙත වස්ත්‍රාස්තරණයක් පරිද්දෙන්; තිබෙයි-විද්‍යමානවේ; සියක් දන-ශත සඞ්ඛ්‍යාත ජනයෝ; වැඳ-වන්දනයකොට; පුද-පූජනයකොට; පැදකුණු කෙරෙති-ප්‍රදක්ෂිණා කෙරෙත්.

163. නුදුරුව-අදූරස්තව; සැදි-සජ්ජිතවූ; සිහිලැලීය-ශීතභාවය ප්‍රකාශකරන්නාවූ; ගිරිගඟුලැලීය-ගිරිනිර්ඣරයෝය; වට-හාත්පස්හි; මල්වැලීය-පුෂ්පලතාවන්ගෙන්; සැදි-සජ්ජිතවූ; සුදුවැලීය-ධවල

වාලුකාතලයෝය; පිපිවන සිටි-පුෂ්පිත පරිද්දෙන් ස්ථිතවූ; මලිය-පුෂ්පයන් ඇත්තාවූ; වනමලීය-වනපඞ්ක්තිහුය, හෙවත් පුෂ්පාරාම පඞ්ක්තිහුය; සිහිවිලිය-චින්තාවන්; තුටුවන-තුෂ්ටවන්නාවූ; පුල් විලිය-පුෂ්පිත තඩාගයෝය.

164. පවන්-මාරුතය තෙමේ; නිරතුරේය-නිරන්තරයෙන්; පිපි තුරේය-පුෂ්පිත වෘක්ෂයන්හිවූ; කුසුමන් පෙති-පුෂ්ප පත්‍රයන්; ඇද-ආකර්ෂණයකොට; මලුතුරේය-මාලකාභ්‍යන්තරයෙහි; අතුරේය-ආස්තරණය කෙරෙයි; අවට-හාත්පස්හි; සුපිපි-සුත්ඵුල්ල (පුෂ්පයන් ඇත්තා)වූ; සරේය-තඩාගයන්හි; බිඟුසරේය-භෘඞ්ගනාදයෙහි. (එසේ හෙයින්ම) සිත-(දර්ශනය කරන්නවුන්ගේ) චිත්තය තෙම; එවෙහෙර කෙරේය-තද්විහාරය කෙරෙහි; ලොබකෙරේය-අභිලාෂ කරන්නේය.

165. හිතාය-(සත්වයාහට) හිතවූ; සඟන-භික්ෂුසඞ්ඝයා; වෙන කතාය-(රාජ කථාදි අප්‍රතිරූප) අන්‍ය කථාවන්; නොකියා-කථනය නොකොට; නිති හිතාය-නිත්‍යයෙන් හිත (සාධක)වූ; බණකතාය-ධර්මකථාවක්; කියත-කථනයකරන කල්හි; (යලිත්) නිති-නිරන්තර යෙන්; පතාය-සම්ප්‍රාප්තව (රාශිභූතව); වතාය වතායකර-වතාවත් කොට; එහි-තත් විහාරයෙහි; සිටිසඳ-වැඩසිටි කල්හි;

166. කෙළනා-ක්‍රීඩා කරන්නාවූ; බිඟු-භෘඞ්ගයන්ගේ; රැවින්-රාවය කරණකොටගෙන; බුදු මතුරු-බුද්ධ මන්ත්‍රය, හෙවත් සම්බුද්ධ ධර්මය; දපමින-ජල්පනය කරමින්; අතු-ශාඛා නැමැති; අතිනි-හස්තයෙන්; මල්ගෙන-පුෂ්පග්‍රහණය කොට; වෙහෙර-තත් විහාර යෙහි; සිටි-ස්ථිතවූ; නාතුරු-නාගවෘක්ෂ පඞ්ක්තිය; (කෙසේද) යති නායක-යතිරාජවූ; එහිමි-තත් ස්වාමීහු; බුදුබව ලබන දින-බුද්ධත්වය ලබන දිනයෙහි; පිටදෙන ලෙසට-පෘෂ්ඨදානය කරන පරිද්දෙන්; පතමින-ප්‍රාර්ථනා කෙරෙමින්; සිටිනා වැනිය-ස්ථිතිය කරයි හඟිම්.

167. සඟන-(තත්විහාරස්ථ) භික්ෂු සමූහය විසින්; නිති-නිරන්තර යෙන්, හෙවත් දිනපතා; පවසන-ප්‍රකාශකරනු ලබන්නාවූ; දහම් කඳ-ධර්මස්කන්ධය; එවෙහෙර-තත් විහාරයෙහි; උන්-වාසගතවූ; සොඳ-සුන්දරවූ; පරෙවි-පාරාපත (සමූහ)යන්; අසා-ශ්‍රවණයකොට; තොසාවෙමින්-සන්තුෂ්ටවෙමින්; දුව වළලු පිට-සඬසාට මස්තක යන්හි; ඉඳ-නිෂණ්ණව; මුව-මුඛය; පියෙන්-පක්ෂපත්‍රයෙන්; වසා-ඡාදනය කොට; නදකරන-නාදකරන කල්හි; උනුනට-ඔවුනොවුන්ට; දෙසා-ප්‍රකාශකොට; බලනවැනි-(වද්‍යවද්‍යභාවය) පරීක්ෂා කිරිමක් වැන්නේය.

168. දුටු-දර්ශනය කළාවූ; සත-සත්ත්වයන්ගේ; සිත-චිත්තය; නිතියෙනි-අනවරතයෙන්; සතොසවන ලෙසිනි-සන්තුෂ්ටවන ආකාරයට; සතරත-චතුර්දශාවන්හි; එකට-එකාකාරයෙන්; බෙරඇසක් මෙනි--භෙරි තලයක් සෙයින්; සමකොට-සමතලාකොට; පැහැපත-ප්‍රභායුක්තවූ; සුද-ධවලවර්ණය; නොහළ-අත්නොහැරියාවූ; වැලි-වාලුකායෙන්; අතුල-ආසන්නතවූ; මලුතැනි-මාලක ස්ථානයතෙම; (කුමක් වැන්නේද යත්) මිහිකත-මහීකාන්තාවගේ; සඳනලෙව් දුන්-චන්දන කල්කාලෙපය කරන ලද්දාවූ; උරමඬල වැනි-වක්ෂස්ථලය වැන්නේය.

169. සසර-සංසාරයෙන්; එතරවන ලෙස-පරතීරප්‍රාප්තවන පරිද්දෙන්; වඩන-වර්ධනය කරන්නාවූ; අදහස-(විඩිසහගත) කුශලාශය; නොහැර-වර්ජිත නොකොට; සකස-මනාසේ; වෙහෙර රැඳි-තත්විහාර වාසීවූ; සඟගණගේ-සඞ්ඝ සමූහයාගේ; සතරසිල් කඳ-චතුසංවර සීලස්කන්ධය; නිතොර-නිරන්තරයෙන්; ගෙන-උද්වහනය කොට; සිටින ලෙස-ස්ථිතිය කරන්නාක්මෙන්; සතර පවුර-ප්‍රාකාර චතුෂ්ටය; සතරදෙස සිට-චතුර්දිශාවෙහි ස්ථිතව; බබලසි-භ්‍රාජමානවේ.

C තවද-යලිත් කියයුත්තක් ඇත; කාංස්‍යමණි නුපුරරාව-කාංස කාල මණිමය නූපුර යන මොවුන්ගේ රාවයට බඳු රාවයෙන්; විරාජිත-බබලන්නාවූ; හංස රාජොත්තමය-ශ්‍රෙෂ්ඨවූ හංස රාජය; මෙද-මේ (මතු වක්ෂ්‍යමානවන්නේ); ඒ විහාරයාගේ- තත් විහාරය පිළිබඳවූ; ආකර්ණනියවූ-ශ්‍රවණය කිරීමට යොග්‍යවූ; වර්ණනා විශෙෂයෙක-විශිෂ්ට වර්ණනාවකි; එද-තත්වර්ණනාවද; තා-යුෂ්මත්හුගේ; කණ්යට-ශ්‍රවණ යුග්මයට; ස්වාලඞ්කාර-ශොභනාලඞ්කාරවූවක්; කර-කළමැන. (කෙසේද?)

## පද්මවතී පිරුවන

170. ගුරුන්-ආචාර්යවරයන්ගේ; සරණ-පාදයන්; වැඳ-අභිවාදනය කොට; දිනෙන් දින-දවසින් දවසක් පාසා; කියවා-වාචනය කොටගෙන; පරණ-පුරාණවූද; අලුත්-නූතනවූද; පොත්-පුස්තකයන්; පණින් පණ-පණියක් පාසා; පෙරළා-පරිවර්තනය කොට; දරණ කරන ලෙස-ධාරණය කරන පරිද්දෙන්; වෙනින් වෙන-පෘථක් පෘථක්ව; ඉඳගෙන-නිෂණ්ණව; තැනින් තැන-තන්හි තන්හි; හෙරණසික-හෙරණසික නම් ග්‍රන්ථය (සාමණේර ශික්ෂාව); කියන-අධ්‍යයනය කරන්නාවූ; හෙරණෝ සාමණේර වරුය.

**171.** සතකිරඹ මෙන් - සංඛක්ෂීරාකාරයෙන්; සිල්ගුණය - ශීල ගුණයන්; පිරිසුදුකර-පරිශුද්ධකොට; ඉන්-ඒ හෙතුවෙන්; සැක නොවි-නිශ්ශඞ්කිතව; සසර-සංසාරය; තරණය කරනුව-එතරකිරීම සඳහා; නන් සිකපද-නානා ශික්ෂාපදයන්; පණයලෙස-ප්‍රාණය පරිද්දෙන්; රකිනා-රක්ෂණය කරන්නාවූ; මුන්සිකා-මූල ශික්ෂා සහිත; සිකවළඳ-ශික්ෂාපද වළඤ්ජනය; විමසනා-පරීක්ෂණය කරන් නාවූ; සඟ ගණය-සඞ්ඝසමූහයාය.

**172.** එසමන් බදුරු-ඒ සමන්ත භද්‍රවූ; මුනි-සර්වඥයන් වහන්සේගේ; සදහම් පෙලෙහි-සද්ධර්මපාලියෙහි; ඇතිලෙස-විද්‍යමාන පරිද්දෙන්; සන්සඳ සමස් ඈ-සංඥා සන්ධි සමාසාදිය; දනුමට-උද්ග්‍රහණයට; පැවැති-ප්‍රවෘත්තවූ; කසයින් විරිත-කාත්‍යායන වෘත්තිය; සැක නැති-ශඞ්කාස්පදනුවූ; නෑසරීකා විනිස-න්‍යාස ටීකාවිනිශ්චය; අසමින්-ශ්‍රවණය කරමින්; සමහරු-අන්‍යතර ශිෂ්‍යයෝ; වන පොත් කෙරෙහි-වාචොද්ගත කරන්නාහුය.

**173.** සසරණ-සංසාරාර්ණවයට; පිවිස-ප්‍රවිෂ්ටව; විඳිනා-විඳනය කරනු ලබන්නාවූ; දුක්-දුඃඛය; ඉමක්නැති-සීමා රහිතය (සිතියා); තිසරණ පිණිස-ශරණත්‍රය සඳහා; තම සිතෙහි-ස්වීය චිත්තයෙහි; බැති වඩවමින්-භක්තිවර්ධනය කරමින්; ගුරුවරන්-ආචාර්යවරයන්ගේ; දෙසරණ-චරණ යුග්මය; සිරසකර-ශීර්ෂයෙහි ස්ථාපිතකොට ගෙන; වැඳ-අභිවාදනය කොට; සමහර සඟගණ-අන්‍යතර නවක සංඝ සමූහයා; නිසබණ-නිඃශ්‍රය ධර්මයන් පිළිබඳවූ; විනිස-විනිශ්චය; අසති-ශ්‍රවණය කරත්.

**174.** නොයෙක්-නානා විධවූ; වත පිළිවෙත-වෘත ප්‍රතිවෘත්ත (කරණයෙහි); තිරසරනු-ස්ථිරසාරව; පසිඳු-ප්‍රසිද්ධවූද; මුනිඳු-මුනිරාජයන් වහන්සේගේ; සසුන් වැඩ-ශාසනාභිවෘද්ධිය; වැඩුමට-සිද්ධිය පිණිස; වැරසැරනු-වීරසාර ගුණ ඇත්තාවූද; පුබුදුනැණින්-ප්‍රබොධඥානය හෙතුකොටගෙන; තෙරපදවියට-ස්ථවිර පදවි (ලාභ)යට; විතරනු-ප්‍රමාණවූද; සමහරනු-අන්‍යතර භික්ෂූහු; එහි-තත්විහාරයෙහි; තෙරබණ-ස්ථවිරාඞ්ග ධර්මයන්; පුරුදුකෙරෙති-ප්‍රගුණ කරන් නාහුය.

**175.** සොඳුරු - සුන්දරවූ; පොරණ-පුරාණවූ; පිවිතුරු-පවිත්‍රවූ; ඇදුරොල්-ආචාර්යත්වය; නොහැර-වර්ජිතනොකොට; විදුරුනැණින්-වජ්‍රඥානය කරණකොටගෙන; පිරිසුදු-පරිච්ඡින්නකොට; මොහඳුරු-මොහාන්ධකාරය; දුරැර-දූරීභූතකොට; මියුරුබසින්-මධුර වචනයෙන්; සැකහැර-ශඞ්කා විච්ඡේදය කොට; දෙසන-(ගුරුවරයන්

විසින්) ප්‍රකාශකරනු ලබන්නාවූ; විසිතුරු-විචිත්‍රවූ; ගැඹුරු විජම් පෙල-ගම්භීර අභිධර්ම පාලිය පිළිබඳවූ; අරුත්-පදාර්ථයන්; සමහරු-අන්‍යතර භික්ෂූහු; අසත්-පෘච්ඡනය කෙරෙත්.

**176.** මඳක්-ස්වල්ප මාත්‍රයක්; ඇසුව-ශ්‍රවණය කළහොත්; කැමැති-අභිප්සිතවූ (ප්‍රාර්ථිතවූ); සගසිරි-ස්වර්ග සම්පත්තිය; සිදුවන-සිද්ධවීමට හෙතුවූද; නොයෙක්රතින්-අනෙකාකාරයෙන්; මොක්-මොක්ෂශ්‍රිය; සිදුනොකොට-සාධනය නොකොට; නොනැවති-නිවෘත්ත නොවන්නාවූද; (අනෙක විධියෙන් මොක්ෂ සම්පත්ති ප්‍රතිලාභය කරන්නාවූද යනුයි); උදක්-නිඃශෙෂකොට; දෙසැට මිසදිටු-ද්වාෂෂ්ටි මිථ්‍යාදෘෂ්ටිය; මුල්සිඳ-මූලොද්ධරණය කොට; පැවැති-ප්‍රවෘත්තවූද; සුතුරු පෙලදම්-සූත්‍රපාලි ධර්මය පිළිබඳවූ; පදරුත්-පදාර්ථයන්; අයෙක්-අන්‍යතර භික්ෂූහු; අසති-(ගුරුන්බසින්) පෘච්ඡනය කෙරෙත්.

**177.** පැවැති-ප්‍රවෘත්තවූ; හෙවත් ප්‍රශස්ත බුද්ධිමත් පණ්ඩිතයන් විසින් ග්‍රන්ථිතවූ; නොයෙක්-නානාවිධවූ; ටීකා ගැටපද-ටීකා හා ග්‍රන්ථිපදයන්; දක්‍ය-අවලොකනය කොට; එකද තැනකය-එක ස්ථානයෙක්හිදු; මඳකුත්-ස්වල්පමාත්‍රයකුත්; විමතිනොවී-වෛමතික නොවී; සිතශ-(ශ්‍රවනය කරන්නවුන්ගේ) චිත්තයෙහි; සැකයහැර-ශඞකාවිච්ඡෙදයකොට; කැමැති ලෙසින්-චිත්තානුකූල න්‍යායයෙන්ම; පවසත-( ආචාර්යවරයන් විසින් ) ප්‍රකාශ කරනු ලබන්නාවූ; විනය පිටකය-විනය පිටක දෙශනාව, නොයෙක් සඟගණ-බහුතර භික්ෂූහු, අසති-(අර්ථවශයෙන්) පෘච්ඡාකෙරෙත්.

**178.** පවර-ශ්‍රෙෂ්ඨවූ; පෙරදුරු-පූර්වාචාර්යයන්ගේ; උවදෙස්-උපදෙශයන්; මඳකුත්-ලෙශමාත්‍රයකුත්; නොහැර-වර්ජිත නොකොට; ගැඹුරු-ගම්භිරවූ; පදරුත්-පදාර්ථයන්; ඇම-සියල්ලම; නියම කර-නිශ්චයකොට(පූර්වාචාර්යයන් විසින් පඨිතාකාරයෙන්ම)දැනගත්-ඥානනය කළාවූ; පැනවත්-විශිෂ්ටබුද්ධි ඇත්තාවූ; පසිඳු-ජගත් ප්‍රසිද්ධවූ; පඬිවර-ශ්‍රෙෂ්ඨ පණ්ඩිතයෝ; වෙහෙරතුර-තත් විහාරාභ්‍යන්තරයෙහි; ඉඳ-උපවිෂ්ටව; නොයෙක්-නානාවිධවූ; තකුව්යරණ සඳලකර-තර්ක ව්‍යාකරණච්ඡන්දොලඞකාර ශාස්ත්‍රයන්; පවසත්-(ප්‍රති පෘච්ඡනය කරන ශිෂ්‍යයන්ට) ප්‍රකාශ කෙරෙත්.

**179.** අසේස දෙස-සකල දිශාවන්හි; පරසිදු-ව්‍යාප්ත කීර්ති ඇත්තාවූ; පොරණ-පෞරාණිකවූ; පඬිවර-පණ්ඩිතාචාර්යයන් විසින්; පදිකර-පද්‍යබන්ධනයකොට; පැවසූ-ප්‍රකාශකරන ලද්දාවූද; අසේස යෙන්-විශෙෂවශයෙන්; නොයෙක-අනෙක ප්‍රකාරවූ; (නොයෙක් වෘත්තභෙද යුක්ත) සඳවියරණ ලකර-ඡන්දොව්‍යාකරණාලඞකාර ශාස්ත්‍ර

විධියෙන්; දෙසේ-දොෂයන්, හෙවත් අක්‍ෂරපද වාක්‍යයන් පිළිබඳ උච්චාරණ දොෂයන්; දුරලමිනි-දූරිභූත කරමින්; කියන-(ශිෂ්‍යයන් විසින්) කථනය කරනු ලබන්නාවූද; විසිතුරු-විචිත්‍රවූද; කව් නළු සතර-(නෛෂධ රඝුවංශාදි) කාව්‍ය ශාස්ත්‍රීය ග්‍රන්ථයන් හා නාටක ග්‍රන්ථද; ඇසේ-ශ්‍රවණයවේ.

180. තම-යුෂ්මත්හු විසින්; නුදුටු-(පූර්වයෙහි) දර්ශනය නොකළාවූද; එහි-තත් විහාරයෙහිවූ; හැම මහිම-සකල මහිමයන්; මෙලෙසේ-මේ උක්තප්‍රකාරයෙන්; අසා-ශ්‍රවණයකොට; අනුරපුර මහවෙහෙර-අනුරාධපුර මහා විහාරය; දුටුමෙන්-දර්ශනය කළාක්මෙන්; සැකහැර-නිඃශඞ්කිතව; දැක-අවලොකනය කොට;

181. පවනින්-මාරුතයෙන්, ගත්-ග්‍රහණය කරනලදුව; අඹර-ආකාශයෙහි; ලෙලදෙන-චංචල වන්නාවූ; දද-ධ්වජයන්ගෙන්; යුත්-යුක්තවූද; පැහැපත්-ප්‍රභාන්විතවූ; කොත්-ශෘඞ්ගපඞ්ක්තීන්ගේ; කිරණීත්-රශ්මි කාරණකොටගෙන; අඳුරු-අන්ධකාරය; දුරුකළ-දූරිභූත කළාවූද; මුනි මැඳුර-බුද්ධ ප්‍රතිමාලය; දැක-දර්ශනයකොට; නෙත්සිත්-චිත්ත නෙත්‍රයන්; තුටුකෙරෙමින්-සන්තුෂ්ටකෙරෙමින්; සසර සමුදුර-සංසාර සාගරොත්තාරණයට; තර - පසුරක් බඳුවූ; කුසල්-පුණ්‍ය බලයක්; අත්පත්කර-හස්තප්‍රාප්ත කරන්.

182. සුරසිඳුසේම - ආකාශ ගඞ්ගාව පරිද්දෙන්ම; සුදු - ධවල වර්ණවත්වූ; උදු-ඍජුවූ; රුදු-මහත්වූ; කඳ වෙලෙප්-ස්කන්ධ ශාඛා විටප ඇත්තාවූද; මුදු දලු-බාල පල්ලවයෝය; නිල් කොළින්-නිලවර්ණ පත්‍රයෝය, යන මෙතෙක් දෙසින්; විදු-විද්‍යුද්වලඤ්ජිතවූ; ඝනකුල-මෙඝකූටයක්; එකබඳු-එකාකාරවූද; බුදුහුදු විසින්-තථාගතයන් වහන්සේ විසින්ද පවා; බැතිනි-භක්ති යුක්තව; නෙතිනිඳු-අනිමිස ලොචනයෙන්ද; පුදකළ-පූජාකරන ලද්දාවූද; මුනිඳුන්-මුනිරාජයන් විසින්; පිටදුන්-පෘෂ්ඨදානය කරන ලද්දාවූද; දුම්ඳු-අශ්වත්ථ ද්‍රැමෙන්ද්‍රය; සිත තොසින්-චිත්තසන්තුෂ්ටියෙන්; වඳු-ප්‍රණාමයකර.

## සංඝරාජ වර්ණනා

183. වත්තල වෙහෙර-වත්තල නම් ග්‍රාමයෙහිවූ විහාරය; වැඩ-වර්ධනය කොට; වනවාසයෙහි-වනවාස විහරණයෙහි; වැඩඋන්-වාසොපගතවූ; නාගසේන මහතෙරිඳුන්ට-නාගසේනාභිධාන මහාස්ථවිරයන්ට; මුනුබුරු-නප්තෘවූ; බෝ ගණසුරු-බොධිපාලකගණයට නායකවූ; දළසෙන් ගමු හුනන්නරු-දළසෙන් ගමු හුනන්නරු නම්වූ; ඔහු-එම ක්‍ෂත්‍රියයාගේ; වෙත-සමීපයෙහි, හෙවත් ඥාතිත්වයෙහි; උන්-සර්පිතවූ; උතුම්-ශ්‍රෙෂ්ඨවූ; අලගක්කෝනාර සඳ-අලගක් කෝනාර මන්ත්‍රීශ්වරයාහට; බඳු-බන්ධුවූ; අත්තනායක මැතිසඳුන්ගේ-අත්තනායක මන්ත්‍රීශ්වරයන්ගේ; සොවුරු-සහොදරවූ; පද්මවතී-පද්මවතී

නම්වූ; රදූ ළඳුන්ගේ-රාජකන්‍යාවට; හිමිවන-වල්ලභවූ; සීහනාසූද සුත් මහලේන-අසිග්‍රාහක සුදර්ශන මහාලේඛක නම්වූයේ; ලම්ැණිකුලයෙන් - ලම්බකර්ණවංශයෙන්; සිරිලක-ශ්‍රී ලංකාවෙහි; යෙහෙන-යසපත්සේ; වැජඹෙන-විජෘම්භමානවූ; සිසිවන යසස්-චන්ද්‍ර සදෘශකීර්තියෙන්; ලොවපරසිදු-ජගත් ප්‍රසිද්ධවූ; කුලෙන් එන-කුලයෙන් ප්‍රවෘත්තව එන්නාවූ; ඔහුට-ඒ මන්ත්‍රීන්ද්‍රයාහට; මනනඳන-මනොනන්දනය කරන්නාවූ; මුතුබුරුවන-නප්තෘවූ;

184. දුල්-ජ්වලිතවූ; සියපත්-ශතපත්‍රාකාරවූ; පතුල්-පාදතලයන්; නිරිඳුන්-නරේන්ද්‍රයන්ට; මුදුන් මල් කළ-මූර්ධමාල්‍ය කළාවූද; නුවණින්-ප්‍රඥාව හේතුකොටගෙන; සියල් විදු දනහට-සමස්ත විද්වජ්ජනයන්ට; මුදුන්වන-ශ්‍රෙෂ්ඨවන්නාවූද; තිළිණෙන්-විතරණය හෙතුකොටගෙන, හෙවත් පරිත්‍යාගය හෙතුකොටගෙන; සුරබි සුරතුරු-සුරභි, සුරද්‍රැම යන මොවුන්ගේ; රඟ-ආකාරය; අඳුන්වන-සංඥානනය කරන්නාවූද; නිවැරදි-දොෂ ශූන්‍යවූද; තම බස-ස්වකීය තෙපුල; ඇමටම-සකල ලොකයාහටම; අමාරස කළ-සුධා රසයක් කළාවූද; දෙවන - ද්විතියවූ; අටුවා ඇදුරකු - අර්ථකථාචාර්යයකු; බටුවා ලෙසින් – ප්‍රාදුර්භූතවූවාසේ; යසස් සිටුව – කීර්තිස්ථාපනයකොට; තුටුව - සන්තුෂ්ටියෙන් යුක්තව; පෙලරුත් දෙසන – පාල්‍යර්ථයන් ප්‍රකාශකරන්නාවූද; රත්නගිරිමෙන්-ස්වර්ණ පර්වතරාජයා සෙයින්, හෙවත් මේරුපර්වතයා පරිද්දෙන්; මුළුලොවට-සකල ලොකයාහට; පසිඳුවන-ප්‍රසිද්ධ වන්නාවූද; රුවට-ශොභන විලාසයෙන්; දිලි-ජ්වලිතවූද; රත්නරුව මෙන්-රත්නමය රූපයක්සේ; මුරුදුවන-මාර්දව ගුණ යුක්තවූද; රත්නදිව්-රත්නද්වීප නම් මේ ලංකාවෙහි; ලද-ප්‍රාදුර්භූතවූ; මුනිරදුට මැතිඳු-මුනිරාජයාගේ ශ්‍රෙෂ්ඨ මන්ත්‍රියෙක් වැනිවූද; වනරත්න මාහිමි හිමිසඳුට-වනරත්න සංඝරාජ ස්වාමිපාදයාණන්ට; නමදු-නමස්කාර කරත්.

D තවදඃ—යලිත් (කියයුත්තක් ඇත.) ලංකාරක්ෂණ-ලක්දිව් රැක්මෙහි; දක්ෂ විචක්ෂණ-චතුර බුද්ධි ඇත්තාවූ; ක්ෂත්‍රිය රත්නායමාන-ක්ෂත්‍රිය (රාජ) රත්නයක් සදෘශවූ; වන රත්න සංඝ රාජොත්තමයාගේ-වන රත්න සංඝ රාජයන් වහන්සේ පිළිබඳවූ; මෙද-මේ වක්ෂ්‍යමාන වන්නේත්; එක් වර්ණනා කථනයෙක-අන්‍ය ප්‍රකාර ගුණ කීර්තනයෙක් වේ; එද-එයද; තා-යුෂ්මත්හුගේ; කර්ණපථ-කර්ණ ශ්‍රවණ පථයට; අලංකාරකර-ආභරණයක් කරනු මැන.

185. සියුම් අරුත්-සූක්ෂ්මාර්ථවත්වූ; ටීකාපොත්-ටීකා ග්‍රන්ථයන්; කළ-රචනය කළාවූ; බුහුටි-ප්‍රගල්භවූ; උතුම්-ශ්‍රෙෂ්ඨවූ; පොරණ ඇදුරන්ගේ-පුරාතනාචාර්යයන්ගේ; රඟින්-ආකාරයෙන්; දිටී-දෘශ්‍යමානවූ; ඔහු-එම වන රත්න සංඝරාජ මහාස්ථවිර පාදයන්ගේ;

නොකිලිටි-ක්ලිෂ්ටනොවූ; නුවණ ගුණ-ප්‍රඥාව හා ගුණය; කෙසේ-කොසිලෙසින්; කියම්-වර්ණනා කෙරෙම්ද? විජම්පෙල අරුත්-අභිධර්ම පාලාර්ථ; අතැඹුල ලෙසින්-හස්තාමලක ක්‍රමයෙන්; දිටී-දර්ශනය විය.

186. සුතුරු අබිදම්-සූත්‍රාභිධර්ම නැමැති; ගං-ගඞ්ගාවන්ට; සතත-නිරන්තරයෙන්; වැද-ප්‍රවිෂ්ටව; වෙසසින්-විශෙෂයෙන්; පිරෙමින්-පූරිතවෙමින්; වෙරලත-වෙලාන්තයක්; නොදක-දර්ශනය නොකොට; පැතිර සිටිනා-ව්‍යාප්තව සිටින්නාවූ; නන්නය සැදි-නානා නය යුක්තවූ; ගැඹර යුතු-අර්ථගාම්භීර්යයෙන් යුක්තාවූ; විනය සමුදුර-විනය පිටක නැමැති සාගරයෙහි; ඔහු-ඒ වනරත්න සංඝරාජයන්ගේ; මින්-ප්‍රඥා නැමැති; තිමිංගලමින්-තිමිඞ්ගල නම්වූ මත්ස්‍යයා; නොකෙළිතැන්-ක්‍රීඩනය නොකළ ස්ථානයක්; නැත-අවිද්‍යමානවේ.

187. එසම-උන්වහන්සේට සදෘශවූ; කෙනෙකුන්-අන්‍යයකු පිළිබඳවූ; අසනු-ශ්‍රවණයෙක්; දෙරටකය-රාෂ්ට්‍රද්වයෙහිම; නැත-අවිද්‍යමානය (යලිත්) ඔහු-උන්වහන්සේ; දැන-ජානනය කොට; සිටින-ස්ථිතය කරන්නාවූ; පටකය-ආගමික යුක්ති මාර්ගයතෙම; දිනනු-ජයග්‍රහණය කිරීම; නියමය-නියම නිශ්චයවේ; ඉතිනු-ඉතිකින්; (එසේම හෙයින්) ගැඹුරු පදරුත්-ගම්භීර පදාර්ථවත්වූ; සුතුරු පිටකය-සූත්‍රපිටකය; ලොවට-සත්ත්වයාහට; දැනෙනනු-ජානනය වන්නේ; එයතිඳු-එම සංඝරාජ යතීන්ද්‍රයන් වහන්සේ; දෙසනවිටකය-දෙශනා කරන කල්හිමැයි.

188. ඔහු-ඒ වනරතන සංඝරාජ ස්වාමිතෙම; විසඹ-වාග්වනිතාවට; සරණ-ප්‍රතිෂ්ඨාස්ථානයෙකි. (එසේම) සසුනඹරට-ශාසන නැමැති ආකාශයට; රිවිමඩල-සූර්යමණ්ඩලයෙකි; අසරණ සත-අනාථ සත්ත්වයන්ගේ; ගිම්-(දුඃඛ නැමැති) ග්‍රීෂ්මය; නිවුමට-නිර්වාපණයට; සඳමඩල-චන්ද්‍රමණ්ඩලය වැන්න; (යලිත්) ඔහු-උන්වහන්සේගේ; තෙපලම-වාක්ප්‍රයොගයම; නැණලු සරණ-ප්‍රඥා ලොකයාගේ ව්‍යාප්තියට; මිහිමඩල-මහීමණ්ඩලය වේ. හැම වියරණ-සකල ව්‍යාකරණ ශාස්ත්‍රයතෙම; ඔහු-උන්වහන්සේගේ; නැණකෙළි-ප්‍රඥා ක්‍රීඩාවට; කෙළිමඩල-ක්‍රීඩාමණ්ඩලයෙකි.

189. ඔහු-ඒ සංඝරාජොත්තමයාගේ; යසස-යශොමහාත්ම්‍යය; වෙන වෙන-පෘථක් පෘථක් වශයෙන්; දැනී-මේ කාලයෙහි; අප-අස්මතුන් විසින්; කියනු-කථනය කිරීම; කිම-කිමර්ථද? (ඵල නැතැයි සේයි); ඇති තතුලෙස-යථාභූතාකාරයෙන්; සව්සතරම-සකල ශාස්ත්‍රයම; දත් බැවින්-ජානනය කළ හෙයින්; සුරගුරුමිස-සුරාචාර්යයාමුත්; කෙනෙකුන්-අන්‍යයෙක් තෙම; දෙවෙනි-(මුන්වහන්සේ) ද්විතීයවූවකු; නොකෙරෙයි-නොකරන්නේය, (එසේ හෙයින්) එය තිඳු-ඒ යතිරාජයාගේ; බස-භාෂිතයතෙම; සඳලකරන්-ඡන්දොලඞ්කාර ශාස්ත්‍රයන්; උපන්තැනී-ජන්මස්ථානයකි.

190. ඇසට-චක්ෂුසට; පෙණෙනු මිස-දෘශ්‍යමාන වන නමුත්; දිවඉසිවර කෙනෙකි-දිව්‍යර්ෂිවරයෙකි; (ඇසට පෙනීම පමණක් නොවේනම් දිව්‍යර්ෂිවරයෙක්ම ය'යි සේයි.) ඔහුගේ-උන්වහන්සේගේ; බසට-වචනයට; සරිවනරසෙකි-සදෘශවන රසයක්තෙම; ලොව-ලොකයෙහි; නැත-අවිද්‍යමානය. දෙසැටදිටුම-(ශාශ්වතාදි) ද්වාෂෂ්ටි දෘෂ්ටීන්ම; නුවණින්-බුද්ධි මාහාත්ම්‍යයෙන්; විමසා-විමංසනය කොට; නිසැකි-නිශ්ශඞ්කිතවිය; දසට පොරණ-(බ්‍රහ්මපුරාණාදි) අෂ්ටාදශ පුරාණ ශාස්ත්‍රයතෙම; වරදැසි-සාවද්‍යයයි; ඔහු-උන්වහන්සේ විසින්; හළදෙයකි-බැහැර කරන ලද්දේය.

191. කලාසැට සතර-චතුඃෂෂ්ටිකලා විද්‍යාවන්; කී-ප්‍රකාශකළාවූ; ගුරු-ආචාර්යවූ; ඉසිවරන්-ඍෂිවරයන් විසින්; දොසක් නොලා-දොෂ මාත්‍රයක්වත් නොතබා; සඳලකරින්-ඡන්දොලඞ්කාර විධියෙන්; සොඳුරුකර-මනොඥකොට; රසෙහි ගලා-(නවවිධ ශෘඞ්ගාරාදි) කාව්‍ය රසයෙහි නිමග්නකොට; පැවසූ-ප්‍රකාශකරන ලද්දාවූ; ගැඹුරු; ගම්භීරවූ; කව්නළු-කාව්‍ය නාටක ශාස්ත්‍රය; බලා-අවලොකනයකොට-පලාපය කැයි-ප්‍රලාපයක කියා; ගරුනොකළේය-(මුන්වහන්සේ) සම්භාව්‍ය නොකළේය.

192. අනුරපුර-අනුරාධපුර (මහා විහාර පරම්පරා)යෙහිවූ; මහත්-පූජ්‍යතරවූ; පොරණ ඇදුරන් ඇර-පුරාතනාචාර්යවරයන් විනා; අතර-මේ අතර කාලයෙහි; බලත්-විමංසනය කරත්හොත්; මෙවිතර-මේ වනරතන සංඝරාජ මහා ස්වාමින් සදෘශවූයේ; දෙරණ (ලඞ්කා) ධරණියෙහි; කවරෙක-කිනම් කෙනෙක්ද? (නැත්තේමය) ඔහුගේ-උන්වහන්සේගේ; යස ගුණ-යශො ගුණයතෙම; දිගත් සතර විතරය-දිශා චතුෂ්ටයම ප්‍රමාණකොට ඇත්තේවේ; (යලිත්) නැණ-(උන්වහන්සේගේ) බුද්ධියතොමෝ; නකත් සතර-ජ්‍යොතිශ්ශාස්ත්‍රය සම්බන්ධවූ; අතර-අන්තරයෙක්හි; නොතිබීය-අප්‍රවෘත්තවීය.

193. විසිතුරු-විචිත්‍රවූ; ගහගණිතින්-ග්‍රහගණිතයෙන්; නොකිවත්-කථනය නොකරන ලද්දේවී නමුත්; පිවිතුරු-පරිශුද්ධවූ; ඔහුගෙ තෙපලම-උන්වහන්සේගේ වචනයම; සතට-සත්වයාගේ; වැඩට-අභිවෘද්ධියට; මුල්වෙයි-මූලස්ථානයවේ; කිවි ගුරුවරන්-ශුක්‍රාචාර්ය සුරාචාර්ය දෙදෙනා; පැවසූ-ප්‍රකාශකරන ලද්දාවූ; නිති සතරට-ශුක්‍රනීති-ගුරුනීති ශාස්ත්‍රයන් පිළිබඳව; දැන් මේ වර්තමාන සමයෙහි; තමගුරු බවම-ස්වීයාචාර්ය භාවයම; නරලොවට-මනුෂ්‍ය ලොකයට; දැන්විය-ඥාපනය කළේය.

194. ඔහු-උන්වහන්සේගේ; බස්-තෙපුලක්; ඇසුව-ශ්‍රවනයකළ හොත්; සුර ඇදුරන්ගෙතුත්-සුරාචාර්යයන් ගෙන්ද පවා; තුති-ස්තුතිය; ලබසි-ප්‍රතිලාභය කරයි; මෙලොව-මේ ලෝකයෙහි; කෙනෙක්-කිසියම් බුද්ධිමත් කෙනෙක්; ඒ-එය; වරදැයි-සාවද්‍යයයි; නොකිය හෙති-කථනය කළ නොහෙති; (එහෙයින්) දිවැස් ඇතිව-දිව්‍ය චක්ෂුඃ ප්‍රතිලාභය කොට; කී බස් මෙන්-ප්‍රකාශිත භණිතයක් පරිද්දෙන්; පිළිගනිති - (ප්‍රාඥවරයෝ) ප්‍රති ග්‍රහණය කෙරෙත්; (එසේම) මෙලොව-මේ ලෝකයෙහි; අදිකරණ-අධිකරණ විනිශ්චය තෙම; ඔහු - උන්වහන්සේ; ඇතිතෙකැයි - විද්‍යමාන තාක් ය යි; යෙති-(තත්ත්වඥයෝ) කියන්නාහුය.

195. (ඔහු-ඒ ශ්‍රී වනරතන සංඝරාජ මහා ස්වාමිපාදයන් වහන්සේ) හිත අහිතන්-හිතාහිතජනයන්; සුතන් ලෙසට-ස්විය පුත්‍රයන් පරිද්දෙත්; උදු-ඍජුකොට; රකින-රක්ෂාකරනසේක; (යලිත්) රජ ගුරුතන්-රාජ ගුරු ස්ථානාන්තරයද; තෙරනමුදු-(මහා ස්වාමිපාදන්විත) ස්ථවිර ස්ථානාන්තරයද; (යන) පුදතැන්-පූජ්‍යපදවිය; ලැබ-ලබ්ධව; පෙර-පූර්වියවූ; මහතැන්-මහා බුද්ධිමතුන් විසින්; නොමදුටුතැන්-දර්ශනය නොකළාවූම ග්‍රන්ථිස්ථානයන්; පුරුදුකර-පරිචිතකොට; හැමවිදු තැන්-සකල විද්‍යාස්ථානයන්; දැන-පරිඥානයකොට; හැම තැන්-සකල ස්ථානයන්හි; පසිඳුවිය-ප්‍රසිද්ධවූසේක.

196. දෙවෙනිනැතයන-(කිසිවකුත්) ද්විතීය නොවේ යන; විරුදුනමුදු - විරුදාවලී නාමයන්ද; කියවූ-(කවීන් ලවා) ප්‍රකාශකරවූ; මෙබඳු-මේ උක්තප්‍රකාරවූ; යතිඳු උතුමෙක්-යතීන්ද්‍රෝත්තමයෙක් තෙම; සත පිනිනි-සත්ත්වයන්ගේ පුණ්‍ය මහිමය කාරණකොටගෙන; විය-ප්‍රාදුර්භූතවූයේය; එසිදු මෙසිදු-ඒ මේ කාරණයන්; නොකියා-කථනය නොකොට; බණ-සම්බුද්ධ ධර්මයම; දෙසනුයෙනි-දේශනා කරන හෙයිනි; මිහිඳු-මහෙන්ද්‍රවූ; මිහිඳු මාහිමියන්-මහින්ද්‍ර මහා ස්වාමින් වහන්සේ; පැමිණිවෙති-ප්‍රාදුර්භූතවීයයි හඟිමි.

197. සතතනු-නිරන්තරයෙන්; පත්-උපස්ථිතවූ; මෙත් සිතැතනු-මෛත්‍රී සහගත චිත්තයෙන් යුක්තවූද;කිත් කොතනු-කීර්ති ලක්ෂණ ධවජ ඇත්තාවූද; ලත් - ප්‍රතිලබ්ධවූ; සමතනු සැපතනු-සමස්ත සම්පත්තීන්; දෙනු-දානය කිරීමෙහි ලා; සත්සිතනු-ආසක්ත චිත්ත ඇත්තාවූද; ගත්-ග්‍රන්ථවිෂයෙහි; සමතනු-සමර්ථවූද; ඔහු-තත් වනරතන සංඝරාජ ස්වාමීන්; වනත-වර්ණනාකරත්හොත්; නන්-අනන්ත යා හා; සතතනු-බ්‍රහ්ම යන මේ දෙදෙනා; මුත්-වර්ජිතකොට (විනා) කෙවතනු-කවුරු සමර්ථවෙද්ද? (කිසිවකුත් අසමර්ථයයි සේයි.)

## සන්දේශය

198. කෙළ සුවහසක් සක්වළ-කොටි ශතසහස්‍ර චක්‍රවාටයෙහි; නිති-නිත්‍යයෙන්; අණසක පතළ-ආඥාචක්‍රය ප්‍රකාශ කළාවූ; රුවන් පන්තිසෙහි-ෂට්ත්‍රිංශත් ප්‍රකාර රත්නයන් පිළිබඳවූ; ගුණ-ගුණ මහාත්ම්‍යය; වෙසෙස් කොට-විශේෂ ප්‍රකාරයෙන්; කළ-කළාවූ; රුවන් සුතුර-රත්නසූත්‍රාන්ත දේශනාව; සියදහස් විට-ලක්ෂවාරයක්; පිරුවා-පරිවහනය කොට, හෙවත් ජපකොට; හැමසුර නරන්-සකල දෙවියන් හා මනුෂ්‍යයන්; නොහැර-ශේෂනොකොට, තමහට කිකරුකර-තමා කෙරෙහි අවනත කොට; සතත-නිත්‍යයෙන්; ලොවට සෙතදෙන-සත්ත්වයාහට ශාන්තිදානය කරන්නාවූද; ඒ යති සඳුට-එම යති රාජයන් වහන්සේට; නැමද-අභිවාදනය කොට; නැවත-පසුව; සිට-ළඟිතව; මෙලෙසින්-මේ වක්ෂ්‍යමාන ප්‍රකාරයෙන්; සැලකරව්-මතක්කරන්; (කෙසේදයත්) මහත් තෙදැති-උදාර තෙජෝ යුක්තවූ; පුල්වන් සුරිඳු මුල්කොට-උත්පලවර්ණ සුරෙන්ද්‍රයා ප්‍රධාන කොට; දිමුත්-දීප්තිමත්වූ; සමන් බොක්සැල් සුරිඳුන්-සමන්තකූට පර්වතවාසී සුමන දෙවියන්; එක්කොට-සමග්‍රකොට; සවත් සුරිඳු-ෂඩ්වක්ත්‍ර සුරේන්ද්‍රයාය; විබිසණ ඈ-විභීෂණ ආදීවූ; සුරන්හට-දෙවියන්ට; පිරිත්කියා-පරිත්‍රාණ දේශනාව ගණසජ්ඣායනය කොට; පින්දී-පුණ්‍යදානය කොට; සිත-චිත්තය; සතුටුකොට-සන්තුෂ්ට කොට;

199. පවර-ප්‍රවරවූ; සිරිසඟබෝ සිරි පැරකුම් නිරිඳුවෙත-ශ්‍රී සංඝබොධි ශ්‍රී පරාක්‍රමබාහු රාජයා කෙරෙහි; දිවස යොදමින්-දිවස්ලා; කුළුණු සිත-කරුණාචිත්තය; දියුණුකර-ද්විගුණකොට; ඇම දවස-සියලු දවස්හි; සුබ සිරිසෙත-සොභන සම්පත් සහිත ශාන්තියක්; පමුණුවමින්-ප්‍රකාශකරමින්; සතුරු වියවුල්-ශත්‍රූන්ගේ විරුද්ධත්ව යද; උවදුරු-උපද්‍රවයන්ද; අතුරුදන්කර-අන්තර්ධාන කොට; පහන් සිතින්-ප්‍රසන්න චිත්තයෙන් යුක්තව; මුනිඳුට-මුනීන්ද්‍රයාහට; නිබඳ-නිත්‍යයෙන්; පුදකර-පූජා පවත්වා; දෙපන්සියක් අවුරුදු-සහස්‍ර වර්ෂයක් මුලුල්ලෙහි; රජ ඉසුරු විඳ-රාජ සම්පත් විඳනයකොට; පවතිනමෙන්-ප්‍රවෘත්තවන පරිද්දෙන්; සලසා-සලස්වා; ඇමතැන-සකල ස්ථානයෙහි; එකරඟට-එකාකාරයෙන්; අණ පවතිනු කොට-ආඥා පැවැත්ම කොට; ඇමදෙන-සකල ජනයන්; නියමකොට-නිශ්චයකොට; රකිනලෙස-රක්ෂාකරන පරිද්දෙන්; අයදින ලෙස-ආයාචනය කරන පරිද්දෙන්; ඒ යතිරදුට-ඒ වනරතන සංඝරාජයාණන් වහන්සේට; සැලකරන්-විඥාපනය කරන්.

## දූතාශංසනය

200. ගොස්-ප්‍රයාණය කොට; මෙහසුන්-මේ සන්දෙශය; ඇති රඟ-විද්‍යමාන ආකාරයෙන්; යුතු-යොග්‍යව; දක්වමින-ප්‍රකාශකර මින්; ලොව-ලොකයෙහි; දිමුතු යසස්-දීප්තවූ යශස; තරඟරඟ-තරඞ්ගාකාරයෙන්; පෙන්වා-දර්ශනය කරවා; එමුතු කලඹවත්-ප්‍රසිද්ධවූ මුක්තා කලාපයක් සෙයින්; මනරඟ-මනොරම්‍යවූ; හසමිතුර!-මිත්‍රවූ හංසය!;සිය-ස්වීයවූ; සියොතුන් සමග-පක්ෂීන් හා සමගින්; යෙහෙන්-යහපත්සේ; පවතු-ප්‍රවෘත්තවේවා!

## කර්තෘනාම සන්දර්ශනය

201. මනරම්-මනොරම්‍යවූ; ලකළ-අලඞ්කෘතවූ; නිසි-යොග්‍යවූ; මල්පල රම් රඳන-පුෂ්ප ඵලාදීන් සඤ්ජනනවූ; නොවකිම්-සීමාව (ප්‍රමාණය)ක් නැත්තාවූ; නිතොර-නිරන්තරයෙන්; දිසි-දෘශ්‍යමානවූ (බබලන්නාවූ); උතුම්-උත්තමවූ; ගෙවුයනුදුල-ගෘහොද්‍යානයන් ගෙන් ජ්වලිතවූ; ඉසුරු රුසි-ඓශ්වර්‍ය රාශියෙන්; පිරි-පූර්ණවූ; රයිගම් නුවර පුරරුඳි-රෛග්‍රාම නගරයට අයත්ව පිහිටියාවූ; විහිගුම්-උතුම්වූ; සොඳුරු-සුන්දරවූ; වීදාගම වෙහෙර වැසි-වීදාගම විහාර වාසීවූ;

202. නිරතුරු-අනවරතයෙන්; එකලෙසින්-ඒකාකාරයෙන්; සත්වෙත-සත්ත්වයා කෙරෙහි; මෙත්-මෛත්‍රිය; පතළ-පැතුරුවාවූ; හෙළුසකුමගද ඇ-සිංහල සංස්කෘත මාගධී ආදි; නෙකසත්-අනෙක (නොඑක්) ශාස්ත්‍රයන්; නිසින්දත්-යොග්‍යාකාරයෙන් උගත්තාවූ; සහ තොසින්-සන්තොෂයෙන්; දිගුයටග-දිශා නැමැති යෂ්ට්‍යග්‍රයන්හි; කිත්යසකොත්-යශොකීර්ති නැමැති කෙතුන්; බඳ-බඳනාලද්දාවූ; මහනෙත් පාමුල මෙත් තෙරිඳුසඳ විසින්-මහා නෙත්‍ර ප්‍රාසාදමූල මෛත්‍රෙය සථවිර ස්වාමීන් විසින්;

203. සිනිඳු-ස්නිග්ධවූ, හෙවත් මධුරවූ; ගැඹර-ගම්භිරවූ; පද රුත් සමග-පදාර්ථයන් හා; පදරස-පදමාධුර්යයෙන්; සුසැදු-මනා කොට සජ්ජිතවූ; කිවිලකර එක්කොට-කාව්‍ය ලක්ෂණයන් එක්කර; සකස-සකස්කොට; ලකළ-අලඞ්කෘතවූ; පසිඳු-ප්‍රසිද්ධවූ; වනරතන යතිඳුට-වනරතන සංඝරාජ මහා ස්වාමීන් වහන්සේට; දෙව්නලෙස-දූතය කරවන පරිද්දෙන්; හිසර සඳෙස-හංස සන්දෙශයයි; මෙබඳු නමින්-මේ ආකාර නාමයෙන්; සැලසී-සම්පාදිතවී.

**වර්ණනා සහිත හංස සන්දෙශයෙහි අර්ථ ව්‍යාඛ්‍යා**

**නිමි.**

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙල | අශුද්ධ පාඨ | ශුද්ධ පාඨ |
|---|---|---|---|
| 4 | 32 | නිතර නිතර | නිතොර නිතොර. |
| 18 | 21 | ජයවඞින | ජයවඞීන |
| | 32 | භාව | හාව |
| 19 | 11 | භොගාවලි | භෝගාවලි |
| 20 | 24 | සෙනග | සෙනඟ * |
| 21 | 23 | හකාරද්ව ට | හකාරද්වයට |
| 22 | 19 | මූලට-කියන-යනු අඩුවී තිබේ. | |
| 28 | 3 | තෙමලිය | තෙමාලිය |
| 29 | 18 | නැතිත් | නැණින් |
| 30 | 13 | ප්‍රජාවත් | ප්‍රජාවන් |
| 37 | 25 | රජුන් | රදුන් |
| 38 | 18 | ක්‍ෂමා | ක්‍ෂමා |
| 39 | 14 | සමගින් | සමග |
| 44 | 29 | පතුරවන | පතුරුවන |
| | 32 | මැතිදු | මැතිඳු |
| 46 | 15 | සන්නස් | සත්හස් |
| 47 | 24 | ළඟට-අන්වය සුබාවබොධය-යනු අඩුවී තිබේ. | |
| 48 | 5 | පා | පැ |
| | 18 | සබේ | සෙබේ |
| 50 | 17 | තෙප | තොප |
| | 17 | පෙල අගට-සිතට-යනු අඩුවී තිබේ. | |
| | 18 | සිතෙහිවැර | සිතෙහි වැර |
| 53 | 1 | වත | වන |
| | 28 | මෙත් | මෙතේ |
| 54 | 12 | පැලඳ | පැළඳ * |
| | 13 | විහිද | විහිදී |
| 55 | 8 | මුනිඳු | මුනි |
| | 19 | සිරිමහබෝ-මේ වචනය අත්හළ යුතු | |
| 57 | 31 | නෙයක | නොයෙක |
| | 20 | පුත්රුවෙති | පුත්තුරුවෙනි |

* සෙසු තැන්ද මෙසේයි.

| පිට | පෙළ | අශුද්ධ පාඨ | ශුද්ධ පාඨ |
|---|---|---|---|
| 62 | 24 | කෙළිමින්......කෙළිමින් | කෙළිමිනේ......කෙළිමිනේ |
| 63 | 6 | දූත-මේ ළඟට-ලන-යනු යෙදිය යුතු. | |
| 65 | 12 | මදනල-මේ ළඟට-ඇදගෙන-යනු යෙදිය යුතු. | |
| 66 | 11 | සඳවෙල | සඳවෙලෙ |
| 69 | 7 | ළඟට 8 පෙළ-නළඟනන්ගේ රැඟුම්-යනු වියයුතු. | |
| | 21 | යවන | වයන |
| | 28 | එයබ | එසබ |
| | 33 | ඉඳුලිය | ඉදුලිය |
| 70 | 3 | ඉඳුලිය | ඉදුලිය |
| 79 | 15 | වනගල | වනගැබ |
| 87 | 9 | සමකර | සමකොට |
| 135 | 10 | සුබසත් | සුබසෙත් |
| 141 | 37 | ප්‍රාසාදජනකවූ | ප්‍රසාදජනකවූ |

ඳව්-හෝ ද්ව්-වෙනුවට “ඞ” ද
ඬ-හෝ ද්ධ- ,, ධ ද
බැඳි අකුරු ,, හල් අකුරුද යෙදී ඇත.

ණ-න-ළ-ල ආදි සමහර තැන්ද ශුද්ධි පත්‍රයට ඇතුළත් නොකරන ලදී. එබඳු තැන් පරීක්ෂාවෙන් කියවනවිට ශුද්ධකර ගතහැකි බැවිනි.

## — දැන්වීම්. —

**පී. ඩී. ඇස්. වීරසූරිය මහතාගේ පාඨශාලා පොත්**

# සරල කථා

මේ පොත් ළමෝ ප්‍රීතියෙන් කියවත්.

භාෂාව ලිහිල් ය. සිලිටු ය. ඒ ඒ ප්‍රමාණවලට සර්වප්‍රකාරයෙන් ම සුදුසු ය. මුද්‍රණය පිරිසිදු ය. චිත්‍ර (රූප) යත්නෙන් ශෝභනය. උගත යුතු දෙයින් ම සම්පූර්ණය. මිල පහසු ය.

**අධ්‍යාපන මණ්ඩලයෙන් පිළිගන්නා ලද**

ඉතා ශීඝ්‍රව පැතිරියන ඉතා ම හොඳ පාඨශාලා පොත් පඞ්ක්තිය සරල කථා.

| | | | |
|---|---|---|---|
| ඉහළ බාලාංශයේ කියවීම් පොත | | ශත | 15 යි |
| දෙවන ප්‍රමාණයේ | ,, | ,, | 20 යි |
| තුන්වන ,, | ,, | ,, | 25 යි |
| සතරවන ,, | ,, | ,, | 30 යි |
| පස්වන ,, | ,, | ,, | 35 යි |

ප්‍රාණවද් භාෂාවෙන් සාහිත්‍ය ඉතිහාසය ගරු කරමින් ලියන ලද

# සිංහල කවීන්ද්‍රයෝ පොත්

අධ්‍යාපන මණ්ඩලයෙන් පාඨශාලාවල භාවිතයට සමමතයි.

**අතිගෞ: පැළෑණේ වජ්‍රඥාන මහානායක ස්වාමි**
**අතිගෞ: භදන්තාචාර්ය තෙල්වත්තේ ශ්‍රී අමරවංශ ස්වාමි**
**සර් ඩී. බී. ජයතිලක ශාස්ත්‍රාචාර්ය තුමා**
**ජී. පී. මලලසේකර ශාස්ත්‍රාචාර්ය තුමා**

ආදී පඬිවරයන්ගේ ප්‍රශංසාවද ලැබී තිබේ.

| | | | |
|---|---|---|---|
| 4 ප්‍රමාණයේ කියවීම් පොත | | ශත | 30 යි |
| 5 ,, | ,, ,, | ,, | 35 යි |

# ළමා කවි

ප්‍රීතිජනක කථා, කෙළි සෙල්ලම්, තේරවිලි, දෙබස්, පැල්කවි, ගොයම්කවි, ගී, සින්දු ළමා බසින්ම ඇතුළත් මේ කවිපොත් වලට ළමයි ඉතා කැමැත්තාහ.

| | | | |
|---|---|---|---|
| පහළ බාලාංශයේ පොතක් | | ශත | 7 යි |
| ඉහළ ,, | ,, | ,, | 10 යි |
| දෙවන ප්‍රමාණයේ | ,, | ,, | 12 යි |
| තුන්වන ,, | ,, | ,, | 12 යි |

## — දැන්වීම් —

### පී. ඩී. ඇස්. වීරසූරිය මහතාගේ පාඨශාලා පොත්

## මාතෘකා සහිත ලෝවැඩ සඟරාව

4 ප්‍රමාණයට ලෝවැඩ සඟරාව තෝරාගත් කොටස්ද
5 ,, වඩා ගැඹුරු තෝරාගත් කොටස්ද නියමිතය.
මෙන්න ඒ පන්ති දෙකටම ඉතා හොඳ පොත. වුවමනා මාතෘකා තෝරාගත හැක. කවිවල භාවය පොතේ අගට යොදා තිබේ.

අධ්‍යාපන මණ්ඩලයෙන් පිළිගන්නා ලදී.

පොතක් ශත 15 යි.

## සුභාෂිතය

(තෝරාගත් කොටස්)

5 ප්‍රමාණයේ ශිෂ්‍යයන් උදෙසා නවීන ක්‍රමානුකූලව සම්පාදිතයි. ඒ ඒ මාතෘකා හඳුන්වා පොත අගට භාවයද යොදා පුහුණු සටහන් ලියා ගැන්මට ඉඩතබා තිබේ.

පොතක් ශත 15 යි.

## සෞඛ්‍ය චාරිත්‍ර

සෞඛ්‍ය අභ්‍යාසයන් භාවිතාවන අපූරු සටහන් කිරීමට පිළියෙළ කරන ලදී.

පොතක් ශත 8 යි.

## සදාචාර ප්‍රතිපත්ති

අවුරුද්දේ සදාචාරාත්මක කටයුතු ලකුණු කිරීමේ සටහනින් යුක්ත යි.

පොතක් ශත 8 යි.

## සාමාන්‍ය ඥානය

(ප්‍රශ්නෝත්තර) මිල ශත 30 යි

## ඔවා කලඹ

ත්‍රිභාෂාමය පද්‍යරචනා 4, 5, ප්‍රමාණවලට ශත 20 යි

## සිංහල වීරවරයන්ගේ මත

ඉතිහාස කරුණු ශත 10 යි

## අමෘත බින්දු

ධර්මානුකූල උපදෙශ (සිංහල-පාලි) ශත 10 යි

| | | | | |
|---|---|---|---|---|
| ස | සිංහල ළමයා | 1, 2 | කාණ්ඩයක් | රු: 1 50 |
| හ | එම | 3 | ,, | ශත 75 |
| රා | කාව්‍ය රසය | 1 | ,, | ,, 75 |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු